## 2019.01.08 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රීනි |
| දිනයාදුර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රීනි |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති | ගරු නගර සභා මන්ත්‍රීනි |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රීනි |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රීනි |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.35 රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී☸**

## (01)

**01.01** **2018 – 12 – 04දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම**

**2018-12-04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ඒ අනුව 2018- 11- 13 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මැතිවරණ කාර්යාලය , ගාල්ල, සභික ධුර පුරප්පාඩු පිරවීම සම්බන්ධ ගැසට් නිවේදනය . අම්බලන්ගොඩ නගර සභාවට තෝරා පත් කර එවන ලද ජනතා විමුක්ති පෙරමුණේන් පත් කර එවන ලද මන්ත්‍රී කකුළගේ පත්මසිරි දයානන්ද මහතා ඉල්ලා අස්වීම හේතු කරගෙන පුරප්පාඩු වූ සභික ධුරය සඳහා එම පක්ෂයේ අංක 01 කෙරමිණියගේ කොට්ඨාශයට තරඟ කළ මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය නම් කරන ලදී. ඒ අනුව මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මියගේ පුරප්පාඩු වූ සභික ධුරයට පත්කරන ලද අංක /21/01/38/2018/12/17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය කේ.යු. චන්ද්‍රලාල් මහතා , තේරීම්භාර නිළධාරි , අම්බලන්ගොඩ මේ සමඟ ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අති විශේෂ අංක /21/01/38/2018/දෙසැම්බර් 14 වන සිකුරාදා දින . පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥා පණතට දැන්වීම 262 අධිකාරිය . පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥා පණතේ 66 අ 1 යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම . ඉල්ලා අස්වීම හේතු කොට ගෙන අම්බලන්ගොඩ නගර සභාවේ පුරප්පාඩුව පිරවීම හේතු කොට ගෙන සභාවේ තෝරා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩුව ඇති හෙයින් ද ඉහත කී ආඥා පණතේ 66අ 1 වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ තෝරා ඇති සභිකයකු ලෙස පත් වූ කුකුළගේ පත්මසිරි දයානන්ද සිල්වා අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ විසින් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින 30 ක කාලයක් ඇතුලත පළාත් පාලන ආයතන ජන්ද විමසීම් පණතේ 262 අධිකාරිය යටතේ නම නොලත් නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු සභිකයකු වශයෙන් තෝරා පත් කර යුතු යැයි ප්‍රකාශ කර ලැබිය යුතු වුද එම පක්ෂයට අයත් වන්නාවූ ද අම්බලන්ගොඩ නගර සභාවට තෝරා ඇති සභිකයකු ගත් තිරණය මා විසින් නිම කරන ලද හෙයින් ද ඉහත කී පිළිගත් දේශ පාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සඳහා මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය නම් කිරිම ස්වකියි තීරණය දන්වා ඇති හෙයින් ද අම්බලන්ගොඩ නගර සභාවේ තේරීම් භාර නිලධාරි කන්ද උඩ චන්ද්‍ර ලාල් වන මම පළාත් පාලන ආයතනයේ ජන්ද විමසීම් ආඥා පණතේ 66අ1වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් මගගේ චම්පා සුමුදු කුමාරි අම්බලන්ගොඩ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයකු ලෙස මෙයින් දැනුම් දී ප්‍රකාශයට පත් කර ඇති බවට අම්බලන්ගොඩ තේරීම් භාර නිලධාරිතුමා විසින් දන්වා ඇත.

අපේ නගර සභාව වෙනුවෙන් එතුමියව අපි ගෞරවයෙන් පිලිගනු ලබනවා . මීට අදාල දිවුරුම් ප්‍රකාශ ලේකම්තුමියට භාර දී ඇති අතර දිවුරුම් දීමේන් අනතුරුව එතුමියව අපි පිළිගනු ලබනවා. අප සමඟ වැඩ කර ඉල්ලා අස්වී ඇති ගරු නගර සභා මන්ත්‍රී කුකුළගේ පත්මසිරි දයානන්ද මහතාට අපගේ නගර සභාවේ වැඩ කටයුතු සඳහා හා අම්බලන්ගොඩ නගරයේ ජනතාවට සේවය කීරීම පිළිබඳව විශේෂ ස්තුතිය පුද කර සිටින අතර ඔබතුමියද අපි පිළිගන්නවා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනි මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමා ඇතළු සමස්ත සභාවෙන්ම අවසර ඉල්ලා සිටිනවා.මෙම මන්ත්‍රී ධුරය සඳහා මාව තෝරා පත් කර එවීම පිළිබඳව අම්බලන්ගොඩ තේරීම්භාර නිලධාරිතුමාට සහ අප පක්ෂයේ ලේකම්තුමාට මා මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. එසේම මා ජනතා විමුක්ති පෙරමුණේන් තෝරා පත් වුවත් අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට සභාවේ වැඩකටයුතු සිදු කරගෙන යාමට අවශ්‍ය සහයෝගය හා කැපවීම ලබා දෙන බව මා ඉතාමත් සතුටින් දන්වා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මධ්‍යවේදිනි, සියළුම නිලධාරිනි , මේ අවස්ථාවේ අම්බලන්ගොඩ නගර සභාවට හිටපු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවයාගේ ඉල්ලා අස්වීම මත නවක වශයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරියක් ලෙස තේරීම්භාර නිලධාරි විසින් පත්කර එවා තිබෙනවා. එතුමිය අපි අම්බලන්ගොඩ නගර සභාවට සාදරයෙන් පිළිගන්නවා . ඒ වගේම අප හා එක්ව අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ සුභසිරිය වෙනුවෙන් ඉතාමත් කැපවීමෙන් හා උනන්දුවෙන් කටයුතු කරන මෙන් ඉල්ලමින් එතුමියගේ දේශපාලන ජීවිතය සාර්ථක වේවායි ප්‍රර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , සියළුම මන්ත්‍රීවරුන්ගෙන්ද අවසරයි. ඇත්තටම මා ඉතාමත් සතුටට පත් වෙනවා අපේ කාන්තාවක් මෙම ස්ථානයට පත්වීම පිළිබඳව. ජනතා විමුක්ති පෙරමුණේ ගරු නගර සභා මන්ත්‍රී පත්මසිරි දයානන්ද මහතා ඉවත් වීමෙන් පසු කාන්තා මන්ත්‍රීවරියක් පත් කිරිම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණට මා ස්තුති වන්ත වෙනවා . කාන්තාවකට තැන දී කාන්තාවක් මේ සභාවට එවීම ගැන ආඩම්බරයක් ඇති වෙනවා කාන්තාවක් වශයෙන් . මේ ගරු සභාවේ ගනු ලබන වැදගත් ඕනැම තීරණයකට අපි එකඟ වී සභාව ගෙන යමු . නගරයේ දියුණුවට අපි එකතු වි වැඩ කරන ලෙසද ඉල්ලා සිටිනවා. ඔබතුමිය අපි ඉතා ගෞරවයෙන් , ආදරයෙන් . එක්සත් ජාතික පක්ෂයේ කාන්තාවක් විදියට මා ඉතාම සාදරයෙන් පිලි ගන්නවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ජනතා විමුක්ති පෙරමුණේ ගරු නගර සභා මන්ත්‍රී පත්මසිරි දයානන්ද මහතා මෙම සභාව නියෝජනය කර හදිසියේම රෝගාතුර වී ඇති නිසා එම රෝගය හේතුවෙන් මෙම නගර සභා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වී ඇති නිසා එම ඉල්ලා අස්වීමේ පුරප්පාඩුව පිරවීම සඳහා නවක මන්ත්‍රීවරියක් ලෙස මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය මැතිවරණ ලේකම් කාර්යාලය විසින් ගැසට් කර පත් කර එවා ඇත.අපි බලාපොරොත්තු වෙනවා නගරයේ

ජනතාවගේ උන්නතිය වෙනුවෙන් හරි දේ කරන්න එතුමියගේ දායකත්වය ලබා දෙයි කියා. එම දායකත්වය ලබා දී අප සියළු දෙනාගේම නගරයේ දියුණුව කරා ගමන් කරන්නට සහායෝගය දක්වන ලෙස ඉල්ලා සිටිමින් එතුමියගේ වැඩ කටයුතු සාර්ථකව ඉටු වේවායි පතමින් අපගේ අනෙකුත් මන්ත්‍රීවරුන් වෙනුවෙන් ස්තුතිය පුද කර සිටිනවා.

- පෙරවරු 09.42 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා සභාවට පැමිණියහ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි , අපගේ මන්ත්‍රී ධුරයක් දැරූ ගරු නගර සභා මන්ත්‍රී පත්මසිරි දයානන්ද මහතා ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වූ එම තනතුර සඳහා පත් කෙරුණු අපගේ සහෝදර මන්ත්‍රීතුමිය මා ඉතාමත් ගෞරවයෙන් පිලිගනු ලබනවා. විශේෂයෙන්ම මේ සභාවේ 1/3 වඩා කාන්තාවන් නියෝජනය කරනු ලබන සභාවක් බවට පත් වුවා. අපි සතුටු වෙනවා දිගින් දිගටම කාන්තා අයිතිය වෙනුවෙන් සටන් කරන යුගයක අද අපේ සභාව නියෝජනය කරන කාන්තාවන් 06දෙනෙකු සිටිනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. අපිත් සමඟ අම්බලන්ගොඩ නගර ජනතාවට ඒ කාන්තාවන්ගේ අයිතින් දිනා ගැනීමට අද අම්බලන්ගොඩ නගර සභාව පත්වීම සම්බන්ධව. අපිත් අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් සේවය කළා . අඩුපාඩුවක් කියා අපිට එසේ දැනීමට දෙයක් තිබුණේ නැහැ. යම් අඩුපාඩුවක් තිබේනම් එම සියළු අඩුපාඩු සාදාගෙන එම කාන්තා පාර්ශවය වෙනුවෙන් සටනක් කරන්න මන්ත්‍රීවරියන් 06 දෙනෙකු සිටි. අද දිනයේ මේ තේරි පත් වූ නවක මන්ත්‍රීවරියත් අපි හොඳින් දන්නා අතර හොඳට සටන් වැදුණු සහ සටන් කළහැකි සටන් සහයෙකු ලෙස අපි එතුමියව දකිනවා. අද අප සියළු දෙනා එකතු වී සභාවෙන් ගෙන යනු ලබන අම්බලන්ගොඩ නගර සභාවේ දියුණුව වෙනුවෙන් ගනු ලබන සංවර්ධනය සහ ජනතාවට දිය හැකි සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් ඔබතුමියගේ මන්ත්‍රී ධුර කාලය ජනතාවට දිර්ඝ කාලයක් සේවය කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි , සුවිශාල මෙහෙවරක් ජන සමාජයට කරපු දැඩි අත්දැකීම් බහුල කාන්තා රත්නයක් අද අපගේ ගරු සභාවේ අසුන් ගෙන . ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මැතිණිය අපි දැන හැඳින ගනු ලැබුවේ අපේ සිරි මහින්දාරාමේ පින්නදූවේ ධර්ම විද්‍යාලාධිපතිණිය ලෙසයි.ඇය අපට මතකයි එම කාලයේ එතුමිය පක්ෂය වෙනුවෙන් දැඩි කැපවීම් කරමින් වෙර විරිය කරමින් කටයුතු කල කෙනෙකු ලෙස අප කුඩා කාලයේ දැන හඳුන ගත්තා. එවගේම ඇයගේ චින්තනය එතුමිය අදහන නායකත්වය තුල යමින් එතුමිය දුරදර්ශී වැඩ පිළිවළක් ගෙන යන කාන්තාවක් විදියට අපට ඇය හැඳින්විය හැකියි. එසේම අපගේ බල ප්‍රදේශයේ ආගමික කටයුතු වලදී ඇගේ දැත් දිග හැර කටයුතු කරනවා.කොයි කවුරු සමඟත් සුහදශීලිව කටයුතු කරන ඇය අද නාගරික මන්ත්‍රීවරියක් හැටියට අභිමානයට ලක්වන මේ මොහොතේ කෙරමිණිය , පින්නදූව බල ප්‍රදේශයේ නගර සභා මන්ත්‍රීවරයා හැටියටත් එසේම සමාජ සේවකයකු ලෙසත් ඇයගේ ඉදිරිය ප්‍රභාන්විත වේවායි ද සුභාෂිංශන එක් කරනවා.

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 ශ්‍රී බුද්ධදත්ත දහම් පාසලේ වාර්ෂික ත්‍යාග හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය 2018 දෙසැම්බර් මස 30 ඉරිදා දින පැවැත්වෙන බැවින් පුටු 300 ක් ලබා දිම සම්බන්ධයෙන් සහා අනුමතියට යටත්ව ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
අග්ගමහාපණ්ඩිත මහාචාර්ය අතිපූජනීය පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත මාහනායක මාහිමිපාණන් වහන්සේගේ ශ්‍රීනාමයට පූජෝපහාර පිණිස 1978 මාර්තු මස 24 ඉරුදින ආරම්භ කළ ශ්‍රී බුද්ධදත්ත දහම් පාසලේ වාර්ෂික ත්‍යාග හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය 2018 දෙසැම්බර් මස 30 වන ඉරිදා දින පස්වරු 1.30 අග්ගාරාම විහාරස්ථානයේදි පැවැත්වේ. ඒ සඳහා ප්ලාස්ටික් පුටු 300 ක් අවශ්‍ය ඇති බව නින්දානේ වජිරඥාණ මාහිමිපාණන් වහන්සේ විසින් ඉල්ලා ඇත . ඒ අනුව සභා අනුමතියට යටත්ව එම පුටු ලබා දී ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි , මා පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත දහම් පාසලට එම පුටු ලබා දිම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා .

**තීරණය**

**අම්බලන්ගොඩ පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත දහම් පාසලේ වාර්ෂික ත්‍යාග හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය 2018 දෙසැම්බර් මස 30 වෙනි දින පැවැත්වීමට අවශ්‍ය ප්ලාස්ටික් පුටු 300ක් ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීමට අනුව සභා අනුමැතියට යටත්ව එම පුටු ලබා දීම වෙනුවෙන් සභා අනුමතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**03.02 ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය මඟින් 2019 වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනිම සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගරයේ සභා අනුමතියට යටත්ව බැනර්යක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් යටත්ව 2018.12.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කරමින්</u>

අප මධ්‍යස්ථානයේ 2019 I කණ්ඩායම සඳහා ආධුනිකයින් බඳවා ගැනීම මේ දිනවලදී සිදු කෙරේ. ඒ සඳහා නිර්මාණය කරන ලද බැනරය අම්බලන්ගොඩ නගරයේ නොමිලේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා ඇත. මෙමඟින් ඔබ ප්‍රෙද්ශයේ රැකියා විරහිත තරුණ තරුණියන්ට නොමිලේ පාඨමාලා හැදෑරිමට අවස්ථාවක් සලසා දෙන බැවින් මෙම කටයුත්ත ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටී. ඒ අනුව සභා අනුමතියට යටත්ව එම දැන්වීම් පළ කර ඇත.එ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

**ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2019 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිළිබඳව බැනරයක් ප්‍රදර්ශනය කිරීම සඳහා කරන ලද ඉල්ලීමට අනුව සභා අනුමැතියට යටත්ව එම බැනර් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දීම වෙනුවෙන් සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**03.03 එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සම්බන්ධව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරිමේ සහ සංවර්ධනය කිරිමේ සංස්ථාව විසින් එවන ලද 2018.12.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කරමින්</u>

එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානයක් ඉදිකිරිම සම්බන්ධවයි. උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මෙම සංස්ථාව වෙත යොමුකරන ලද ඉහත අංක හා 208/10/18 දිනැති ලිපිය හා බැඳේ. අම්බලන්ගොඩ , හල්වතුර ඇළ යෝජනා ක්‍රමය යටතේ මෙම සංස්ථාව විසින් සංවර්ධනය කරන ලද ඉඩම කොටස් අතරින් දැනටමත් බලයලත් මිනින්දෝරු එල්.පී.ඒ.ශාන්ත පෙරේරා මහතා විසින් මැන පිළියෙල කරන ලද 2391 අංක දරණ සැලසුමේ කැබලි අංක 01 දරණ අක්කර 07 ක් වූ ඉඩමේ කැබලි අංක 01 දරණ කොටස හා එම මිනින්දෝරු මහතා විසින් පිළියෙල කරන ලද 38/ පිඹුරේ කැබලි අංක 61 දරණ ඉඩම් කොටස රූඩ් 1 පර්.36.5 ඔබ නගර සභාව වෙත විවෘත ප්‍රදේශයක් ලෙස පවත්වාගෙන යාම පිණිස මෙම සංස්ථාව විසින් මුදල් අය කිරීමෙන් තොරව ලබාදී ඇත. ඒ අනුව එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානයක් අදාළ ප්‍රදේශය තුළ ඔබ නගර සභාව විසින් ඉදිකරන්නේ නම් ඉහත සඳහන් පොදු පහසුකම් සඳහා වෙන්කරන ලද ඉඩම් කොටස් භාවිතා කරන ලෙස කාරුණිකව දන්වමි. තවද ඉහත ඉඩම් කොටස් ඇතුළත්ව ගරු දිසා අධිකරණයේ නඩුවක් පවතින බැවින් එකී තීරණ සඳහා ද මෙම ඉදිකිරීම් අගතිදායක විය හැකි බවද වැඩි දුරටත් වැඩබලනල සාමාන්‍යාධිකාරි ,කේ රාජපක්ෂ මහතා විසින් දන්වා ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා ගියවර රැස්වීමේදිත් සඳහන් කළා . මෙම ලිපිය මෙහේට එව්වට අපි සාකච්ඡා කළ පසු ඒ අය පවසා සිටිනු ලැබුවේ අපහට නොමිලේ නිදහස් කිරීමට නොහැකි වාතාවරණයක් ඇති බවයි. මුදල් ගෙවනවානම් එම කුඩා බිම් කොටස නිදහස් කිරිමට සූදානම් බව එම නිලධාරින් පවසා සිටියා.නගර සභාවට පුළුවන්නම් පර්චස් එකකටත් අඩු එම කුඩා බිම් කොටස මා හට ලබා දෙන ලෙස මාගේ සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. යම්කිසි මොනයම් හෝ නීති කටයුක්තක් නිසා මෙම ඉඩම් කොටස ලබා දීමට නොහැකි නම් මා යෝජනා කරනවා එම මුදල මා ගෙවිමට කැමති බවත් නගර සභාව හරහා එම ඉඩම් කොටස මා හට ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
ගරු සභාපතිතුමනි , මොකක්ද ඔය ඉඩමට නඩුවක් තිබේනවා කියන්නේ .

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්**

පාර සඳහා තමයි නඩුවක් පවතින්නේ.සම්පූර්ණ ඉඩමෙන් කොටසක් තමයි මේ අත්පත් කර ගෙන ඇත්තේ . ඉඩම අත්පත් කර ගැනිම හේතුවෙන්  ඔහුගේ ඉඩමට යාමට තිබු පාර අහිමි වි ඇත. පාරක් තිබුණ නිසා යම් පාරක්  දෙන්න කියා ඉල්ලා ඇත. එම ඉල්ලීම සාධාරණයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එය සාධාරණ වෙන්න ඇති. නමුත් ඔතැන පාරක් තිබුණේ නැති නිසා. ඔහු කරනු ලබන්නේ කොළේ වසා ගැහිල්ලකී. අපි දන්න නිසා තමයි මේසේ පවසන්නේ. ඕතැන කරනු ලබන්නේ පොදු කටයුත්තකි. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාගේ පෞද්ගලික වැඩක් නොවේ. ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවට කරුණු පැහැදිලි කර අපි ඉල්ලීමක් කරන්න. පොදු කටයුක්තක් සිදු කරනු ලබන අවස්ථාවේදී මන්ත්‍රීවරු සියලු දෙනාම මේ සඳහා සහයෝගය ලබා දෙන ලෙස තමයි ඉල්ලා සිටින්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කරමින්**

ගරු සභාපතිතුමනි , ගරු නගර සභා මන්ත්ත්‍රී රාහුල මහතා  ප්‍රකාශ කර ආකාරයට එම පුද්ගලයන්ට පිවිසුම් මාර්ගයක් තිබුණේ පොඩි කොටසකී.ඒ පෝරඹ හරස් පාරේන් යාමටයි.අඩි තුනක හතරක පමණ පාරකී. අපි මෙම ඉඩමට පාරක් දිය යුතුයි. ධම්මික මන්ත්‍රීතුමා පාරට ඉඩ තබා තමයි මෙම ව්‍යාපෘතිය පටන් ගෙන ඇත්තේ.අද තමාගේ මුදලුත් මේ සඳහා යොදවා, තවත්  මුදල් එකතු කරගෙන තමයි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත්තේ.මෙය ඉටුකළ යුතුයි. මෙය බොහෝ කලක සිට ඇණ සිටි ඇත. මන්ත්‍රීවරයකු ලෙස එතුමා පත්වී මුලින්ම ආරම්භ කළ ව්‍යාපෘතිය මෙයයි. මෙම ව්‍යාපෘතිය අඩපණ වී ඇති බවමිනිසුන් කතා කරන්න වුණත් පුළුවන් .මෙම ව්‍යාපෘතිය අඩපණ වීමෙන් එතුමාගේ තනතුරට හා පෞද්ගලික ජීවිතයට ද හොඳ නැත. පාරට ඉඩ තබා ඇත. මා එතුමාට පැවැසුවා මෙය ආරම්භ කරන්න කියා.මේ සභාවේ සියළු මන්ත්‍රීවරු මේ සඳහා සහායෝගය දි ඇත.පහත් බිම් සංවර්ධන අධිකාරියට මේ සඳහා ඇස ඇරුණේ මෙය සෑදිමට ගත් පසුවයි.මීට ඉහත මෙය කැලෑ වැවි තිබුණු ස්ථානයකී.සභාවෙන් මෙය සුද්ද කර එම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ. මා ඉල්ලා සිටිනවා ඉතා ඉක්මිනින් මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා සහායෝගය ලබා දෙන ලෙස. පාරට ඉඩ තිබ්බාම පර්චස් 1 ටත් අඩු ප්‍රමාණයක් තමයි තිබේන්නේ.මෙම වැඩ කටයුක්ත ආරම්භ කරන්න . යම් ප්‍රශ්නයක් නැගුණොත් අපි සභාවෙන් එම මුදල ලබා දෙන්න . මීට ඉහතදි එම ස්ථානයේ නිවසක් ඉදිකර තිබුණා. සභාවෙන් විශාල ප්‍රශ්නයකට මුහුණ දී එය කඩා ඉවත් කරනු ලැබුවා.ඒ වගේ නෙමේ මෙය පොදු කටයුක්තක්. මගේ පෞද්ගලික මතය මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන්න. නිත්‍යානුකුල පැත්තෙන් බැලුවත් අඩි 10ක 15 ක පාරක් තබා ඇත. එම නිසා මෙය නිත්‍යානුකුලව ගැටලුවක් නොවේ.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**
ගරු සභාපතිතුමනි ,ජන සමාජයට මෙහෙවර කිරීමේ උතුම් අරමුණ ඇතිව ක්‍රියාකරන ජන නායකයින්ට උදාවෙන අහිතකර එම තත්වයට අපේ ගරු මන්ත්‍රීතුමා මුහුණ දී ඇත. අපි දකිනවා එදා අනගාරික ධර්මපාලතුමා , වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා වැනි ඒ ජාතික නායකයින්ටත් එවැනි ගැටලු එමට ඇතිවි තිබේ. නමුත් අපේ මේ මන්ත්‍රිතුමාගේ නව ගමනේ අරම්භක පියවර කිසිසේත්ම ආපස්සට ගන්නට නොදි අපේ ගරු සභාව එකා මෙන් අත්වැල් බැඳගෙන එතුමා සුරාක්ෂා කළ යුතුයැයි අපේ හැඟිම. එම නිසා සභාපතිතුමනි , පහත් බිම් සංවර්ධනය කියන අධිකාරිය කියන ආයතනයේන් මේ දක්වා අපි නම් දැක තිබුණේ නැත කිසිම ක්‍රියාවක නිරත වෙනවා අපේ නගර වල . මෙවැනි වැඩක් ඇති වැඩ කරනා විටද ඔවුන්ට ඇස් ඇරුණේ.එම නිසා මෙම මන්ත්‍රීවරයාගේ තිබෙන හොඳකම මහත ඒතුමා තමන්ගේ පෞද්ගලික ධනය පවා යොදවලා මේ අපේ නගරය විතරක් නෙමේ පාරේ එහේ මෙහේ යන වැස්සන්ට පවා එළිමහනේ ක්‍රීඩා කරන්න අවස්ථාවක් සැලසිමට සඳහායි එතුමා ක්‍රියාකර ඇත්තේ. අපි එතුමාගේ සිතඟි තිබෙන ඒ මුල හේදය අපි අභය කරනු ලබනවා. එනිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා නගරයේ ප්‍රධාන නායකත්වය දරණ මෙම අභියෝගයට කිසිසේත්ම පසු නොබා අපේ මන්ත්‍රිතුමා ආරක්ෂා කරමින් පහත් බිම් සංවර්ධන අධිකාරිය නොසලකා හැර හෝ අපි මේ ඉදිකිරිම කළ යුතුයි. ඒ සඳහා අවස්ථාව උදා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි ,අපේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා සිදු කරනු ලබන කටයුක්ත ඉතාම වැදගත් පොදු කටයුක්තක් නිසා එතුමාගේ ධන පරිත්‍යාගයෙනුත් එතුමා කිරීමට බලාපොරොත්තු වන නිසා ඔබතුමා මේ පිළිබඳ නීතිමය තත්වය අපිට වඩා දන්න නිසා එහි නීතිමය බාධාවක් නොමැතිනම් මේ කටයුක්ත කළ යුතු යැයි මා යෝජනා කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , සුභ නව වසරක් වේවායි ගරු සභාපතිතුමා ඇතුළු අපගේ ගරු මන්ත්‍රීවරු සියලු දෙනාටම සුභ පතනවා. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා මාගේ ප්‍රතිවාදියා ප්‍රදේශයේ. එත් එතුමා කරනු ලබන මේ උදාර කටයුක්ත මම අනුමත කර සිටිනවා. ඊට සහායෝගය දෙනවා.මෙතැන මෙම වැඩය කරද්දී එතුමා පාරක් ලකුණු කර තිබෙනවා. එත් උසාවිය පැත්තෙන් නීතිමය මොනවාගේ ගැටලු ඇතිවෙනවා ද කියන්න දන්නේ නෑ.කොහොම වුණත් මා සුභ පතනවා එතුමාගේ මෙම කටයුක්තට.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා ඉදිරියේදී අපි සාමාන්‍යාධිකාරිතුමාත් මුණ ගැසි සාකච්ජා කර මෙම කටයුක්ත පිළිබඳ ඉදිරිපත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මට අමතක වුණා ප්‍රකාශ කිරීමට මා එතුමන්ලාට යෝජනා කළා මෙයට අපේ නමත් එපා . අම්බලන්ගොඩ නගර සභාවේ නමත් එපා . මොකුත් එපා . අපි මේ ටික සවි කර දෙන්නම් . මෙය නඩත්තු කරන්න කියා. සුද්ද කර දීමට වුණත් අපි ලැස්තියි. අපිට නම් දාන්න අවශ්‍ය නෑ . කිසිම ප්‍රසිද්ධියක් එපා .

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා ආයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අද දිනයේ අපගේ විපක්ෂ නායකතුමා නැති නිසා යම් අදහසක් පැවසිමට කැමතියි. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කිරිමට යන ව්‍යාපෘතිය ඉතාමත්ම වැදගත් වැඩකි. මොකද අද ලංකාවේ බැලුවොත් කියනවා ලෙඩ රෝග වැඩියි, කරදර වැඩියි, ජිවිත අවදානම් වැඩියි. මෙහිදි කිරිමට යන්නේ අම්බලන්ගොඩ නගරයේ සිටින සියළු ජනතාවට නීරෝගි සුවයෙන් ජිවත් වීමට ක්‍රමයක් තමයි සැදිමට යන්නේ.එයට අපි සියළු දෙනාම එකාමෙන් සහායෝගය දෙන ලෙස ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි ඔබතුමාගේ සම්පූර්ණ ශක්තිය යොදවා මෙම වැඩ කටයුක්ත ඉටු කිරීමට සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඔබතුමා මේ කරන ව්‍යාපෘතියට එක සිතින් මෙම වැඩය ඉටු කිරීමට හැකියාව ලැබේවායි සුභාෂිංශනය පතනවා.

- ❖ පෙරවරු 10.00ට පමණ ගරු උප සභාපතිතුමා සභාවෙන් පිටවීම.
- ❖ පෙරවරු 10.00ට පමණ ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ් එම්. නිලානී මෙනවිය සභාවට පැමිණියහ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , අම්බලන්ගොඩ නගර සභාවක් විදියට ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා එම ප්‍රදේශය නියෝජනය කරන ගරු නගරික මන්ත්‍රීතුමා. ඒ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවය දැකලා තමයි මෙම ක්‍රියා දාමයට එකතු වෙන්නේ.එසේ නැතිව එතුමාගේ පුද්ගලික කරණයක් නොවේ. අම්බලන්ගොඩ නගර සභාව නගරයම නියෝජනය කරන සියලුම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සමස්ත අදහස මෙය ඉදිවිය යුතුයි කියන අදහස. එය සත්‍යයක් නම් එය අපි පිලිගන්නවානම් අපිට තිබෙන්නේ පහත් බිම් සංවර්ධනය කිරීමේ අධිකාරියෙන් මෙම ඉඩම් කොටස නොමිලේ ලබා දෙන්නේ නැතිනම් මුදල් ගෙවා ලබා ගන්න.මේ ගරු සභාවේ අපි අනුමතිය දෙනවා. පහත්බිම් ගොඩ කිරිමේ කාර්යාංශය රජයේ ආයතනයකි. මෙම ආයතනය අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් කිසිම වැඩක් කළේ නෑ කියා අපිට පිලිගන්න බෑ. එම ආයතනය තමයි ඔය හල්වතුර අත්පත් කර ගත් ඉඩම ගොඩ කරනු ලැබුවේ අම්බලන්ගොඩෙ නගර සභාව වෙනුවෙන්. එම ආයතනය එම ඉඩම් සඳහා වන්දි ගෙවීම කරනු ලැබුවා. රාජ්‍ය ආයතනයක් විදියට එම ආයතනය එම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මුදල් ගෙවා ඇත. නැවත අප සතු කිරීමේදි මුදල් ගෙවීමේ අව්‍යශතාවයක් ඇත. හැබැයි රාජ්‍ය තන්ත්‍රික මට්ටමින් ඇමතිවරුන්ගේ මට්ටමින් මෙම මුදල් නිදහස් කිරීමේ හැකියාව ඇත. මෑත කාලයේදි අප දැක තිබෙනවා එම ඉඩම් නිදහස් කරනවා රජයන් විසින්. එසේ සිදු වුවත් සිදුනොවුවත් පර් 1 ක් වැනි ඉඩම අම්බලන්ගොඩ නගර සභාව විදියට අපිට මිලදි ගැනීමේ හැකියාව තිබෙනවා. එම නිසා මා යෝජනා කර සිටිනවා සියළුම මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය තිබෙන නිසා පහත් බිම් ගොඩකිරිමේ කාර්යාංශයෙන් මෙම කොටස අපට ලබා දීමට හැකියාවක් තිබෙනවානම් අප ඇස්තමේන්තුවක් අරගෙන එය මිලට ගෙන ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතාගේ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා අවශ්‍ය අවසරය ලබා දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්**

මේ සම්බන්ධව ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා හා මා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ අධිකාරියේ සාමාන්‍යාධිකාරිතුමා මුණ ගැසී සාකච්ඡා කර ඉදිරි ප්‍රගතිය හා කළයුතු වැඩ පිළිවළ පිළිබඳව සභාවට ඉදිරිපත් කරන්නම්.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාව මඟින් ඉදිකරනු ලබන එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානයක් ඉදිකිරීම ඉල්ලීමට අනුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිතුමා මුණගැසී සාකච්ඡා කොට තීරණයක් ගැනීම සුදුසු බවට සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**03.04 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරීමේ උත්සවයේ ආරාධිත අමුත්තන්, මන්ත්‍රීවරුන් ( 50 දෙනෙකු සඳහා ) සංග්‍රහ කටයුතු , පලක තිරය මිලදී ගැනීමට අවශ්‍ය උපකරණ හා සිමෙන්ති මිලදී ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් සභා අනුමතියට යටත්ව ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරීමේ උත්සවය සඳහා සභා අනුමතියට යටත්ව ලබා දුන් රු 15000/= ක මුදල අමතරව වැයවූ මුදල රු.3073/=.එම මුදල ලබා ගැනීම සඳහා සභා අනුමතිය ඉල්ලා සිටිනවා. මෙය සභා අනුමතියට ඉදිරිපත් කරනවා.

- ❖ පෙරවරු 10.05 ට පමණ ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා නැවත සභාවට පැමිණියහ.
- ❖ රවරු 10.05 ට පමණ ගරු නගර සභා මන්ත්‍රීනිජ්.පී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය සභාවට පැමිණියහ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ සම්බන්ධව මා යමක් කතා කළ යුතුව තිබෙනවා. මෙම මුදල් සඳහා අනුමතිය දීම පිළිබඳව මාගේ කිසිම විරුද්ධත්වයක් නැත. මේ ක්‍රියාවලිය තුල අපි අපහසුතාවයට පත් වන ආකාරයට කටයුතු සිදු වී ඇත . එසේම මෙය සඳහා පලකයක් ඉදිකර තිබෙනවා. එම පලකයේ වියදම මෙම ලිපියට ඉදිරිපත් කර නැත. එය කාගේ මුදල් වලින් ද පුද්ගලික මුදල් වලින් වියදම් වුවාද කියා මා දන්නේ නෑ. එම පලකයක් ඉදිකරනවා කියන්නේ සාදාතනික සිහිවටනයකි. මේ සඳහා සභා අනුමතියක් ගෙන හෝ මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කරීමෙන් ද මේ නම්ගම් පලකය සඳහා යොදන්නේද කියන එක පිළිබඳව මට ගැටලුවක් තිබේ. එසේම මෙම පලකය සකස් කිරීමේදි ත් යම් යම් වැරදි අඩුපාඩු තිබෙනවා. මා ඉල්ලා සිටිනවා එයත් නිවැරදි කරන ලෙස . මෙහි සම්ප්‍රදායන් සියළුම දේ දන්නවා. ඒ අනුව එය නිවැරදි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මෙවැනි කටයුක්තකදී ගරු සභාවේ සාකච්ඡා කලා නම් හොඳයි කියන මතයේ මා සිටිනවා.

- ❖ පෙරවරු 10.07 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා සභාවෙන් පිටව ගියහ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>

මෙම බිල්පත සඳහා ලබන සභාවට ඉදිරිපත් කරන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , දැන් මේතැන කියවුණා මෙහි ගැටලු සහගත තත්වයක් තිබෙනවා කියා. එහෙම වුණාම අපිට අනුමතියක් දෙන්න බැනේ. මෙහි පැහැදිලි විනිවිදභාවයක් තිබිය යුතුයි ගෙවීම් වලදි. එම නිසා ඔබතුමා විස්තර කියන්න මේ සම්බන්ධව. පලකය සඳහා අනුමතියක් ගත්තේ නෑ ගරු සභාවෙන් . අපි දෙනවා පලකය ඉදිකිරිමට අනුමතිය.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>

මෙය සභා අනුමතියට යටත්ව තමයි මෙය ඉදිකර ඇත්තේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

අත්තිකාරම් මුදලක් ගැනනේ මේ කියා තිබෙන්නේ . මෙහි තියෙනවා පලක තීරය මිලදී ගැනීම යනුවෙන් සඳහන් වෙනවා . පලකය සඳහා සිමෙන්ති මිලදී ගැනීම වෙනුවෙන් යනුවෙන් සඳහන්ව ඇත.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>

පලක තීරය යනුවෙන් සඳහන්ව ඇත්තේ පලකය විවෘත කිරීම සඳහා යොදා ඇති රෙදි කැබැල්ලයි. පලකය සඳහා ගෙවිය යුතු මුදල ලබන සභාවට ඉදිරිපත් කරන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>
කෑම බීම වලට ගැටලුවක් නෑ. අපි ඒවා අහන්නේ නෑ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාට ඇති ප්‍රශ්නය වන්නේ එතුමාගේ නම පලකය සඳහා පල වී ඇති ස්ථානය පිළිබඳවයි. එතුමාගේ නම සඳහන් විය යුතු ස්ථානයෙන් පහළට දමා තිබීම පිළිබඳවයි. නියම කරුණ ඇත්තටම ඉදිරිපත් කර නැත. පලකයේදි නම සඳහන් කිරිමේදි මෙතුමාගේ නම තුන්වෙනියාට සඳහන් කර නොමැති බව තමයි එතුමාට ඇති ගැටලුව. අපි එය පිළිගන්නවා වැරද්දක් සිදු වී ඇති බවට. මට ආවේ පලකය සවිකිරමේ ලේඛණයේ උඩ කොටස පමණයි. මා කියා සිටියා අපගේ සම්ප්‍රදායක් තිබෙනවා මේ සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ නම් ටික සඳහන් කර දමන ලෙස . නමුත් එය සඳහන් වීමේදි ස්ථානය වෙනස් වීම ඇත්තටම වරදක් . අපි එය පිලිගන්නවා. එ කියන්නේ ජොෂ්ඨත්වය අනුව නම පල කල යුතුයි. පල කිරීම සිදුවි ඇත්තේ වෙනත් විදියකට. එය යම් විදියකට නිවැරදි කිරිමට අපි කටයුතු කරනවා. මෙයට විරුද්ධ නෑ නේද.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර ක්‍රීඩාංගනයේ විසිරි ජල සැපයුම පද්ධතිය සකස් කිරීම උත්සවය සහා අනුමතියට යටත්ව ලබා දුන් රු15000/= ක මුදල සහ ඊට අමතරව වැයවු මුදල රු.3073/= වශයෙන් මුළු මුදල රු.18073/= ක් ගෙවීම සඳහා සභා අනුමතිය ලබා දීම සුදුසු බවට සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.05 පුස්තකාල සහායක තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>

ගැසට් පත්‍රයට අනුව අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල සහායක තනතුර සඳහා අයදුම්පත් 3461 ක් ඉදිරිපත් කර ඇත. පවතින පුරප්පාඩු සංඛ්‍යාව 01 කී. බඳවා ගැනීමට අනුමැතිය ලැබි ඇති සංඛ්‍යාව 01කි මෙතරම් අයදුම් කරුවන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අසීරු කරුණක් බැවින් ලැබි ඇති අයදුම්පත් අතරින් නගර සභා බල ප්‍රදේශය තුලින් ලැබී ඇති අයදුම්පත් පමණක් තෝරා ගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවිම සඳහා අනුමතිය ඉල්ලා ඇත. මේ සඳහා නගර සභා බල ප්‍ර දේශය තුල අයදුම්පත් සංඛ්‍යාව 111 කී.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>
මේ ගත්ත එවා ද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>

නෑ . පුස්තකාල සහායක සඳහා ගැසට් කර අයදුම් පත්‍ර කැඳවා ඇත. එක තනතුරක් පමණක් ඇත. කැඳවන ලද අයදුම්පත්‍ර අපට 3461 ක් පමණ ලැබි ඇත. මෙහි තනි එක්කෙනෙකු ගැනීමට මෙම 3461 ක සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේදි ලොකු කාලයක් වැයවේ.නිලධාරින් විසින් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පදිංචි කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවා නැත.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙහි නිත්‍යානුකූල තත්වය කුමක්ද ? යම් කෙනෙකුට අසාධාරණයක් සිදු වුණහොත් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම සම්බන්ධව උසාවි වුණත් යන්න පුළුවනි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

අපගේ නිලධාරීන් විසින් අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත්‍ර කැඳවා නැත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය මුලින්ම අනුමතිය අරගෙන කරන්න තිබුණා. එහෙම කලානම් ඔය ගැටළුව මතු වන්නේ නෑ. අම්බලන්ගොඩ පදිංචිකරුවන්ගෙන් පමණක් කියා පල කර තිබුණා නම් ගැටලුව නෑ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

මෙහිදි එම ගැසට් පත්‍රයේ තිබෙනවා පදිංචිකරුවන්ට ලකුණු 45ක් ලබා දෙනවා. එහෙත් කවුරු පිටින් ආවත් එම ලකුණු 45 නොලැබේ . හරිවිදියට කරනවානම් මේ 3461 කම කැඳවිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නෑ මෙය කැඳවන්න ඕන නෑ. එය මුලින්ම කරන්න තිබුණ වැඩක්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

ගැසට් එකේ තියෙනවා. ලකුණු 45 ක් දෙන්නේ බල ප්‍රදේශයේ පිදංචි කරුවන්ට. එවිට ඒ අය අඩුවෙනවා. එම නිලධාරීන් අපෙන් ඉල්ලා සිටිනවා අම්බලන්ගොඩ අයගෙන් පමණක් සම්මුඛ පරික්ෂණ සඳහා කැඳවන්න අවසර දෙන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නිලධාරීන් වැඩේ කරලානේ ඔය අවසර ඉල්ලා සිටින්නේ. මෙය කරන්න ඉස්සරවෙලා මේ විදියට තෝරා ගත්තා නම් ප්‍රශ්නයක් නැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

දැන් කරලා ඉවරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ සඳහා කමිටුවක් දමා අයදුම්පත්‍ර කැඳවීම ලැයිස්තුගත කළ හැකියි. උපරිම සුදුසුකම් තිබෙන අය පමණක් සම්මුඛ පරික්ෂණයට කැඳවිය හැකියි. ලකුණු දමා ලැයිස්තුගත කර කෙටි කළ හැකියි.ලකුණු 100 ක් වාගේ දමා සම්මුඛ පරික්ෂණයට කැඳවන පිරිස කෙටි කල හැකියි. එහෙම තමයි හුඟක් කරන්නේ. අපේ බෝඩ්එකේ එහෙම අයදුම්පත්‍ර 6000 ගණන් පමණ ඉදිරිපත් වී ඇත. එවිට මේ ආකාරයටයි සිදු කරනු ලබන්නේ. ලකුණු දමා උපරිම ලකුණු තිබෙන ටික දෙනා ගෙන සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත් කරනු ලබනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි . මෙම අයදුම්කරුවන්ගෙන් යම්කිසි මුදලක් අයකර ගත්තාද මේ ඉල්ලීම් කිරිමේදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

සතයක්වත් අයකර නැත. අපි ලේකම්තුමියට කියමු නිලධාරි මට්ටමින් මෙම අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට ලකුණු යොදවා අවම කැඳවිය යුතු පිරිස තෝරා ඉදිරිපත් කරන ලෙස .

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල සහායක තනතුර සඳහා අයදුම්පත් 3461 ඉදිරිපත් කර තිබූ අතර මේ සඳහා ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍ර සඳහා නිලධාරි මට්ටමින් කමිටුවක් පත්කර ලකුණු යොදා අඩුම කැඳවිය යුතු පිරිස තෝරා ගැනීම සඳහා සුදුසු බවට බවට සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.06 අම්බලන්ගොඩ නගර සභාවේ සේවය සඳහා ලියා පදිංචි කර සේවයේ යොදවා ගෙන ඇති සේවකයන් සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී .**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

සෞඛ්‍ය කම්කරු, වැඩ ක්ෂේත්‍ර කම්කරු හා රියදුරු තනතුරු සඳහා ලියාපදිංචිකර සේවයේ යෙදවීම යන පදනම මත බඳවා ගත් සේවක මහත්ම මහත්මීන් සඳහා සභා අරමුදලින් දකුණු පළාත් පාලන කොමසාරිස්තුමාගේ 01/0606/01 හා 2018/10/10 ලිපියේ කොන්දේසිවලට අනුව ගෙවීම් සඳහා සභා අනුමතිය ලබා ගැනීම නිර්දේශ කර ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටි.දැනට බඳවා ගෙන සේවයේ යොදවා ඇත සේවකයන් . අනුමත සේවක පිරිස නිවාඩු ගිය අවස්ථාවලදී ඒ අවස්ථානුකූලව සේවකයන් බඳවා ගෙන ඇත. එම අයට පඩි ගෙවීම සම්බන්ධව සභා අනුමතියක් ලබා ගන්නා ලෙස දැනුම් දී ඇත.

- ❖ පෙරවරු 10.12 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා නැවත සභාවට පැමිණියහ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි මේ සඳහා අනුමතිය දුන්නානේ වැඩ කිරිමට. දැන් මේයට කීදෙනෙක් බඳවා ගෙන තිබේද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

සෞඛ්‍ය කම්කරුවන් ලියාපදිංචි කර තිබෙනවා 03 ක් , වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 15 ක් ලියාපදිංචිකර ඇත.රියදුරන් 02 ක් ලියාපදිංචිකර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

20 කට තව තියෙනවානේද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

නෑ . මේ අය සඳහා අනුමත සේවක සංඛ්‍යාව තිබෙන්නේ සෞඛ්‍ය 35 නම් වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 25 නම් ඒ අය නිවාඩු යන අවස්ථාවලදී මේ අය බඳවා ගන්න . තාවකාලිකව බඳවා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ අය පිළිබඳව අධීක්ෂණ කටයුතු සිදු වෙනවාද ? නගරයේ ජනතාවට මෙම පුරප්පාඩු පිරවීමේදී ප්‍රමුඛතාවය දක්වන ලෙස අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමනි , මෙම රැකියා දෙකටම නගරයේ පිරිස් ඉදිරිපත් වන්නේ නැත. ඇත්තටම කුණු ඇදිමට හරි පාරේ වැඩ කරන්න හරි පුළුවන්නම් එවන්න . මං ඕන වේලාවක කැමතියි ගන්න. නමුත් ගන්න කැමති වුණාට මිනිසුන් එන්නේ නෑ. එම නිසා එන මනුස්සයාගෙන් අපි මෙම වැඩය කර ගත යුතුයි. නගරයේ අය ගන්න කිව්වොත් මෙය කවදාවත් සිදු වන්නේ නැත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සමහර තැන්වල කුණු ගන්න ගියාම නිවැසියන්ටත් මොවුන් දෝෂාරෝපණය කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරමින්**

ඒ සඳහා තමයි අපේ වැඩ පරික්ෂකවරු සිටින්නේ. මෙය අනුමත කරනවා.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාවේ ලියා පදිංචි කර සේවයේ යොදවා ගෙන ඇති සෞඛ්‍ය කම්කරු , වැඩ ක්ෂේත්‍ර කම්කරු හා රියදුරු තනතුරු සඳහා යොදවා ඇති සේවක මහත්ම මහත්මීන්ට පළාත් පාලන කොමසාරිස්තුමාගේ 01/06/06 හා 2018/10/10 ලිපියේ කොන්දෙසිවලට අනුව සහා අරමුදලින් වැටුප් ගෙවීම සුදුසු බවට බවට සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

- පෙරවරු 10.15ට පමණ ගරු උප සභාපතිතුමා නැවත සභාවට පැමිණියා.

**03.07 පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතවරුන් සඳහා වන පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2019 අධ්‍යයන වර්ෂයට අයදුම්පත් කැඳවීම සම්බන්ධ 2018.12.17 වන දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතවරුන් සඳහා වන පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම.පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය. පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයුදුම් පත්‍ර එවනු ලැබේ.එම පාඨමාලාවේ මුලික අරමුණ වන්නේ පළාත් පාලනය පිළිබඳ මහජන නියෝජිතයන්ට පුළුල් අවබෝධයක් විධිමත්ව ලබා ගැනීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශිය සංවර්ධනය සපථ කරඇති දායකත්වය සපයා ඇති විද්වත් දේශපාලන නායකත්වයක් පළාත් පාලන ක්ෂේත්‍රය තුල බිහිකිරිම මෙම පාඨමාලාවේ මුලික අරමුණ වේ. ඒ අනුව ඔබ පළාත් පාලන ආයතනය තුල මහජන නියෝජිතවරුන් මෙම පාඨමාලාව සඳහා යොමු කරන ලෙස ඉල්ලා සිටින බවට අධ්‍යක්ෂක , පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දන්වා ඇත. ඒ අනුව අයදුම් කිරිමේ අවම සුදුසුකම අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගය සමත්වීම හා පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයකු විම හෝ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වන ලද පාඨමාලාව හදාරා තිබිම පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයකු විම හෝ ඉහත කී අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව සමාන්තර අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිම සහ පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයකු ලෙස කටයුතු කර තිබිම. මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ සම්පුර්ණ කාලය වසරකි.ඒ අනුව ගෙවිය යුතු මුදල රු.60000/= කි. කැමති මන්ත්‍රීවරයකු සිටිනම් එය අයදුම් කරන ලෙස ඉල්ලා සිටිනවා

**ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ඔය පාඨමාලාව පවත්වනු ලබන්නේ සති අග දිනවලදී ද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔව්. දැනට අපේ මන්ත්‍රීවරු ගිය වසරේ මෙම පාඨමාලාව සඳහා යනවා නේද? .

**ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

අපි විභාගයත් කළා. දැන් එහි ප්‍රතිඵල එන්න තියෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඒ කරනු ලැබුවේ ඩිප්ලෝමා පාඨමාලාවද ?

**ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

පළාත් පාලනය පිළිබඳ පාඨමාලාවයි.

**තීරණය**

**පළාත් පාලන කොමසාරිස්තුමා විසින් මහජන නියෝජිතවරුන් සඳහා වන පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට 2019 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**03.08 2018 වර්ෂයේ මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පළාත් පාලන ආයතනයෙන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම 2018. මා වෙත වත්කම් බැරකම් ඉදිරිපත්ඩ කර ඇති නගර සභාවේ මන්ත්‍රීවරුන්ගේ තොරතුරු පිළිබඳව කරුණික අවධානය සඳහා යොමු කරමි. ඒ අනුව මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි . ඉදිරිපත් කර ඇති මන්ත්‍රීවරුන් වන්නේ ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්. නිලානි මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී කුකුලගේ පත්මසිරි දයානන්ද මහතා, ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා යන මන්ත්‍රීවරුන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව 9කු ඉදිරිපත් කර ඇත.තව මන්ත්‍රීවරු 11කු ඉදිරිපත් කල යුතුව ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මගේ නම ඉදිරිපත් කලා හරිද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ එවලා තිබෙනවා වාර්තාව 2018 වර්ෂය සඳහා. මෙය වසරෙන් වසර දිය යුතුයි. ඒ නිසා මේ වසරේත් එය ඉදිරිපත් කරන්න .

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ඡන්දය වේලාවේදි ගන්නවා නේද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ ඡන්දේ වේලාවේදි ගනු ලැබුවේ ඡන්ද කොමසාරිස්තුමා විසිනි. අපි පළාත් පාලන කොමසාරිස්තුමාටත් සියලුම මන්ත්‍රීවරුන් වසරෙන් වසර මෙය ලබා දිය යුතුයි.

**තීරණය**

**ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර තිබූ වත්කම් බැරකම් පිළිබඳ පළාත් පාලන කොමසාරිස්තුමා විසින් මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම 2018 මැයෙන් එවන ලද ලිපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කර අතර මෙසේ වත්කම් හා බැරකම් ඉදිරිපත් නොකළ අනෙකුත් මන්ත්‍රීවරුන්ට ද මේ සඳහා තොරතුරු ලබා දෙන ලෙස ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදී.**

**03.09 අම්බලන්ගොඩ නගර සභාවේ දැනට ආරක්ෂක සේවය සපයන ආයතනයේ ගිවිසුම අවලංගු කර වෙනත් ආරක්ෂක සේවා ආයතනයක සේවාව ලබා ගැනීම සම්බන්ධයෙන් ඇති ලිපිය සභා ගත කරන ලදී .**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ 2018.08.02 දින සිට 2019.07.31 කාලයට ආරක්ෂක සේවය සැපයීම සඳහා ටෙන්ඩරය ලබා ඇති එල්. ආර්.ඩී.සී ආයතනයේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි රනිල් විජේරත්න මහතා විසින් ආරක්ෂක සේවයේ වෙනත් නිලධාරි මහතකු නගර සභාවේ වාහන වලින් ඉන්ධන ලීටර් 4 ක් පමණ සොරකම් කර එම ආරක්ෂක අංශ නිලධාරි කුටියේ තැන්පත් කර ඇති බවට ගරු සභාපතිතුමා, වැඩ පරිපාලක සහායක ලෙස අනුයුක්ත කොට සේවය

කරන ඉදුනිල් මහතා වෙත වචිකව දැනුම් දී ඇත. රනිල් විජේරත්න මහතා විසින් ඒ පිළිබඳව ආරක්ෂක සේවා නිලධාරි සටහනේ 2018.12.04 වන දින පිටු අංක හි සඳහන් තබා ඇත. ආරක්ෂක අංශයේ සටහන් ලේඛණය පරික්ෂා කර වාර්තාවක් සපයන ලෙස තාක්ෂණ සේවා නිලධාරි සඳුන් මහතාට භාරදෙන ලදි. ආරක්ෂක සේවා නිලධාරින් මඟින් මෙවැන්නක් සිදු විම නිසා ආරක්ෂක සේවය පිළිබඳව විශ්වාසය පළුදු විමක් සිදු වි ඇති අතර ආරක්ෂක සේවා ගිවිසුමේ අංක 2,6,7,9 සහ 16 වගන්තිය උල්ලංඝණය වී ඇති බව සඳහන් කරමි. මේ පිළිබඳව සභාපතිතුමා ලබා දුන් වාචික උපදෙස් අනුව ආරක්ෂක සේවා ආයතනය දැනුවත් කර එම ගිවිසුම අවලංගු කිරිමට හා සුදුසු ආරක්ෂක සේවාවක් ලබා ගැනීම සඳහා අනුමතිය සුදුසු බව ලේකම්තුමිය විසින් නිර්දේශ කර ඉදිරිපත් කර ඇත.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මේ උල්ලංඝණය කර ඇති ගිවිසුමේ අංක මොනවාද?

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

ගිවිසුම් අංක 2,6,7,9 සහ 16

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි , එසේ අංක කිවට පැහැදිලි නෑ. අඩුම ගානේ ෆොටෝ කෝපියක්වත් මන්ත්‍රිවරුන්ට ලබා දෙන්න. දැන් සභාපතිතුමාට ඔය කියවීමට ගියොත් ගොඩක් වෙලා යනවා.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

අපි අසන්නේ මෙයයි. දැන් තෙල් හොරකමක් කරලා . එයාට පරික්ෂණයක් කරන්න කිව්වාම දැන් ඇවිත් ඇත්තේ වෙනත් පැත්තකටයි.එවිට අපිට පැහැදිලිව පෙනිය යුතුයි . මෙන්න මේ වරද මේ අයගෙන් තමයි සිදුවි ඇත්තේ කියා. එයයි පරික්ෂණයකින් අපි බලාපොරොත්තු වන්නේ. එම වාර්තාව අපේ මන්ත්‍රීවරුන්ට දෙන්න. දීලා ඉවර වෙලා තින්දුවක් ගනිමු.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මට යොමු කළ වාර්තාව මම නිර්දේශයක් ලබා නොදි සභාවට ඉදිරිපත් කරනු ලැබුවේ සභාවේ මතය අනුව ක්‍රියා කිරිම සුදුසු නිසාය.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, ලබන සභාවට ඉදිරිපත් කරන්න කියන්න සම්පූර්ණ වාර්තාවක් ගෙන.

__ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මෙතැන පැති දෙකක් මා දකිනවා. එකක් තමයි මෙම ආරක්ෂක සේවය විසින් පසුගිය දිනවල සිදුවුණාය කියන හොරකම් කිහිපයක් පිළිබඳව අල්ලා ගෙන ඇත.ඒ යහපත් පැත්තක්. එසේම අම්බලන්ගොඩ බස් නැවතුම්පොළේ අපි රෑ ගිහින් බැලුවොත් එතැන ආරක්ෂක නිලධාරින් හෝ කවුරුත් පෙන්න නෑ. එහෙම ක්‍රියාවලියක් යනවා කියා අපිට පෙන්නේත් නෑ. එතැන දෙපැත්තකට තමයි ඇඳි ඇත්තේ. අනික් පැත්තෙන් මා මේ මොහොතේම මතක් කර සිටිනවා කම්කරු සේවයේ සේවකයෙක් අත්වැසුමක්, සබන් කෑල්ලක් වැනි පුංචි දෙයක් සොරකම් කළොත් අපි ඔහුට අවවාද කර දඩුවමක් සුළු වශයෙන් දී ඔහුව හදා ගැනීමට බලන්න. සොරකම් ගැන නම් මා ඊට එහාට කතා කිරිමට යන්නේ නැත. රටේ ඉතිං මහා පරිමාණ සොරකම් සිදුවන නිසා. මේ කාරණයේ දෙපැත්තක් තිබෙනවා අතන බස්නැවතුම්පලේ ප්‍රශ්නය සහ මෙතැන ආරක්ෂාව සම්බන්ධව

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පළේ ආරක්ෂක සේවාව පිළිබඳව අපිට සෑහිමට පත්විය නොහැකිය. මාත් දින තුන හතරක් ඔතැනට ආවා. ආරක්ෂක අංශයේ සිටින සේවකයන් බස්නැවතුම්පළේ ආරක්ෂාවට යෙදිය හැකි පුද්ගලයින් නෙමේ එහි සිටින්නේ. ඒ ගැනනම් අපගේ අවධානය යොමු කළ යුතු වෙනවා. එම නිසා මා ප්‍රකාශ කර සිටින්නේ මොවුන්ගේ තිබෙන වැරදි මන්ත්‍රිවරුන් දැනුවත් කරන්න. මෙවැනි දෙයක් සම්බන්ධව අපි ලබන සභාවට ඉදරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ලබන සභාවට මේ සම්බන්ධ ගතයුතු තින්දු සමඟ සියලුම මන්ත්‍රිවරුන්ට පිටපත් සහිතව වාර්තා නිසියාකාරව ලබන සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා කතා කරමින්**

බස්නැවතුම්පොළේ සිටින ආරක්ෂක අංශ නිලධාරියා සමඟ මා සකච්ජා කරනු ලැබුවා . ඔහු පැවසුවා ප්‍රධාන ආරක්ෂක නිලධාරියා රාත්‍රි 10න් පසු මෙතැනට එක්කෙනෙකු සැමදාම ගෙන එන බව. එක් කෙනෙකු පමණයි එහි සිටින්නේ. එම පුද්ගලයාත් තනියම ඉන්න නිසා ඔහේ පැත්තකට වී සිටිනවාලු.

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නෑ. දැන් අපි අපේ සේවකයකුත් එහි යොදවා තිබෙනවා. පසුගිය සභාවේ ගත් තින්දුව පරිදි සභාවේ ස්ථිර සේවකයකු යොදවා තිබේ. සභාව විසින්ම තමයි තීරණය කරනු ලැබුවේ මොහු සේවයේ යොදවන ලෙස.

**ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා කතා කරමින්**

අර අඹ ගහ තිබෙන පැත්තේ දුම්රියපොළ පැත්තේ කිසිම එළියක් නැහැලු රාත්‍රියට. කළුවරේ මත්පැන් පානය කිරිමත් , නොයෙක් දෙවල් සිදුවන බවත් ඔහු පැවසුවා.

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ආරක්ෂක අංශ සේවයේ අය යොදවා ඇත්තේ සිගා කැම , මත්පැන් පානය කිරිම , අපචාර ක්‍රියාවෙනවා නම් ඒ සියල්ල වලක්වාලීම ආදි සියල්ල ඔවුන් විසින් වැලැක්විය යුතුයි..

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපිම තමයි මේ ආරක්ෂක සේවය හොඳ බව පැවසුවේ. වැඩකරනගෙන යනවිට එතුමා හොඳ කාර්යශුරය කියා සැමදෙනාම සමඟ ප්‍රශංසනීයයි කියා මේ රනිල් වික්‍රම සිංහ මහතාට පවසා තිබේ. වැඩකරන ලද පඩි මාස 2ක් ගෙවා නැත.එක අත්‍යවශ්‍ය දෙයක්.

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමිය , පඩිය අත්හිටවනු ලැබුවා යම් සොරකමක් සිදු විම පිළිබඳ අපට වාර්තා වුණා එක් ආරක්ෂක අංශ නිලධාරියෙකුගේ. එම ආරක්ෂක අංශ නිලධාරියාගේ මාස 2ක් වැටුප පමණක් නවත්වනු ලැබුවා. අනික් ඒවා ගෙවා ඇත.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

සොරකම සිදුවු පුද්ගලයාගේ දවසේ වැටුප පමණක් කැපුවානම් හරි නේද?

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මෙහි සිදු වි ඇත්තේ සොරකම සිදුවිමට කලින් ආරක්ෂක අංශයේ සේවකයාට අපි වැටුප් ගෙවීමට කලින් එම ආරක්ෂක සේවා ආයතනය විසින් ඔවුන්ට වැටුප් ගෙවා ඇත. ඔවුන්ට ප්‍රශ්නයක් වී ඇත්තේ මෙම ගෙවන වැටුප අයකර ගන්නේ කෙසේද කියා. එය අපට අදාල නැත. කොහොම වුණත් වරදක් සිදුවී තිබෙන නිසා වැටුප් ගෙවීම සිදු කරන්න එපා කියා තිබුණානම් හරි..

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

යම් සාධාරණයක් ඉටු කරවා දෙන්න . සොරකමක් සිදු වී ඇත්නම් වරදට දඬුවම් දිය යුතුයි. අසාධාරණ ලෙස එය හේත්තු ගන්වමින් කෙනෙකුගේ පඩිය අහිමි කිරිම නොකළ යුතුයි.

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අහිමි කර තිබෙන්නේ මෙහි පරික්ෂණය නිමවනතුරු . පරික්ෂණයේ ප්‍රතිඵලවලින් අපිට කිව්වොත් මෙම පඩිය ගෙවන්න කියා අපි එය ගෙවනවා. දැනට තාවකාලිකව එම නිලධාරියාගේ පමණක් වැටුප නවත්වා ඇත.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ප්‍රධාන ආරක්ෂක නිලධාරියාගේද?

**ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ වරදකරන ලද ආරක්ෂක නිලධාරියාගේ.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

නෑ මට දැන් දැනගැනීමට ලැබුණේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියාගේ වැටුප නවත්වා ඇති බවයි.

**ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය ගෙවා ඇත.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එසේ නම් කමක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මා කතා කරන්නේ එක නෙමේ. දැන් වේලා තියෙන්නේ ආරක්ෂක නිලධාරියාගෙන් අඩුකර ඇති වැටුප ප්‍රධාන ආරක්ෂක සේවා නිලධාරියාගේන් අඩුකර ගන්නා බවකි.

**ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එක එම ආයතනයේ වැඩකි. අපි ආරක්ෂක සේවයට වැටුප ගෙවා ඇත.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි මේ පිළිබඳව අපි ආරක්ෂක සේවා ආයතනයට මේ පිළිබඳව දැන්විය යුතුයි. මෙයින් සිදු වන්නේ එම නිලධාරියා අධෛර්‍යමත් වී තවදුරටත් සොරකම් පිළිබඳව දන්වන්නේ නැතිව සිටියි.

**ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපිට ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ඔහුගේ වැටුප ගෙව්වේ නැ කියා මාහට තවම දැනුම් දී නොමැත. කොහොම වුණත් සභාව ගිවිසුම්ගත වී ඇත්තේ අදාල ආයතනය සමඟ පමණකි. අපි රු.200000/= ක මුදලකට වැඩියේ මුදලක් ආරක්ෂක සේවා ආයතනයට ගෙවනු ලබයි. එම මුදල අපි ගෙවා ඇත.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපිට මැදිහත් වීමට පුළුවන් නම් සාධාරණ මැදිහත් වී ඔහුගේ වැටුප නැවැත්වීම වලක්වන්න.

**ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එයඑම ආයතන නිලධාරින් අතර ප්‍රශ්නයක් මිස නගර සභාවේ ප්‍රශ්නයක් ලෙස භාර ගන්න එපා .

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

දැන් වේලා තියෙන්නේ ආරක්ෂක ආයතනයේ ප්‍රශ්නයක් වුවත් එය නගර සභාවට බලපෑ ඇත. අපි කියන්නේ ඔහු වැඩ නොකර සිටීමට බලයි.

**ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වැඩ නොකර සිටියොත් ආරක්ෂක සේවය අයින් කරන්න සිදුවෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

නෑ මැදිහත් විය හැකියි . මේ ගැන කතා කර බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙතැන තියෙන ගැටලුව මෙකයි. ආරක්ෂක අංශයේ අධික්ෂණය සඳහා කවුරුහරි නිලධාරියෙකුට භාර දී නැද්ද?

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරිගේ අධික්ෂණය යටතේ පවතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතකොට පොතක් දමා අධික්ෂණ කටයුතු සිදු වෙනවා ද? දැන් අපි දන්නේත් නෑ සොරකම් අසුවුණේ එම ස්ථානභාර නිලධාරියා වැඩේ කරන නිසානේ. මන් දනනේ නෑ හරි වැරුද්ද මොකක්ද කියා. අපි පරික්ෂණයෙන් පසුව තමයි කටයුතු සිදු කරන්න වෙන්නේ. පරික්ෂණයේ වාර්තාව අරගෙන තමයි අපිට ඕනම දෙයකට කතා කල හැකි වන්නේ. අපි මුලින්ම ඉල්ලා සිටින්නේ ලබන සභාවට එය ලබා දෙන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රිලාල් මහතා කතා කරමින්</u>**

මේ ප්‍රකාශ කරන ආකාරයට ප්‍රධාන ආරක්ෂක සේවා නිලධාරියාගේ වැටුප් නැතිවිමට ප්‍රධාන හේතුව වී ඇත්තේ සොරකම් ඇල්ලිමයි. එවිට හෙට දවසේ එතුමා සොරකම් අල්ලයිද? රාජකාරිය කරයි. කටයුතු වලට මන්දඋත්සාහයක් ඇති කිරිමයි කරනු ලබන්නේ. එම ආයතනයයි අපි අතරයි සම්බන්ධතාවය තිබෙන බව ඇත්ත. නමුත් දැන් නගර සභාවට මෙම සේවය සපයනු ලබන්නේ එම නිලධාරින් විසිනි. ආයතනය මේතැනට අදාල නෑ. ආයතනය සිටින්නේ මුදල් ලබන්න , ලාභ ඉපයිමට පමණයි බැඳි ඉන්නේ. නිලධාරියා ගැන අපි සොයා බැලිය යුතුයි. අපි ඔහුගේ සේවය ලබා ගන්නවානම් ගරු සේවයක් ලබා ගන්නවා. අවංක සේවයක් ලබා ගන්නවා.ඔහු පෙන්වා තිබෙනවා ඔහුගේ දක්ෂතාවය හා අවංකභාවය පුරාවට. ඔහුගේ රාජකාරි කාලය තුල සොරකම් අකටයුතුකම් කිහිපයක් ඔහු ඉදිරිපත් කර ඇත. ඔබතුමා ගරු ලබන සභාවට ඉදිරිපත් කරනවානම් ඔහුගේ අයිබී වාර්තාව ඔබතුමාට තෙරේයි ඔහුගේ සේවය කුමක්ද කියා. එසේ නම් අපි බැඳි සිටිනවා එතුමා සොරකු නොවනතාක් එවැනි පුද්ගලයන් ආරක්ෂා කිරීමට . ඔහුගේ සේවය වටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙය හොඳ නැත.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා එක දෙයක් ගැන එක වරක් කතා කරන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සමාවෙන්න ඕන. 3.09 කියන්නේ ආරක්ෂක සේවය අවංගු කරන ලෙස ඉල්ලා සිටිනවා. එවිට සිතයි මේ අය සොරකම් අල්ලන නිසා අපේ නගර සභාවෙන් මේ අය අයින් කරන්න කියනවා කියා සිතාවී. ගිය සභාවේ තිබුණේ සොරකමක් ඇල්ලුවා කියා ලොකුවට පත්තර වල දමා තිබුණා. දැන් මෙය අවලංගු කරනවා කියා අපේ මාධ්‍යවේදි මහත්වරු මේ පිළිබඳව දැම්මොත් එහෙම සිතාවි සොරකම් නගර සභාවේ වෙන්න ඕන නිසා මෙම ආරක්ෂක සේවා ආයතනය ඉවත් කරනවා කියා. මෙය ලොකු ගැටලුවකි අපේ නගර සභාවට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

ලංකාවේම හොඳම නගර සභාව පසුගිය වකවානුවල අම්බලන්ගොඩ නගර සභාව තමයි ඉතිහාස ගත වී ඇත්තේ. දැන් නරකම නගර සභාව විදියට තමයි පත්තර වල පලවන්නේ. ගියමාසයේ සිද්ධි 2ක් පත්තරයේ පළ වී තිබිණි. මෙසේ පළවීමෙන් අපගේ නගර සභාවට හොඳ නැත. සොරකම් ඇල්ලිය යුතුයි. අනිවාර්යෙන්ම සොරකම් අල්ලන මහත්වරුන්ට ස්තුති කළ යුතුයි. ඊට අමතරව පත්තර වල පල වි ඇත්තේ අර විදියේ සිද්ධියි.මා ලඟ එම පත්තර කැලි දෙකක් ගෙනවිත් ලඟ තිබේ. අපි හොඳම නගර සභාව වුණු නිසා මෙසේ පලවීමෙන් නගර සභාවට හොඳ නැත.

ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, අපි හෙලා දකිනවා එම අවංක නිලධාරියාගේ පඩි නඩි ගෙවීම පැහැර හැරීම සම්බන්ධව.එම ආරක්ෂක සේවා නිලධාරියා අපි අභය කළ යුතුයි.මුළු සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මේ වෙනුවෙන් පෙනී සිටින ලෙස.

- ✓ **පෙරවරු 10 .15 ට පමණ ටෙන්ඩර් හා මිළ ගණන් විවෘත කරනු ලැබිය.**

ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගරු මන්ත්‍රීවරුන් විසින් දැන ගත යුතුයි අප ගිවිසුමකට එළඹී ඇත්තේ අදාල සමාගම සමඟ පමණකි. එවිට ඒ අදාල සමාගමෙන් බිල්පතක් ඉදිරිපත් කරාම සාධාරණ ගෙවීම අපි ගෙවනවා. අදාල සමාගමේන් ඒ අයට පඩි නොගෙවීමට ක්‍රියා කිරිමේ වගකිම ඇත්තේ ඒ දෙපාර්ශවය අතරේයි. අපි එයට මැදිහත් වන්නේ නැත. අපි එය සොයා බලන්නම්. ආරක්ෂක සේවා ආයතනයේ ඊට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරින් පැමිණෙනවා . ඒ පැමිණියාම සොයා බලන්නම් . මෙහි පැහැදිලි වාර්තාවක් ගරු සභාවේ සෑම මන්ත්‍රීවරයෙකුටම දෙන්නම්.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාවේ දැනට ආරක්ෂක සේවය සපයන ආයතනයේ ගිවිසුම අවලංගු කර වෙනත් ආරක්ෂක සේවා ආයතනයක සේවාව ලබා ගැනිම පිළිබඳ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සාකච්ජා කිරීමෙන් අනතුරුව ආරක්ෂක සේවා ගිවිසුම හා ආරක්ෂක සේවය පිළිබඳ පරීක්ෂණ වාර්තාවක් ලබන සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.10 අභ්‍යන්තර දුරකථන ජාල සම්බන්ධතාවය ලබා ගැනීමට යෝජිත ස්ථාන හා සිමාවන් සම්බන්යෙන් ඇති ලිපිය සභාගත කරන ලදි.**

ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අභ්‍යන්තර දුරකථන ජාල සම්බන්ධතාවය ලබා ගැනීමට යෝජිත ස්ථාන හා සිමාවන් . ඉහත සඳහන් කර ඇති අභ්‍යන්තර දුරකථන ජාල සම්බන්ධතාවය ලබා ගනීමට යෝජිත ස්ථාන හා සිමාවන් පහත පරිදි වේ.ඩ එය රු.10000/= ක මුදලක් ගෙවීමට අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

| | |
|---|---|
| සභාපති | රු.500 |
| උපසභාපති | රු.500 |
| ලේකම් | රු.500 |
| ගණකාධිකාරි | රු.500 |
| ප්‍රධාන කළමණාකරන සහකාර | රු.500 |
| ප්‍රධාන ආදායම් කළමණාකරන සහකාර | රු.500 |
| ප්‍රජා සංවර්ධන නිලධාරි | රු.500 |
| ආරක්ෂක අංශය | රු.500 |
| සැපයුම් නිලධාරි (ගබඩාව) | රු.500 |
| කර්මාන්ත අධිකාරි (TO) | රු.500 |
| ආදායම් පරික්ෂක (RI) | රු.500 |
| තොරතුරු තාක්ෂණඩ නිලධාරි | රු.500 |
| සෞඛ්‍ය අංශය (PHI) | රු.500 |
| වැඩ අංශය ( Supervisor) | රු.500 |
| මහජන පුස්තකාලය | රු.500 |
| විද්‍යුත් පුස්තකාලය | රු.500 |
| ජංගම සේවා සඳහා වාහනතුල රැගෙන යන දුරකථන | රු.500 |
| බස්නැවතුම්පොළ - අම්බලන්ගොඩ | රු.500 |
| නගර සභා සුසානභූමිය - ඕකන්ද පොල්වත්ත , අම්බලන්ගොඩ | රු.500 |
| නගර සභා සුසාන භූමිය පටබැදිමුල්ල , අම්බලන්ගොඩ | රු.500 |

ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , මෙය සෞඛ්‍ය අංශයට නැද්ද ?

ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

සෞඛ්‍ය අංශයේ (PHI) මහතාට ලබා දී ඇත.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

ඔය දුරකථන ජාල සපයන ආයතනයේ පූර්ව කොන්දෙසිය රු.500/= ක් එක දුරකථන සම්බන්ධතාවයකට අයකරන එක . දැන් සභාවේ ඉදිරිපත් කර ඇති ආකාරයට මෙයින් අර්ථ කථනය වන්නේ සභාපතිතුමාට රු.500/= කි , ලේකම්තුමියට රු.500/= කි , එයට නෙමේ අපි අනුමතිය ලබා දෙන්නේ . සභාපතිතුමාගේ දුරකථනයේ බිලට ගාණක් නියම නැත. ලේකම්තුමියගේ බිලත් සිමා රහිතයි. එයට කොන්දෙසි අපිට දැමිය නොහැකිය. නිලධාරින්ගේ ඒවාට රු.500/= ත් වැඩියි. සමහර නිලධාරින්ට අවශ්‍ය වන්නේ නෑ. උදාහරණයක් ලෙස ආදාහනාගාරයට රු.500ක් යන්නේ නැත. මෙම දුරකථන සම්බන්ධතා අතර කිසිම මුදලක් අය කරනු නොලැබේ. අපගේ අම්බලන්ගොඩ නගර සභාවත් පිටස්තර ආයතනයත් අතර අපි ගන්නා දුරකථන ඇමතුම් සඳහා පමණි මේ සඳහා අයවනනේ .එවිට ලැබෙන ඇමතුම් අපගේ පරණ දුරකථන ජාලයටයි ලැබෙන්නේ. ඒ ආකාරයට මේ සඳහා අනුමතිය ලබා දෙන්න .නැතනම් ලේකම්තුමියගේ දුරකථනය රු.500/= ක වැඩි මුදලකට පාවිච්චි කළ නොහැකි වේ. මෙම දූරකථන 20 අනුමත කරනු ලබන්නේ රු .10000/= ක මුදලක් ගෙවීමටයි.

ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

ඒ අනුව උපරිම රු.10000/= ක මුදලක් ගෙවීමට සභා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

**අභ්‍යන්තර දුරකථන ජාල සම්බන්ධතාවය ලබා ගැනීම හා සීමාවන් සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ , උප සභාපතිතුමාගේ , ලේකම්තුමියගේ දූරකථන සඳහා උපරිම සීමාවක් නොමැති අතරත් අනෙකුත් දූරකථන සඳහා ලැබෙන හා හදිසි ඇමතුම් පහසුකම් පමණක් ලබා දීම සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.11 ජී.ඩබ්.ඒ. ශ්‍යාමලි මහත්මිය විසින් තම ඉඩමට ඔප්පුව ලබා දීම පිළිබඳව එවන ලද ප්‍රසංසා ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

පදිංචි ඉඩමට ඔප්පුවක් ලබා දිම සඳහා ඒ.ඩබ්. චන්ද්‍රලතා මහත්මියට 86ඩී , තල්ගස්ගොඩ , ග්‍රාම නිලධාරි වසමේ තැලිගල කන්ද නැමති ඉඩමේ පර්චස් 6 ක පමණ භූමි ප්‍රමාණයක මා විසින් ඉඩමක් තනනු ලැබු අතර වසර 10 ක පමණ කාලයක සිට පදිංචි අතර එයට ඔප්පුවක් ලබා දීම සම්බන්ධයෙන් නගර සභාවේ සියලුම මන්ත්‍රිවරුන්ට හා සියලුම දෙනාට ස්තුතිය පළ කර ලිපියක් එවා ඇත . එය දැන ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**තීරණය**

**ජී.ඩබ්.ඒ. ශ්‍යාමලි මහත්මිය විසින් තම ඉඩමට ඔප්පුව ලබා දීම පිළිබඳව එවන ලද ප්‍රසංසා ලිපිය ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී**

**03.12 2018.12.24 වන දින පුවන්වඩු ජයන්ත මහතා විසින් සමරු මුද්දර සඳහා නිර්දේශ ලබා දීම සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

හිටපු උපසභාපති සාමවිනිසුරු ජුවන්වඩු ජයන්ත මහතා විසින් සමරු මුද්දරයක් සඳහා නිර්දේශ ලබා දීම . අම්බලන්ගොඩ නගරයේ වැදගත් ස්ථානයන් හැ ප්‍රභුවරුන් නම් කිරීම කොමසාරිස්තුමාගේ ඉල්ලීමක් අනුව අම්බලන්ගොඩ සුනාන්දාරාම විහාරයේ සන්ථාර කුළුණ සහ නගරයේ ප්‍රභූන් නම් කිරීමට පසුගිය මාසික සභා රැස්වීමේ සිදු කර ඇති බව දැන ගතිමි .එහිදී සුනාන්දාරාම විහාරාස්ථානයේ සන්ථාර කුළුණ නම් කිරීම පිළිබඳව සතුටට පත් වන අතර එය අනුමත කරමි. මෙම තොරණ අනුමත කර ගැනීමට වසර දෙකකට ඉහතදි මා උත්සාහ කළද එම ලිපි නියමිත කාලයට ලබා දීමට නොහැකි විමෙන් එය ඉටු නොවිය. නැවත මා විසින් මේ වසරේදි නියමිත කාලයට ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා වෙත ලිපියක් සහිතව කරන ලද ඉල්ලීම තැපැල් ඇමතිතුමා මුද්දරයක් භාරගෙන මුද්දර කාර්යාංශයේ අධ්‍යාක්ෂකතුමා වෙත ඉහත යෝජනා 2019 මුද්දර යෝජනාවක් යටතට වැටුණු යෝජනවක් ලෙසින් මුද්දර උපදේශන සේවයේ සාකච්ඡාවට ඉදිරිපත් විමට ඇත. මා වෙත දැනුම් දීමේ ලිපියක් ද මේ සමඟ එවා ඇත. එය ඔබතුමාගේ හා මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ජුවන්වඩු ජයන්ත මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.

**තීරණය**

**2018.12.24 වන දින ජුවන්වඩු ජයන්ත මහතා විසින් සමරු මුද්දර සඳහා නිර්දේශ ලබා දීම සම්බන්ධයෙන් එවන ලද ලපිය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.**

**03.13 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ සභාව සතු සියළුම වත්කම් වල ආරක්ෂාව සඳහා C.C.T.V. කැමරා පද්ධතියක් සවි කිරීම සුදුසු බවට ලේකම්තුමිය විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ සභාව සතු සියළුම වත්කම් වල ආරක්ෂාව සඳහා C.C.T.V. කැමරා පද්ධතියක් සවි කිරීම සුදුසු බවට නිර්දේශ කර ලේකම්තුමිය විසින් යෝජනාවක් සකස් කර ඉදිරිපත් කර ඇත.

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , මෙය හොඳ යෝජනාවක් වන අතර ඒ සඳහා යන මුදල කොපමණද කියා ඇස්තමේන්තුවක් සකස් කර සභාවට ඉදිරිපත් කරන්න. එවිට ගරු සභාවේ මන්ත්‍රිවරුන්ට තීරණය කළ හැකියි ඒ සඳහා කොපමණ මුදලක් වැයවේ ද කියා .

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි ටෙන්ඩර් කර ටෙන්ඩර් පටිපාටියකට යටත්ව සිදු කළහොත් හොඳයි. ඒ සඳහා ඇස්තමේන්තුවක් සැකසීමට ඊට කලින් බැරිද ?

ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ සඳහා යන වියදම පිළිබඳ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න .

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ සභාව සතු සියළුම වත්කම් වල ආරක්ෂාව සඳහා කැමරා පද්ධතියක් සවි කිරීම සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කර මිල ගණන් කැඳවා සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදී.**

**03.14 පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින්** 2018- II **භාගයේ ගොඩනැඟිලි මිල ගණන් පිළිබඳව තාක්ෂණ නිලධාරින් දැනුවත් කිරීම සම්බන්ධ 2018.12.06 දිනැති ලිපිය සභා ගත කරන ලදී.**

ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

2018- II භාගයේ ගොඩනැඟිලි මිල ගණන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් එවා ඇත. අවශ්‍ය කෙනෙකු සිටි නම් මෙහි ජායා පිටපතක් ලේකම්තුමියගෙන් ඉල්ලා ගන්න.

**තීරණය**

**පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් 2018- II භාගයේ ගොඩනැඟිලි මිල ගණන් පිළිබඳව තාක්ෂණ නිලධාරින් දැනුවත් කිරීම සම්බන්ධ 2018.12.06 දිනැති ලිපිය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.**

**03.15 පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් 2018- II භාගයේ ගොඩනැඟිලි මිල ගණන් පිළිබඳව තාක්ෂණ නිලධාරින් දැනුවත් කිරීම සම්බන්ධ 2018.12.13 දිනැති ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2018- II භාගයේ ගොඩනැඟිලි මිල ගණන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් එවා ඇත. අවශ්‍ය කෙනෙකු සිටි නම් මෙහි ජායා පිටපතක් ලේකම්තුමියගෙන් ඉල්ලා ගන්න.

තීරණය

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් 2018- II භාගයේ ගොඩනැඟිලි මිල ගණන් පිළිබඳව තාක්ෂණ නිලධාරින් දැනුවත් කිරීම සම්බන්ධ 2018.12.13 දිනැති ලිපිය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.16 නගර සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන ලබා දීම අධික්ෂණය කිරීම වෙනුවෙන් ගෙවනු ලබන 2018 වර්ෂයේ දීමනාව ලබා ගැනීම සම්බන්ධව එම්.ඩබ්.ආර්. දිල්රුක්ෂි මහත්මිය විසින් 2018.12.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නගර සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන ලබා දීම අධික්ෂණය කිරීම වෙනුවෙන් ගෙවනු ලබන 2018 වර්ෂයේ දීමනාව ලබා ගැනීම. සභාව සතු වාහන යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන ලබා ගැනීම සම්බන්ධව අධික්ෂණය කිරීම වෙනුවෙන් 2008.11.04 වන දින මාසික සභාව් 12.04 වන දින සභා තීරණයට අනුව මාසික රු 800/= ක මුදලක් ගෙවනු ලබයි .2018 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල සිමාවට රු.800/= බැගින් මාස 12 ක් සඳහා රු.9600/= ක මුදලක් ලබා ගැනිම සඳහා නිර්දේශ කර අනුමතියට ඉල්ලා ඇත.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි එය ලබා දෙන්න .

**තීරණය**

**නගර සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන ලබා දීමේ අධික්ෂණය කිරීම වෙනුවෙන් එම්.ඩබ්.ආර්. දිල්රුක්ෂි මහත්මියට 2018 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා මාසිකව රු.800/= ක දිමනාවක් ගෙවීමට සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලද අතර සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.17 කසල බැහැරලීම විශේෂ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කරීම සම්බන්ධව 2018.12.26 වන දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කසල බැහැරලීම විශේෂ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම සම්බන්ධව මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර කසල බැහැරකරන ලද සේවක මහතුන්ගේ සේවා කාලය 2019 ජනමාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා දිර්ඝ කරන ලෙස ඉල්ලා සිටි.

**තීරණය**

**කසල බැහැරලීම විශේෂ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කරීම සම්බන්ධව මහජන සෞඛ්‍ය මහතා විසින් ඉදිරිපත් කරන ලද 2018.12.26 වන දිනැති ලිපිය සාකච්ඡා කිරීමෙන් අනතුරුව කසල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ සේවය කරන සේවක මහතුනගේ සේවා කාලය 2019ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා දිර්ඝ කිරීම සුදුසු බවහා ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලද අතර සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.18 විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර ඇති කාර්ය සාධනය සඳහා අවශ්‍ය2019 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලිපිය සභාග කරන ලදී .**

<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ කාර්ය සාධනය සඳහා අවශ්‍ය2019 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මන්ත්‍රිවරුන්ගේ දැන ගැනීමටසහ අනුමතිය සඳහා ඉදිරිපත් කර ඇත. මෙය නිලධාරින් විසින් සකස් කර ඇත.

**තීරණය**

**විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර ඇති කාර්ය සාධනය සඳහා අවශ්‍ය2019 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා සහා අනුමතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඒකමතිකව ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.19 2019 වර්ෂය සඳහා විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර ඇති අභ්‍යාන්තර විගණන සැලැස්ම - (අර්ධ වාර්ෂික ) සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අභ්‍යාන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද 2019 1 හා11 කාර්තුව සඳහා අදාල අභ්‍යාන්තර විගණන සැලැස්ම නිර්දේශ කර සහා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර මෙය මන්ත්‍රිවරුන්ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

**තීරණය**

**2019 වර්ෂය සඳහා අභ්‍යාන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති අභ්‍යාන්තර විගණන සැලැස්ම - (අර්ධ වාර්ෂික ) සැලැස්ම සඳහා සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.20 අංක 63/8, 4 වන පටුමඟ දළුක්කන්ද , තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ අදාල දෙපල සඳහා ඉදිරිපත් කර ඇති ඔප්පු කෙටුම්පත සහා අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් අදාළ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එච්.ඒ. ජයලත් මහතාට ලබා දි ඇති කෙටුම්පත් ඔප්පුව සහා අනුමතිය සඳහා ඉදිරිපත් කර ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි තව කිදෙනෙකුට ඔප්පු දීමට තිබේද ?

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

හතර දෙනෙකුට ඔප්පු ලබා දීමට තිබේ. දෙදෙනෙකුට ඔප්පු කෙටුම්පත් ලබා දී ඇත. තව දෙදෙනෙකුට ලබා දිමට ඇත.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේ ඔප්පු කෙටුම්පත් දෙපාරකට ලබා දී ඇත්තේ මොකද ?

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඒ අය මුදල් ගෙවන ආකාරයට තමයි ඔප්පු කෙටුම්පත් ලබා දෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , ඒ අයගේ කාලය මේ දෙසැම්බර් 31 දිනෙන් කාලය අවසන් නේද?

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔව් . මුදල් ගෙව්වේ නැතිනම් බදු ක්‍රමයකට යා යුතුයි.ඒ අය මුදල් ගෙවිය යුතුයි. කිසිම පිළිතුරක් නොදී ඔහේ ඉන්නවා.

**තීරණය**

**අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ . 4 වන පටුමග දළුක්කන්ද , අංක 63/8හි පදිංචි එච්.ඒ. ජයලත් මහතා නමින් අදාල දෙපල සදහා ඉදිරිපත් කර ඇති ඔප්පු කෙටුම්පත සහා අනුමැතියට යටත්ව අනුමත කිරීම සම්බන්ධයෙන් අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලද අතර සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03.21 මාර්ග සංවර්ධනයට අවශ්‍යා තාර මිලදී ගැනීම සඳහා තාක්ෂණ සේවා නිලධාරි මහතාගේ ඉල්ලීම පරිදි තාර බැරල් 30 ක් කලින් ටෙන්ඩරය පිරිනමා ඇති බිටුමික්ස් ආයතනයෙන් (නව මිල බැරලයක් රු.16500/=) සහා අනුමතියට යටත්ව ලබා ගැනිම වෙනුවෙන් සහා අනුමතිය ලබා ගැනීමේ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභාවේ ගබඩාවේ ඇති 80/100 තාර බැරල් මේ වන විට අවසන් වෙමින් පවතී. ඒ අනුව මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍යා 80/100 තාර බැරල් 30 ක් ඇනවුම් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව ඉහත විෂය නිලධාරි විසින් මාර්ග සංවර්ධනය කඩිනමින් සිදු කළ යුතු නිසා කලින් ටෙන්ඩරය පිරිනමා ඇති බිටුමික්ස් ආයතනයේ තාර බැරලයක වර්තමාන මිල වන රු.16500/= ක් වී ඇත.ආයතන කිහිපයකින් විමසන ලද අතර තාර මිල වැඩි වි ඇති බවත් සංස්ථාවේ තාර නොමැති බවත් වාර්තා වි ඇති බැවින් කඩිනමින් මාර්ග සංවර්ධනය සිදු කළ යුතු බවත් සහා අනුමතියට යටත්ව බිටුමික්ස් ආයතනයේන් තාර බැරල් 30 ක් ලබා ගැනිම වෙනුවෙන් සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , දැන් සංස්ථාවේ තාර නොමැතිද?

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

සංස්ථාවේ තාර නොමැත.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මෙම තාර වර්ගය බාලයි. මෙය ගැලවී යනවා වැඩි කාලයක් තිබෙන්නේ නෑ. මා දුටුවා කළුවඩුමුල්ල පාරේ තාර දැම්මට ගල් ගැලවී ගොස් ඇත.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>

බාල එකක් නෙමේ තිබෙන්නේ . එහි ඝණත්වය අඩුකමයි. ප්‍රමාණය අඩුයි. මෙය ගැටලුවක් වි තිබෙ අපේ කාර්මික නිලධාරි මහතුන්ට පාරවල් වලට අනෙක් තාර බැරලයකින් යොදන ප්‍රමාණයට වඩා මීන් යෙදිය හැකි ප්‍රමාණය අඩු වී ඇත. මට පෙනෙන ආකාරයට එවැනි තත්වයක් උදා වී ඇත.

<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මා දන්නේ නෑ මේ පිළිබඳව.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>

හැමතැනම ගැලවි ඇත. දමන ප්‍රමාණය අඩු වී ඇත. බාල එක නෙමේ තිබෙන්නේ ප්‍රමාණය අඩුකමයි.

<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැනට වැඩ නැවැත්විමට සිදුවෙනවා ජනවාරි 01 ඉදගෙන . අපි අලුතින් ගෙන්වනු ලැබුවා. එයට අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

**පිලිගත් මිල ගණන්  අනුව 80/100 තාර බැරලයක මිල රු.13750/= ක් වුවද වර්තමාන තාර මිල වැඩිවි ඇති අතර තාක්ෂණ සේවා නිලධාරි මහතාගේ ඉල්ලීම පරිදි කඩිනමින් මාර්ග සංවර්ධනය කළයුතු බැවින් හා සංස්ථාවේ තාර නොමැති බැවින් කලින් ටෙන්ඩරය පිරිනමා ඇති බිටුමික්ස් ආයතනයෙන් තාර බැරලයක් රු.16500/= බැගින් තාර බැරල් 30 ක් ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

- **පෙරවරු 10.40 ට විනාඩි 05ක කාලයක් තේ පැන් සංග්‍රහය සඳහා සභාවේ වැඩ කටයුතු නතර කරන ලදී .**
- **පෙරවරු 10.40 ට ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා සභාවෙන් පිටව යන ලදි.**

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න — නැත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා — ඇත

**05.01. සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා:-**

<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

**මෙහි ඇස්තමේන්තු කර ඇති යෝජනා මා යෝජනා කර සිටිනවා.**

**05.01.01** **අම්බලන්ගොඩ පටබැදිමුල්ල වෙරළ පිවිසුම් මාර්ගය සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී .**

05.01.02 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල වෙරළ පාර කාණු පද්ධතිය සහා අරමුදලින් සිදු කිරීමට යෝජනා කර සිටිනවා.

ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී .

05.01.03 චන්ද්‍රාවාස පාරෙන් අතුරු පාර සම්බන්ධව සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා

ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී .

05.01.04 පොල්වත්ත පෙර පාසලේ ආරක්ෂිත මායිම් තාප්පය ඉදිකිරීම සහ වැට ඉදිකිරීම කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරීමට යෝජනා කර සිටිනවා.

ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී .

05.01.05 අම්බලන්ගොඩ උස්වැල්ලවත්ත පාර , කාණු පද්ධතිය ඉදිකිරීම සම්බන්ධ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරීමට යෝජනා කර සිටිනවා.

ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදී .

05.01.06 උස්වැල්ල වත්ත පාර හරස් පායිප්ප ඇතිරීම සඳහා සහා අරමුදලින් සිදු කිරීමට යෝජනා කර සිටිනවා.

ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදී .

05.01.07 පටබැඳිමුල්ල ආදාහනාගාරයේ තින්ත ආලේප කිරිම සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.

ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී .

05.01.08 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල ළමා ක්‍රීඩාංගණය ඉදිකිරිම සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.

ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී .

ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අපි ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළහොත් ඒ සඳහා යෝජනාවකුත් ඉදිරිපත් කළ යුතුයි. එම නිසා එය

**05.01.09** **අම්බලන්ගොඩ රේණුක මොටර්ස් අසළ ළිඳ අයත් භූමිය සංවර්ධන කටයුතු සඳහා කාණුව ඉදිකිරිම සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී .**

**05.01.10** **අම්බලන්ගොඩ මහජන පුස්තකාලය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සභා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදී .**

**05.01.11** **අම්බලන්ගොඩ හිරිකැටියවත්ත පාර සංවර්ධනය කිරීම සභා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදී .**

**05.02** **හිටපු අපේ උපසභාපති මනික්කුවාඩු රත්නසිරි මහතා අභාවයට පත්වීම පිළිබඳව**

ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

හිටපු අපේ උපසභාපති මනික්කුවාඩු රත්නසිරි මහතා අභාවයට පත්වීම පිළිබඳව අම්බලන්ගොඩ නගර සභාවේ ඒ සම්බන්ධයෙන් සාතිශය සංවේගය එම මහතාගේ බිරිඳටත් දරුවන් සියලු දෙනාටත් දන්වන ලෙස අපි ඉල්ලා සිටිනවා.එතුමා අම්බලන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති වශයෙන් දිර්ඝ කාලයක් සේවය කරන ලදි. හෙට දිනයේ (2019.01.09) දින අදාහාන උත්සවය පවත්වනවා. දැනට දේහය ඔහුගේ නිවසේ තිලකපුර තැන්පත් කර තිබේනවා. ඒ සඳහා සියලු දෙනාට සහභාගිවන ලෙස දන්වා සිටිනවා.

**05.03** **හිටපු අපේ උපසභාපති මනික්කුවාඩු රත්නසිරි මහතාගේ දේහය අදාහානය කිරීම සඳහා අදාල ගාස්තුව කිරිම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කර සිටීම.**

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

හිටපු අපේ උපසභාපති මනික්කුවාඩු රත්නසිරි මහතාගේ දේහය අදාහානය කිරීම සඳහා යන මුදල ගරු සභාව මගීන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

**හිටපු අපේ උපසභාපති මනික්කුවාඩු රත්නසිරි මහතාගේ දේහය අදාහානය කිරීමඅම්බලන්ගොඩ පටබැදිමුල්ල ආදාහානාගාරයේදි ගාස්තු අයකිරීමකින් තොරව සිදු කිරිම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කර සිටි අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.04 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව**

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිවරුන් 18 දෙනෙකු විසින් අත්සන් කර යෝජනවක් ඉදිරිපත් කර තිබෙනවා . එය ඉදිරිපත් කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ට අවස්ථාව දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ වර්මතමාන නාවික හමුදාපතිවරයා ලෙස අභිනවයෙන් පත් කරන ලද අම්බලන්ගොඩින් බිහිවූ ජොෂ්ඨ ප්‍රත්‍ර රත්නායක් වූ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වූ වෛශ අද්මිරාල් කේ. ටි . පියල් හර්ශ්වන්ද්‍ර මහතාට සුභ පැතිම එතුමාගේ නිලය පිළිබඳව මේ ගරු සභාවට මා යෝජනා කර සිටිනවා. කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා අපි සියලු දෙනා දන්නා පරිදි අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඉපදි අම්බලන්ගොඩ ප්‍රදේශයේ ධර්මාශෝක විද්‍යාලයේ 1 සිට 13 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා උසස් පෙළ සමත් වී නාවික හමුදාවට ඇතුලත් වී එම නාවික හමුදාව තුල ඔහුගේ රාජකාරි වපසරිය තුල ශ්‍රී ලංකාව බේරා ගැනිම සඳහා උතුරු නැගෙනහිර යුද්ධයේදි ඉතා විශාල මෙහෙවරක් කළ අති දක්ෂ රණ ශුරයෙකි. ඔහුගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මුළු රටේම ජනාදරයට පත් වුණා. මුළු නාවික හමුදාවේ ජනාදරයට පත්වෙච්ච පුද්ගලයෙකි. එතුමා වචනයේ පරිසමාප්තියෙන්ම හමුදා නිලධාරියෙකි. රාජ්‍ය නිලධාරියෙක් වශයෙන් ඉතාමත් වැදගත් මහත්මයෙකි.එමනිසා එතුමාගේ මේ නිලය ඔහුට ලැබීම පිළිබඳව අම්බලන්ගොඩ නගරයේ ජනතාව විදියට අපි ඉතාමත් සංතෝෂ විය යුතුයි.ඔහු අම්බලන්ගොඩ නගරයට මේ ලබා දුන් ගෞරවය සම්බන්ධයෙන් ගරු නගර සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් යෝජනාවක් ඔහුට සුභ පතා ලිඛිතව යැවිය යුතු යයි යෝජනාව මා සභාවට ඉදිරිපත් කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , නාවික හමුදාවේ අද්මිරාල් ලෙස පත්වි ඇති ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමාට අපිත් සුභාශිංෂණ එක් කරන්න කැමතියි. මොකද එතුමා අම්බලන්ගොඩ නගරයට ලබා දුන්නේ ඉමහත් කීර්තියකි. අද ලංකාවේ නාවික හමුදාපති අම්බලන්ගොඩින් බිහිවිම පිළිබඳව අම්බලන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරුන් වශයෙන් අපිටත් ලොකු ආඩම්බරයකි. ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කර ආකාරයට එතුමා අද එම පුටුවේ වාඩි වි මුළු ලංකාව වෙනුවෙන්ම යම්කිසි සේවයක් කිරිම පිළිබඳව මාත් අප සියලු දෙනාමත් අප පක්ෂයේ සියලු දෙනාමත් සුභාශිංෂණ එක්කරනවා.එක් පැත්තකින් මාගේ ඥාතිවරයෙකි. එවැනි දක්ෂ කෙනෙකු එවැනි තත්වයකට පත්වීම පිළිබඳව මාගේ පෞද්ගලික හා අප පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සුභාශිංෂණ එක්කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ දේශප්‍රත්‍ර ගරු කේ.ටි පියල් මැතිදාණෝ මුළු මහත් දේශයටම වටිනා සම්පතක් බවට පත් මේ මොහොතේ සහෝදර ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා ඉදිරිපත් කර ඇති යෝජනාවට කෙරම්ණිය , පින්නදූව බල ප්‍රදේශයේ ප්‍රසාදයත් ප්‍රණාමයත් මේ අවස්ථාවේ පල කර සිටිනවා. ඒ වගේම එවැනි දේශප්‍රත්‍ර රත්නයන් කිහිප දෙනෙකුම අම්බලන්ගොඩ බල ප්‍රදේශයෙන් බිහි විම බුද්ධිමතුන්ගේ පුරවරය කලඹන අවස්ථාවකයි තව තවත් අපේ ජන සමාජයෙන් බිහි වුයේ. මේ අවස්ථාවේ අපගේ පෞද්ගලික ප්‍රණාමය පල කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මාත් ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමාට මාගේ සුභාශිංෂණ එක්කරනවා. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ මට වඩා එක වසරක් ඉහලින් තමයි එතුමා අධ්‍යාපන කටයුතු හැදැරුවේ. පාසල් යන කාලයේ ක්‍රීඩා කටයුතු වලට ඉතාමත් දක්ෂ පුද්ගලයෙකු වූ ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා ඒ දිනවල බොහෝ ක්‍රියාකාරි පුද්ගලයකු ලෙස කටයුතු කරනු ලැබුවේ .පාසලේ බොහොම ජනාදරයට පත් වෙච්ච චරිතයකි.ධර්මාශෝක විද්‍යාලයේ අදි සිසුවෙකු එතුමාට අම්බලන්ගොඩ ජනතාවගේ හා මාගේ පෞද්ගලික සුභාශිංෂණය එක් කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වත්මන් නාවික හමුදාපති ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා සම්බන්ධයෙන් ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා ඉදිරිපත් කර ඇති සම්බන්ධයෙන් අපි ඇත්තටම ස්තුතිය පුද කර සිටිනවා.අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ අදි සිසුවකු වන ඒ මහතා ඉතාමත්ම දිගු ගමනක් ගිහින් අද අපගේ ප්‍රජාතන්ත්‍රවාදි ජනරජයේ නාවික හමුදාපති වශයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරන ලදි. එම පත්කිරීම සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රිතුමන් සහ මන්ත්‍රීතුමියන් ප්‍රධාන ආමාත්‍යතුමාගේ සුභාශිංෂණ එක් කර සිටිනවා. මෙය

ඉතාමත්ම වැදගත් යෝජනවාකි.අම්බලන්ගොඩ නගරයට ඉතාමත්ම ගරුත්වයක් දෙන .අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ අදි සිසුවකු වන එතුමා අපගේ ගරු නගර සභා මන්ත්‍රිනි ලක්ෂ්මි මෙනවියට වඩා ඉහල පන්තියේ තමයි සිටියේ . මෙවැනි දුර ගමනක් ගිය එතුමාගේ ඉදිරි අනාගත බලාපොරොත්තු සහ කළයුතු සේවාවන් ඉටු කිරිම සඳහා ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි  ලලිත් ධම්මික කොඩිකාර මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , නාවික හමුදාපති ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා කුඩා කල සිටම මාගේ හොඳ මිත්‍රයකි . විනීත නිහතමානි පුද්ගලයකු ලෙස තමයි මා එතුමා ඇසුරු කරන්නේ.එතුමාට සුභ පැතිමට මාත් එකතු වෙනවා මේ අවස්ථාවේ .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඇත්තටම ස්තුති වන්ත වෙනවා මෙම යෝජනව ගෙන එම පිළිබඳව ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතාට . වැදගත් යෝජනාවකි. අම්බලන්ගොඩින් බිහි වු දක්ෂ නිලධාරියෙක් හැටියට එතුමාට සුභ පතන්න එතුමට ගෙන එනු ලබන යෝජනාව සම්බන්ධව. අම්බලන්ගොඩ කියන්නේ බුද්ධිමතුන්ගේ පුරවරයේ ඉතාමත් වැදගත් පුද්ගලයන් වැදගත් තනතුරු බිහි කරන්න දායකත්වය දුන් නගරයකි . වැදගත් පුද්ගලයන් බිහි කරන ලද පාසලක් තමයි අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය.එතුමාට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සහ අම්බලන්ගොඩ ජනතාවගේ සුභාශිංෂණ මේ අවස්ථාවේ පුද කර සිටිනවා. විශේෂයෙන්ම මතක් කළ යුතුයි අම්බලන්ගොඩ නගරයෙන් බිහි වුණා ගුවන් හමුදාපති , පොලිස්පති , හමුදාපති , නාවික හමුදාපති යන සතර දෙනාම අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙන් බිහි වු නිලධාරින්ය . මේ නිලධාරින් රටේ පවතින ආරක්ෂක අංශ හතරෙම ප්‍රධාන පුද්ගලයන් බිහිකරන ලද නගරයක් හැටියට අපි ඉතාමත් සතුටු වෙනවා .මේ තනතුර එතුමාට ලැබිම සම්බන්ධව නැවත වරක් සතුටු වෙනවා. අම්බලන්ගොඩ නගරයට අපිට අඩුපාඩුවක් තිබුණේ නාවික හමුදාපති විතරයි . අද අම්බලන්ගොඩ නගරයට ඒ වාසනව ලැබුණා.එම පුද්ගලයාත් අම්බලන්ගොඩ නගරයෙන් බිහි කරන්න. විශේෂයෙන්ම නගරයේ යම්කිසි පුද්ගලයන් ගැන කතා කලහොත් එක් එක් පුද්ගලයන් ගැන මේ සභාව වර්ණනා කළා.පහු පහු වෙන්න එම පුද්ගලයන් කරන ප්‍රකාශ හා  අම්බලන්ගොඩ නගරයට යම්කිසි තිතක් තබන්නට අම්බලන්ගොඩ නගරය සම්බන්ධව පසුගිය කාලයේ දිගින් දිගටම සිද්ධ වුණා. නාවික හමුදාපති ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා බොහොම නිහතමානි පුද්ගලයකු ලෙස මා අසා ඇත. මා ආශ්‍රය කර නැත. පහළ නිලධාරින් ප්‍රකාශ කරන ආකාරයට ඉතාමත් දක්ෂ , බුද්ධිමත් ,කාර්යශුල නිලධාරියෙකු හැටියට තමයි එතුමා හඳුන්වා දි ඇත්තේ. මා ඇත්තටම කතා බහා කල නොමැති වුවත්  එතුමාගේ ක්‍රියා කලාපය ජනතාව යම්කිසි පුද්ගලයකුගේ හොඳක් සේ නරකක් ප්‍රකාශ කරන විට නරකක් තිබේ නම් එය නොකියා සිටින්නේ නැත. එසේම හොඳක් ඇති පුද්ගලයන් ගැන තමයි නිතරම කතා වෙන්නේ. මා පසුගයි දිනක අවමංගල්‍යයකට සහාභාගි වු අවස්ථාවේ එතුමා පිළිබඳ පොඩි සාකච්ජාවක් ඇතිවු අවස්ථාවේ එතුමාගේ ගුණ වර්ණාවක් සිද්ධ වුණා. අපි සතුටු වෙනවා එවන් නාමයක් අම්බලන්ගොඩ නගරයේ මේ ස්තුති කරන , සුභාශිංෂණ ගෙන එන මේ සභාවේ එතුමාට රටට දැයට සේවය කිරීමට ශක්තිය ධෛර්ය හා වාසනාව එතුමාට ලැබේවායි සිතන අතර එතුමාට මාගේ සුභාශිංෂණය පුද කර සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ අවස්ථාවේ  නාවික හමුදාපති ධුරයට පත්වු ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා අම්බලන්ගොඩ අතිජාත ප්‍රත්‍රයකු වශයෙන් මෙම තනතුරට පත්වීම සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගර සභාවේත් , සමස්ත අම්බලන්ගොඩ ජනතාවගෙත් ප්‍රණාමය අපි පුද කළ යුතුයි. අම්බලන්ගොඩ නගරය ගත් කළ අපේ නගරය තුලින් පොලිස්පතිවරයෙක් , හමුදාපතිවරයෙක් ,ගුවන් හමුදාපතිවරයෙක් බිහි වි තිබෙනවා. අපිට එකම අඩුවකට තිබුණේ නාවික හමුදාපතිවරයෙකු බිහිවිම පමණයි. නමුත් මේ වසරේ ජනවාරි 01 වන විට අම්බලන්ගොඩ නගරයට ඒ භාග්‍ය ලැබුණා. සමස්තයක් ලෙස සාඩම්බර නගරයක ඉපිදුනු සාඩම්බර නගරයකින් බිහිවුණු පුද්ගලයන් මේ ලංකාව තුල සුවිශාල සේවාවන් රාශියක් ඉටු කිරීමට හැකි පුද්ගලයන් බවට පත් වි ඇත. එම නිසා  ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා මට මතකයි මා කුඩා කාලයේ අම්බල්නගොඩ ධර්මාශෝක විද්‍යාලයේ පැසි පන්දු ක්‍රීඩාව කරනු ලැබුවා. ඒ අවධියේ සිටි ජ්‍යොෂ්ඨ කණ්ඩායමේ සිටි පුද්ගලයකු තමයි එතුමා. අපි එකට ඒ දිනවල සෙල්ලම් කරනු ලැබුවා.අප සමඟ බොහොම ලෙන්ගතු මිත්‍රයකු ලෙස කටයුතු කරනු ලැබුවා.එතුමාගේ අම්මා , තාත්තා , නැගණිය මුළු පවුලේ උදව්ය බොහොම සමිපව කටයුතු කරයි.කෙසේවෙතත් නාවික හමුදාවේ ප්‍රධාන ධුරයට පත්වීම සම්බන්ධයෙන් අපගේ විශේෂ ස්තුතිය පුද කර සිටිනවා. මට මතකයි අපේ බෝට්ටු වලින් ගිය පිරිස් මුහුද මැද අතරමං වුණාම අපිට මතක් වෙන්නේ  ගරු කේ.ටි පියල් හර්ශ්වන්ද්‍ර මැතිතුමා. අපි නිතරම එතුමාට දුරකථනයෙන් කතා කර කියා සිටිනවා අපේ අම්බලන්ගොඩ නගරයේ මහ මුහුදේ හැතැම්ප 4ක් 5 ක් දුර බෝට්ටුව කැඩිලා අතරමං වී සිටිනවා. එම නිසා මොවුන් පුළුවන් කමක් තිබෙනවාද මේ අය ගොඩබිමට ගෙන දිමට . එතුමා ඒ කාලයේ නාවික හමුදාපති නොවුවත් එතුමාගේ නිලය අනුව වහාම ක්‍රියාත්මක වි අපේ ධිවර ජනතාව වෙනුවෙන් නොපිරිහෙලා ඉටු කර ඇත. එතුමා යහපත්  තනතුරට පත් විම සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. එතුමාගේ ක්ෂේත්‍රය තුල මේ රටට කරනු ලබන සේවාවන් තුල විශිෂ්ඨ සේවාවක් කිරීමට එතුමාට හැකියාව ඇති

බව දන්නවා. අපි දන්නවා නාවික හමුදාවේ කිමිදුම් ශුරයන් අතර ඉතාමත් අති දක්ෂ කිමිදුම් ශුරයෙක් තමයි එතුමා.නාවික හමුදාවේ මගේ විශාල මිත්‍රයන් පිරිසක් සිටිනවා. ඒ පිරිස අතර අසන පුද්ගලයෙක් තමයි අම්බලන්ගොඩ ගරු කේ.ටි පියල් හර්ශ්චන්ද්‍ර මැතිතුමා අඳුරනවාද කියා තමයි මිට වසර 10 කට 15කට පමණ ඉහතදී ඇසුවේ.කිමිදුම් ශුරයෙක් අද නාවික හමුදාවේ එවැනි තත්වයට පත් වෙලා වැඩ කිරිම සම්බන්ධයෙන් අම්බලන්ගොඩ පුතුයකු වශයෙනුත් අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ ඉගෙනුම ලැබු ආදි ශිෂ්‍යයකු වශයෙනුත් මා එතුමාට අපගේ අවංක ආදර සුභාශිංෂණය පුද කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , නාවික හමුදාපති වශයෙන් අභිනවයෙන් පත් වූ කේ.ටි පියල් හර්ශ්චන්ද්‍ර මැතිතුමාගේ උසස් වීමේ යෝජනාවට සුභ පැතිම සම්බන්ධයෙන් ගරු සභාවේ සියළුම මන්ත්‍රිතුමන්ලා මන්ත්‍රිතුමියන්ලා අදහස් ප්‍රකාශ කරනු ලැබුවා. ඒ සියළු දෙනාටම මාගේ ගෞරව ස්තුතිය පුද කර සිටිනවා. ඒ සියළු දෙනාගේන් කියවුණු ගම්‍ය වුණු එක අදහසක් වුණේ මෙම නිලධාරියා ඉතාමත් අවංක රටට වෙනුවෙන් කැපවු ශ්‍රේෂ්ඨ නිලධාරියෙක් වීමයි. තවදුරටත් එතුමාගේ සේවය රටට අවශ්‍ය සේවය ලැබේවායි කියා ප්‍රාර්ථනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනි මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , අභිනව නාවික හමුදාපති වශයෙන් පිදුම් ලැබු කේ.ටි පියල් හර්ශ්චන්ද්‍ර මැතිතුමාට මේ අවස්ථාවේ මාගේ පෞද්ගලික සුභාශිංෂණය පුද කර සිටින අතර මාගේ පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණේ සුභාශිංෂණය ද පුද කර සිටින අතර අම්බලන්ගොඩ බුද්ධිමතුන්ගේ පුරවරය කියා නම් කරනු ලබයි . ඒ බුද්ධිමතුන්ගේ පුරවරයට හැමදාමත් බුද්ධිමතුන් ශ්‍රේෂ්ඨයන් එකතු වෙනවා . ඒ ඒ බුද්ධිමතුන්ගේ පුරවරයෙන් බිහිවු එතුමාට මාගේ අවංක ආදර සුභාශිංෂණය පුද කර සිටිනවා.

**තීරණය**

**ගරු නගර සභා මන්ත්‍රිවරුන් 18 කු විසින් අත්සන් සහිතව ඉදිරිපත් කර තිබු අභිනවයෙන් පත් වු ගරු නාවික හමුදාපති කේ.ටී. පියල් හර්ස්චන්ද්‍ර මහතාට සුභාශිංෂණය පුද කිරීමේ යෝජනාවට ගරු සභාවේ මන්ත්‍රීවරුන් විසින් සුභාශිංෂණය පුදකර සිටි අතර නාවික හමුදාපති ලෙස පත්විම සම්බන්ධයෙන් ගරු සභාවේ සුභාශිංෂණ පුදකර ලිපියක් එතුමාට ප්‍රසංශා ලිපියක් යවන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**06.01 2018.12.24 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2018.12.24 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා

<u>ක්‍රීඩා කමිටු වාර්තාව</u>
<u>**2018.12.24**</u>

**සහභාගිත්වය-**

| | | |
|---|---|---|
| ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා | - | ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව. |
| ධම්මික කොඩිකාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.ඉනෝකා ක්‍රිෂානති මිය | - | ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඒ.එම්.ඩී.එම්.ටී.බී.අබේරත්න මයා | - | ස.අ.අ.(ක්‍රීඩා),කලාප අධ්‍යාපන කාර්යාලය,අම්බලන්ගොඩ. |

කේ.ඒ.ඩී.ඩී.කහදවල මිය - ගා/ප්‍රජාපතීගෝතමී බා.වි.,අම්බලන්ගොඩ.

එස්.ඩබ්ලිව්.මහේන්ද්‍ර ගුණරත්න මයා- ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.

එස්.කේ.පත්මසිරි මහතා - ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.

මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා - ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ.

සඳුන් ගුණවර්ධන මහතා - තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.

එච්.පී.මිහිරි ද සිල්වා මිය - ප්‍රධාන කළමනාකරණ සහකාර,අම්බලන්ගොඩ නගර සභාව.

ජී.අශෝක කුමාර මහතා - ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.

ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - දකුණු පළාත් පා පන්දු පුහුණුකරු.

ඒ.ඩබ්ලිව්.හිමාල් ගුණවර්න මහතා - වැඩ පරිපාලක,අම්බලන්ගොඩ නගර සභාව.

ඩී.වි.තරංගි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.

**පිළිගැනීම.-ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අද දින උත්සව කිහිපයකට සහභාගි වීමට සිදුවූ බැවින් ප්‍රමාදව ක්‍රීඩා කමිටුව ආරම්භ කිරීමට සිදුවීම ගැන කණගාටුවන බව දන්වමින් ක්‍රීඩා කමිටුවට පැමිණි සියළුම මහත්ම,මහත්මීන්, පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

<u>පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය</u>

**වයස අවු.16න් පහළ පා පන්දු තරගාවලිය සංවිධාන කිරීම.**
**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා,දකුණු පළාත් පාපන්දු පුහුණුකරු.**
මෙම තරගාවලිය 2018.12.03,04,06 දිනයන්හි අම්බලන්ගොඩ කලාපයට අයත් පාසල් කණ්ඩායම් 16ක සහභාගිත්වයෙන් (බාලක කණ්ඩායම් 13,බාලිකා කණ්ඩායම් 03) ප්‍රජාපතීගෝතමී බාලිකා විද්‍යාල ක්‍රීඩාංගණයේ සාර්ථකව පවත්වනු ලැබුවා. නගර සභා පාපන්දු සංචිතයට ක්‍රීඩකයන් 234කු ගෙන් පළමු වටයෙන් ක්‍රීඩකයන් 54 තෝරාගෙන දෙවන වටයේදී 25දෙනෙකු තෝරාගනු ලැබුවා. ක්‍රීඩිකාවන් 15කුත් අමතර ක්‍රීඩිකාවන් 03කුත් සංචිතයට තෝරාගනු ලැබුවා.(අදාල නාම ලේඛනය ඉදිරිපත් කරන ලදි.)

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මෙම සංචිතයට ධර්මාශෝක විද්‍යාලයේ ළමයි නැත්ද?

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය - පාපන්දු පුහුණුකරු,අම්බලන්ගොඩ නගර සභාව.**
ධර්මාශෝක විද්‍යාලයේ පාපන්දු කණ්ඩායමක් නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ධර්මාශෝක විද්‍යාලයේ කණ්ඩායමක් නැත්නම් මෙම තරගාවලියේ දක්ෂ ළමයි කිහිපදෙනෙකු හරි අරගෙන කණ්ඩායමක් හදනවනම් හොඳයි.මෙවැනි තරගාවලියකින් අපි අපේක්ෂා කරන්නෙත් ඒකයි. දක්ෂ ළමයින්ට අවස්ථාවන් සලසා දීම.

අපි මේ සංචිතයට තෝරාගන්න ළමයින්ට සියළුම පහසුකම් ලබාදෙමින් නොමිලේ පුහුණුවීම් කරනවා. පුහුණු කටයුතුවලට අවශ්‍ය දේවල්වලට අදාළව ඇස්තමේන්තුවක් හදල මේ සභාවට ඉදිරිපත් කරන්න. ක්‍රීඩා අමාත්‍යාංශයෙනුත් මොනවහරි ලැබෙනවද?

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය - පාපන්දු පුහුණුකරු,අම්බලන්ගොඩ නගර සභාව.**
රු.3500.00 ක පෝෂණ දීමනාවක් ලැබෙනවා.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**

ධර්මාශෝක විද්‍යාලයේ පාපන්දු කාන්තා කණ්ඩායමක් අපි හැදුවා. නමුත් මෙම තරගාවලියට ඉදිරිපත් වුනේ නැහැ.ඒ කණ්ඩාමේ දක්ෂ ළමයි ටිකත් අපි සංචිතයට ගන්න ද?

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ගන්න. අපි ගමේ ළමයින්ට අවස්ථාව ලබාදිය යුතුයි.

- ❖ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට සෑදීමට අවශ්‍ය බඩු ඇණවුම් කර දීම.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
කොහොමද දැන් වැඩ කටයුතු? තාම වැඩ ඉවර නැද්ද?

**ඒ.ඩබ්ලිව්.හිමාල් ගුණවර්න මහතා,අම්බලන්ගොඩ නගර සභාව.**
වැඩ පටන් ගත්තා තාම ඉවර කර ගන්න බැරි වුණා. මානාන ක්‍රීඩාංගණයේ වැඩත් කරන නිසා.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
එක වැඩක් අවසන් කරල ඉන්න. මේ සතිය ඇතුළත වැඩ ටික අවසන් කරන්න.

**ධම්මික කොඩිකාර මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමනි,කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ දුර පනින වළක් හදල දෙන්න කියල මීට කළිනුත් ඉල්ලීම් කරා ඒ වැඩය කෙරුනේ නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
පොල්වත්ත ක්‍රීඩාංගණයේ වගේ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේත් දුර පනින වළ හදල දෙන්න.

- ❖ මාදම්පාගහපිහිනුම්තටාකයේප්රතිසංස්කරණකටයුතුපිළිබඳ

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි වැඩේ කරන්න ලැහැස්තියි. ඔබතුමාලාගේ ප්‍රමාදය තමයි තියෙන්නේ හොඳ කොන්ත්‍රාත් කරුවෙක් අපට හොයල දෙන්න.

**එස්.කේ.පත්මසිරි මහතා,ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.**
අපි එක්නෙකුට කථාකරල එක්කරගෙන ආවා.කොන්ත්‍රාත් එක සමිතියක් හරහා කරල සමිතියට 5% තියාගන්න දෙනකොට වැඩේ කරන්න අමාරුයි කියලා කියනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
සමිතියක් හරහා ලියාපදිංචි වෙලා කරන එක තමයි සාමාන්‍ය ක්‍රමවේදය.එතුමා රජයේ කොන්ත්‍රාත් කරුවෙක් විදියට ලියාපදිංචි වෙලා නම් ටෙන්ඩර් කරන්න පුළුවන්. රජයේ Rates වලට තමයි ඇස්තමේන්තු හදල තියෙන්නේ. රජයේ කොන්ත්‍රාත් එකක් කරල ලබන්න පුළුවන් ලාභය ගන්න පුළුවන්.

**එස්.කේ.පත්මසිරි මහතා,ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.**
අපි වෙන කෙනෙක් බලන්නම්.

- ❖ මහජන ක්‍රීඩාංගණයේ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරිමට හා තණකොළ සිටුවීමට අදළ ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා ගැනීම.

**සඳුන්ගුණවර්ධනමහතා-තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.**
මම ජිනසේන එකත් එක්ක කථා කළා මේ දවස් තුන Christmas වලට නිවාඩු බවත් බ්‍රහස්පතින්දා හෝ සිකුරාදා අවශ්‍ය බඩු ගෙනත් වැඩ ආරම්භ කරන බව දැන්වුවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
Cricket Board එකට Mail එක යවන්න. මේ පිළිබඳව කමල් ධර්මසිරි මහතා දැනුවත් කරන්න.

- ❖ **මානාන ක්‍රීඩාංගණය ශුද්ධ පවිත්‍ර කිරීම.**

**හිමාල් ගුණවර්න මහතා- වැඩ පරිපාලක,අම්බලන්ගොඩ නගර සභාව.**
වැඩ කරගෙන යනවා. J C B එකෙන් ශුද්ධ කරන්න අමාරුයි. Motorcade එකක් තියෙනවා නම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
බද්දේගම ප්‍රාදේශිය සභාවේ තියෙනවා කථා කරල ගෙවීම් පදනම මත ගන්න. Tap එකත් දාල දෙන්න.

**එස්.ඩබ්ලිව්.මහේන්ද්‍ර ගුණරත්න මයා -ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.**
මානාන ක්‍රීඩාංගණයේ Toilet පහසුකම් හදලා දෙන්න පුළුවන්නම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ප්‍රජාශාලාව ඇතුලේ තියෙනවා.ගිය මස ක්‍රීඩා කමිටුවේ දී දැනුවත් කළ පරිදි ප්‍රජා ශාලාවේ යතුර තියෙන්නේ පනියන්දූව පූජා මණ්ඩලයේ නිලධාරි මහතුන් ළඟ Ground එක බුක්කළහම Recite එක පෙන්වල ඒ මහත්වරු දැනුවත් කරන්න . ඒ අය ඇවිත් ප්‍රජා ශාලොවේ දොර ඇරල දේවි.

- ❖ **ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයට අයත් තෙමහල් ගොඩනැඟිල්ල පැවති භූමිය ශුද්ධ පවිත්‍ර කිරීම.**

**කේ.ඒ.ඩී.ඩී.කහදවල මිය,ගා/ප්‍රජාපතීගෝතමී බා.වි.,අම්බලන්ගොඩ.**
ඒ වැඩය කළ බව විදුහල්පතිනිය පැවසුවා.

**හිමාල් ගුණවර්න මහතා- වැඩ පරිපාලක,අම්බලන්ගොඩ නගර සභාව.**
විලේගොඩ ඇළයි, පිට්ටනයේ වැසිකිළි පද්ධතිය පිටුපස කොටස ශුද්ධ කරන්න තියෙනවා. ඒ වැඩ ටික කරල දෙන්නම්.

- ❖ **පොල්වත්ත ක්‍රීඩාංගණයේ වොලිබෝල් පිටියක් සකස් කිරීම.**

**එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
වැඩේනම් කෙරුනේ නැහැ සභාපතිතුමනි, මේ දවස්වල JCB එකේ වැඩ ගොඩක් කෙරෙන නිසා මම කරදර කළෙත් නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මේ වෙලාවේ බැම්ම හදන එක නම් කරන්න අමාරුයි. ඒ ටික පසුව කරනකම් පස් දාල තුනි කරලා සාමාන්‍ය විදියට Code එක හදල දෙන්න.

- ❖ පැවිලියන් එකේ කාමර Wiring කිරීම.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
බඩු ඔක්කොම ගෙනැල්ල තියෙන්නේ.ඒ වැඩය අවසන් කරන්න.

- ❖ **මාදම්පා ගඟේ බෝවී ඇති බෙල්ලන් ඉවත් කිරීම පිළිබඳව රුහුණු සංචාරක කාර්යාංශය දැනුවත් කිරීම.**

**ඩී.වී.තරංගි මිය , ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
ලිපියකින් දැනුවත් කරන ලද බව.

**එස්.කේ.පත්මසිරි මහතා, ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**
ඉදිරි සතිය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඇළවල් ශුද්ධ කරන්න පටන් ගන්නවා. මේ පිළිබඳව වාරිමාර්ගයත් දැනුවත් කරනවනම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අදාළ දැනුවත් කිරීම කරන්න.

<u>අදහස් හා යෝජනා</u>

**කසුන් ගාල්ලගේ මහතා , ක්‍රීඩා නිලධාරි, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ.**

හල්වතුර ඇවිදින මංතීරුව ප්‍රධාන පාරේ සිට 15m විතර අතහැරල තමයි පටන් අරන් තියෙන්නේ ඒ ටිකත් හදාගන්න පුළුවන්නම් හොඳයි. ඇවිදින මං තීරුව ගොඩක් අය භාවිතට ගන්නේ උදේ පාන්දරම නිසා ඒ දිගට Light පේළියක් දාල දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ඇස්තමේන්තුවක් හදල සභාවට ඉදිරිපත් කරන්න.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
මානාන ක්‍රීඩාංගණය දැන් ගොඩක් දුරට ශුද්ධ කරල ඉවරයි. පස් දාල තුනි කරල පස් පිඩලි අල්ල ගන්න පුළුවන්නම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
වාර දෙකකට කරන්න පුළුවන් විදියට ඇස්තමේන්තු දෙකක් හදල දෙන්න.

**එස්.ඩබ්ලිව්.මහේන්ද්‍ර ගුණරත්න මයා -ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.**
මානාන ක්‍රීඩාංගණය හදන එක ගොඩක් හොඳයි මම හිතන්නේ මීටර් 400 ට්‍රැක්එකකටත් යන්න පුළුවන් වෙයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ප්‍රධාන ක්‍රීඩාංගණයේත් හරක්ට ඇතුළු වෙන්න බැරිවෙන්න Green Net ගහන්න.

**එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
පොල්වත්තේ Foot ball සෙල්ලම් කරන දරුවෝ පුළුවන්නම් බෝලයක් දෙන්න කියල ඉල්ලුවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපේ Football Federation එකෙන් දෙන්නම්.ඉදිරියේ දී අපි සංවිධානය කරන Tournament එකට සහභාගි වෙන්න කියන්න. සහභාගිත්වය වෙනුවෙන් ball 05 දෙනවා.

ස්තුති කථාව
**ස්තුති කථාව-ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා,**
අපි හැමදාම මතක් කරන දෙයක් තමයි මේ කමිටුවට පාසල් සහභාගිත්වය මදි බව. පාසල් වලින් Ground එක හදන්න අපිට Pressure කරනවා. ඒ වුනාට කමිටුවලට සහභාගිවන්නේ නැහැ.මම හිතන්නේ පාසල් වලින් එනවනම් තීරණ ගන්න පහසුයි. කෙසේ වෙතත්අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගී වූ ගරු සභාපතිතුමා ඇතුළු සියළුම නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාටත්, විශේෂයෙන්ම පාසල් නියෝජනය කරමින් පැමිණි ආචර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ,ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි සියළුම මහත්වරුන්ටත් නිලධාරි සියළු දෙනාටත් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් දක්වන කැපවීම වෙනුවෙන් ස්තුතිය පුද කර සිටිමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදි.

සකස් කළේ,

.........................................
ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

.........................................
ලේකම්,
නගර සභාව- අම්බලන්ගොඩ.

.........................................
සභාපති,
නගර සභාව-අම්බලන්ගොඩ.

**තීරණය -**

**2018.12.24දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**06.02 2018.12.27 දින පැවති ත්‍රීරෝද රථ කමිටු වාර්තාව සහා ගත කිරිම.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2018.12.27 දින පැවති ත්‍රීරෝද රථ කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා

ත්‍රිරෝද රථ කමිටු රැස්වීම

2018.**12.27** දින පෙ.ව. 10.30

සහභාගීත්වය

1. කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ඩෙනට් පතියන්දුවගේ මයා - ගරුනගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
3. ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. නන්දන රාජපක්ෂ මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
5. දිනයාදුර ධර්මදාස මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
6. එම්. අතුල ප්‍රියන්ත මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
7. කේ. ශ්‍රේෂන් මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
8. එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
9. බි.ඒ. ධම්මිකා මිය - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
10. එස්.යූ.එස්.ද සිල්වා මිය - කළමනාකරණ සහකාර
11. අචිරා රංජනි ලොකුගේ මිය - කළමනාකරණ සහකාර
12. කේ.පියරත්න මයා - ආදායම් පරීක්ෂක

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

ත්‍රිරෝද රථ කමිටුරැස්වීම සඳහා සහභාගි වීමට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන් හා, ලේකම් තුමිය, ඇතුළු නිලධාරීන් සියළු දෙනාම ඉතාමත් ගෞරයෙන් පිළි ගන්නා බව ප්‍රකාශ කරමින් ත්‍රිරෝද රථ කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදී.

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන නගර සභාව සතු ඉඩම් බැවින් එම නැවතුම් ස්ථානවල ස්ටිකර් නොමැති ත්‍රීරෝද රථ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂකවරුන් පැමිණිලි දැමීමට කටයුතු කල යුතුයි.

**සෝභිත මයා - ගරු නගර සභා මන්ත්‍රී,**
**රථවාහන අංශයේ ස්ථානාධිපතිතුමන් නිසි අවසරයක් ලබා දුන්නා නම් එය ඉටු කර දෙන බව පැවසුවා.**

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

උසස් නිලධාරීන් එසේ පැවසුවාට ඔවුන්ට වැඩ අධික බැවින් ඒවා සිදු කිරීම ප්‍රමාද වෙනවා.මේ ප්‍රශ්නය අනිවාර්යයෙන් විසඳිය යුතුයි.

මෙම අවස්ථාවේ ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මයා සභාවට පැමිණි අතර උප සභාපතිතුමා විසින් ඔහු පිළිගන්නා ලදී.

<u>ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>
අම්බලන්ගොඩ ප්‍රදේශයේ පවතින වාහන තදබදය නිසා වාහනයක් නතර කිරීමට තැනක් නොමැති බැවින් මම එය සංවර්ධන කමිටුවේදී ඉදිරිපත් කලත් යම් කොටසක් නිසා තීරණයක් ගැනීමට නොහැකි වුනා.මම කීවා අනිවාර්යයෙන් තීන්දුවක් ගන්න කියා.වෙනත් ප්‍රදේශවල පුද්ගලයින් නිසා අම්බලන්ගොඩ ප්‍රදේශයේ මිනිස්සුන්ට කරදරයි.මම අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්ට පැවසුවා මේ ගැන තීන්දුවක් ගන්න රථ වාහන
පාලනයක් කරන්න කියා.උදේ 7.00 - ෆ 7.00 දක්වා ලොකු ලොරි නැවැත්වීම තහනම් කලා.අතේ.තියාගෙන මාළු විකුනන්න බැහැ.ලොකු ලොරි තියාගෙන මාළු විකුණනවා.එහෙම තත්වයක් තමයි තියෙන්නෙ.ප්‍රධාන නගර කීපයකම උදේ ලොකු ලොරි වැනි වාහන නතර කිරීම තහනම් කරල තියෙන්නෙ.සතියක් දඩ ගැහුවනම් නිවැරදි කරන්න පුළුවන්.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

මෙම තීරණ ක්‍රියාත්මක වන්නේ නැතිනම් මම මෙම කමිටුවට සහභාගි වන්නේ නැහැ.මෙම තීරන ජනවාරි 01 සිට ක්‍රියාත්මක විය යුතුයි.
මන්ත්‍රීවරුන්ට ත්‍රීවිල් බලපත්‍ර ගන්න දෙන්න බැහැ.ත්‍රීවිල් අයදුම් පත් ගන්න අපි ගාවට එවන්න එපා.
එම අවස්ථාවේ තාක්ෂන නිලධාරි සඳුන් ගුණවර්ධන මයා සභාවට පැමිනියේය.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

අපිට බෝඩ්වල ත්‍රීරෝද රථවල නොම්මර ගහන්න බැරිද එය වෙනත් අයටත් දැනගන්න.

<u>ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>
එවිට පිට අය හඳුනා ගැනීමට පුළුවන්.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

මේ වන තුරු වැට ගහල නැහැ.මට තිබෙන ගැටළුව තාක්ෂන නිලධාරි හරහා මෙම ලිපි නොයන එක.මේ පිළිබඳව තාක්ෂන නිලධාරි දැනුවත් විය යුතුයි.

<u>තාක්ෂන නිලධාරි සඳුන් මයා</u>

මම මේ සතියේ එය සිදු කරන්නම්.

<u>සරත්චන්ද්‍ර මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>

වැට ගහන කොට ගැටළු එනවා.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

බෝඩ්වල සලකුණු කිරීම ඉක්මනින් කරන්න.නොම්මර ගහන්න එය ඉතා හොඳයි.

<u>ආදායම් පරීක්ෂක පියරත්න මයා</u>

බෝඩ්වල රථ ගාලේ නම දාන්න එපා කියමු.

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

**අපේ නගරයේ මෙය ක්‍රියාත්මක වෙන්න ඕන.**

**ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**ලේකම තුමිය උප සභාපතිතුමන් ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් පැවති කමිටුව විසින් ගන්නා ලද අවසාන තීන්දු, මේක ඩෙනට්ගේ වැඩක් සෝභිතගේ වැඩක් කියා නොසිතා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර ප්‍රාදේශිය ලේකම්, ප්‍රධාන අමාත්‍යවරයා හා පොලිසිය වෙත ද යැවිය යුතුයි.**

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

**මෙතන තෝරණ සුදුසුකම්ලාභි අයට සතියකින් පසු දන්වා යැවිය යුතුයි.**

**එම්.අතුල ප්‍රියන්ත මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**රන්දොඹේ, බලපිටිය මායිම්වල සිටින අයට අසාධාරණයක් නොවන විධියටත් අපේ නගර සභාවේ නීති ක්‍රියාත්ක කල යුතුයි.**

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

වාර්ෂිකව මුදල් ගෙවා ඇති, ලියා පදිංචි වී ඇති ඔබ තුමා කිවූ ආකාරයේ සියළු දෙනාට අපි ලියාපදිංචිය දුන්නා. ඒ ගොල්ලන් ගන්නේ නැත්නම් අපි රාජකාරි කරලා පොලිසිය සමඟ මෙය ක්‍රියාත්මක කල යුතුයි.

**ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**අපිට ත්‍රිරෝද රථ 05 ක් නවතා තබන තැනකට ත්‍රිරෝද රථ 08 ක් සඳහා ඉඩ ලබා දිය හැකිය.**

එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී

උප සභාපතිතුමා මෙය අවසාන කමිටුව ලෙස කීවත් මෙය කෙසේ හෝ ක්‍රියාත්මක කල යුතුයි

**ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**මෙය හරියාකාරව ක්‍රියාත්මක නොවීම නිසා විශාල මුදලක් අහිමි වෙලා තියෙනවා.**

එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී

මේ හේතුවෙන් අපට වාහනක් නවතලා තියන්න විධියක් නැහැ. මම බයිසිකලය නතර කරලා තිබුනාම ඒකත් පෙරල ගිහින් තිබුනා.

**ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**පාර පුරාම වාහන නවතා තැබීම නිසා වාහන හිරවීමේන් හිටපු නගරාධිපති තුමාටත් වාහනය ගන්න බැරිව හිටියා. පසුව මම HQY ට කෝල් කරලා ගෙන්නගෙන එම වාහන ලියාගෙන ගියා. අපට නීතිය ක්‍රියාත්මක කරන්න බෑ කියලා මම පොලිසියට කීව්වා.**

ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා- ගරු නගර සභා මන්ත්‍රී

ත්‍රිරෝද රථ නවතන තැන් වල බෝඩ් එකක් ගහලා වැඩක් නැහැ. සීමාවන් සලකුණු කර පෙන්වන්න ඕන.

**ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**කොටුවත් හොඳයි කඩවල් ඉස්සරහ ගහන්න එපා**

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

**බස්නැවතුම්පොල ඉදිරිපිට ත්‍රිරෝද නැවතුම්පොලෙහි වැටක් ඉදි කිරීමට යෝජනා වුවද එය මෙතෙක් ක්‍රියාත්මක කෙරිලා නැහැ.**

ඩබ්.එම්. නිලානි මෙනවිය - ගරු නගර සභා මන්ත්‍රීණි

බස්නැවතුම ඉදිරිපිට පලතුරු විකිණීමේ මධ්‍යස්ථානයක් සකස් කිරීමට යෝජනා කරනවා.

**ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**ඒ සඳහා කලින් රිගල් හෝල් එක තිබුන තැනට එහා පැත්තේ තිබෙන තීරුව හොඳයි**

**කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති**

**අපි දැනට මේ ටික ක්‍රියාත්මක කරමු. කමිටුවට ලැබී ඇති ලිපි සම්බන්ධව සලකා බලමු**

| අනු අංකය | නම | ලිපිනය | තීරණය |
|---|---|---|---|
| **01** | ජී.ඩබ්. ලලිත් බන්දුල මයා | **224/1**ඒ රෝහල පාර, පොල්වත්ත අම්බලන්ගොඩ | නව අයදුම්පතක් ඉදිරිපත් කර ලබා ගන්නා ලෙස දැනුම් දීමට |
| **02** | සභාපති | ත්‍රිරෝද රථ ගාල මහජන බැංකුව අසල, මහ වීදිය, අම්බලන්ගොඩ | හය දෙනාටම නව අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලෙස |
| **03** | බී.ඩී.ජේ. ද සිල්වා බෝදාහන්දි මයා | කුරුදුවත්ත පාර, අඳාදොල, වතුගෙදර | දිය නොහැකි බවට දැනුම් දෙන්න |
| **04** | එල්.එච්. චමින්ද සම්පත් මයා | නො:**4/15**, පාළුවත්ත, පෝරඹ, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **05** | ජී. සුසන්ත ප්‍රියදර්ශන මයා කේ. නිලන්ත කුමාර මයා | වටරවුම් පාර, පින්නදූව. අම්බලන්ගොඩ | |
| **06** | ඩබ්.ඒ. සුරංග දිනේෂ් වීරකෝන් මයා | **133/**ඒ **1**, පොල්වත්ත පාර, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **07** | කේ.ඒ. රංජිත් පුෂ්ප කුමාර මයා | **9/313**. විද්‍යාල මාවත, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| 08 | එම්.ඩබ්. මාලිත ගිහාන් මයා | නො:**04**, හීගලදූව පාර, විලේගොඩ අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **09** | කේ.ඩබ්. කපිල මයා | **144/1**සි, පෝරඹ, අම්බලන්ගොඩ | සභා තීරණයක් මගින් වෙනස් කරන්න |
| **10** | එන් . කරුණාදාස මයා | නො: **143**, හම්බුවත්ත, කුලීගොඩ, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **11** | නම සඳහන් නොවේ | **80/53**, හල්වතුර, විලේගොඩ, අම්බලන්ගොඩ | (ලිපිනය වෙනස් විම දැනුම් දීම නමක් සඳහන් කර නොමැති බැවින් දැනුම් දීමට නොහැක. |
| **12** | එස්.එච්. චින්තක ශ්‍රිමාල් ද සිල්වා මයා | ශ්‍රීලාල්, මාදම්පාගම, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **13** | එස්.එච්.ජේ.පී. ද සනිල්වා මයා | විජයමාලි, සුදුවැලිකඩ පාර, මාදම්පේ, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **14** | එම්. ලසන්ත ජයලාල් පෙරේරා මයා | මැදගොඩ පාර, රන්දොඹේ. අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **15** | එම්.එච්. සුජිත් නිශාන්ත මයා | නො:**100**,ගොඩහේන, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **16** | වික්‍රමසූමල් ද සිල්වා මයා | අදුරන්ගොඩ, කුලීගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |

| | | | |
|---|---|---|---|
| 17 | ඒ. සමන්ත මයා | 293/ඒ, මහරුප්ප, කුලීගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 18 | පී.එම්. රංජිත් ද සිල්වා මයා | මාදම්පේ, දේවගොඩ. අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 19 | ඒ.එච්. සුදත් ප්‍රියන්ත කුමාර මයා | නො:19/100, තිලකපුර. අම්බලන්ගොඩ | |
| 20 | සභාපති | අම්බලන්ගොඩ මාර්කට් (පොදු වෙළඳ පොළ අසල) | සියල්ලන්ටම අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන්න. |
| 21 | ප්‍රේමලාල් වරුෂවිතාන මයා | නො:15/7 , ග්‍රාමීණිය විදුහල් මාවත, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 22 | පී.එච්.කේ. ප්‍රීති විරාජ් ද සිල්වා මයා | 48, තුඩුවමුල්ල, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 23 | කේ. කමල් ප්‍රසන්න ද සිල්වා මයා | 55/11, දෙල්දූව පාර,අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 24 | අගම්පොඩි දයානන්ද මයා | නො:01, රොටරි නිවාස, ගලගොඩ, කුලීගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 25 | කේ. නලින් අජිත් කුමාර ද සිල්වා මයා | නො:55/1ඒ, කරෝලිස් වෙද මාවත, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 26 | එච්. ප්‍රසාද් විජේරත්න මයා | ගොඩහේන, අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 27 | එල්.එච්. රත්නසිරි ද සිල්වා මයා | 437, ගැලවීමේ හමුදා නිවාස, ගලගොඩ, කුලීගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 28 | සනත් පෙරේරා මයා | 456/ඒ, ගාලු පාර, පටබැඳිමුල්ල, අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 29 | සභාපති | අම්බලන්ගොඩ මාර්කට් (පොදු වෙළඳ පොළ අසල දකුණ ත්‍රිරෝද රථ සංගමය) | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 30 | සභාපති | එස්.එම්.එස්. ප්‍රියනන්ද, දොලොස්මහේ සේල් පොළ අසල | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| 31 | බී.ඩබ්. සිරිපාල මයා | 16, පෝරඹ, අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කර |
| 32 | සභාපති | සමුපකාර මන්දිරය අසල ත්‍රිවීල් සංගමය | අයදුම්පත් ඉදිරිපත් කර |
| 33 | | පුංචිපොල අසල ත්‍රිවීල් සංගමය | අයදුම්පත් ඉදිරිපත් කර |
| 34 | | මහ වීදිය ත්‍රිරෝද රථ ඉවත් කිරීම | අයදුම්පත් ඉදිරිපත් කරන්න |

<u>එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>

ත්‍රිරෝද රථ ගාල්වල අයිතිකරුවන් සිටිනවා

**<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>**

**අපේ අවසරයක් නැතිව ත්‍රිරෝද රථ නතර කරන්න දෙන්න බෑ**

<u>ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා- ගරු නගර සභා මන්ත්‍රී</u>

ත්‍රිරෝද රථ සංගම් වල සභාපතිවරුන්ට අවශ්‍ය විධියට කටයුතු කරන්න දෙන්න බෑ

**<u>ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>**

පොලිසිය ලව්වා මෙම තීන්දු ක්‍රියාත්මක කරන්න ඕන.

<u>එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා  - ගරු නගර සභා මන්ත්‍රී</u>

තෝරන්නේ කොහොමද, ඒ මිනිසුන් ජීවිකාව ගෙනයන්නේ කොහොමද

**<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>**

ටවුමේ නැවැත්වීමට බලපත්‍ර ලබා දිය හැකි ත්‍රිරෝද රථ සංඛ්‍යාව 220 ක්

**<u>ඩෙනට් පනියන්දුවගේ මයා -  ගරු නගර සභා මන්ත්‍රී</u>**

**පිළිවෙලක් නැතිව වාහන නවතා තැබීම නිසා අම්බලන්ගොඩට පිටින් එන මිනිසුන් බැන බැන යන්නේ.  බනින්නේ නගර සභාවට.  අපි මේ ගන්නා තීන්දු සියළු දෙනාම වෙනුවෙන්**

**<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>**

ලිපි අවසන් බැවින් ඉදිරිපත් වී ඇති අයදුම්පත්  කමිටුවට ඉදිරිපත් කිරීම

කමිටුවට අයදුම්පත් 136 ක් ඉදිරිපත් වී තිබූ අතර පහත සඳහන් අයදුම්පත් සඳහා කමිටුවේ අනුමැතිය ලැබීන

ත්‍රිරෝදරථලියාපදිංචියසඳහා අනුමැතිය
ලැබිඇතිඅයදුම්පත්

| අනු අංකය | වාහනඅංකය | නම | ලිපිනය |
|---|---|---|---|
| 1 | AAW-6467 | පින්නදූවහේවාදුලානිදසිල්වා | නො: 15/7, ග්‍රාමිණි විද්‍යාලමාවත,කළුවඩුම්ල්ල, අම්බලන්ගොඩ |
| 2 | HR-5941 | එම්.ඩබ්. ප්‍රභාත්දසිල්වා | 309, ගාලුපාර , අම්බලන්ගොඩ |
| 4 | QT-1641 | බෝලපගේලලිතාස්වර්ණලතා | නො:88/1, කැපුඇලපාර, අම්බලන්ගොඩ |
| 7 | AAP-5947 | මොරගොඩලියනගේස්වර්ණල තා | නො:04, හීගල්දුව, විලේගොඩ, අම්බලන්ගොඩ |
| 8 | ABB-7037 | ජී.එම්. උෂාන්සම්පත් | 2/14, පෝරඹ, අම්බලන්ගොඩ |
| 9 | AAU-7171 | ඩබ්.එම්. දමයන්තිමැණිකේවර්ණසූරිය | 27,ආර්.ඊ.දසිල්වාමාවත, අම්බලන්ගොඩ |
| 10 | QL-6490 | සීක්කුවායමන්ජයරත්න | 58/2,ආර්.ඊ.දසිල්වාමාවත, අම්බලන්ගොඩ |
| 11 | 207-1210 | එම්.ඩබ්.එච්. පද්මසීලි | 100/5, පින්නදූව, අම්බලන්ගොඩ |
| 12 | YK-7392 | ආර්.එම්. නිලන්ත | නො:03,ආදර්ශනිවාස, පටබැඳිමුල්ල, අම්බලන්ගොඩ |
| 14 | 204-1364 | කේ.එස්.ප්‍රේමචන්ද්‍ර | නො:52/3, මානිමුල්ල, අම්බලන්ගොඩ |
| 15 | QL-9639 | එච්. ආරියතිලකමෙන්ඩිස් | නො:32/2,  ශ්‍රී මේදානන්දමාවත, හෙප්පුමුල්ල, අම්බලන්ගොඩ |
| 17 | ABJ-1030 | ගාල්ලගේඅසන්ත | නො:24, ශ්‍රීබුද්ධදත්තමාවත, පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 18 | YY-6323 | වැල්ලගේඉරෝෂිණිප්‍රියංගිකා | නිව්යෝක්ජනපදය, දළුක්කන්ද, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 19 | YW-9174 | ජයවර්ධනහෙට්ටිකරන්නාගොඩ | 49, පින්නදූව, අම්බලන්ගොඩ |
| 20 | YA-1491 | කේ.කේ. නයෝමිදිල්හාරි | 275/2, ජාතිකනිවාස, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |

| | | | |
|---|---|---|---|
| 21 | GZ-1747 | තිරිමාදූරනිමල්සංජීවදසොයිසා | නො:25අත්කම්නිවාස, ඕකන්ද, අම්බලන්ගොඩ |
| 24 | YC-5032 | කේ.ජී.ජී. මංජුලා ප්‍රියන්ති | 79/13, දේවාලපාර. පෝරඹ, අම්බලන්ගොඩ |
| 25 | ABJ-4609 | එස්.කේ. පුෂ්පකුසෝම | නො:65/2, තුඩුවමුල්ල, අම්බලන්ගොඩ |
| 26 | AAJ-5901 | මල්ලියාවඩුනිරංජලාදිල්රුක්ෂි | 07බී, ශ්‍රීබුද්ධදත්තමාවත, පළමුපටුමග, පොල්වත්ත. අම්බලන්ගොඩ |
| 27 | YY-8983 | කේ. දයාල්ප්‍රියන්තදසිල්වා | 327/19, පොල්වත්තපාර, කෙරමිණිය, අම්බලන්ගොඩ |
| 28 | YP-2573 | ටී.එච්. ශ්‍යාමානිරෝෂනි | නො:25, නගරසභානිවාස, ඕකන්ද, අම්බලන්ගොඩ |
| 29 | Hu-1684 | එච්.ටී. ඩෙන්සිල්ක්ලේමන්ට්දසිල්වා | නො: 03, කන්දමාවත, පටබැදිමුල්ල, අම්බලන්ගොඩ |
| 30 | ABD-0223 | බී. චමින්ප්‍රියංකර | 343/11, කෙරමිණිය,අම්බලන්ගොඩ |
| 31 | ABJ-3743 | ජේ. දීපිකා ප්‍රියදර්ශනි | 18/5,කැපුඇලපාර, අම්බලන්ගොඩ |
| 34 | HF-3866 | ඒ.ඩබ්. නන්දිකකුමාර | නො:27, ගොඩහේන, අම්බලන්ගොඩ |
| 35 | 207-1119 | ඒ.ඩබ්.සංජයචාමාල්නන්දිකකුමාර | 146/3සී, පල්ලෙතොටපාර. තල්ගසගොඩ, අම්බලන්ගොඩ |
| 42 | ABC-1945 | කේ.කේ. චන්ද්‍රසිරි | 2/275,ජාතිකනිවාස, තල්ගස්ගොඩ. අම්බලන්ගොඩ |
| 43 | QU-6869 | එච්.එච්. චන්ද්‍රාවතී | නො:149බී, පල්ලියගොඩවත්ත, මහවීදිය, අම්බලන්ගොඩ |
| 44 | QF-9694 | කේ. කුමාරිඅමල්කා | නො:305/2, මහවීදිය, අම්බලන්ගොඩ |
| 45 | ABQ-7576 | ජී.ඩබ්. ගාමිණිටෙරි | 226/5, පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 46 | 200-8874 | පී.ඩබ්. ලෝරන්ස් | 137බී, තල්ගස්ගොඩ. අම්බලන්ගොඩ |
| 47 | ABF-5352 | ජී.එජ්.එම්. තරංග | 305/3, මහවීදිය, අම්බලන්ගොඩ |
| 48 | QZ-5246 | එස්.ටී.ඒ.පී. දසිල්වා | නො:08, රණසුරියමාවත, පෝරඹ, අම්බලන්ගොඩ |
| 49 | HF-7591 | එල්. නිරෝෂා | 344, කෙරමිණිය, අම්බලන්ගොඩ |
| 50 | ABL-9589 | කේ.ඒ.ඩී. සුමිත්‍රා | 24/4 ඩී, පඤ්ඤාලෝකමාවත, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ |
| 51 | QG-1058 | ලමාහේවාවිමලාකාන්ති | නො: 36, බුද්ධදත්තමාවත, පොල්වත්ත |
| 53 | YJ-6108 | ජී.ඩබ්. මල්කාන්තිගුණතිලක | 11/9, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 63 | YD-7538 | එම්.එම්. නලීන්චින්තකදසිල්වා | වැල්ලබඩ, මාදම්පේ, අම්බලන්ගොඩ |
| 64 | 201-7062 | එන්. සුජීවකුමාරදසිල්වා | නො:107, සන්ධ්‍යා , ඌරවත්ත, අම්බලන්ගොඩ |
| 75 | QW-6792 | බී. මංජුලදසිල්වා | නො:01, කණුව, කුලීගොඩ |
| 78 | YY-7285 | පී.කේ. වානකජයන්තදසිල්වා | 66, කන්දේගොඩ, අම්බලන්ගොඩ |
| 99 | QA-1626 | එන්.එච්. ශ්‍රිටා ඉන්දනි | 409/3, ගාලුපාර, බේරතුඩුව, බලපිටිය |

| | | | |
|---|---|---|---|
| 106 | AAJ-3664 | කේ. ලහිරුවිරාජ්සිල්වා | 6/90, පින්නදූව. අම්බලන්ගොඩ |
| 108 | ABJ-5488 | යූ.පී. යටිලවසන්ත | නො;15/1, තල්ගස්ගොඩපාර,පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 109 | QZ-1006 | ඩී. රොහාන්කුමාරරණසිංහ | 6/377,මාදදූව, කුලීගොඩ, අම්බලන්ගොඩ |
| 111 | QM-4794 | ඩබ්. ප්‍රසන්නඋදයකුමාරසිරි | 31/14, මිහිතරුනිවස, සමගිමාවත, ආදාදොල, වතුගෙදර |
| 112 | 16-1207 | කේ.එච්. සමන්කුමාර | නො:28/4එම්, රණසුරියමාවත, පනියන, අම්බලන්ගොඩ |
| 114 | YZ-6345 | ඩී.කේ. වරුසවිතාන | 20, ශ්‍රීවිජයාරාමපාර. කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ. |
| 118 | ABA-5996 | ඩබ්.ටී. දේවිකාවමනි | නො:31/1, පින්නදූව, අම්බලන්ගොඩ |
| 120 | YW-3414 | එච්.එච්. නයනිමහේෂිකා | 4/15පාළුවත්තපාර, පෝරඹ, අම්බලන්ගොඩ |
| 121 | ABO-7176 | කේ.ඩබ්. චන්ද්‍රසීලි | නො: 54, තුඩුවමුල්ල, අම්බලන්ගොඩ |
| 124 | AAZ-8446 | එස්. ස්ටෙලාසමාධිදසිල්වා | නො:17/7, බෝගහවත්ත, අම්බලන්ගොඩ |
| 126 | YA-5202 | එස්.ටී. ගිහාන් ප්‍රියන්ත | 56/1, පනියන්දූව, අම්බලන්ගොඩ |
| 129 | 204-3737 | එම්.ඩබ්.චතුරාන්ප්‍රියදර්ශන | නො,23පතිරාජපාර, කෙරමිණිය, අම්බලන්ගොඩ |
| 130 | ABN-7632 | ඒ.පී. පත්මකිර්ති | 180/191, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 131 | AAI-7673 | එස්.එච්. ඒෂාන්සුරංගචන්ද්‍රසිරි | නො,15 සිතුම්සෙවන, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 132 | AAV-0524 | ඩබ්.ටී. උපුල්තුසන්ත | නො:320, කෙරමිණිය. අම්බලන්ගොඩ |
| 133 | YL-3335 | ඩබ්. සනත්පෙරේරා | 456/ඒ,ගාලුපාර, පටබැදිමුල්ල, අම්බලන්ගොඩ |
| 134 | ABP-7407 | යූ.ජී. සංජීවසඳකැලුම් | නො:36, ඕකන්ද, අම්බලන්ගොඩ |
| 135 | QZ-2049 | එන්. ඩබ්. නිමාලිප්‍රියදර්ශනි | නො:20/76, ටී.එච්.ඩබ‘. නිවාස, දළුක්කන්ද, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 136 | ABS-3238 | කේ. සුමිත්‍රා | 193/9, පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 138 | AAO-4395 | ගාල්ලගේරමණි | නො:22/7, ශ්‍රීබුද්ධදත්තමාවත, පොල්වත්ත, අම්බලන්ගොඩ |

<u>එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>

අදාල බලපත්‍රය ලබා දෙන්නේ පැය 24 ට ම ද යන්නත් නොමැති නම් රාත්‍රී කාලය හා දිවා කාලය සඳහා වෙන වෙනම බලපත්‍ර දීම කරන්නේ ද යන්න විමසන ලදී.

**<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>**

**ඒක අපට දැන්ම කියන්න බෑ. කව්රුත් උදවු කරන්න ඕන මෙය ක්‍රියාත්මක කර ගන්න.**

**<u>ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>**

ත්‍රිරෝද රථ 10 ක් දාන්න පුළුවන් තැනට ත්‍රිරෝද රථ 20 ක් දානවා. අපි මේ සියළු දෙනාම කැඳවා ඔවුන් දැනුවත් කිරීමක් කරමු.

ඩබ්.ඒ. සෝහිත රංජිත් මයා- ගරු නගර සභා මන්ත්‍රී

රථ ගාල්වල ත්‍රිරෝද රථ කීයක් පාක් කරන්න පුළුවන්ද

**කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති**

**ත්‍රිරෝද රථ 220 ක් පමණ ගාල්ල කල හැකි බවත්. කමිටු නිර්දේශ අනුව අනුමත කරන ලද අයදුම්පත් නිලධාරින් විසින් පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු කලයුතු බවත් ප්‍රකාශ කරන ලදී. අපි අද ඉදිරිපත් කල බලපත්‍ර නුදුන්නු ඉතිරි අයදුම්පත් ප්‍රමාණය අනුව තැන සලකා බලන බව ප්‍රකාශ කරන ලදී . අලුතින් අයදුම්පත් දෙන විට බලප්‍රදේශයේ අයට පමණක් ලබා දීමටත් අනුමත කරන ලද සියළු දෙනාට ස්ටිකර් ලබා දිය යුතු බවත් අදාල තීරණ අනුව කටයුතු කල යුතු බවත් නිලධාරීන්ට ගැටළුවක් තිබේ නම් පොලිසිය දැනුවත් කර රථවාහන සම්බන්ද ගැටළුව නිරාකරණය කර ගත යුතු බවත් සඳහන් කරන ලදී.**

ඩබ්.ඒ. සෝහිත රංජිත් මයා- ගරු නගර සභා මන්ත්‍රී

ස්ටිකරය ලබාගෙන නොමැති මුල්වටයේ 120 දෙනාගෙන් ඉතිරි අයට සතියක් තුල ස්ටිකරය ලබා ගන්නා ලෙස දැනුම් දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

**ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**කාලයක් තිස්සේ රථ වාහන නිසි පරිදි ගාල් නොකිරීම නිසා පිටස්තර ජනයාගෙන් ලැබෙන අවලාද අපහාස බොහෝ බවත් සියළු දෙනාම වෙනුවෙන් ගන්නා තීන්දු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය සංවර්ධන කමිටුව හරහා අනුමැතිය ලබාගෙන ඒ අනුව නඩු දැමීමට ක්‍රියා කල යුතු බවත් , පසුව රත්ගම, බලපිටිය කොට්ඨාශ වල අයටත් බලපත්‍ර ලබා දීම ගැන සලකා බැලිය යුතු බවත් බලහත්කාරයෙන් වන්ඩි කමින් ඉන්න අයට ඉඩදිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.**

**කලි මුදල් ගෙවා ස්ටිකරය ලබා ඇත්නම් පිටස්තර අයට වුවද ස්ටිකර්ය ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. තවද ගරු උප සභාපති තුමන් ඇතුළු නාගරික මන්ත්‍රි තුමන්ලාගෙන් ද මේ සඳහා සහභාගි වීම පිළිබඳ ස්තුතිය පුද කරන ලදී.**

තීරණ

- **අදාල තීරණ ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට ඉදිරිපත් කර ප්‍රාදේශිය ලේකම්, ප්‍රධාන අමාත්‍යවරයා හා පොලිසිය වෙත ද යැවීමට තිරණය විය**
- **සුදුසුකම්ලාභි අයට සතියකින් පසු දන්වා යැවිය යුතුයි**
- ත්‍රිරෝද රථ නවතා තබන තැන්වල සසීමාවන් සලකුණු කර පෙන්වීමට

| | | |
|---|---|---|
| සකස් කලේ | ලේකම් | උප සභාපති |
| එස්.යු. එස්. ද සිල්වා | බී.ඒ. ධම්මිකා | කමල් වැල්ලගේ |
| | අම්බලන්ගොඩ නගර සභාව | අම්බලන්ගොඩ නගර සභාව |

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**
මෙම වාර්තාව නිවැරදි කිරීමක් අවශ්‍යයි. මා පෝරඹ ත්‍රීරෝද රථ ගාලක් එදා නම්කරන ලදී.එය වැටි නැත.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**
මෙම කමිටුව ඔබතුමා සහභාගී නොමැත .

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
ගරු මන්ත්‍රීතුමනි එම දිනයේ ගනු ලැබූ තින්දු පිළිබඳවයි මේ කමිටු වාර්තාවට ඇතුලත් වී ඇත්තේ . මේ මන්ත්‍රීතුමා කියන යෝජනාව ඇතුල් කිරීමට පුළුවන් නම් එය ඇතුලත් කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**
මේ සභාවට එම යෝජනාවක් පැමිණ තිබුනේ නැත. ඔබතුමා එය ඉදිරිපත් කරන්න. අපි මෙහි පිට පළාත් වල ඒවා ගැන නම්කරනු ලැබුවේ නැහැ. ඒවාට කිසි ගැටලුවක් වන්නේ නැහැ. නගරයේ පමණයි මේ ගනු ලැබුවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ත්‍රිරෝද රථ කමිටුවට මා ප්‍රකාශ කිරිමට කැමතියි පොල්වත්ත හංදියේ තිබෙන රථ ගාල සම්බන්ධයෙන් අපිට පැමිණිල්ලක් ලැබී ඇත .ඔබතුමාලා විසින් බලපත්‍ර නිකුත් කරනු ලබනවා. එම බලපත්‍ර නිකුත් කරන අයට එතැන සංගමයක් තිබෙනවා. ඒ අය පවසා සිටින්නේ මෙම අයට වාහනය නතර කරනවාට ඒ අයට මුදලක් ගෙවන ලෙස දන්වා සිටින බවයි.එවැනි බලහත්කාරකම් වණ්ඩිකම් කරන පුද්ගලයන් සිටි නම් ඔවුන්ගේ බලපත්‍ර අහෝසි කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

බලපත්‍ර නැ ඒ අයට . අපි එයට තීරණයක් ගනු ලැබුවා . පොලිසිය යන ලෙස දන්වා සිටියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම පුද්ගලයා පොලිසියෙත් පැමිණිලි කර ඇත. මට එම පැමිණිල්ලේ විස්තරයක් ගෙනත් දුන්නා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා හටත් එය පෙන්නුවා. එය එසේ කළා කියා අපිට ත්‍රීරෝද රථ සංගම් වලට ගොස් අපිට ප්‍රශ්නයක් කර ගැනිමට බැරිය. අපි එතැන පොල්වත්ත නැවතුම්පොළක් දී තිබේ. එහි බලපත්‍ර ගෙන නැති පුද්ගලයන් තමයි බලහත්කාරකම් කරනු ලබන්නේ. මේ සම්බන්ධව අපි යෝජනාවක් කළා . එය ඇතුලත් වි නොමැත.ත්‍රිරෝද රථ කමිටුවේ වාර්තාව සකසනු ලබන්නේ කවුද දන්නේ නැහැ.අපි යෝජනවාක් කළා විශේෂයෙන්ම අම්බලන්ගොඩ නගරයට යාබද රන්දොඹේ ග්‍රාමසේවා කොට්ඨාශය , හිරේවත්තට යාබදම ග්‍රාමසේවා කොට්ඨශය , දෙල්දූව , බෝගහවත්ත , ගොඩහේන කියන මේ ටික සඳහා නගරයක් නොමැති නිසා අපි යෝජනා කළා මේ ටික දෙනාටත් අම්බලන්ගොඩ නගරයේ ත්‍රීරෝද රථයක් ගාල් කරන්න අවස්ථාව ලබා දීමට යෝජනා කර සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි සඳහන් වී තිබෙනවා ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් යෝජනා කළ ඇති කැපුඇළ හංදියේ සිට අම්බලන්ගොඩ දෙසට පදිංචි අයටත් දෙල්දූවේ පදිංචි අයටත් ප්‍රමුඛතාවය දිය යුතුයි . අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ පදිංචියෙන් පසු ඉහත ස්ථාන වල පදිංචිකරුවන්ටත් නිග්‍රෝධාරාමය මාදම්පා කණිෂ්ඨ විද්‍යාලය අසල සිට අම්බලන්ගොඩ පදිංචි අයටත් ලබා දීම සහ ගාස්තු අයකිරීම වාර්ෂිකව සිදු කිරීමටත් සභාවේදි ඒකමතිකව තින්දු කරන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

වාර්තාවේ කොතනද ඔය කියන දෙය සඳහන් වී තිබෙන්නේ ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වාර්තාවේ තිබේ. 2 වෙනි කොළයේ .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මගේ වාර්තාවේ මුකුත් පෙන්නේ නැත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමියනි, ත්‍රීරෝද රථ වාර්තාව කරනු ලබන්නේ ගරු උප සභාපතිතුමා නිසා එම වාර්තාව එතුමාට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව මාහට ලබා දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙය නිසියාකාරව විමසා බලා ගරු මන්ත්‍රිවරුන්ට ලබා දෙන්න . මෙහි තිබෙනවා කැපුඇළ, දෙල්දූව , මාදම්පා කණිෂ්ඨ විද්‍යාලය දක්වාත් . මෙයට ඇතුලත් වී නොමැත අපි ගොඩහේන , බෝගහවත්ත යන ප්‍රදේශ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම ස්ථාන ඇතුලත් කර සංශෝධනය කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා යෝජනා කර සිටිනවා හෙප්පුමුල්ලට ආසන්නම ග්‍රාමය වන රන්දෝඹේත් , බෝගහවත්ත , දෙල්දූවත් , ගොඩහේන සහ මාදම්පේ හිරේවත්තට යාබදම ග්‍රමසේවක කොට්ඨාශය යන තැන් නම් කළා .විශේෂයෙන්ම දෙල්දූව කියන්නේ රත්ගම ආසනයේ වුවත් අපේ නගරයට දැඩි සම්බන්ධකමක් තිබෙන ගමකි .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතකොට තිලකපුර නැද්ද?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

තිලකපුර කියන්නේ ගොඩක් දුර නිසා අපි ගොඩහේන ගනු ලැබුවා. තිලකපුර රථගාලක් තිබෙනවා. ගොඩහේන රථ ගාලක් නැත. මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා නැතිනම් මේ ජනතාවට , ත්‍රිරෝද රථ හිමියන්ට යම් අසාධාරණයක් සිදු වෙනවා . ළඟම නගරය අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයයි. මේ ප්‍ර දේශවල ත්‍රිරෝද රථ සඳහා බලපත්‍ර ලබා දෙන ලෙස මා යෝජනවක් ගරු සභාවට ඉදිරිපත් කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

මා කිසිම කමිටුවක නෑ. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා . ත්‍රිරෝද රථ සංගමේ නාමලේඛණයේ 23 හි සඳහන් වි තිබෙනවා 23/8, රබර් වත්ත , කුරුඳුවත්ත , වතුගෙදර ලෙස. එය අනුමත කර ඇත.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙහි බලපත්‍රය කලින් අවුරුදදෙන් අවුරුද්ද ගෙන තිබෙනවා .

**ගරු නගර සභා මන්ත්‍රි ඩී. ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මෙතැන මේ කැපුඇළ හංදියේ සිට අම්බලන්ගොඩ දෙසට පදිංචි අයට කියා දමා ඇත.එයට බෝගහවත්ත අයිති වෙන්නේ නැත. අපි එදා නම්කර තිබුණා කැපුඇළ අංක 82 ග්‍රාමසේවා වසම දක්වා . එය වෙනස් කරන්න. ගරු මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා අපි සාකච්ජාවකදි එතුමා ප්‍රකාශ කරනු ලැබුවා සිංහල අලුත් අවුරුද්දට ප්‍රථම මේ ත්‍රිරෝද රථ වල නැවතුම් ස්ථාන ස්ථානගත කරන ලෙසට . පාරිභෝගිකයන්ට උත්සව සමය නිසා කරදර වන නිසා ඊට ප්‍රථම මෙම කටයුක්ත සිදු කරන ලෙසට මා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි ,2019 වර්ෂයේදි අපි ත්‍රිරෝද රථ කමිටුව ලෙස නෙමේ රථවාහන කමිටුව ලෙස නම්කරන ලදි. මොකද අනෙකුත් වාහන වලට මෙම ප්‍රශ්නය එන නිසා. මෙහි 220 ක් පඹන තිබෙනවා . බස්නැවතුම්පොල අසළ , සුවණ රෝහල අසළ, හැටන් නැෂනල් බැංකුව අසළ , දුම්රියපොළ අසළ , හාෂිණි සුපර් මාර්කට් අසළ , සමුපකාර කර්යාලය අසළ , අබාන්ස් ඉදිරිපිට , දොළොස්මහ අසළ, සෙලාන් බැංකුව ඉදිරිපිට ,සේන කොපි කඩය අසළ . දැන් මේම 220 නතර කරනවිට නිත්‍යානුකුල තත්වයන් මත කටයුතු කරනවාද? මෙය ගැසට් කර නිවැරදිව සිදු කෙරෙනවාද කියන එක තවත් කරුණකි. මොකද නිලධාරින්ට අපහසුතාවයට පත්වෙනවා මේ සඳහා රාජකාරි කිරිමට ගියාම.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එය කමිටුව විසින් සංශෝධනය කර සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අන්න එයයි ගැටලුව . ත්‍රිරෝද රථ හිමියන් අපට පවසා සිටින්නේ අපි මුදල් ගෙවනවා. දැනට තුරෝද රථ කියකට බලපත්‍ර ලබා දී තිබෙනවාද ? කොටසකට දී තිබෙනවානේද ? 148 ක ට ලබා දී තිබෙනවා නේද? ඒ කියන්නේ කලින් හිටපු කට්ටිය ඒ විදියට තෝරා ලබා දි තිබෙනවාද? මෙම අයට නිත්‍යානුකුල තත්වය කෙසේද? කවුරු හරි පහර දී මොනවා හරි ප්‍රශ්නයක් ඇති වුවහොත් නිත්‍යානුකුල තත්වයක් තිබිය යුතුයි. දැන් මේ ස්ථාන සියල්ලම ගැසට් කර තිබෙනවාද? එකතමයි මෙය දෙනවිටම ඉදිරි නිත්‍යානුකුල කටයුක්තක් සිදු වි තිබිය යුතුයි.නැතිනම් අපි මෙය කලිනුත් සිදු කරන්න ගිහින් ප්‍රශ්න ඇති වුණා. මේ නිසා අනෙක් පිරිස බලපත්‍රය නොගෙන සිටිනවා.මේ වසරේ ගත්තායි කියමු. ඊලඟ වසරේ ඒ අය ගන්නේ නැහැ. එතැන ගැටලුවක් ඇතිවේ . මේ නිසා මේ ස්ථාන ටික හරියටම ගැසට් කර ප්‍රසිද්ධියට පත් කර කලානම් හොඳයි. නැතිනම් අපේ ගමේ කට්ටිය නගරයේ කට්ටිය අපිටත් දෝෂාරෝපණය නගනවා මේ සඳහා මුදල් අයකරනවා නිසියාකාරව වැඩේ සිදු නොවන නිසා.මෙහි ත්‍රීරෝද රථ හිමියන්ගේ නාමලේඛණයේ 220 ක් පමණ තිබෙනවා. මෙම 220 නතර කළ හැකිද? බස්නැවතුම්පළ අසළ නතර කළ හැකිය. මෙහි මෙය කතා කරන්න වේලාවක් නැහැ.උදාහරණයක් ලෙස ගතහොත් සමුපකාර වෙළඳසැල අසළ . මෙහි ලොතරැයි කුඩු තිබෙනවා. එහි ත්‍රීරෝද රථ නතර කරනවානම් ලොතරැයි කුඩු ඉවත් කරන්න.මුලික දේ කළ යුතුයි. අදාල ස්ථාන ගැසට් කර මේ කටයුක්ත ආරම්භ කරන්න.මේ ආකාරයට වැඩ කටයුතු සිදු කරන ලෙස අප කමිටුව සඳහා පත්කර සිටින නියෝජිතයන්ටත් උපදෙස් දෙනවා.නැතිනම් මුදල් ගෙවා ඇති පිරිසටත් මුදල් ගෙවීමට එපා වෙනවා. ඊළඟ වසරේ මේ අය කරන්නේ මුදල් නොගෙවා මෙය වල් වැදිමට කටයුතු සලසනවා.නිත්‍යානුකුල තත්වයක් අති කර කටයුතු කරන්න. නැතිනම් මේ සඳහා උසාවි පවා යන පුද්ගලයන් සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී පී .සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි ,ත්‍රිරෝද රථ නතර කරන ස්ථාන ලෙස බස්නැවතුම්පළ අසළ 45 ආදි ලෙස සඳහන් කර තිබෙනවා . මා දකිනවා සමහර ස්ථානවල උදාහරණ ලෙස දුම්රියපොළ හංදිය මෙහි දුම්රියපොළට යන පාරේ පටු තිරුවේ ත්‍රිරෝද රථ 30 කට අවසර දී තිබෙනවා. අවසර දීම් පිළිබඳ මා සංතෝෂ වෙනවා. හැබැයි මා ඉල්ලා සිටිනවා එකවර නැවත්වීම උපරිම 05කට හෝ 08කට සීමා කරන ලෙස. ඒ අදාල ස්ථානය අනුව තීරණය කරන්න කියා.අපි බෝඩ් ගසා තිබෙනවානේ . තවම ප්‍රමාණ දමා නැහැ.මා ඉල්ලා සිටිනවා මේ ව්‍යාපාරික ස්ථානයක් ඉදිරිපිට තමයි මේ ත්‍රිරෝද රථ හලක් ලබා දි තිබෙන්නේ.මා දන්නා පරිදි නම් මේ හතරන හංදි එකකවත් රථගාලක් දෙන්න බෑ.මා දන්නේ නෑ පොලිසිය මෙයට අනුමතිය දෙනවාද කියා. දැනට අපි තාවකාලිකව හෝ දී තිබෙන නිසා දි තිබෙන ඒවාට ව්‍යාපාරික ස්ථාන වලට කරදරයක් නොවන විදියට ලබා දෙන්න.අඩුම තරමේ ත්‍රිරෝද රථ 05 . 06 කට වඩා එකවර නවත්වන්න දෙන්න එපා.නරගයේ වරිපණම් බදු ගෙවන ජනතාවට නගරයට පැමිණ තම වාහනයක් නතර කර බඩුවක් ගැනිමට හැකියාව තිබෙන්නට ඕන.මේ නගරය ත්‍රිරෝද රථ හිමියන්ටම අයිති කර දෙන්න එපා. මෙය ඉතාම පටු නගරයකි. විශාල නගරයක් නෙමේ. ඉතාම සිමා සහිත පාරවල් ප්‍රමාණයක් තිබෙන්නේ . මේතරම් ත්‍රිරෝද රථ ප්‍රමාණයකට අපි අවසර දුන්නොත් එකවර නතර කිරීමට නගරය අවධිමත් වේ. ඉඩ දීම හොඳයි පුළුවන්තරම් එකවර නතර කරන ත්‍රිරෝද රථ ප්‍රමාණය සිමා කරන ලෙස ඉල්ලා සිටිනවා. අපි මම හිතන්නේ ගැසට් කර තිබෙන්නේ ත්‍රිරෝද රථ 7 ක් තමයි රණසිංහ එක ලඟ සිට පොළ දෙසට . තව 04 ක් තිබෙනවා හාෂිණි සුපර් මාර්කට් ළඟ තිබෙනවා , එසේම හැටන් නැෂනල් බැංකුව ලඟ ටිකත් අපි ගැසට් කර තිබෙනවා. මේවා නිත්‍යානුකුල රථගාල් ලෙස නම්කර තිබෙනවා. අනෙක් ස්ථාන තමයි අපිට ගැසට් කිරීමට තිබෙන්නේ .

**තීරණය -**

**2018.12.27 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ත්‍රිරෝද රථ කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවටත් බෝගහවත්ත කැපුවෙළ අංක 82 ග්‍රාමසේවා කොට්ඨාශය , රන්දොඹේ අම්බලන්ගොඩ නගරයට ආසන්නම ග්‍රාමසේවා කොට්ඨාශය , දේල්දූව, ගොඩහේන , හිරේවත්තට ආසන්නම ග්‍රාම සේවා කොට්ඨාශය යන ප්‍රදේශවල පදිංචිකරුවන් සඳහා අවසර දීම යනුවෙන් කමිටු වාර්තාව සංශෝධනය විය යුතු බවත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.03 2018.12.18 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව සභා ගත කිරීම.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්
2018.12.18 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාවට යෝජනා කර සිටිනවා

ටෙන්ඩර් කමිටුව

**2018/12/18 දින ප.ව. 1.30**

**සහභාගීත්වය**

01. අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
02. ධම්මික කොඩිකාර මහතා — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
03. නන්දන රාජපක්ෂ මහතා — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
04. පේෂලා කුමාරි මහත්මිය — ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව
05. බී.ඒ. ධම්මිකා මහත්මිය — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
06. එච්.පී. මිහිරි ද සිල්වා මිය — ප්‍රධාන කළමණාකරන සහකාර,අම්බලන්ගොඩ නගරසභාව
07. ඩී.එච්.එස්.ඩී. ගුණවර්ධන මහතා — තාක්ෂණ නිළධාරී,අම්බලන්ගොඩ නගරසභාව
08. පී.එම්. විජේසිංහ මෙනවිය — තාක්ෂණ නිළධාරී,අම්බලන්ගොඩ නගරසභාව
09. කේ. පියරත්න මහතා — ආදායම් පරීක්ෂක,අම්බලන්ගොඩ නගරසභාව

09. ලක්මාලි රුවනි — සං.නිළධාරී ,අම්බලන්ගොඩ නගරසභාව

**කමිටු වාර්තාව**

1.පෙර පාසැල් ළමුන් සඳහා නිළ ඇඳුම් රෙදි සඳහා අවම මිල ඉදිරිපත් කල සරසි රෙදි ගෙදර ආයතනයේ මිලගණන්පිළිගැනීමසුදුසුබවටතීරණයකරනලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | Spider garment ambalangoda | Pewarit ambalangoda | සරසි රෙදි ගෙදර අම්බලන්ගොඩ |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | කලිසම්, සාය රෙදි ( 60 පළල) | 150 යාර | මෙරූන් | 350.00 | - | 195.00 |
| 2 | කමිස රෙදි (45 පළල) | 150 යාර | කීම් | 380.00 | - | 240.00 |

2. Ribban සඳහා(original) මිල ඉදිරිපත් කල omak technoiogy ආයතනයේ මිල පිලිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | omak technoiogy | සරසි කම්පියුටර් අම්බලන්ගොඩ | Tulip computer ambalangoda |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| | Lq 2090 Ribban | 10 | epson | 2900.00 (original) | 1500.00( competabal) | - |
| | Lq 310 Ribban | | | 650.00 (original) | 600.00 (competabl) | |

3.බස් නැවතුම්පල භූමියේ තැබීම සඳහා ප්ලාස්ටික් කසල බඳුන් වෙනුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නයනරංජන ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | තරු ස්ටෝල් සෙන්ටර් අම්බලන්ගොඩ | නයන රංජන ස්ටෝල් පොල අම්බලන් | ශ්‍රී ශක්ති සුපර් මාර්කට් | කාගිල්ස් ෆුඩ්සිටි | ආර්.ටී.එස් ෆුඩ්සිටි | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | |
| 1 | 100 l ප්ලාස්ටික් කසල බඳුන් | 10 | | 2600.00 | 1450.00 | - | - | - | |

.

4.කැනපි රෙදි මැසීම සඳහා මිල ඉදිරිපත් කර ඇති කේ.කේ ක්‍රිෂාන්ත මහතා වෙතින් ලබාගත් මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ෂ්.ෂ්. ෂිෂාන්ෂ ඹටපොල | ෂදීපා ෂාන්ෂ ෂිෂ්පාදකයෝ ඇල්ෂපිටිය | ෆ.ඩබ. ෂයන්ෂ ඹටපොල | ධකුෂ්ෂ ෂෂ් ධර්ෂ්ෂ් ඇඹලන්ගොෂ |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | කැනපි රෙදි මැසීම | 10 | ඔක්ෂ් පොඩි | 10500.00 | | | |

**5.කුණු තුනී කරන යන්තය සදහා අවම මිල ලබා දී ඇති පී.එච් සී. ගොඩනැගිලි දව සපයන්නෝ විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනීමට තීරණය කරන ලදී**

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ඩඹ.ඩඹ. ෂාන්ෂටෂ් ෂෂ් | ෂ.ඩබ.ෂ. ගොඩනැගි ලි දව ෂපයන් | ඩෂ්ෂ ෂ ගොන්ෂ්ට ඩර්ෂ්ෂ් |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | **කුණු තුනී කරන යන්තය මීටර් පැය එකකට** | | | 3500.00 | 3200.00 | - |

6.මැනුම් කටයුතු සදහා එකම මිල ඉදිරිපත් කර ඇති පී.ඒ රබින් චන්දසිරි මහතාගේ මිල පිලිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ෂ.ඒ රබින් ඩන්දෂිර | | |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | ව.අංක 349 දරන ඉඩම සම්බන්ධ මැනීම සහ පිඹුරු සෑදීම | | | 30000.00 | | |
| 02 | තල්ගස්ගොඩ ප්‍රජාශාලාව ඉඩම මැනීම සහ පිඹුරු සෑදීම | | | 50000.00 | | |

7.පෙර පාසැල් ළමුන් සදහා ටීෂර්ට් මිල ගණන් රෙදි වර්ගය ලබා දී නැවත කැදවීමට තීරණය කරන ලදී.

............................................ ....................................................

සකස් කලේ පරීක්ෂා කලේ

එල්.ආර්.මිගෙල්හේවා — තාක්ෂණ නිළධාරීසංවර්ධන නිළධාරී
අම්බලන්ගොඩ නගර සභාව

. ..................................................... ....................................................

| | |
|---|---|
| ලේකම් | සභාපති |
| බී.ඒ.ධම්මිකා | ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් |
| අම්බලන්ගොඩ නගර සභාව | අම්බලන්ගොඩ නගර සභාව |

**තීරණය -**

**2018.12.18 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.04 2018.12.18 දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව සභා ගත කිරිම.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2018.12.18 දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව සභා ගත කිරිම.

**<u>2018 දෙසැම්බර් මස 18 වන දින පුස්තකාල කමිටු වාර්තාව</u>**

- ගරු සභාපති — ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා
- ගරු නගර සභා මන්ත්‍රී — නන්දන රාජපක්ෂ මහතා
- ගරු නගර සභා මන්ත්‍රී — ධනසේන මාදුවගේ මහතා
- ගරු නගර සභා මන්ත්‍රීනි — ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය
- ගරු නගර සභා මන්ත්‍රීනි — එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය
- කමිටු සාමාජික — හර්බට් වීරක්කොඩි මහතා
- කමිටු සාමාජික — එන්.එච්.ඩන්කන් ද සිල්වා මහතා
- කමිටු සාමාජික — ටී.ඩබ්ලිව්. පියසිරි මහතා
- කමිටු සාමාජික — ටී.ඩබ්ලිව්. හරිස්චන්ද්‍ර මහතා
- කමිටු සාමාජික — ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා
- කමිටු සාමාජික — සුගත් හෙට්ටිආරච්චි මහතා
- කමිටු සාමාජික — ජේමසිරි රතුවඩු මහතා
- ලේකම් — බී.ඒ. ධම්මිකා මහත්මිය
- ප්‍රජා සංවර්ධන නිලධාරී — ඩී.වී.තරංගි මහත්මිය
- තාක්ෂන සේවා නිලධාරී — ඩී.එච්.එස්.ඩී. ගුණවර්ධන මහතා
- පුස්තකාලයාධිපති — කේ.ඩබ්ලිව්.රංජනී මානෙල් මෙනවිය
- පුස්තකාලයාධිපති — ඩී. මහේෂා තාබ්‍රේව් මෙනවිය
- පුස්තකාල සහායිකා — ජී.එච්.එල්.පියන්ති මෙනවිය

- පුස්තකාල සහායිකා ඒ.ජී.රසිකා මහත්මිය
- පුස්තකාල සහායිකා එස්.සුසිලා දීපානි මහත්මිය
- පුස්තකාල සහායිකා ඒ.ජී. ලක්ෂ්මි පෙරේරා මෙනවිය
- පුස්තකාල සහායිකා බී.එච්. දයාලතා මහත්මිය
- පුස්තකාල සහායිකා එම්.ඩබ්ලිව්. ජේ.සුමංගලී මහත්මිය
- පුස්තකාල සහායිකා එස්.එම්.මනෝරි චන්ද්‍රවංශ මහත්මිය
- පුස්තකාල සහායක ඒ.ඩබ්.ඉන්ද්‍රදාස මහතා
- පුස්තකාල සහායිකා මාලති සමන්තා ආරියසිංහ මහත්මිය

<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ **2018/12/18** දින පැවති පුස්තකාල කමිටු වාර්තාව</u>

- ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව. 2.30 ට පමණ පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

- ගරු සභාපතිතුමා විසින් පුස්තකාල කමිටුවට පැමිණි සියලුම ගරු නගර සභා මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්, පුස්තකාල කමිටු සාමාජික මහතුන්, ලේකම්තුමිය සහ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාලයාධිපතිනියන් සහ පුස්තකාල සහායක සහායිකාවන් ඇතුලු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදි.

- පළමුවෙන්ම ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම සිදුකරන ලදි.

  ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද ශාඛා පුස්තකාලවල ප්‍රගතිය ඒ ඒ ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි. විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ජී.එච්. එල් .පියන්ති මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදි.

- ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා පුස්තකාල කමිටුවට සහභාගී වීමට නොහැකි බව දුරකථනයෙන් දැන් වූ බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදි. සිරිපාල මාදුවගේ මහතා සහ එම්.ඒ. ජයවීර මහතා පුස්තකාල කමිටුවට පැමිණීමට නොහැකි බව දන්වා ලිපි එවා ඇති බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදි.

- දකුණු පළාතේ විශිෂ්ඨතම මහජන පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථානය තේරීමේ තරගය සඳහා ලැබුණු සහතිකය සහ කුසලානය කමිටුවට ඉදිරිපත් කිරීම. එම කුසලානය ලබා ගැනීමට සහ සාහිත්‍ය උත්සවය පැවැත්වීමට මහත් සේ කැප වූ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාල කාර්ය මණ්ඩලයට ගරු සභාපතිතුමාගේ ප්‍රශංසාව ලබාදුන් අතර ප්‍රශංසාත්මක ලිපි පෞද්ගලික ලිපි ගොනු වලට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට උපදෙස් ලබාදෙන ලදි.

- පොත් බැඳීමට අවශ්‍ය සියලුම ද්‍රව්‍ය ලබා දී ඇති දැයි ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනියගෙන් විමසන ලද අතර බඳින ලද පොත් දැමීමට පොත් අල්මාරියක් ලබා ගැනීම සහ පොත් බැඳීමට නියමිත ස්ථානයක් නොමැති බව පුස්තකාලයාධිපතිතුමිය පුස්තකාල කමිටුවට දන්වන ලදි.

- අදහස් හා යෝජනා කමිටුවට ඉදිරිපත් කිරීම.

- ප්‍රේමසිරි රතුවඩු මහතා අදහස් කළේ පුස්තකාල ප්‍රගති වාර්තාව ඉදිරිපත් කර ඇති ආකාරය පැහැදිලි නැති බැවින් සාමාජික වැඩිවීම පෙන්වා දෙන තීරුව සඳහා නව සාමාජිකයන් ලෙස සංශෝධනය කලයුතු බවය. ඒ අනුව ගරු සභාපතිතුමා දන්වා සිටියේ ඒ මහතාගේ අදහස අනුව නිවැරදි කලයුතු බවය.

- පොත් රාක්ක ලබාදෙන ලෙස ඉල්ලා ඇති පුස්තකාල සඳහා පොත් රාක්ක සාදා නිමකර ඇති බැවින් ඒවා ලබාදීම සිදුකල හැකි බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදි.

- පොල්වත්ත ශාඛා පුස්තකාලයේ පුවත්පත් බැලීමට ඇති මේසය ඉඩකඩ ප්‍රමාණය මදි බැවින් එම ශාඛා පුස්තකාලයෙන් ඉවත් කරදෙන ලෙස ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා පුස්තකාල කමිටුවට දන්වන ලද අතර එහි දී ගරු සභාපතිතුමා යෝජනා කළේ එම මේසය භාවිතයට ගැනීමට සුදුසු මට්ටමක නොමැති නම් එය භාණ්ඩ සමීක්ෂණයේ දී ගබඩාවට භාරදෙන ලෙසය.

- මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ වහල කැඩී ඇති බැවින් එය සාදා දෙන ලෙස හර්බට් වීරක්කොඩි මහතා ඉල්ලා සිටි අතර තාක්ෂණ නිලධාරීතුමා පුස්තකාල කමිටුවට පැමිණි බැවින් එය ඉක්මණින් සාදා දෙන ලෙස ගරු සභාපතිතුමා ඒ මහතාට උපදෙස් ලබාදෙන ලදි.
- තවද සියලුම ශාඛා පුස්තකාල සඳහා තීන්ත ආලේප කිරීමට කටයුතු කරන ලෙසද උපදෙස් ලබාදෙන ලදි. ඒ සඳහා පළමුවෙන්ම මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයෙන් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස එතුමා කමිටුවට දන්වන ලදි.

- විද්‍යුත් පුස්තකාලයේ බිල වැඩිවීම සම්බන්ධයෙන් පසුගිය මස පැවැති කමිටු රැස්වීමේදී සාකච්ඡා කල අතර එහි දී රු.1490.00 මාසික ගාස්තු සඳහා ඇති පැකේජය භාවිතා කිරීම සුදුසු බව කමිටුවේ තීරණය විය.

- පෝරම්බ ශාඛා පුස්තකාලයේ පුටු කුෂන් කිරීම සඳහා ටෙරන්ස් මහතා සහ එම ශාඛා පුස්තකාලය භාර ඒ.ජී. ලක්ෂ්මී කාන්තා පෙරේරා මෙනවිය විසින් මුදල් යොදා එය අවසන් කල බව එන්.එච්. ධන්කන් මහතා පුස්තකාල කමිටුවට දන්වන ලදි. ඒ සඳහා ගරු සභාපතිතුමා ස්තුතිය පුදකර සිටිය අතර එම මහත්ම මහත්මීන්ට ස්තුතිය පුදකර ලියුම් යැවීමට කටයුතු කරන ලෙස දන්වන ලදි.

- වෙනත් කරුණු.

- අලුතින් පොත් ලබා ගැනීම සඳහා රු. 250000/= ලබා දීමට හැකි බව ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට දන්වන ලදි. නවතම මුද්‍රණය සහිත නීතිය සම්බන්ධ පොත් ලබා ගැනීමට සුදුසු බව කමිටුවේ තීරණය විය.

- ලෝක ළමා දින වැඩසටහන, ජාතික කියවීමේ මාසයේ උත්සවය සහ ශාසනාරක්ෂක බල මණ්ඩලය මගින් පැවැත් වූ උත්සවයට මෙන්ම මෙවැනි උත්සව සංවිධානය කිරීමට ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය වන ඩී.වාසනා තරංගි මහත්මියට සහ එයට සහයෝගය ලබාදුන් සියලුම කාර්ය මණ්ඩලයට පෞද්ගලික ස්තුතිය පිරිනමන බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදි.

- විශේෂ ස්තුතිය පුද කිරීම සඳහා හර්බට් වීරක්කොඩි මහතා පුස්තකාල කමිටුව ඇමතූ අතර එහි දී ඒ මහතා සඳහන් කළේ මෙම නගර සභාව දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබාදෙන බවත් එයට අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාට විශේෂ ස්තුතියක් පුද කිරීමට අදහස් කරන බවය.

- එන්.එච්. ධන්කන් මහතා ප්‍රධාන පුස්තකාලයට භාවිතා කිරීම සඳහා සාදා ඇති වැසිකිලි පද්ධතිය භාවිතයට ගැනීමට සුදුසු පරිදි සකස් කරදෙන ලෙස නගර සභාවේ තාක්ෂණ නිලධාරීතුමාගෙන් ඉල්ලා සිටි අතර ඒ මහතා එම ඉල්ලීම කඩිනමින් නිමකර දෙන බව දන්වා සිටින ලදි.

- පාඩම් කිරීමට පැමිණෙන ළමුන්ට අලුතින් අධ්‍යයන අංශයක් සාදා දීමට අදහස් කර ඇති බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදි. ඒ සඳහා සුදුසු ස්ථානයක් නම් කරන ලෙස පුස්තකාල සහායිකාවන්ට උපදෙස් ලබාදුන් පසුව කෙරමිණිය ශාඛා පුස්තකාලයට ලබාදීම සුදුසු බවට යෝජනා විය. එම ගොඩනැගිල්ල සෑදීමට අවශ්‍ය ඇස්තමේන්තුව සාදා දෙන ලෙස තාක්ෂණ නිලධාරීතුමාට ගරු සභාපතිතුමා උපදෙස් ලබාදෙන ලදි.

වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු අවසක් කරන ලදි.

.....................................

කමිටු ලේකම්

නගර සභාව අම්බලන්ගොඩ

| | |
|---|---|
| ........................................ | .................................... |
| **ලේකම්** | **අත්සන් කළේ සභාපති** |
| **නගර සභාව අම්බලන්ගොඩ** | **නගර සභාව අම්බලන්ගොඩ** |

**තීරණය -**

**2018.12.18 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රීනි පේෂලා කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.05 2018.12.21** දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභා ගත කිරීම.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2018.12.21 දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.

මූල්‍යකමිටුව

**2018-12-21** දින ප.ව.2.30

සහභාගීත්වය

| | | |
|---|---|---|
| 1. | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 2. | ධම්මික කොඩිකාර මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 3. | ඇම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 4. | බී.ඒ.ධම්මිකා මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මූල්‍ය කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් , නගර සභා ලේකම්, ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිලිගන්නා ලදී.

අනතුරුව එදිනට කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සඳහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදී.

| **ගෙවීම් ලබන්නාගේ නම** | **මිලදීගෙන ඇති භාණ්ඩ පිලිබද** | |
|---|---|---|
| | **විස්තර** | **මුදල රු.** |
| 01. අරුණගෑස්සෙන්ටර් (ඇනවුම-1996) | ආදාහනාගාර සඳහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.6050 බැගින් 08 ක් ) | 43,560.00 |
| 02.සභාපති නගර සභාව අ/ගොඩ ගි.අ.0351001106295876 බැර | නගර සභා ප්‍රතිපාදන යටතේ රණසූරිය පාර පෙට්ටි බෝක්කුව ඉදි කිරිම සඳහා ගෙවීම් කිරිමට පොදු ගිණුමින් ප්‍රාග්ධන ගිණුමට මුදල් මාරු කිරීම | 1560000.00 |
| 03. ජී.සැම්සන්ඇන්ඩ්සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ( ඇ.අ.1982) | පෙර පාසැල් ලමුනු සඳහා DSI සපත්තු වෙනුවෙන් DSI වවුචර් ලබා ගැනීම (රු.1000*127) | 127000.00 |

| | | |
|---|---|---|
| 04. සභාපති පනියන්දූව ප්‍රජා මණ්ඩලය | කෙරමිණිය පතිරාජපාර සංවර්ධනයේ 10% රඳවුම් මුදල නිදහස් කිරීම | 58361.98 |
| 05. සභාපති සමගි ප්‍රජා මණ්ඩලය | හිරිකැටිය හරස්පාර සංවර්ධනයේ 10% රඳවුම් මුදල නිදහස් කිරීම | 39052.30 |
| 06. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2018 නොවැ.16-30 දක්වා VAT ගෙවීම | 704536.06 |
| 07. විදුහල්පති ,ගා/ ධීරානන්ද මහාවිද්‍යාලය, බූස්ස | නගරාධිපතිකුසලානවයස අවු.16 න් පහල පාපන්දු බාලක ශුරතාවයේ මුදල් ත්‍යාගය | 10000.00 |
| 08. විදුහල්පති ,ගා/ සිද්ධාර්ථ මහා විද්‍යාලය, බලපිටිය | නගරාධිපති කුසලාන වයස අවු.16 න් පහල පාපන්දු බාලිකා ශුරතාවයේ මුදල් ත්‍යාගය | 10000.00 |
| 09. ලුමිනෙක්ස් ග්‍රොසස් ප්‍රයි.ලිමිටඩ් (ඇනවුම් අංක 1937) | සාහිත්‍ය උත්සවයේ තිළිණපත් සඳහා ගෙවීම (රු.850*64 හා 425*16) | 61200.00 |
| 10. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් | සභාව සතු වාහන වල රක්ෂන ගාස්තු ගෙවීම (PF-7424,QL-6618,ll-6406) | 80902.50 |
| 11. එස්.එම්.සරත්වන්Ø සිල්වා | නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්වන්Ø මහතාගේ 2018 අප්‍රේල් සිට ඔක්. දක්වා දුරකථන බිල් ප්‍රතිපූර්ණය | 10066.89 |
| **12.** . සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය | සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන්නොවැ. 01-15 දක්වා ඉන්ධන බිල | 152330.50 |
| 13. සී/ස ලංකා විදුලි පෞද්.සමාගම | 2018 අගෝස්තු විදුලි බිල | 86865.64 |
| 14. සී/ස ලංකා විදුලි පෞද්.සමාගම | 2018 සැප්තැ. විදුලි බිල | 122782.18 |
| 15. සරප්- නගර සභාව අම්බලන්ගොඩ | ලියාපදිංචි කර බදවා ගත් සේවකයින් සඳහා ඔක්. හා නොවැ. මස දීමනා ගෙවීම | 212250.00 |
| 16. ජාතික ජලසම්පාදන හා ජලාපවා- - හන මණ්ඩලය | 2018 ඔක්. මස ජල ගාස්තු (සභාව සතු ආයතනයන්හි ) | 79308.59 |
| 17. LRDC සර්විසර්ස් ප්‍රයි.ලිමිටඩ් | 2018 ඔක් . මස ආරක්ෂක අංශයේ වැටුප් ගෙවීම (සේවා මුර 165 ක් සඳහා ) | 221633.98 |
| 18. ප්‍රමිලා නදීෂිකා | අයවැය ලේඛණයන්හි වර්ණ පිටු මුද්‍රණය සඳහා ලබාගත් අත්තිකාරම පියවීම (පොත් 01 කට වර්ණ පිටු 15 බැගින් පොත් 25 ක් සඳහාත්, පිටකවර 40 ක් සඳහාත් ) | 28455.00 |
| 19. මධුමි විජේසිංහ | ZA-5185 දරණ බැකෝලෝඩරය අලුත්වැඩියාවේ අත්තිකාරම පියවීම | 8280.00 |
| 20. බී.ඒ. ධම්මිකා | නගර සභාවේ හිටපු සභාපති වරයෙකු වූ ජී.එම්.එස් ද සිල්වා මහතාගේ අවමංගල උත්සව සංවිධානය සඳහා අත්තිකාරම් ලබා දීම | 25000.00 |
| 21. එච්.පී.මිහිරිඳ සිල්වා | නගර සභාවේ හිටපු සභාපති වරයෙකු වූ ජී.එම්.එස් ද සිල්වා | |

| | | |
|---|---|---|
| | මහතාගේ අවමංගල උත්සව සංවිධානය සඳහා අත්තිකාරම් ලබා දීම | 25000.00 |
| 22. ඉසුරු මෝටර්ස් | සභාව සතු මාර්ග තලනය අලුත්වැඩියාව | 63250.00 |
| 23. ප්‍රමිලා නදීෂිකා | අයවැය ලේඛණයන්හි වර්ණ පිටු මුද්‍රණය සඳහා අත්තිකාරම් ලබා ගැනිම | 25000.00 |
| 24. එම්.ඩබ්.රජිතා දිල්රුක්ෂි | සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සභාවතුල අලුත්වැඩියාව සඳහා අත්තිකාරම් ලබා දිම | 25000.00 |
| 25. ඩී.වී.තරංගි | පලාත් පාලන ක්‍රීඩා උළෙල සඳහා සහභාගි වන සේවක මහත්ම මහත්මීන්ට සංග්‍රහ සඳහා අත්තිකාරම් ලබා දිම | 30000.00 |
| 26. හර්ෂණ ලක්මාල් | සභාව සතු PF-7424, RA-8796,SL-5694 දරණ වාහන සඳහා ආදායම් බලපත්‍ර වෙනුවෙන් ගෙවීමට අත්තිකාරම් ලබා දිම | 12480.00 |
| 27. ස්ටාර් ලයින් හාඩ්වෙයාර් | කලුවඩුමුල්ල ක්‍රීඩා පිටිය අලුත්වැඩියාවට අවශ්‍යා උපකරණ ගැනීම | 24250.00 |
| 28. ලුම්නෙක්ස් ග්‍රොසස් (ප්‍රයි.) ලිමිටඩ් | පුස්තකාල කමිටු තීරණය අනුව පොල්වත්ත ශාඛා පුසුතකාලයට අධ්‍යාපනික පොත් ගැනීම | 10000.00 |
| 29. ඩී.වී.තරංගි | පළාත් පාලන ක්‍රීඩා උළෙලේ සංග්‍රහ වෙනුවෙන් ලබාගත් අත්තිකාරම පියවීම | 23711.00 |
| 30. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන | ගලිලෝඩ් 25 ක් සඳහා ගෙවීම | 25875.00 |
| 31. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | නොවැම්බර් මස දුරකථන බිල් | 26296.70 |
| 32. පී.එච්.සී.ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ (ඇ අංක 1977) | මාර්ග ප්‍රතිසංස‘කරනයට අවශ්‍යා ගල් ගැනීම (1 ½ ගල් 6000*8.4,3/4 ගල් 6000*4.2 චිප් ගල් 7000*2.1) | 90300.00 |
| 33. එච්.ටී.මෙන්ඩිස් | 2019 සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචියේ පුවත්පත් දැන්වීම්03 සඳහා ගෙවීම | 152212.50 |
| 34. සභාපති නගර සභාව අ/ගොඩ ගි.අ.0351001106295876 බැර | කැටන්තොට පෙර පාසලේ ළමා ක්‍රීඩා පිටිය සඳහා ගෙවීම් කිරීමට අදාල මුදල පලාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පොදු ගිණුමට බැර කිරීම නිසා එම මුදල පොදු ගිණුමින් ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීම | 1560000.00 |
| 35. සභාපති, නගර සභාව අම්බලන්ගොඩ | ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ලබාදෙන ලද චෙක්පත අගරුවීම ගැලපීම | 10413.00 |
| 36. එම්.ඩබ්.රජිතා | සභාව සතු වාහන අලුත්වැඩියාවට ලබා දුන් අත්තිකාරම පියවීම | 25000.00 |
| 37. සරප්- නගර සභාව අම්බලන්ගොඩ | ලියාපදිංචි කර බඳවා ගත් සේවකයින් සඳහා ඔක්. හා නොවැ. මස දීමනා ගෙවීම | 36000.00 |

| | | |
|---|---|---|
| **38.** සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය | සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන්නොවැ. 16-30 දක්වා ඉන්ධන බිල | 145151.00 |
| 39. හර්ෂන ලක්මාල් | සභාව සතු PF-7424, RA-8796,SL-5694 දරණ වාහන සඳහා ආදායම් බලපත්‍ර වෙනුවෙන් ගෙවීමට ලබා දුන් අත්තිකාරම පියවීම | 12480.00 |
| 40. එන්.එච්.එල්. ආර් ද සිල්වා | මහජන ක්‍රීඩාංගනයේ විසිරි ජල පද්ධතිය ස්ථාපිත කිරීමේ උත්සවය සඳහා අත්තිකාරම ලබා දිම | 15000.00 |
| 41. උදය පුෂ්ප ඉලෙක්ට්‍රිකල්ස් (ඇ.අංක 1980) | CFL 20 W බල්බ 500 (420*500) | 210000.00 |
| 42. නලින් ප්‍රමෝෂන් | පළාත් පාලන ක්‍රිඩා උළෙල සඳහා ටී ෂර්ට් ලබා දිම (650*200) | 130000.00 |
| 43. තුෂාන් ලිමෝල (කාර්.නි.පත්‍රිකා 0463) | පුස්තකාල සඳහා අවශ්‍ය ලී ඉරා රාක්ක 18 ක් සෑදීම | 114712.50 |
| 44. පූර්ණා වෙළද සැල | පටබැදිමුල්ල ආදාහනාගාරයේ හදිසි අලුත්වැඩියා සඳහා තීන්ත මිලදි ගැනිම | 30490.00 |
| 45. අයේෂා ඉන්ඩස්ට්‍රීස් (ඇ.අංක 1984) | පෙර පාසැල් ළමුන් සඳහා පාසැල් බෑග් ලබා දීම (510*127) | 64770.00 |
| 46. ලලාන්ස් ස්පෝට්ස් ගුඩ්ස් මැනිපf ැක්වර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කැටන්තොට පෙර පාසැලේ සෙල්ලම් මිදුල සඳහා උපකරණ සවිකිරීම | 998775.00 |
| 47. එම්.ඩබ්.රජිතා | සභාව සතු වාහන අලුත්වැඩියාවට ලබා දුන් අත්තිකාරම පියවීම | 25010.00 |
| 48. කේ.පී.චන්දන රුක්ෂාන් | 49-9421 දරණ ට්‍රැක්ටරයේ විදුලි දෝශ අලුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම | 35000.00 |
| 49. කේ.පී.චන්දන රුක්ෂාන් | RF-002 දරණ ට්‍රැක්ටරයේ අලුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම | 16000.00 |
| 50. එම්.එස්. වීරසිංහ | නගර සභා පුසුතකාල සඳහා පුවත්පත් මිලදී ගැනීම | 48370.00 |

පැමිණි සැමට ස්තුති කරමින් ප.ව.4.30 ට පමණ කමිටුවේ කටයුතු නිම කරන ලදී.

| | | |
|---|---|---|
| ...................................... | ............................................. | .................................................... |
| සකස් කලේ | ලේකම්, | ගරු සභාපති, |
| | බී.ඒ. ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් |
| | නගර සභාව , අම්බලන්ගොඩ | නගර සභාව , අම්බලන්ගොඩ |

**තීරණය -**

**2018.12.18 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මුල්‍ය කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.06 2018.12.19 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කිරීම.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2018.12.19 දින පැවැති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂකකමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.

<u>**පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**</u>

**2018.12.19 ප.ව.2.30**

<u>**සහභාගීත්වය**</u>

| | | |
|---|---|---|
| **01.** | ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| **02.** | ජී.ජී.ආර්.පී.කේ.ද සිල්වා මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| **03.** | එම්.පී.බී.ඩබ්.යූ.කුමාරි මහත්මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරිනී |
| **04.** | බී.ඒ ධම්මිකා මහත්මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| **05.** | බී.එච්.යූ.ඩබ්.ප්‍රනාන්දු මහතා | මහජන සෞඛ්‍ය පරීක්ෂක උතුර |
| **06.** | ඩී.එන්.ඉසෙඩ්.අබේසිරිවර්ධන මහතා | මහජන සෞඛ්‍ය පරීක්ෂක දකුණ |
| **07.** | ජේජී.ඩී.ඩී.හර්ෂනාත් මහතා | නියෝජ්‍ය වරාය කළමණාකාර,අම්බලන්ගොඩ ධීවරවරාය |
| **08.** | මහේෂ් ප්‍රනාන්දු මහතා | මහජන සෞඛ්‍ය පරික්ෂක, අම්බලන්ගොඩ උතුර. |
| **09.** | ඩී.එස්.ඊ.ගමගේ මහත්මිය | පවුල් සෞඛ්‍යසේවා නිලධාරී,නගර සභාව |
| **10.** | පී.එච්.එල්.සී.පුෂ්පරාණි මහත්මිය | සංවර්ධන සහකාර,අම්බලන්ගොඩ නගර සභාව. |
| **11.** | ඊ.ඒ.එස්.ද සොයිසා මහත්මිය | කළමණාකරන සහකාර.අම්බලන්ගොඩ නගර සභාව |
| **12.** | එම්.ඩබ්.එච්.එස්.චිත්‍රාවංශ මහතා | සෞඛ්‍යපරිපාලක, අම්බලන්ගොඩ නගර සභාව |
| **13.** | ඒ.අයි.සාරංග මහතා | සෞඛ්‍ය පරිපාලක, අම්බලන්ගොඩ නගර සභාව |

**පිළිගැනීම**

ගරු නගර සභා සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රිවරුන් , සියළු නිලධාරි මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග | සාකච්ඡා වූ කරුණු | තීරණය |
|---|---|---|---|
| ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම<br><br>මධ්‍යම පරිසර අධිකාරිය විසින් යොමු කරන ලද ලිපිය සභා ගත කිරීම | ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා | මාදම්පාවිල අභය භූමියට කසල බැහැර කිරීම සම්බන්ධව | ගැසට් නිවේදනයේ සඳහන් සියළුම ඉඩම් වන ජීවී දෙපාර්තමේන්තුවට අයත් නොවන අතර බොහොමයක් ඉඩම් නොබෙදූ කුඹුරු ඉඩම් වේ. ඉදිරියේදී මෙම සංශෝධනය සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කරන බව |
| කසල බැහැර කිරීම විධිමත් කිරීම | ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් | කසල බැහැර කිරීම පිළිබඳ සැලැස්ම ඉදිරිපත් | |

| | | | |
|---|---|---|---|
| | මැතිතුමා | කරන ලෙස සහ නොදිරන කසල මගින් ආදායමක් ලබා ගැනීම | |
| | සංවර්ධන සහකාර පී.එච්.එල්.සී පුෂ්පරාණි මිය | කසල වෙන් කර එකතු කිරීම සහ දිරන කසල දිනපතා ප.ව.1.00 ට බැකෝ යන්ත්‍රය මගින් ඩ්‍රම්ට්‍රක් රථයට පටවා රජගම මොන්රෝවියා වත්ත කසල අංගනයට යැවීම සහ නොදිරන කසල හල්වතුර කසල අංගනයේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ ගබඩා කිරීම. | ඒ අනුව අවශ්‍ය කටයුතු කිරීම |
| සෞඛ්‍ය අංශය සඳහා හැන්ඩ් ග්ලවුස් සහ කැන්වස් සපත්තු අවශ්‍ය බව | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි.සාරංග මහතා | ග්ලවුස් නොමැති බැවින් කසල එක්රැස් කිරීමේදී සේවකයින් අපහසුතාවයට පත්වන බව | හැකි ඉක්මණින් ග්ලවුස් සහ කැන්වස් සපත්තු සපයා දිය යුතු බවසහ ගාල්ල ලූමිනෙක්ස් ආයතනයෙන්අඩුමිළට ලබාගතහැකිබව |
| මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා උසාවියේ නඩුවක් ගොනුකර ඇති බව | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | මහජන සෞඛ්‍ය පරීෂක මහතා විසින් සභාපති සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සතුව ඇති බලතල භාවිතා කරමින් උසාවියේ නඩුවක් ගොනුකර තිබීම | නඩු පැවරීමේ බලතල කිසිසේත් මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාට ලබා නොදෙන බව |
| ස්තුති කතාව | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | අද දින කමිටුවට සහභාගී වූ සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන බව. | |

සකස් කළේ

කළමනාකරණ සහකාර

නිර්දේශ කරමි.

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අනුමත කරමි.

සභාපති
අම්බලන්ගොඩ නගර සභාව.

**තීරණය -**

**2018.12.19 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**06.07 2018.12.20 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කිරිම.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2018.12.20 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව යෝජනා කර සිටිනවා.

<u>**2018.12.20 දින පැවති කළමණාකරණ කමිටුවේ වාර්තාව**</u>

<u>**සහභාගිත්වය -**</u>

- ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති, නගර සභාව, අම්බලන්ගොඩ
- කමල් වැල්ලගේ මහතා - ගරු උප සභාපති, නගර සභාව, අම්බලන්ගොඩ
- බී.ඒ.ධම්මිකා මිය - ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ
- එච්.පී.මිහිරි කාන්ති ද සිල්වා - ප්‍රධාන ආදායම් කළමණාකරණ සහකාර
- එස්.සි. දයාරංසි - ආදායම් කළමණාකරණ සහකාර
- කේ .පියරත්න මහතා - ආදායම් පරික්ෂක
- කේ.වන්න මහතා - ආදායම් පරික්ෂක
- හිමාල් ගුණවර්ණ මහතා - වැඩ පරිපාලක
- පි.එච්.එල්.සි.පුෂ්පරාණී - සංවර්ධන සහකාර
- ඩී.එච්.සඳුන් දිනේෂාන් - තාක්ෂණ සේවා නිලධාරි
- එච්.අයි.ද සිල්වා නිලමනි - තාක්ෂණ සේවා නිලධාරි
- කේ.එම්.මල්කි - කළමණාකරණ සහකාර
- ප්‍රභාවි නානායක්කාර - සංවර්ධන නිලධාරි
- කේ.ටි.රසිනි නිලූෂිකා - සංවර්ධන නිලධාරි

ගරු සභාපතිතුමා විසින් ප්‍රථමයෙන්ම නගර සභාවේ ලේකම්තුමිය ඇතුළු නගර සභා නිලධාරින් පිලිගනු ගනු ලැබු අතර ඉන් අනතුරුව න්‍යායපත්‍රානුකූව පළමුව එක් එක් අංශවල ගැටලු සම්බන්ධයෙන් සාකච්ජා කිරිම ආරම්භ කරන ලදි.

ප්‍රථමයෙන්ම ආදායම් අංශයේ හිඟ ආදායම් බදු අයකර ගැනිම සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි.

<u>ලේකම්</u>

2017.12.31 දිනට හිඟ වරිපනම් බදු රු.134,141,196.64 ඇති බවත් එම මුදලින් 2018.11.30 දිනට රු. 2,042,998.00 ක මුදලක් අයවී ඇති බවත් පවසන ලදි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා</u>

වරිපනම් බදු හිඟ සම්බන්ධයෙන් හිඟ බදු මුදල් අයකර ගැනිම සඳහා යම්කිසි වැඩපිළිවෙළක් යෙදිය යුතුයි

<u>ආදායම් පරීක්ෂක පියරත්න මහතා</u>

මේ සම්බන්දව කොට්ඨාශ මට්ටමින් සභාවේ මන්ත්‍රීවරු කොට්ඨාශ මට්ටමෙන් පත් කර ඉදිරියේදි ඉදිරිපත් කරන බවට සභාවෙන් තින්දු කරලා තියෙනවා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

මෙය දැන්වීම් පළ කර සුදුසු අය තෝරා ගන්න. මෙසේ කොට්ඨාශ මට්ටමින් මන්ත්‍රීවරු විසින් පත් කිරිම ගැටලුවක් .මෙය ක්‍රියාත්මක කළ නොහැකියි. ජංගම සේවයක් මගින් හෝ බදු එකතු කිරිමට සුදුසුකම් ඇති අය කැඳවන්න

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

ප්‍රාදේශිය ලේකම් අනුමැතිය ලබා ගෙන සමිතියකට වුවද මෙය කළ හැකියි.තනි පුද්ගලයෙක්ට දෙනවට වඩා සමිතියකට දෙන එක වගකිමක් තිබෙනවා

**<u>ලේකම්.</u>**

ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතුයි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

කොට්ඨාශ මට්ටමින් එකතු කිරිම සඳහා දැන්වීම් පළ කර සුදුසුකම් ලත් පුද්ලයන් ලබා ගන්න

**කමිටු තිරණ අංක 01.01**

**කොට්ඨාශ මට්ටමින් හිඟ බදු මුදල් එකතු කිරිමේ කාර්යය සඳහා දැන්වීම් පළ කර සුදුසුකම් ලත් පුද්ලයන් ලබාගැනිම සුදුසු බවත් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන සමිතියක් මගින් වුවද ලබා ගැනිම සුදුසු බවට තීරණය කරන ලදි.**

දෙවනුව වෙළඳ බදු (නඩු පැවරිම) සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

වෙළඳ බදු (නඩු පැවරිම) සම්බන්ධයෙන් ගැටලු මොනවද

**<u>ආදායම් පරික්ෂක චන්න මහතා</u>**

නඩු දාලා තියෙන්නෙ

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

වෙළඳ බදුවල හිඟයක් තියෙන්න බැහැ.

**<u>ආදායම් පරික්ෂක</u>**

හිඟ ලැයිස්තු ලබා දිම පිළිබඳ ගැටලුවක් පසුගිය අවුරුද්දෙ සිදුවි තිබුනා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

අපේ පනත අනුව හිඟයක් නොතිබිය යුතු එකම ගාස්තුව වෙළඳ බලපත්‍ර පමණයි.6/31 දිනෙන් පසු නඩු පවරන ලෙස පනතේ දක්වා තිබෙනවා.ඒවගේම උරුමකරුවෙක් සොයා ගැනිමට නොහැකිනම් 9( උරුමකරු මියයාම, කළත්‍රයා නොමැති ආදි කරුණු ) සභාවට වාර්තාවක් ලබා දෙන්න.එය ප්‍රාදේශිය ලේකම් සහතික කරන්න ඕන.කපා හරින්න කියලා සභාවට ඉදිරිපත් කරන්න ඕන.හිඟය ඇතිවිමට හේතුව කුමක්ද

**<u>ආදායම් පරික්ෂක</u>**

අපට ලබා දුන් හිඟ ලේඛණය නිවැරදි නැහැ.සැමදාම ගෙවන පිරිසක් සිටින අතර ඔවුන්ගේ නම්ද මෙහි සටහන් වි තිබු බැවින් ගොස් පරික්ෂා කිරිමේදි අපට වැටහුණා .

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ප්‍රධාන ආදායම් කළමණාකරණ සහකාර උත්තරයක් තියෙනවද මේ සම්බන්ධව

**ලේකම්**

ගෙවූ අයගේ ඒවා සටහන් වී නැහැ

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා**

හැම ලැයිස්තුවක්ම අපට ලබා දෙන්න.එසේ වරදක් සිදු වී ඇත්න subject clerk ගෙන් අයකර ගන්න.මේ පිළිබඳව සොයා බලන්න

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා**

වෙළඳ බලපත්‍ර විෂය ලිපිකරු නිවාඩු ගොස් ඇති අතර මේ විෂයට කවුරුවත් යොදවලා නැ නේද .ඒකට කවුරුහරි අනුයුක්ත කරන්න ඕන නේද

**ලේකම්**

අවසාන ගිණුමට තොරතුරු ලබා දිය යුතු බැවින් අනෙක් අංශවලින් මෙම දිනවල නිලධාරින් ගැනිමට අපහසු වී තිබෙනවා

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා**

නගර සභාවට ලබා දී ඇති system (ආදායම් වියදම් පරිගණක වැඩසටහන)ක්‍රියාත්මක කරන්න.ලක්ෂ 06 ක් පමණ වියදම් කර මෙය ලබා දුන්නා.අවුරුදු 05 ක් වෙනකම් මේ තියෙන ප්‍රශ්නයට උත්තරයක් නැහැ.දියුණු ක්‍රමයකට යාම සඳහා අප ගිය සභාවේදි සිට මෙය කළා.මෙතෙක් එය ක්‍රියාත්මක නැත්තේ ඇයි.එවිට මෙම තොරතුරු සියල්ල ලබා ගත හැකියි.

**ලේකම්**

ඉහළ මාළයේ සිට පහළ මාලයට පැමිණිම හේතුවෙන් පරිගණක ජාලය වෙනස් කිරිමට සිදුවුනා .එවිට ඇති වූ ප්‍රමාදය නිසා වෙන් මාසයක පමණ පරණ වැඩ Enter කරන්න සිදුවුනා

**පුෂ්පරාණී මිය**

පරිසර බලපත්‍ර සඳහා අයකරනු ලබන මුද්දර ගාස්තුව (පරිසර බලපත්‍ර ගාස්තුවට අදාළ අයකිරිම්වලින් 10%ක්) අය කරනු ලබන අතර එය මෙම system එක තුළ ඇතුළත් වී නැහැ.ඒක නිසා manual එය සිදු කරනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා**

තැපැල් කන්තෝරුවෙන් මුද්දර ගෙන අලවන්න කියන්න. අප විසින් මුදල් ගෙන චෙක් එක යවනවා වෙනුවට චෙක් එක නොයවා මුද්දර එම පුද්ගලයන්ට අලවන්න කියන්න චෙක් එක නොයවා .පරිසර බලපත්‍රය ලබා ගැනිමට පැමිණෙන පුද්ගලයන් විසින් තැපැල් කාර්යාලය මගින් මුද්දර රැගෙන ලවා එම කටයුත්ත කිරිම සඳහා උපදෙස් ලබාගෙන කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලදි.

ඉන් අනතුරුව හිග කඩකුලි සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා**

එක් දහස් නවසිය ගණන්වල ලක්ෂ 03 තක්සේරු කරන ලද කඩ අද අවු .28 පමණ පසුව 150000.00 පමණ තක්සේරු කරනවා.නමුත් ඇත්ත තත්ත්වෙ ලක්ෂ 30.නගර සභාව මීට වඩා අයකර ගැනිමට කටයුතු කරන්න.වරිපනම් බදුවලට වඩා ආදායම් ලබා ගන්න පුළුවන් මේ හරහා.අපි මේවා දුන්නෙ ලක්ස 4 2/1 .අවුරුදු 4 කින් ගෙවන්න දුන්නෙ ( පොළී රහිතව).මීට වඩා ඔබලා තක්සේරු කරන්න

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා**

මාසෙට 200 තියෙන ඒවා මාසෙට 3000.00 වත් ගන්න කියලයි අපි කියන්නෙ

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

මේ වසරේදි වරිපනම් ගාස්තු අඩුකර මේ පැත්ත වැඩිකලේ ඒ නිසයි.ඔයාලා තක්සේරු කරන්නනෙ අඩුවෙන්.ඔයාලා තක්සේරුව දෙන්න හැම තක්සේරුවක්ම සභාවේ අනුමත කරනවා.වැඩිම ආදායමක් බවට මෙය පත් කළ හැකියි.මෙ හරහා නගර සභාවේ ආදායමට ලොකු ආදායමක් ලබා ගන්න පුළුවන් .හිඟ කඩකුලී කියක් තියෙනවද

**<u>ආදායම් පරික්ෂක</u>**

හිඟකඩ කුලි ලක්ෂ 11 තියෙනවා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

සිල් කරන්න කියලා තින්දු කරන්න. මම අනුමත කරනවානෙ.ලක්ෂ 11 තියෙන්න විදියක් නැනෙ.

**<u>ආදායම් පරික්ෂක</u>**

අන්තිමට සිල් කරේ ආනන්ද ඩයස්ගේ කඩේ

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ඒ සම්බන්ධ ප්‍රශ්න ගොඩක් තියෙන නිසා මම මේ ගැන කිව්වෙ.ඇයි සිල් කරන්නෙ නැත්තෙ.වැඩිම හිඟ තියෙන නම් ටික කියන්න.රු.50000.00 ට වැඩි ඒවා විතරක් කියන්න

**<u>ආදායම් අංශ ප්‍රධානි දයාරංසි මිය</u>**

ආර්.එම්.මහේෂ් මහතා, ඩබ්.ජී.කරුණාදාස මහතා, වරුෂවිතාන නිර්මාලී මිය, ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා, කේ.වානක ලසන්ත ද සිල්වා මහතා,පේදුරුහේවා ජයසේන මහතා, කේ.කේ.ආර්.එම්. ද සිල්වා මහතා, කේ.එම්.වසන්ත කුමාර මහතා, ඩබ්.ඒ.ආනන්ද ඩයස් මහතා, ආර්.ජේ.එම්.පුෂ්පකුමාර මහතා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ලක්ෂය ඉක්මවා ගිය ඒවා තියෙනවද

**<u>ආදායම් පරික්ෂක</u>**

නැහැ. මේ සම්බන්ධව විෂය භාර මිස් අවසාන නිවේදන යවලා තියෙනවා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ඔයාලා නිත්‍යානුකූලව කටයුතු කරන්න

**.<u>ආදායම් අංශ ප්‍රධානි දයාරංසි මිය</u>**

තානායම් කුලි මාස 02 හිඟයක් තියෙනවා.නමුත් පසුගිය ගිණුම්වල ලක්ෂ 83 ක හිඟයක් පෙන්වනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

Accountant කෙනෙක් ගෙන්න ගන්න ඉල්ලීම් කරන්න

**<u>ලේකම්</u>**

ලක්ෂ 304 ක් මුද්දර ගාස්තු හිඟ තියෙනවා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

හිඟ මුද්දර ගාස්තු සඳහා නැවත ඉල්ලීමක් මගේ අත්සනින් ඉදිරිපත් කරන්න. ප්‍රධාන ඇමතිතුමාට ලිපියක් සකස් කර මට එවන්න

**කළමණාකරණ කමිටු තිරණ 01.02 තිරණය**

**මුද්දර ගාස්තු හිඟ ගෙන්වා ගැනිම සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමන් වෙත යැවිම සඳහා ලිපියක් සකස් කර ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කරන ලෙසට තිරණය කරන ලදි.**

අනතුරුව ගිණුම් අංශයේ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර ඒ සම්බන්ධව පවතින බාධාවන් මොනවාද යන්න සම්බන්දව ගරු සභාපතිතුමා විසින් විමසන ලදි .අවසාන ගිණුම් ලබා දිම සහ බැංකු සැසඳුම් පිළියෙල කරදිම අදාළ දිනට සිදුකිරිම සම්බන්ධයෙන් අංශ ප්‍රධානින දැනුවත් කරන ලදි.

**<u>ලේකම්</u>**

ජනවාර 15 ට  පෙර ගිණුම් සඳහා තොරතුරු ලබා දෙන ලෙසට අංශ ප්‍රධානින් දැනුවත් කරන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා</u>**

දෙන ඕන කෙනෙක් එක්ක වැඩ කරන්න උත්සාහ කරන්න ඕන .ගිණුම් අංශ ප්‍රධානි රෝෂිණි මිය යවනවානම් accountant කෙනෙක් එවන්න ඕන .

මේ සම්බන්ධව අංශ ප්‍රධානින්ට ගැටලු තිබේද .ආයුර්වේද සම්බන්ධව ගැටලු තිබේද.පරිසර විෂය  සම්බන්ධව ගැටුලු තිබේද

**<u>පරිසර විෂය, ආයුර්වේද වෛද්‍යතුමිය</u>**

නැහැ

භාණ්ඩ සමික්ෂණය නියමිත දිනට අවසන් කර වෙන්දේසි සහ අපහරණය කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකර වාර්තා ඉදිරිපත් කරන ලෙසට ද එහිදි දැනුවත් කරන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා</u>**

ගස්වල කඳන් ගොඩවල්  ඉවත් කරන්න. කඳන් ගොඩවල් මොකටද තියාගෙන ඉන්නේ.

**<u>ලේකම්</u>**

වෙන්දේසි කිරිමට පෙර දැව සංස්ථාවෙන් තක්සේරු කර වෙන්දේසි කිරිම කළ යුතු බැවින් දැව සංස්ථාවට දැනුම් දුන්නා එහි ක්ෂේත්‍ර නිලධාරි මහත්මයෙක් ඇවිත් ලි මැනගෙන ගියා.තවම වාර්තාව ලැබුනෙ නෑ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

අපට ප්‍රයෝජනයට ගන්න බැරිද

**<u>ලේකම්</u>**

එම තක්සේරු වාර්තාව ලබාගැනිමට අපි ගාස්තුවක් ගෙවිය යුතුයි. තවම ගාස්තුව සඳහන් කර එවිම සිදු කර නොමැති බව පවසන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා</u>**

කතා කරලා විසඳගන්න

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

දැව සංස්ථාවෙන් කියුබික් අඩිය මෙච්චර කියලා ලබා ගෙන අපි තාක්ෂණ සේවා නිළධාරි විසින් තක්සේරු වාර්තාවක් ලබා දෙන්න.මැනලනේ විකුණන්නෙ.එතකොට ගැටලුවක් නැහැ.එකේෂියාවල සාමාන්‍යයන් කියුබික් අඩියක් කියද බලන්න.දැව සංස්ථාවෙන් මෙය ඕනම අවස්තාවක ලබා ගත හැකියි

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

එතන ගාණට වඩා රු.50.00 ක් වැඩිකර ලබා දෙන්න.දැව සංස්ථාවෙන් මෙය ඕනම අවස්තාවක ලබා ගත හැකියි

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

තාක්ෂණ සේවා නිලධාරි සඳුන් මහතා ඔබ මේක කරන්න

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

කර්මාන්ත අංශයේ ගැටලු පිළිබඳ සාකච්ජා කිරිමේදි මෙතෙක් අවශ්‍යතාවයන් අනුව ඉංජිනේරු වාර්තා නොමැතිව පොඩි පොඩි Repair කරා. විගණන පනතට අනුව සියල්ල සම්පූර්ණ කළයුතු වෙනවා..වාහනය කැඩිලා හදන්න ගෙවන්න තියෙන බාධක මොනවද.අපේ ඉංජිනේරු මහත්තයගේ වාර්තාව පිළිගන්න බැරි ඇයි

වැඩ පරිපාලක

Roller එක මෙහේ හදන්න බෑ.කඩුවෙල හෝ ජාඇල අරගෙන යන්න ඕන.පටවලා අරන් යන්න ඕන.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ඒක ගෙවන්න බැරි ඇයි

**<u>ප්‍රභාවි මිය</u>**

ඒක ගෙවන්න පුළුවන් .සර් දාලා තියෙන්නෙ මුල්‍යා කමිටුවට යොමු කරන්න කියලා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

මුල්‍යා කමිටුවට යටත්ව ගෙවන්න අනුමත කරන්නම්.අද වුණත් ගෙවන්නම්

සරප් නිවාඩු ලබා ගැනිමේදී නිසිපරිදි රාජකාරි පැවරිම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සම්බන්ධයෙන් අනතුරුව සාකච්ජා කරන ලදි

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

මොකක්ද ප්‍රශ්නය

**<u>මිහිරි මිය</u>**

මුදල අනිවාර්යයෙන්ම භාරදිලා යන්න ඕන

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

නිවාඩු දිම පිළිබඳ ප්‍රශ්නයක් නෑ නේද .වැටෙන සල්ලි බැංකු ගත කරන්නේ කවදාද

**<u>ලේකම්</u>**

අද සල්ලි හෙට බැංකුවේ දාන්නෙ

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

Mechine එකේ දාන්න පුළුවන් නේද .සරප් විසින් එම දිනය තුළදි එකතු වන මුදල් එදිනම අදාළ බැංකවට ටෙ‍්‍රලර් යන්ත්‍රය මගින් මුදල් දැමිය හැකි බැවින් උපදෙස් ලබා මේ කටයුත්ත කිරිම සුදුසු බවත් මේ සම්බන්ධව ක්‍රියාකිරිමේදි අදාල නිලධාරියා වෙත ආරක්ෂාව සැපයිම කල යුතු බවත් ප්‍රකාශ

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

මහජන බැංකුවේ දුරකථන අංකය ඉල්ලනවා.එයට සභාවේ දුරකථන අංකය ලබාදෙන්න.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා

සරප් අයිතිවන්නේ ගිණුම් අංශයටද

ලේකම්

ඔව්. පසුගිය කාලයේදි ආදායම් අංශය හැර සියලුම නිලධාරින් වැඩ ආවරණය සඳහා යෙදවිම කළා

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

වෙනත් විෂයන්වලින් යෙදවිමෙන් එම විෂයන්වල ගැටලු ඇතිවනවා

**කළමණාකරණ කමිටු තිරණ අංක 01.03**

**සරප් රාජකාරි ආවරණය සඳහා ගිණුම් අංශයෙන් නිලධාරියෙකු යෙදවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැලල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදි.**

මිළහට ගබඩාවේ භාණ්ඩ තොග අවසන් විමට ප්‍රථම ඇණවුම් කිරීම කල යුතු බවත් මාර්ග සංවර්ධනය සඳහා ප්‍රමාණවත් තාර නගර සභාවේ නොමැති බව සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි..

මෙහිදි දැනට පවතින තාර බැරල් සම්බන්ධව ප්‍රශ්නයක් නැගුණු අතර කලින් ඇණවුම් කර තිබිම කළ යුතු බව පෙන්වා දෙන ලදි.

මේ වන විට තාර බැරල් company එකකවත් නොමැති බවත් IOC එකේ විතරක් ලංකාවටම 300 ක් පමණක් ඇති බවත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා සහ ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් පෙන්වා දෙන ලදි.මෙහි පිළිගත් මිළ ගණන් වලට වඩා වැඩි බව ද දැක්වුහ.. තොග අවසන් විමට කලින් ඇණවුම් කිරිමටත් .එම මුදල් general Account එකෙන් ගෙවිම් කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ප්‍රකාශ කරන ලදි.

**කළමණාකරණ කමිටු තිරණ අංක 01.04**

**ගබඩාවේ භාණ්ඩ අවසන් විමට ප්‍රථම ගබඩා නිලධාරියා විසින් ඒ බව සැපයුම් නිලධාරියාට දැනුම් දිමට කටයතු කරන ලෙසට කළමණාකරණ කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදි.**

කර්මාන්ත අංශයේ රාජකාරි කරගෙන යාමේදි අවශ්‍යා භාණ්ඩ ලබ දෙන ලෙසටත් වැඩ පරික්ෂක හිමාල් මහතාත් තාක්ෂන සේවා නිලධාරින් විසින් ඔවුන්ට රාජකාරියේ යෙදිමේදි අවශ්‍යා භාණ්ඩ ලබා දෙන ලෙසට ඉල්ලිමක් කරන ලදි.එසේම ආයුර්වේද වෛද්‍යා තුමිය විසින් ආයුර්වේදය සඳහා ටැප් එකක් සවි කර දෙන ලෙසට ද ඉල්ලිමක් කරන ලද අතර අතර මෙම සියලු ඉල්ලීම් නොපමාව ඉටු කරන ලෙසට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දැනුම්දෙන ලදි.භාණ්ඩ අවසන් විමට කලින් ඇණවුම් කරන්න.

තාක්ෂණ සේවා නිලධාරි

අපට නිතර අවශ්‍යා වන ලිස්ට් එකක් දෙන්නද

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා

දෙන්න

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

ඒවා ලබා දෙන්න.ටොයිලට් හදලා දෙන්න කියලා කිව්වා .

තාක්ෂණ සේවා නිලධාරි

බඩු ලිස්ට් එක ගත්තා

වැටුප් විෂය නිලධාරිණිය ද 2019.02.01 සිට ස්ථාන මාරු ලබා ඇති බැවින් වෙනත් නිලධාරිණියක් පත් කිරිම සම්බන්ධව කමිටුවට ඉදිරිපත් කරන ලද අතර මෙහිදි ප්‍රධාන ආදායම් කළමණාකරණ තුමිය විසින් දැනට වැටුප් සකස්

කරනු WINDOWS ක්‍රමය වෙනුවට DOS ක්‍රමය මගින් වැටුප් සකස් කිරිම සුදුසු බවත් මෙය වෙනත් ආයතනවල ක්‍රියාත්මක වන ක්‍රමයක් බැවින් මෙම ක්‍රමය ඔස්සේ වැටුප් සකස් කල හැකි නිලධාරින් දැනට සභාවේ සිටින බවත් එසේ ක්‍රියාත්මක කිරිම සුදුසු බවටත් යෝජනා කරන ලදි.

කර්මාන්ත අංශය යටතේ සේවය කරනු ලබන සේවකයන් දෙදෙනෙකු විසින් සෙනසුරාදා ඉරිදා දිනවල රාජකාරියට පැමිණිම (එදින වැඩ දිනයක් වන )නිසි පරිදි සටහන් නොවී ඇති බවත් ඒවෙනුවෙන් වැටුප් ලබා දි ඇති බවත් ඒ පිළිබඳ ලේකම් මිය හා විෂය භාර නිලධාරිණිය දැනුවත් කල බවත් වැඩ පරික්ෂක මහතා විසින් පවසන ලදි.

<u>**ලේකම්**</u>

හිමාල් මයා ඒ පිළිබඳ වාර්තා කිරිමෙන් පසු අතිකාල හා නිවාඩු ගණනයේදි ඇඟිලි සලකුණු යන්ත්‍රය වේලාවන් අදාළ කර ගැනිමට ඇඟිලි සලකුණු භාර නිලධාරියාට ලිඛිතව උපදෙස් දුන් බව පවසන ලදි.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා**</u>

සමහර සේවකයන් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොකිරිම පිළිබඳ සොයා වාර්තා කරන ලෙසට ප්‍රධාන කළමණාකරණ සහකාර නිලධාරිණියට උපදෙස් ලබා දුනි

**කළමණාකරණ කමිටු තිරණ අංක 01.05**

**කර්මාන්ත අංශය යටතේ සේවය කරනු ලබන සේවකයන් දෙදෙනෙකුගේ සෙනසුරාදා ඉරිදා දිනවල රාජකාරියට පැමිණිම නිසි පරිදි සටහන් නොවි ඇති අතර ඒවෙනුවෙන් වැටුප් ලබා දී ඇත්ද යන්න පිළිබඳව යොයා බලා ක්‍රියා කරන ලෙසට දැනුම් දෙන ලදි.**

අනතුරුව වාහන සඳහා අදාළ ධාවන සටහන් නියමිත පරිදි ලබා දිම සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි.මේ සම්බන්ධව කටයුතු නොකරන ඕන කෙනෙකුගේ නිසි පරිදි ධාවන සටහන් ලබා දෙන තුරු වැටුප් නවත්වන ලෙස ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා දැනුම් දෙන ලදි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා**</u>

වැඩ කරන දවසේ රියදුරු ලියා අත්සන් කරන්න ඕන. මොන වාහනේ ගියත් ගිය දිනය තුළ එම දිනයේ යන රියදුරු අත්සන් කරානම් ඉවරයි.

<u>**කළමණාකරණ කමිටු තිරණ අංක 1.6**</u>

ධාවන සටහන් සම්පුර්ණ කර ලබා දෙන ලෙසට රියදුරු මහතුන් සඳහා ලිඛිතව දැනුම් දීම සුදුසු බවටත් එසේ ලබා නොදෙන රියදුරු මහතුන්ගේ වැටුප් නතර කිරිම සිදු කරන බවට ලිඛිතව දැන්වීම සුදුසු බවටත් කළමණාකරණ කමිටුව තීරණය කරන ලදි.

සභාවේ සෑම නිලධාරියෙක්ම නිවාඩු ලබා ගැනිමේදි නිවාඩු අනුමත කර ගැනිම කළ යුතු බවට මෙහිදි සාකච්ජා කරන ලදි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා**</u>

මෙය අනිවාර්යයෙන්ම කරන්න ඕන

<u>**ලේකම්**</u>

හදිසි අවස්ථාවලදි ටෙලිමේල් මගින් හා දුරකථනය මගින් දැනුම් දීම කරන්න පුළුවන් .හැකි තරම් අනුමත කරගෙන නිවාඩු ලබාගත යුතුයි.

සේවකයන් නිවැරදිව අත්සන් නොකරන ලද අවස්ථාවල ද වැටුප් ගෙවා ඇතැයි ප්‍රකාශ කිරිම සම්බන්ධයෙන් ද මෙහිදි නැවත සාකච්ජා කරන ලදි.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා**</u>

සේවකයන් නිවාඩු නම් පඩි කැපෙන්න ඕන.වැඩිපුර ගෙව්වනම් අයකර ගන්න ඕන.

එහිදි ජගත් එදිරිසිංහගේ වැඩිපුර ගෙවූ වැටුප අයකර ගැනිමටත් සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>

ඔහුගේ විශ්‍රාම වැටුප හදලා දෙන්න සභාපතිතුමනි

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා</u>

මට ලිපි ගොණුව ඉදිරිපත් කරන්න.මම ස්ථිර කරන්නම්

ලේඛණාගාරය සම්බන්ධයෙන් ද මෙහිදි සාකච්ඡා කරන ලදි.අනතුරුව සභා කාර්යාලය ඉහළට ගැනිම කටයුත්ත නොපමාව ඉටු කරන ලෙසට තාක්ෂණ සේවා නිලධාරි මහතුන් දැනුවත් කරන ලදි.

අනතුරුව සෞඛ්‍ය අංශයේ , පුස්තකාලවල ගැටලු සම්බන්ධයෙන් ද විමසන ලදි.ආ ායුර්වේදය සම්බන්ධයෙන් ටැප් එකක් සවි කිරිම සඳහා ඉතා ඉක්මනින් අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් වැඩ පරික්ෂක හිමාල් මහතා වෙත දන්වන ලදි.

ආයුර්වේදය පිරිසිදු කරන ලෙසට කරන කරන ලද ඉල්ලිමද ඉටු කරන ලෙස දන්වන ලදි.අනතුරුව මැතකදි පැමිණි තාක්ෂණ සේවා නිලධාරින් සඳහා අවශය භාණ්ඩ( පුටු දෙකක් , මේස දෙකක් ) ලබා දෙන ලෙසට සහ තවත් භාණ්ඩ අවශ්‍ය බවට ඉල්ලිමක් කරන ලදි.එම අවශ්‍යතා ද කඩිනමින් සපයා දෙන ලෙස ලේකම් මිය වෙත දැනුම් දෙන ලද අතර මෙම කාලය තුල දියුණු උපකරණ භාවිතා වන බැවින් එම උපකරණ නොපමාව ලබා දෙන ලෙසට දැනුම් දෙන ලදි. .තව දුරටත් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් බස් නැවතුම් පළ වැසිකිළියේ මැද බිත්තිය උස් කර සකස් කරන ලෙසටද දැනුම් දෙන ලදි.

සෞඛ්‍ය අංශයේ ගැටලු සම්බන්ධයෙන්ද සාකච්ඡා කරන ලදි. එමෙන්ම විගණන විමසුම් හා විගණන ඡේද වලට නොපමාව පැහැදිලි පිළිතුරු ඉදිරිපත් කළ යුතු බවත් විගණන ඡේදවල විස්තර පුෂ්පරාණි මියගෙන් ඉල්ලා ඇති බවත් එම තොරතුරු මෙතෙක් නොලැබී ඇති බවත් ලේකම්තුමිය දැනුවත් කරනලදි.කොම්පෝස්ට් නිපැයුම් යන්ත්‍රය ගබඩාකාමරයේ තැන්පත් කර ඇති බවත් මෙහිදි ප්‍රකාශ වු අතර මෙය පරීක්ෂා කරන ලදි ඉංජිනේරු මහතා ප්‍රකාශ කරන ලද්දේ ජිනසේන සමාගමේන් නිෂ්පාදනය කරන ලද යන්ත්‍රයක් බැවින් එම ආයතනයේ නිලධාරියෙක් ලවා පරික්ෂා කර බලා යන්ත්‍රය අලුත්වැඩියා කිරිම සුදුසු බවට යැයි තාක්ෂණ සේවා නිලධාරි මහතා විසින් කමිටුව දැනුවත් කරන ලදි.

<u>කළමණාකරණ කමිටු තීරණ අංක 1.7</u>

**ගබඩාකාමරයේ තැන්පත් කර ඇති කොම්පෝස්ට් නිපැයුම් යන්ත්‍රය පිළිබඳ ඉංජිනේරු මහතා විසින් දන්වා ඇති පරිදි ජිනසේන සමාගමේන් නිෂ්පාදනය කරන ලද යන්ත්‍රයක් බැවින් එම ආයතනයේ නිලධාරියෙක් ලවා පරික්ෂා කර බලා යන්ත්‍රය අලුත්වැඩියා කිරිම සුදුසු බවට කරන ලද ප්‍රකාශය අනුව එය ඉටු කිරිම සුදුසු බවට කළමණාකරණ කමිටුව විසින් තීරණය කරන ලදි.**

තව දුරටත් කර්මාන්ත සේවකයන් සඳහා අවශ්‍ය කාමරයක් සකස් කර දෙන ලෙසට තාක්ෂණ සේවා නිලධාරි විසින් ඉල්ලිමක් කරන ලද අතර එහිදි ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ප්‍රකාශ කරන ලද්දේ හිමාල් මහතා සිටින කාමරය වෙනුවට කාමරයක් සකස් කර දෙන ලෙසටයි.

අනතුරුව හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය පෙර පාසල් නිවාඩු කාලයේ කඩා ඉවත් කිරිම සුදුසු බැව් සාකච්ඡා කළ අතර එය අවදානම් බැවින් සභා සේවකයන්ට කළ නොහැකි බැවත් මිළ ගණන් කැඳවා සිදු කිරිම සුදුසු බවත් තාක්ෂණ සේවා නිලධාරි මහතා ප්‍රකාශ කරන ලදි.

අනතුරුව කළමණාකරණ කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

| | | |
|---|---|---|
| සකස් කලේ | ........................... | .................................. |
| ............................... | ලේකම් | සභාපති |
| කේ.ටී.රසිනි නිලූෂිකා | බී.ඒ.ධම්මිකා | ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් |
| සංවර්ධන නිලධාරි | නගර සභාව - අම්බලන්ගොඩ | නගර සභාව - අම්බලන්ගොඩ |

**තීරණය -**

**2018.12.20 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමණාකරණ කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.08 2018.12.24 දින පැවති කමිටු සාමාජිකයන් පත් කිරීමේ කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

<u>**2019 වර්ෂය සඳහා කමිටු සාමාජිකයන් පත් කිරීම සම්බන්ධ වාර්තාව**</u>

2018.12.24 වන දින පස්වරු 12.30 පැවති 2019 වර්ෂයේ කමිටු සාමාජිකයන් පත් කිරීමේ රැස්වීම අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල රැස්වීම් ශාලාවේදි පැවැත්විණි.

**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා | - | ගරු සභාපති , අම්බලන්ගොඩ නගර සභාව |
| ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව |
| එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| එච්.පී.මිහිරි කාන්ති ද සිල්වා මිය | - | ප්‍රධාන කළමණාකරණ සහකාර |
| යු.ජී.තරංගනී මිය | - | ආදේශක සභා ලිපිකරු |

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පළමුව පැමිණ සිටි පිරිස පිළිගන්නා අතර 2019 වර්ෂය සඳහා පුස්තකාල ,පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක ,ටෙන්ඩර්,ක්‍රීඩා,මුල්‍ය, ත්‍රිරෝද රථ හා රථවාහන , නිවාස හා ප්‍රජා සංවර්ධන ,ත්‍රිරෝද රථ, සංවර්ධන උපදේශන කමිටු සඳහා කමිටු සාමාජිකයන් පත් කිරීම සිදු කරන ලදී.

පළමුව පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු සාමාජිකයන් පත් කර ගැනීම සඳහා එක් එක් පක්ෂවලින් නම් යෝජනා කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**1. <u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු සාමාජිකයන්</u>**

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - සභාපති - අම්බලන්ගොඩ නගර සභාව
- ඒ. සරත් ශ්‍රීලාල් මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ඒ.ඩබ්.ජගත් කුමාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ඒ.පි.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙ.වි. - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- ඊ.ඉන්ද්‍රා අයිරාංගනී - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- ජී.ජී.ආර්. ජේෂලා කුමාරි මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- ධනසේන මාදුවගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

<u>නිලධාරීන් හා වෙනත් නියෝජිතයන්</u>

- බි.ඒ. ධම්මිකා මහත්මිය - ලේකම්, නගර සභාව අම්බලන්ගොඩ
- ඩී.එන්.ඉසෙඩ් අබේසිරිවර්ධන මහතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක , අම්බලන්ගොඩ දකුණ
- වෛද්‍ය වී.ජී.සී. ජීවනී මහත්මිය - පශු වෛද්‍ය නිලධාරිනී, අම්බලන්ගොඩ
- බී.එම්.යු.කේ ප්‍රනාන්දු (මහේෂ්)මහතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක , අම්බලන්ගොඩ උතුර
- පී.එම්. විජේසිංහ මෙනවිය - තාක්ෂණ සේවා නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව
- පීඑච්.එල්.සී.පුෂ්පරාණි මහත්මිය - සංවර්ධන සහකාර , අම්බලන්ගොඩ නගර සභාව
- ඊ.ඒ.එස්. ද සොයිසා මහත්මිය - කළමණාකරන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව
- එම්.ඩබ්.හිරාන් සංජීව මහතා - සෞඛ්‍ය පරිපාලක , අම්බලන්ගොඩ නගර සභාව
- ඒ.අයි. සාරංග මහතා - සෞඛ්‍ය පරිපාලක , අම්බලන්ගොඩ නගර සභාව
- එච්.පී. මහින්ද මහතා - කමිටු සාමාජික

## 2. <u>ටෙන්ඩර් කමිටු සාමාජිකයන්</u>

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති - අම්බලන්ගොඩ නගර සභාව
- කමල් වැල්ලගේ මහතා - ගරු උපසභාපති , අම්බලන්ගොඩ නගර සභාව
- ඒ. සරත් ශ්‍රීලාල් මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ලලිත් ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- නන්දන රාජපක්ෂ මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- මගගේ අතුල ප්‍රියන්ත මහතා - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

<u>නිලධාරීන් හා වෙනත් නියෝජිතයන්</u>

- බි.ඒ. ධම්මිකා මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ
- පී.එම්. විජේසිංහ මෙනවිය - තාක්ෂණ සේවා නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව
- එච්.එල්. ද සිල්වා නිලමුණි මහතා - තාක්ෂණ සේවා නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව
- ලක්මාලි රුවනි - සංවර්ධන නිලධාරී , අම්බලන්ගොඩ නගර සභාව

## 3. <u>මූල්‍ය කමිටු සාමාජිකයන්</u>

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති - අම්බලන්ගොඩ නගර සභාව
- ඒ. සරත් ශ්‍රීලාල් මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- මගගේ අතුල ප්‍රියන්ත මහතා - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- බි.ඒ. ධම්මිකා මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ

## 4. <u>කර්මාන්ත කමිටු සාමාජිකයන්</u>

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති - අම්බලන්ගොඩ නගර සභාව
- කමල් වැල්ලගේ මහතා - ගරු උපසභාපති , අම්බලන්ගොඩ නගර සභාව
- ඒ. සරත් ශ්‍රීලාල් මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

- ලලිත් ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- මගගේ අතුල ප්‍රියන්ත මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

**නිලධාරින්**

- බී.ඒ. ධම්මිකා මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ

## 5. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු සාමාජිකයන්

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති - අම්බලන්ගොඩ නගර සභාව
- ශ්‍රේෂන් කෙරමිණියගේ - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ඩී.ධර්මදාස මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ආර්.එම්.ලසන්ත මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ඩබ්.එම්. නිලානි මෙනවිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- ධනසේන මාදුවගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

**නිලධාරින්**

- බී.ඒ. ධම්මිකා මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ

## 6. ක්‍රීඩා කමිටු සාමාජිකයන්

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති - අම්බලන්ගොඩ නගර සභාව
- ලලිත් ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ඒ.ඩබ්.ජගත් කුමාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- ඩබ්.එම්. නිලානි මෙනවිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

**නිලධාරින් හා නියෝජිතයන්**

- බී.ඒ. ධම්මිකා මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ
- ඩී.එච්.සඳුන් ගුණවර්ධන මහතා - තාක්ෂණ සේවා නිලධාරි, අම්බලන්ගොඩ නගර සභාව
- එච්.එල්. ද සිල්වා නිලමුණි - තාක්ෂණ සේවා නිලධාරි, අම්බලන්ගොඩ නගර සභාව
- අශෝක කුමාර මහතා - ක්‍රීඩා භූමි උපදේශක , අම්බලන්ගොඩ නගර සභාව
- කසුන් ගාල්ලගේ මහතා - ප්‍රා දේශීය ලේකම් කාර්යාලය , අම්බලන්ගොඩ
- විදුහල්පති/ක්‍රීඩාභාර නිලධාරි - ගා/ධර්මාශෝක විද්‍යාලය , අම්බලන්ගොඩ
- විදුහල්පති/ක්‍රීඩාභාර නිලධාරි - ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය , අම්බලන්ගොඩ
- විදුහල්පති/ක්‍රීඩාභාර නිලධාරි - ගා/ප්‍රජාපති ගෝතමී බා.වි. , අම්බලන්ගොඩ
- විදුහල්පති/ක්‍රීඩාභාර නිලධාරි - ගා/කුලරත්න විද්‍යාලය , අම්බලන්ගොඩ
- විදුහල්පති/ක්‍රීඩාභාර නිලධාරි - ග/ගාමිණී විද්‍යාලය , අම්බලන්ගොඩ
- අම්බලන්ගොඩ සිංහ, රියෝ , ආදී සියළුම ක්‍රීඩා සංගමයන් නියෝජනය කරන ක්‍රීඩා පුහුණු මහත්ම / මහත්මින්

- ඩී.වී. තරංගී මහත්මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව

## 7. <u>පුස්තකාල කමිටු සාමාජිකයන්</u>

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති - අම්බලන්ගොඩ නගර සභාව
- ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- නන්දන රාජපක්ෂ මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ආර්.එම්. ලසන්ත මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ධනසේන මාදුවගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- ජී.ජී. පේෂලා කුමාරි මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

**නිලධාරින් හා නියෝජිතයන්**

- බී.ඒ. ධම්මිකා මහත්මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ
- ඩී.වී.තරංගි මහත්මිය - ප්‍රජා සංවර්ධන නිලධාරිනි, අම්බලන්ගොඩ නගර සභාව
- කේ.ඩබ්.රංජනී මානෙල් මෙනවිය - පුස්තකාලයාධිපතිනිය
- ඩී.මහේෂා තාබ්‍රෙව් මෙනවිය - පුස්තකාලයාධිපතිනිය
- බී.එච්.දයාලතා මහත්මිය - පුස්තකාල සහායිකා
- එස් සුසිලා දීපානි මහත්මිය - පුස්තකාල සහායිකා
- ඒ.ජී. ලක්ෂ්මි කාන්තා පෙරේරා මෙනවිය - පුස්තකාල සහායිකා
- එම්.ඩබ්.ජිනේකා සුමංගලි මහත්මිය - පුස්තකාල සහායිකා
- ජී.එල්.පියන්ති මෙනවිය - පුස්තකාල සහායිකා
- එස්.එම්.මනෝරි චන්ද්‍රවංශ මහත්මිය - පුස්තකාල සහායිකා
- මාලතී සමන්තා ආරියසිංහ මහත්මිය - පුස්තකාල සහායිකා
- ඒ.ජී.රසිකා මහත්මිය - පුස්තකාල සහායිකා
- ඒ.ඩබ්.ඉන්දදාස මහතා - පුස්තකාල සහායක
- විදුහල්පති - ගා/ධර්මාශෝක විද්‍යාලය , අම්බලන්ගොඩ
- විදුහල්පති - ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය , අම්බලන්ගොඩ
- විදුහල්පති - ගා/ප්‍රජාපති ගෝතමි බා.වි. , අම්බලන්ගොඩ
- විදුහල්පති - ගා/ කුලරත්න ම.වි. අම්බලන්ගොඩ .
- විදුහල්පති - ගා/ගාමිණී විද්‍යාලය , අම්බලන්ගොඩ
- හර්බට් වීරක්කොඩි මහතා - කමිටු සාමාජික
- එම්.ඒ.ජයවීර මහතා - කමිටු සාමාජික
- සුගත් හෙට්ටිආරච්චි මහතා - කමිටු සාමාජික
- එන්.එච්.ධන්කන් ද සිල්වා මහතා - කමිටු සාමාජික
- සිරිපාල මාදුවගේ මහතා - කමිටු සාමාජික
- ජී.ඩබ්.ගුණසිරි මහතා - කමිටු සාමාජික
- ටි.ඩබ්.හරිස්චන්ද්‍රමහතා - කමිටු සාමාජික
- පේමසිරි රතුවඩු මහතා - කමිටු සාමාජික
- ටී.ඩබ්. පියසිරි මහතා - කමිටු සාමාජික

## 8. <u>රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටු සාමාජිකයන්</u>

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති ,අම්බලන්ගොඩ නගර සභාව
- කමල් වැල්ලගේ මහතා - ගරු උපසභාපති, අම්බලන්ගොඩ නගර සභාව
- ඩී.ධර්මදාස මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
- ඩෙනට් පනියන්දුවගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව
- ඩබ්.එම්. නිලානී මෙනවිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

**නිලධාරින් හා නියෝජිතයන්**

- බි.ඒ. ධම්මිකා මහත්මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ
- ටී.චන්න මහතා - අදායම් පරික්ෂක
- කේ.පියරත්න මහතා - අදායම් පරික්ෂක

## 9. <u>සංවර්ධන උපදේශන කමිටු සාමාජිකයන්</u>

- එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති ,අම්බලන්ගොඩ නගර සභාව
- ධනසේන මාදුවගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
- එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රීනි , අම්බලන්ගොඩ නගර සභාව
- එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

**නිලධාරින් හානියෝජිතයන්**

- බි.ඒ. ධම්මිකා මහත්මිය - ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ

- මෙහදි රථවාහන හා ත්‍රීරෝද රථ , ත්‍රීරෝද රථ කමිටුව යන කමිටු දෙක රථ වාහන හා ත්‍රීරෝද කමිටුව වශයෙන් එක් කමිටුවක් ලෙස පවත්වාගෙන යාමට කමිටු සමාජිකයන් පත් කිරීමට පැමිණි සියළුම මන්ත්‍රීවරුන් විසින්යෝජනා කළ අතර ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් එකඟතාවය පල කරන ලදී.

- පස්වරු 1.15 ට පමණ කමිටු සාමාජිකයන් පත් කරන ලද රැස්වීමේ වැඩ කටයුතු අවසන් විය.

සකස් කළේ,

ආදේශක සභා ලිපිකරු
නගර සභාව - අම්බලන්ගොඩ.

................................ ....................................

ලේකම් සභාපති
නගර සභාව - අම්බලන්ගොඩ නගර සභාව - අම්බලන්ගොඩ

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

2018.12.24 දින පැවති කමිටු සාමාජිකයන් පත් කිරීමේ කමිටු වාර්තාව යෝජනා කර සිටිනවා. මේහි යම් සංශෝධනයක් අවශ්‍ය නම් ඉදිරිපත් කරන්න. මේ සාමාජිකයන් නම් කිරීම සඳහා මාත් ගරු නගර සභා මන්ත්‍රී සෝහිත රංජිත් මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා , අපි මන්ත්‍රීවරු 04 දෙනෙකු එකතු වී තමයි මෙම නම් ටික කමිටු සඳහා යෝජනා කර තිබෙන්නේ. ගරු සභාපතිතුමා විසින් ඉහත කමිටු සඳහා නම් ඉදිරිපත් කරන ලදී. මිට අමතරව යම් කමටුවකට මන්ත්‍රිවරුන්ට ඉදිරිපත් විමට අවශ්‍ය නම් ඉදිරිපත් වන්න.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට මාගේ නම ඉවත් කර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා නම ඇතුලත් කරන්න .

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි නවක මන්ත්‍රිතුමියගේ නමත් මෙම කමිටු සඳහා ඇතුලත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මා යෝජනා කරන්න හැදුවේ එතුමියගේ නමත් . මෙම කමිටු වලින් භාගයකට එතුමියගේ නම ඇතුලත් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමා, ඔබ සමඟ එකතු වි තමයි අපි මෙම සාමාජිකයන් පත් කර ඇත්තේ . එවිට මන්ත්‍රීතුමිය පත් වි තිබුණේ නැහැ.එහිදි ඇයගේ නම ඇතුලත් කළ යුතු කමිටු කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, රථ වාහන කමිටුව පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටුව , පුස්තකාල කමිටුව සඳහා එතුමියගේ නම් ඇතුලත් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ක්‍රීඩා කමිටු සාමාජිකයන් වශයෙන් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ,ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝහිත රංජිත් මහතා , ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්. නිලානි මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර දි සිල්වා මහතා නම් කර ඇත.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**
පුස්තකාල කමිටුව නෙමේ. ක්‍රීඩා කමිටුවයි. ක්‍රීඩා කමිටුවට පසුගිය වසරේ මාගේ නම තිබුණා . එම නිසා මාගේ නම නැවත ක්‍රීඩා කමිටුව සඳහා ඇතුලත් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ක්‍රිඩා කමිටුව සඳහා ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාගේ නම ඇතුලත් කරන්න**. පුස්තකාල** කමිටුව සඳහා ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා, ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත මහතා , ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය , ගරු නගර සභා එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රිනි ජී.ජී. පේෂලා කුමාරි මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතා ගේ නම ඇතුලත් කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**

පුස්තකාල කමිටුවට අපගේ ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මියගේ නම ඇතුලත් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුස්තකාල කමිටුවට ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතාගේ නම ඉවත් කර ගරු නගර සභා මන්ත්‍රිනි චම්පා සුමුදු කුමාරි මහත්මියගේ නම ඇතුලත් කරන්න. මීළඟට රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටුව සඳහා ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා , ගරු නගර සභා මන්ත්‍රී මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී මන්ත්‍රි ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා , ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්. නිලානි මෙනවිය , , ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතාගේ නම යෝජනා කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**
මෙම කමිටුව සඳහා ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මියගේ නම ඇතුලත් කරන්න.
**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ සඳහා ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ නම ඇතුලත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටුවට මාගේ නමත් ඇතුලත් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මෙම කමිටුව සඳහා නම් 3 ඇතුලත් කළාද? මෙම රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටුවෙන් මාගේ නම ඉවත් කරන්න. මට එය හිසරදයකි. මා දිස්ත්‍රික්ක ජන්ද 2 ක් ඉල්ලුවා . මට විශාල බාධාවක් වුණා ඔය රථ වාහන කමිටුවේ සිටිම .

**<u>ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපගේ රථ වාහන කමිටු 2 ක් පවතිනවා මොකක් ද මේ දෙකක් ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටුව කියා එකක් කළා. සංවර්ධන උපදේශන කමිටුව සඳහා ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා , ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රිනි එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රි එස්.එම් සරත් චන්ද්‍ර දි සිල්වා මහතා නම් කර ඇත. ඒ අනුව ඉදිරියට කැඳවන්න. මෙම සියලු මන්ත්‍රිවරුන් මෙම පත්විම් සමඟ මෙම කමිටු රැස්වීම් සඳහා සහභාගි වන ලෙස ඉල්ලා සිටිනවා . නම් දමා විතරක් ඉන්න එපා. රැස්විම් වලට පැමිණෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , සංවර්ධන උපදේශන කමිටුව මාගේ නමත් දමන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතුමියගේ නමත් සංවර්ධන උපදේශන කමිටුවට ඇතුලත් කරන්න.

**<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු සාමාජිකයන්</u>**

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | - | ගරුසභාපති - |
| ඒ. සරත් ශ්‍රීලාල් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්.ජගත් කුමාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙ.වි. | - | ගරු නගර සභා මන්ත්‍රීනි |

| | | |
|---|---|---|
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනී | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ධනසේන මාදුවගේ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |

## <u>ටෙන්ඩර් කමිටු සාමාජිකයන්</u>

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා | - | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මහතා | - | ගරු උපසභාපති |
| ඒ. සරත් ශ්‍රීලාල් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |

## <u>මූල්‍ය කමිටු සාමාජිකයන්</u>

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා | - | ගරු සභාපති |
| ඒ. සරත් ශ්‍රීලාල් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |

## <u>කර්මාන්ත කමිටු සාමාජිකයන්</u>

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා | - | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මහතා | - | ගරු උපසභාපති |
| ඒ. සරත් ශ්‍රීලාල් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |

## <u>නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු සාමාජිකයන්</u>

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා | - | ගරු සභාපති |
| ග්‍රේෂන් කෙරම්ණියගේ | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩී.ධර්මදාස මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්.ලසන්ත මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මෙනවිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ධනසේන මාදුවගේ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |

## <u>ක්‍රීඩා කමිටු සාමාජිකයන්</u>

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | - | ගරු සභාපති |
| ජී.සරත් ශ්‍රී ලාල් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්.ජගත් කුමාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ඩබ්.එම්. නිලානි මෙනවිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |

## <u>පුස්තකාල කමිටු සාමාජිකයන්</u>

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | - | ගරු සභාපති |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ජී.ජී. පේෂලා කුමාරි මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එම්. චම්පා සුමුදු කුමාරි මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |

**නිලධාරින් හා නියෝජිතයන්**

| | | |
|---|---|---|
| බී.ඒ. ධම්මිකා මහත්මිය | - | ලේකම් , නගර සභාව අම්බලන්ගොඩ |
| ඩී.වී.තරංගි මහත්මිය | - | ප්‍රජා සංවර්ධන නිලධාරිනි, අම්බලන්ගොඩ නගර සභාව |
| කේ.ඩබ්.රංජනී මානෙල් මෙනවිය | - | පුස්තකාලයාධිපතිනිය |
| ඩී.මහේෂා තාබ්‍රෙව් මෙනවිය | - | පුස්තකාලයාධිපතිනිය |
| බී.එච්.දයාලතා මහත්මිය | - | පුස්තකාල සහායිකා |
| එස් සුසිලා දීපානි මහත්මිය | - | පුස්තකාල සහායිකා |
| ඒ.ජී. ලක්ෂ්මී කාන්තා පෙරේරා මෙනවිය | - | පුස්තකාල සහායිකා |
| එම්.ඩබ්.ජිනේකා සුමංගලි මහත්මිය | - | පුස්තකාල සහායිකා |
| ජී.එල්.පියන්ති මෙනවිය | - | පුස්තකාල සහායිකා |
| එස්.එම්.මනෝරි චන්ද්‍රවංශ මහත්මිය | - | පුස්තකාල සහායිකා |
| මාලතී සමන්තා ආරියසිංහ මහත්මිය | - | පුස්තකාල සහායිකා |
| ඒ.ජී.රසිකා මහත්මිය | - | පුස්තකාල සහායිකා |
| ඒ.ඩබ්.ඉන්ද්‍රදාස මහතා | - | පුස්තකාල සහායක |
| විදුහල්පති | - | ගා/ධර්මාශෝක විද්‍යාලය , අම්බලන්ගොඩ |
| විදුහල්පති | - | ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය , අම්බලන්ගොඩ |
| විදුහල්පති | - | ගා/ප්‍රජාපති ගෝතමී බා.වි. , අම්බලන්ගොඩ |
| විදුහල්පති | - | ගා/ කුලරත්න ම.වි. අම්බලන්ගොඩ . |
| විදුහල්පති | - | ගා/ගාමිණී විද්‍යාලය , අම්බලන්ගොඩ |
| හර්බට් වීරක්කොඩි මහතා | - | කමිටු සාමාජික |
| එම්.ඒ.ජයවීර මහතා | - | කමිටු සාමාජික |
| සුගත් හෙට්ටිආරච්චි මහතා | - | කමිටු සාමාජික |
| එන්.එච්.ඩන්කන් ද සිල්වා මහතා | - | කමිටු සාමාජික |
| සිරිපාල මාදුවගේ මහතා | - | කමිටු සාමාජික |
| ජී.ඩබ්.ගුණසිරි මහතා | - | කමිටු සාමාජික |
| ටී.ඩබ්.හරිස්චන්ද්‍රමහතා | - | කමිටු සාමාජික |

| | | |
|---|---|---|
| ප්‍රේමසිරි රතුවඩු මහතා | - | කමිටු සාමාජික |
| ටී.ඩබ්. පියසිරි මහතා | - | කමිටු සාමාජික |

රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටු සාමාජිකයන්

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා | - | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මහතා | - | ගරු උපසභාපති |
| ඩී.ධර්මදාස මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මෙනවිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී |

සංවර්ධන උපදේශන කමිටු සාමාජිකයන්

| | | |
|---|---|---|
| එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා | - | ගරු සභාපති ,අම්බලන්ගොඩ නගර සභාව |
| ධනසේන මාදුවගේ මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි , අම්බලන්ගොඩ නගර සභාව |
| එස්.එම්.සරත් චන්ද්‍ර ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව |

**තීරණය -**

**2018.12.24 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද 2019 වර්ෂය සඳහා කමිටු සාමාජිකයන් පත් කිරීමේ කමිටු වාර්තාව සංශෝධන පහත පරිදි සිදුවිය යුතු බව**

- **නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු සාමාජිකයකු ලෙස ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ නම ඉවත් කර ඒ වෙනුවට ගරු නගර සභා මන්ත්රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා ,**

- **පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු සාමාජිකයකු ලෙස ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාගේ නම ඉවත් කර ඒ වෙනුවට ගරු නගර සභා මන්ත්‍රිනි එම්. චම්පා සුමුදු කුමාරි මහත්මිය**

- **ක්‍රීඩා කමිටු සාමාජිකයකු ලෙස ගරු සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා**

- **පුස්තකාල කමිටු සාමාජිකයකු ලෙස ලෙස ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාගේ නම ඉවත් කර ඒ වෙනුවට ගරු නගර සභා මන්ත්‍රිනි එම්. චම්පා සුමුදු කුමාරි මහත්මිය**

- **රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටු සාමාජිකත්වයෙන් ගරු නගර සභාපතිතුමාගේ නම ඉවත් කරන ලෙසත් , ගරු නගර සභා මන්ත්‍රිනි එම්. චම්පා සුමුදු කුමාරි මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා ගේ නම් ඇතුලත් කරන ලෙස**

- **සංවර්ධන උපදේශන කමිටු සාමාජිකත්වය සඳහා ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය**

**සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(07)** ටෙන්ඩර් හා මිල ගණන්

**07:01 ටෙන්ඩර් :-**

**07:02 මිළ ගණන් :-**

07.02.01 පෙරපාසල් ළමුන් සඳහා ටීෂර්ට් සඳහා මිළ ගණන්

| ආයතනයේ නම | අයිතමය | ඒකක් තොගය |
|---|---|---|
| කෝසල නදුන් මහතා | පෙර පාසල් ටී ෂර්ට් | රු.480/= |
| මොක්ෂාධි සොයිසා මහත්මිය | පෙර පාසල් ටී ෂර්ට් | රු.850/= |

තීරණය

පෙර පාසල් ටී ෂර්ට් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් අවම මිළ ගණන් කෝසල නදුන් මහතා ඉදිරිපත් කර තිබූ අතර එම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .

07.02.02 පෙරපාසල් ළමුන් ගේ වැඩ පොත් සඳහා මිළ ගණන්

| ආයතනයේ නම | අයිතමය | ඒකක් තොගය |
|---|---|---|
| සක්වා ප්‍රිනටර්ස් | පෙර පාසල් වැඩ පොත් ළමුනු සඳහා ආකෘති අනුව පොත් 6 කින් යුතු කට්ටලය | රු.2000/= |

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පෙර පාසල් වැඩ පොත් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ සිහිනි ප්‍රින්ටර්ස් ආයතනය මඟින් පමණි.

ඒ අනුව එම මිළ ගණන් පිළිගැනිමට ගරු සභාව තීරණය කරන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , පෙර පාසල් පොත් 6ක කට්ටලයක් රු.2000/= ක මුදලක් පමණ වේ. මොකක්ද ඒ? ඔහු එම පොත් කට්ටලය මුද්‍රණය කර දෙනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මේ සඳහා එක ආයතනයක් පමණයි ටෙන්ඩර් ඉදිරිපත් කර ඇත්තේ. රු.ලක්ෂ 4 ක 5ක වියදමකි. මෙසේ ප්‍රකාශ කළාට. ළමුන් 200 කට ආසන්න ප්‍රමාණයක් සිටිනවා. අද කාලයේ තිබෙන මුද්‍රණය සමඟ තමයි අපි බලන්නේ. නැතිව වෙන දෙයක් නෙමේ.එම ආයතනයට අගතියෙන් නෙමේ.මෙම පොත් 6 මුද්‍රණය කිරිමට රු.2000/= ක මුදලක් වියදම් වන්නේ මොනවාදටද ? පොත් 6 ම බස්රථවල විකුණනු ලබන්නේ රු.100/= ක මුදලකටය. එහෙම බැලුවාම මේතැන රු.2000/= ක මුදලක් වැයවේ. එම නිසා අපි පවසනනේ මෙහි රු.2000/= පොත් තිබේනවාද කියා බලන්න.රු2000/= ඒවා 200 වුණොත් රු.400000/= ක මුදලකි.මෙය නැවත බලන්න . අගතියක් නැහැ. මේ සඳහා සභාවේ අනුමතිය දෙන්න ඕන. මොකද අත්‍යවශ්‍ය කරුණක් නිසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය පෙර පාසල් ළමුන් වෙනුවෙන් අපි සභාව ලබා දෙන දෙයකි. එම නිසා එය අනුමත කර වැඩය කරන්න. පළමු වාරය ආරම්භ වන විට දිය යුතුයි. නැතිනම් පහුවෙලා දී වැඩක් නැත.

**තීරණය**

**පෙර පාසල් වැඩ පොත් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ සිහිනි ප්‍රින්ටර්ස් ආයතනය මඟින් පමණි. මෙම පොත් පෙර පාසල් ආරම්භයේදීම ලබාදිය යුතු බැවින්, ඒ අනුව එම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .**

07.02.03 තාර සඳහා මිළ ගණන්

| ආයතනයේ නම | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| බිටුමික්ස් ආයතනය(Butumix) | 80/100 තාර බැරල් | රු.16500/= |
| බිටු ලින්ක් ( Butulink ) | 80/100 තාර බැරල් | රු.16500/= |

**තීරණය**

80/100 තාර බැරල් සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතුරින් බිටුමික්ස් හා බිටු ලින්ක් ආයතනය මඟින් එම මිළ ගණන් ඉදිරිපත් කර තිබුණත් බිටු ලින්ක් ආයතනය මඟින් ලබා දෙන තාර වල දෘශ්‍යාභාවිතාවය අඩුබැවින් බිටුමික්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .

**07.02.04 ලිපිද්‍රව්‍ය සඳහා මිළ ගණන්**

| **අයිතමය** | **සක්වා ප්‍රින්ටර්ස්** | **ඩයමන්ඩ් ප්‍රින්ටර්ස්** |
|---|---|---|
| සාමාන්‍ය ලිපි ශීර්ෂ | 2.95 | |
| 70 | | 4.25 |
| 60 | | 4.00 |
| 9*4 ලියුම් කවර | 2.80 | |
| 3 ½ *6 ලියුම් කවර | 1.90 | 3.50 |

**තීරණය**

**ලිපිද්‍රව්‍ය සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිමට ගරු සභාව තීරණය කරන ලදී .**

**07.02.05 ටෝනර් සඳහා මිළ ගණන්**

| ආයතනයේ නම | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| Omark Technology | Hp 48 A Toner | රු.10750/= |
| Tulip Computer | Hp 48 A Toner | රු.9500/= |

**තීරණය**

**ටෝනර් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුව ටියුලිප් කම්පියුටර් ආයතනය අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති බැවින් හා තොරතුරු සන්නිවේදන නිළධාරිනියගේ නිර්දේශය අනුව එම ආයතනයේ මිල ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .**

**07.02.06 හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිමේ මිළ ගණන්**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිම සම්බන්ධයෙනි. හිරේවත්ත පෙර පාසලේ අබලි වතුර ටැංකිය කඩා ඉවත් කිරිම සම්බන්ධව මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය මඟිනි. නමුත් එම අබලන් වූ වතුර ටැංකිය ඉතා අවදානම් තත්වයේ පවතින අතර සභා අනුමතියට යටත්ව කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලයේ මිළ ගණන් සුදුසු බවට වාර්තා ලබා දී ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙයට අපට එකඟ විය නොහැකිය. එහි මිළ ගණන් කොහෙත්ම පිළිගන්න බැහැ. කම්කරුවෙකුට ගෙවන වැටුප රු.2500 ක් ලෙස පමණයි. මෙහෙම ගෙන්නේ නැහැ නේද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව අපගේ පෙර පාසල් මහත්මිය පැමිණ දන්වා සිටියා. මෙම ළමයි අනතුරුට ලක් වෙනවා මෙය ඉක්මනින් අයින් කරන ලෙස .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දැන් ඔබතුමාලාගේ ඇස්තමේන්තුව කොහොමද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇස්තමේන්තුව රු.28000/= ක මුදලක් නම් රු.98000/= ටෙන්ඩරයක් පිළිගැනීමට බැහැ. එම නිසා මෙය ප්‍රතික්ෂේප කරනවා. සාධාරණත්වයක් තිබිය යුතුයි.

**තීරණය**

හිරේවත්ත පෙර පාසලේ අබලන්වූ වතුර ටැංකිය කඩා ඉවත් කිරීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය පමණි. එම මිළ ගණන් තාක්ෂණසේවා නිලධාරි ඉදිරිපත් කර ඇස්තමේන්තුවට වඩා බොහෝ වැඩි මිලක් වන බැවින් මෙම මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමටත් නැවත මිල කැඳවීම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය අත්සන් කර දෙන්න. ඔවුන් වාර්තාව එවයි අපට .

## (08) ගෙවීම්

08.01 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා 2018 නොවැම්බර් මසය සඳහා සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු.48370/= ක මුදලක් එම්.එස්. වීරසිංහ මහතා වෙත ගෙවීම සඳහා ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

08.02 අම්බලන්ගොඩ නගර සභාවේ හිටපු සභාපති ගරු ජී.එම්.එස්. ද සිල්වා මැතිතුමාගේ අවමංගල්‍ය උත්සවය වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් මුදල රු.22580/= ක මුදලක් ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.03 අම්බලන්ගොඩ නගර සභාවේ හිටපු සභාපති ගරු ජී.එම්.එස්. ද සිල්වා මැතිතුමාගේ අවමංගල්‍ය උත්සවයේ තොරණ ඉදි කිරීම හා අනෙකුත් වියදම් සඳහා ලබා දුන් අත්තිකාරම් මුදල් පියවීම වෙනුවෙන් රු.25000/= ක මුදලක් ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සඳහා වියදම් වූ සියළුම දේවල් එකට දමා ඉහත සඳහන් 08.02 හා 08.03 යන වියදම් සියල්ලම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමතියට යවන්න මා එතුමා සමඟ දුරකථනයෙන් සාකච්ඡා කර එහි අනුමතිය වාචිකව ගෙන ඇත. ගරු පළාත් පාලන ඇමතිවරයා වශයෙන් එතුමාගේ අනුමතියට යොමු කරන්න. නැතිනම් සිදුවන්නේ අපි සභාවෙන් අනුමත කර ගරු ප්‍රධාන අමාත්‍යතුමා අත්සන් නොකලහොත් එය ප්‍රශ්නයකි. එතුමා වාචිකව එකඟතාවය පල කළා . එය යවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , ගරු හිටපු සභාපති ජී.එම්. එස්. ද සිල්වාගේ මහතාගේ අවමංගල්‍ය උත්සවයේ තොරණ ඉදිකිරිම සම්බන්ධයෙන් බොහොම අසාර්ථක උත්සාහයක් තමයි එහිදි දැරුවේ. අපි හැමෝම හිටියා එතැන .

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එක ඇත්ත . අපිත් හිටියා එතැන මාත් එය පිලිගන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

එය තොරණක් නෙව මරණයකි. එය කඩා වැටුණානම් ලොකු ප්‍රශ්නයක් ඇතිවෙනවා.තව මරණයක් සිදු වෙනවා එතැන . එතරම් අසාර්ථක වැඩකි එය.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපිට මෙය ඉතා ඉක්මනින් සිදු කර ගැනීමට අවශ්‍ය වුණා. අපේ සේවකයන් යොදවා මීට වඩා හොඳින් සිදු කිරිමට තිබුණා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මා දන්නේ නෑ ඔබතුමාලා ඔන විදියකට තිරණය කරන්න. මෙය ඉතා අසාර්ථක ක්‍රියාවලියකි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි පිලිගන්නවා එය.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , දැන් අපගේ තවත් නියෝජ්‍ය නගරාධිපතිවරයෙක් අභාවයට පත් වි ඇත. එතුමාටත් තොරණක් ඉදිකරනවා ද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අවශ්‍ය නම් කළ හැකියි. ෆොටෝ එක මාරු කරන්න විතරයි තිබෙන්නේ.

08.04 දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත 2018 දෙසැම්බර් මස 01-15 දක්වා VAT මුදල වන රු139979.77 ක මුදලක් ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.05 උපේන්ද්‍ර එගොඩගේ මහතාට සහිත්‍ය උත්සවයේ ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රු.25000/= ක මුදලක් ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන්

කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.06 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ගෙන්වා ගැනීම වෙනුවෙන් රු.10860.60 ක මුදලක් රජයේ මුද්‍රණාලයාධිපතිට ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.07 අම්බලන්ගොඩ නගර සභා මාර්ග ප්‍රතිසංස්කරණයට අවශ්‍ය ගල් ගැනීම වෙනුවෙන් රු.100000/= ක මුදලක් චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් ඇන්ඩ් ක්‍රෂර් වෙත ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.08 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයට අවශ්‍ය ලිපි , ලිපි ලේඛන මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.51325/= ක මුදලක් රජයේ මුද්‍රණාලයාධිපතිට ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මෙය ලේකම් නිර්දේශ කර තිබේ ද යන්න සටහන් වී නොමැත.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙය හැමදාම කියනවා එය සටහන් කර එවන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

අයි එසේ සටහන් නොවී එන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එය ලේකම්තුමියගෙන්ම විමසන්න. මන්ත්‍රීතුමා හැමදාම මෙය පවසනවා. එම නිසා කවුද නිර්දේශ දුන්නේ කියා සටහන් කරන්න.

08.09 අම්බලන්ගොඩ නගර සභා ආදාහනාගාරය සඳහා අවශ්‍ය ගෑස් මිලදී ගැනීම වෙනුවෙන් රු.48400/= ක මුදලක් අරුණ ගෑස් සෙන්ටර් වෙත ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.10 අම්බලන්ගොඩ නගර සභාව සතු 252-0730 අංක දරණ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම වෙනුවෙන්රු.10950/= ක මුදලක් පී.එච්.කසුන් තරංග මහතා වෙත ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.11 බස්නැවතුම්පොළ ඉදිරිපිට රෝයල් ෆාම් පැල දෙකක් සිටුවීම වෙනුවෙන්රු.45000/= ක මුදලක් මල්ලියාවඩු ලක්ෂ්මන් කුලතුංග (ප්ලන්ට් කලෙක්ෂන්) මහතා වෙත ගෙවීමටත් , මිට පසුව මෙවැනි පැල සිටුවීමේදි පසු ක්‍රියා කාරිත්වය සහිතව ටෙන්ඩර් හා මිල ගණන් කැඳවීමටත් , ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රොයල් ෆාම් පැල දෙකක් සිටුවීම වෙනුවෙන් බස් නැවතුම්පොළ ඉදිරිපිට. එය අපි සභාවට යොමුකර ටෙන්ඩර් කර තමයි මිලදී ගෙන තිබෙන්නේ .

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කත කරමින්**

මෙය නිසියාකාරව නඩත්තු නොකලහොත් මේ සඳහා වැයකල මුදල් අපරාදේ. වතුර දැමීමට අවශ්‍යයි. මා දුටුවා අපගේ වාහනයේ ගස් වගයක් පටවා ගෙන එනවා. අපගේ සේවකයන්ගේ සහායෝගය දුන්නාද ?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ ඒ පටවා ගෙන ආවේ පෝරඹ නිල සෙවණ සාදන ස්ථානයටයි.

**ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කත කරමින්**
එම ගස් පටවා ගෙන එනු ලැබුවේ පෝරඹ නිල සෙවණ ඉදිකරන ස්ථානයටයි. ඒ රෙඩ් ෆාම් ගස් වගයකි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කත කරමින්**
එම ගස් මිලදී ගනු ලැබුවේ සිටුවීමේ සහ බලා ගැනිමත් සමඟද ? මෙය වසරක් පමණ යනකම් බලා ගත යුතුයි. නැතිනම් මේ සඳහා වැයකර මුදල් අපරාදේ. කොහොම ද එය දී තිබෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දන්නේ නෑ බල්න ඕනඑය බැලිය යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කත කරමින්**
එය අපට බලන්න දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙම සභාවෙන්ම ගත් තීන්දු පිළිබඳ විස්මයෙන් ප්‍රශ්න අසන්න එපා. ඔබතුමලාම අත ඔසවා තමයි මෙය අරගෙන තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කත කරමින්**
අපි අත ඉස්සුවා හරි වැඩේ හරියට කරන්න. නඩත්තු නොකර පැලේ මැරුණොත් වැඩක් නැහැනේ. අපි පවසන්නේ එයයි. හරියට වැඩය කරන්න.ලේකම්තුමියට බලන්න කියන්නේ එකයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙම ගස් දෙක කෙලින් වී නොමැති නිසා මා මෙම ගෙවීම නතර කර තිබුනේ. පසුව එම ගස් දෙක කෙලින් කලාට පසුවයි මේ සභාවට යොමු කර ඇත්තේ.  ගස මහත් වීමට කාලයක් ගත වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කත කරමින්**
මා පවසන්නේ මෙය බලා ගැනීමට කවුරුහරි යොදවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල්  මහතා කත කරමින්**
ගරු සභාපතිතුමනි , එම ගස් දෙක සිටුවීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. සභාව අනුමත කළ බව සැබැම සත්‍යයක් . අපි තමයි අනුමත කරනු ලැබුවේ . මෙය ටෙන්ඩර් කර මිලදී ගැනිමටත් අපිමයි අනුමත කළේ. නමුත් මෙහිදී ඉල්ලා සිටින්නේ ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම ඉල්ලා සිටින්නේ මෙහි පසු ක්‍රියාකාරිත්වය පිළිබඳවයි.  මෙය ගසකි . මෙය තව මාසයකින් විතර ඊළඟ සභාව වනවිට මැරුණොත් වගකීම මොකක්ද ? මෙය විගණනයේදී අපි විසඳා ගන්නේ කෙසේද?  මෙවැනි දෙවල් ටෙන්ඩර් දීමේදී එම සේවයෙන් පසු සේවය පිළිබඳ අඩුම ගණනේ මාස  6කට වත් එම සේවය ලබා ගෙන එයට මුදලක් ගෙවන්න. එයට කමක් නැහැ. දැන් රාජ්‍ය ආයතන තිබේනවා මල් පැල ගෙනත් පෝච්චි පිටින් අරගෙන යන්නේ. ඒ සේවයකි. මේ පැල දෙක ගෙනත් සිටුවා  අඩු වශයෙන් වසරකට මාසයකට මුදලක් ගෙවන්න හරි නැතිනම් වෙන මුදලක් ගෙවන්න හරි  පොරොන්දු වෙන්න. එය අපි අනුමත කරන්නම්. මෙම පැල දෙක සිටුවා ආරක්ෂා

වී අපට ප්‍රයෝජනයක් වන විදියට සභාවට ප්‍රතිලාභයක් එන විදියට තමයි කටයුතු කළ යුක්තේ. එයයි අපගේ ඉල්ලීම. දැන් හරි පුළුවන්නම් එය නිවැරදි කර ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙවැනි පැල සිටුවිමේදී ලේකම්තුමියනි , මීට පසු නිලධාරින් මේ ගැන සලකා බලන්න. මා දන්නේ නැමෙය කලින් කර තිබේ ද නැද්ද කියා. ඒ ගැන සලකා බලන්න.

08.12 ආරක්ෂක ස්ථානභාර නිලධාරි රනිල් විජේරත්න මයා විසින් 2018 ඔක්තෝම්බර් මාසයේ ආරක්ෂක සේවා බිලෙන් අඩුකර ඇති රු40700.80 ක මුදල ආපසු ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව එම මුදල ගෙවීම සුදුසු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ආරක්ෂක ස්ථානභාර නිලධාරි රනිල් විජේරත්න මයා විසින් 2018 ඔක්තෝම්බර් මාසයේ ආරක්ෂක සේවා බිලෙන් අඩුකර ඇති රු40700.80 ක මුදලක් ආපසු ඉල්ලා ඇති ඩබ්.ඒ. බන්දුසිරි මහතාගේ වැටුප් රු80736.26 ක මුදලක් . ඒ මහතා ඉල්ලා තිබේනවා එම මුදල ගෙවන ලෙසට. ඩබ්.ඒ බන්දුසිරි යන අය මෙම ආයතනයේ දිගු කලක් සේවය කරන අතර ඩීසල් හොරකම 2018.11.30 වන දින ඔහුව කොටු කර ගන්නා ලදී. නමුත් 10වෙනි මාසයේ ඔහුගේ වැටුප ගෙවා නොමැත. මෙම සිද්ධිය 11වෙනි මාස සිදු වුවක් බවත් 10වෙනි මාසයට මෙය සම්බන්ධයක් නොවන බැවින් 10 වෙනි මාසයේ ඔහුගේ වැටුප ලබා දෙන ලෙස ඉල්ලා සිටි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

10වෙනි මාසයේ වැටුප ගෙවන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

10 වෙනි මාසයේ වැටුප ගෙවන්න සභාව අනුමතිය දෙනවා.

08.13 අම්බලන්ගොඩ බස් නැවතුම්පොල ශ්‍රීලංගම කාර්යාලයේ වහල අළුත්වැඩියා කිරිමේ කර්මාන්තයේ රුඳවුම් මුදල වන රු.25208.20 ක මුදලක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුවට ගෙවීම සුදුසු බවට සඳහා ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොල ශ්‍රීලංගම කාර්යාලයේ වහල අළුත්වැඩියා කිරිමේ කර්මාන්තයේ රුඳවුම් මුදල වන රු.25208.20 ක මුදලක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුවට ගෙවීමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.මේ සඳහා මුදල් අපිට ලංගම කාර්යාලයෙන් ගෙවන ලදී. මෙය සුළි සුළඟට ගිය පසු අලුත් වැඩියා කටයුතු කරන්න තමයි ඉල්ලා සිටියේ . මෙය රුඳවුම් ගාස්තුවයි.

08.14 දේවානන්ද විද්‍යාලය කාණුව ඉදිකිරිම කර්මාන්තය අත රුඳවුම් මුදල වන රු53223.53 ක මුදලක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුවට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඊ ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.15 හිරේවත්ත විජේ මහතාගේ නිවස අසල කොන්ක්‍රිට් කාණුව ඉදිකිරීම වෙනුවෙන් රු.106196.83 පොල්වත්ත ප්‍රජා මූල සංවිධානයට ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.16 වෙරළ පිවිසුම් මාර්ගය සකස් කිරීම වෙනුවෙන් රු.294317.95ක මුදලක් පෝරඹ 86සී ප්‍රජා මණ්ඩලයට ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී පේෂලා කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මේ හිරේවත්තේ කොතන පාරද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපේ ගරු නගර සභා මන්ත්‍රී පේෂලා මහත්මියගේ නිවස ඉදිරිපිට ඇති පාර පටබැදිමුල්ලේ.

08.17 අම්බලන්ගොඩ නගර සභාවේ මාර්ග නඩත්තුව වෙනුවෙන් චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් ඇන්ඩ් ක්‍රෂර් වෙත රු.11000/= ක මුදලක් ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.18 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඉන්ධන වියදම් ගෙවිම සඳහා රු.177000.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , කවුද ? මෙම ඉන්ධන දීමිනාව ලබා ගන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දීමනාව ගෙවනු ලබන්නේ ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතාට රු.3000/= , ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතාට රු.6000/=, ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පි . ලක්ෂ්මි හේමන්තා මෙනවියට රු.15000/=, ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතාට රු.6000/=, ගරු නගර සභා මන්ත්‍රී නන්දන රජපක්ෂ මහතාට රු.9000/=, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාට රු.24000/=, ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාට රු.9000/=, ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතාට රු.6000/=, ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ සොභිත රංජිත් මහතාට රු.9000/=, ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියට රු.9000/=, ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මියට රු.3000/=, ගරු නගර සභා මන්ත්‍රිනී එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මියට රු.3000/=, ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාට රු.6000/=, ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම් නිලානි මෙනවියට රු.12000/=, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතාට රු.27000/=, ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතාට රු.27000/= ක් ලෙස එහි එකතුව රු.177000/= කි. අපි ගන්නේ නෑ. අපි මෙය ගන්න එපා කියන්නේ නෑ. ගන්න අය මෙය ලබා ගන්න.

08.19 අම්බලන්ගොඩ නගර සභාවේ රණසූරිය පාරේ පෙට්ටි බොක්කු ඉදිකිරිම සඳහා පෝරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතියට රු.1071994.95 ක මුදලක් ගෙවීම සුදුසු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.20 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ආර්.ඊ. ද සිල්වා හරස් පාර (හෙප්පුමුල්ල ) සඳහා 354083.58 ක මුදලක් හෙප්පුමුල්ල සමගි ප්‍රජා මණ්ඩලයට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.21 අම්බලන්ගොඩ නගර සභාවේ හිටපු සභාපති ජී.එම්.එස්. ද සිල්වා මහතාගේ අවමංගල්‍ය උත්සවය වෙනුවෙන් ආදාහනාගාර භූමියේ සවිකරන ලද ටෙන්ට් හා පුටු සඳහා සැපයු කවර වෙනුවෙන් උපේන්ද්‍ර එගොඩගේ මහතාට රු.15000/= ක මුදලක් ගෙවීම සුදුසු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.22 නොදිරන කසල ගබඩා කාමරයක් ඉදිකිරිම වෙනුවෙන් පළාත් නිශ්චිත අරමුදල් ප්‍රදාන කර්මාන්තය සඳහා ගෙවිය යුතු මුදල රු. 429205.68 ක් ගෙවිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නොදිරන කසල ගබඩා කාමරයක් ඉදිකිරිම වෙනුවෙන් පළාත් නිශ්චිත අරමුදල් ප්‍රදාන කර්මාන්තය සඳහා ගෙවිය

යුතු මුදල රු. 429205.68 ක් ගෙවිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

08.23 පී.එච්. ද සිල්වා මාර්ගයේ ගල් ඇතිරිම වෙනුවෙන් ගල් සැපයීම සඳහා රු.161700 ක මුදලක් ගෙවීම සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පී.එච්. ද සිල්වා මාර්ගයේ ගල් ඇතිරිම වෙනුවෙන් ගල් සැපයීම සඳහා රු.161061.00 ක මුදලක් ගෙවීම සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා .

08.24 සි/ස අම්බල්නගොඩ විවිධ සේවා සමුපකාර සමිතියට තෙල් ලබා ගැනීම වෙනුවෙන් රු.152393.00 කමුදලක් ගෙවීමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සි/ස අම්බල්නගොඩ විවිධ සේවා සමුපකාර සමිතියට තෙල් ලබා ගැනීම වෙනුවෙන් රු.153090 කමුදලක් ගෙවීමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙම කොළ අපිට ඇවිත් නැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ මේ දැන් උදේ ලැබුණු ගෙවීම් වගයකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙම ගෙවිම් ඔබතුමා ම අනුමත කර ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහි සඳහන් 08.22,23,24 ආදි සියල්ලම ඉවත් කරනු ලබනවා. ලැයිස්තු කර එවන්න. නැතිනම් මුල්‍ය කමිටුවට දමන්න.

## (09) ගිණුම්

**09.01** 2018 නොවැම්බර් මාසයට අදාළ **පොදුගිණුම් - වියදම් විශ්ලේෂණය** හා 2018 දෙසැම්බර් මාස **වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින්යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය**

**(10)** ඇස්තමේන්තු

10.01 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල වෙරළ පිවිසුම් මාර්ගය තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.345000/=ක ඇස්තමේන්තුවසභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩ පටබැඳිමුල්ල වෙරළ පිවිසුම් මාර්ගය තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 345000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

10.02 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල වෙරළ පාර කාණු පද්ධතිය තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.1660000/= ක ලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා මාගේ කොට්ඨාශයේ පාරවල් වල තාක්ෂණ සේවා නිලධාරි මහතා මඟින් ඇස්තමේන්තු සකසා ගන්නවා. මා සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා තමන්ගේ බල ප්‍රදේශවල ජනතාව ඉදිරිපත් කර ඇති වැඩ තිබෙනවා. එම ජනතාව කියූ වැඩ සඳහා තාක්ෂණ සේවා නිලධාරි මහතුන් සමඟ ගිහින් ඇස්තමේන්තු කර සභාවට ඇස්තමේන්තුව ඉදිරපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මා තාක්ෂණ නිලධාරි මහතාට දින කිහිපයක් පැවසුවා. අපි නගර සභාවට ජනතාවගෙන් මුදල් අයකර ගනු ලැබුවා මහ අම්බලන්ගොඩ පාරක් කැඩීම සම්බන්ධව . එය තවම සාදන්නේ නැහැ.අනෙක් කාරණය තමයි ධම්මකුසල පාර . එන්න කිව්වාම එන්නේ නැහැ. දැන් අපිට තාක්ෂණසේවා නිලධාරිකම අපට ගන්න වී තිබේනවා. නැතිනම් ඔබතුමාගේ අණට කීකරු වි එනවා ඇති. මහ අම්බලන්ගොඩ පුස්තකාලය කඩන් වැටිලා. මහ අම්බලන්ගොඩට කුඩාම්මාගේ සැලකිලි වෙන්නැති.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමියනි , ඔය අපේ සභාපතිතුමාගේ ගණිත චක්‍රයක් තිබෙනවා. එම ගණිත ක්‍රමයට තමයි වැඩ තියෙන්නේ. ඒම නිසා එය හඳුනන ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

දැන් ඔය ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා පාරක් ඔය දමා තිබෙන්නේ . අර සක්වා එක ලඟ පාර . සභාපතිතුමා ඇත්තටම එන්නේ නැහැ තාක්ෂණ නිලධාරි මහත්වරු. මා පවසන්නේ මහ අම්බලන්ගොඩ එක පාරක් කඩා සභාවේ සිටිනා විට එයට මුදල් අය කර ගනු ලැබුවා. එක් පුද්ගලයෙකුගෙන් රු.80000/= ක් පමණ අයකර ගනු ලැබුවා. එය සාදන්න ඕන . ධම්මකුසල ඉස්සරහා පාරේ ජනතාවට ගමන් කිරිමට බැහැ වතුර රැඳි තිබෙනවා. එය බලන්න ආවේ නැහැ. මහ අම්බලන්ගොඩ ළිඳ ප්‍රතිසංස්කරණය ඇත්තෙම නැහැ. මුකුත් ම නැහැ. අපිත් ඔහේ ඉන්නවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමියනි , රැස්වීම දිනට පමණක් නෙමේ අනික් දිනවලටත් පැමිණ වැඩේ කර ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

නැහැ ඉතිං එන්නේ නැ කිව්වට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමියගේ කොට්ඨාශයේ පාරක් කොන්ක්‍රිට් කරා ගරු නගර සභා මන්ත්‍රි නිලානි මෙනවිය මූලික වෙලා. එය පොඩ්ඩක්වත් බලන්න ගියේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

නෑ. නෑ. එතුමිය දන්නවා. මා අසනීප වු වෙලාවේ ඇය මා බලන්න පැමිණියා. දෙතුන් පාරක් ඇවිත් මට උදවු කළා මා අසනීප වු වේලාවේ. එය නෙමේ මාගේ ගේ ඉදිරිපිට කාණුවවත් සාදා ගන්න බැරි වුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කොන්ත්‍රාත් කරුවන් කිහිපදෙනෙකු ඉදිරිපත් කරන්න . අපි කර දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

කොන්ත්‍රාත්කරුවන් එන්නේ නැහැ. එය සභාවෙන් කර දෙන්න . සභාවේ ඉන්නවානේ. එහි සිටිමට බෑ . ඉතාමත් දුගඳ හමයි. සැම දෙනාම මේ ගැන පවසනවා. අපි ගිය සභාවේ සිටම මට ඔය ප්‍රශ්නය තිබුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමියගේ ඔය වැඩේ කරන්න සුදුසු පුද්ගලයෙකු ඉදිරිපත් කරන්න. ඊට පසු අපි කර දෙන්නම් . අපිට කිරිමට හැකි මුදල් දිම පමණයි. කවුරු හරි එවන්න ඒ සඳහා.

**තීරණය**

**අම්බලන්ගොඩ පටබැඳිමුල්ල වෙරළ පාර කාණු පද්ධතිය තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.1660000/=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදී.**

10.03 චන්ද්‍රාවාස පාරේ අතුරු පාර තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.440000/= ක ලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩ චන්ද්‍රාවාස පාරේ අතුරු පාර තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.440000/=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදී.**

10.04 පොල්වත්ත පෙර පාසලේ ආරක්ෂිත මායිම් තාප්පය ඉදිකිරීම සහ වැට ඉදිකිරීම තාක්ෂණසේවා නිලධාරි විසින් සකසන ලද රු.700000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩපොල්වත්ත පෙර පාසලේ ආරක්ෂිත මායම් තාප්පය ඉදිකිරීම හා වැඩ ඉදිකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.700000/=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදී.**

10.05 උස්වැල්ලවත්ත පාර , කාණු පද්ධතිය ඉදිකිරීම තාක්ෂණසේවා නිලධාරි විසින් සකසන ලද රු.1700000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩ උස්වැල්ලවත්ත පාර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.1700000/=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

10.06 උස්වැල්ලවත්ත කාණු පද්ධතිය ඉදිකිරීමේදි මාර්ගය හරහා නළ පද්ධතියක් යෙදිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකසන ලද රු.23000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩ උස්වැල්ලවත්ත පාර කාණු පද්ධතියට සම්බන්ධිත නළ පද්ධතියක් යෙදිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.23000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

10.07 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල අදාහානාගාරයේ තීන්ත ආලේප කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.200000/=කලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩ පටබැඳිමුල්ල අදාහානාගාරයේ තීන්ත ආලේප කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.200000/=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

10.08 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල ළමා ක්‍රීඩාංගණය ඉදිකිරිම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.1,500,000/=කලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩ පටබැඳිමුල්ල ළමා ක්‍රිඩාංගණය ඉදිකිරිම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.1,500,000 /=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

10.09. අම්බලන්ගොඩරේණුක මොටර්ස් අසළ ළිඳ අයත් භූමිය සංවර්ධන කටයුතු සඳහා කාණුව ඉදිකිරිම සම්බන්ධව තාක්ෂණසේවානිලධාරිවිසින්සකස්කරනලදරු.1,500,000/=කලදඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**අම්බලන්ගොඩ රේණු කමොටර්ස් අසළ ළිඳ අයත්භූමිය සංවර්ධන කටයුතු සඳහා කාණුව ඉදිකිරිම සම්බන්ධව තාක්ෂණ සේවා නිලධාරි විසින්සකස් කරන ලදරු.300,000 /=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

10.10 මහ අම්බලන්ගොඩ මහජන පුස්තකාලය අළුත්වැඩියා කටයුතු සිදු කිරිම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.400000 /=කලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

**මහ අම්බලන්ගොඩ මහජන පුස්තකාලය අළුත්වැඩියා කටයුතු සිදු කිරිම සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.400000 /=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා** මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.11 මහ අම්බලන්ගොඩ හිරිකැටියවත්ත පාර සංවර්ධනය සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.400000 /=කලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මහ අම්බලන්ගොඩ හිරිකැටියවත්ත පාර සංවර්ධනය සඳහා (INTER LOCKING CONCRETE BLOCKS ) ඇල්ලීම සඳහා . මෙය හිරේවත්ත කොට්ඨාශයට අයිති පන්සල ළඟින් ඇති පොඩි පාරයි ( ශෂිනා මහතා ගේ නිවස අසල )

**තීරණය**

**මහ අම්බලන්ගොඩ හිරිකැටියවත්ත පාර සංවර්ධනය සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලදරු.360000 /=කලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

## (11) වෙනත් කරුණු

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

12.01 2018.12.28 දින ආර්.එම්.ඥානසිරි මහතා විසින් පළාත් පාලන කොමසාරිස් අමතා යවා තිබූ ලිපියට 2018.12.31 දින පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පළාත් පාලන කොමසාරිස්තුමා විසින් සුනාමි ගැටළුව සම්බන්ධවයි . උක්ත කරුණ සම්බන්ධව අම්බලන්ගොඩ හිරේවත්ත අංක 53 ලිපි නයේ පදිංචි ආර්.එම් ඥානසිරි මහතා විසින් මා අමතන ලද 2018.12.28 දිනැති ලිපිය හා බැඳේ. ඉහත කරුණු සම්බන්ධයෙන් මා විසින් ඔබ වෙත යොමු කරන ලද මාගේ ඉහත සමාංක වැඩිමනත් වශයෙන් ආර්.එම්ඥානසිරි මහතාගේ උක්ත ලිපිය ඉදිරිපත් කර ඇත. මෝදර දේවාල භූමියේ ඉදිකර ඇති මායිම් තාප්පය හේතුවෙන් දේවාලය අවට නිවාස වාසීන් මුහුණ දි ඇති ගැටළුව සඳහා විසඳුම් ලබා දීමේදි උක්ත ලිපියේ සඳහන් ඉල්ලීම කෙරෙහි අවධානය යොමු කරන ලෙසත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කිරිම සඳහා ඔබ විසින් මිට අදාළව ගනු ලබන ක්‍රියාමාර්ග නොපමාව මා වෙත දන්වා එවන ලෙසත් කාරුණිකව දන්වා ඇත. මෝදර දේවාල තාප්පය ඒ අයට අවහිරතාවක් වන බවට විශාල පිරිසකගේ අත්සන් සහිතව පෙත්සමක් එවා ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , පෙත්සමේ සඳහන් වන්නේ කුමක්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පෙත්සමේ සඳහන් කර ඇත්තේ ඉහත ලිපිනයේ පදිංචි මා විසින් 2018.09.17 දින සිට මේ දක්වා ලිඛිත ලියකියවිලි මඟින් අදාල නිලධාරි මහත්ම මහත්මීන්ට වගකිව යුතු බලධාරිවරයාටත් ලිඛිත ලිපි මඟින් වරින් වර එතුමන් ලා දැනුවත් කර සිටියත් අම්බලන්ගොඩ නගරාධිපතිවරයා මේ දක්වා සුනාමි නිවාස ගැටළුව විසදීමට පරික්ෂා කිරීමටත් එතුමා පැමිණියේ නැත. දේවාල තාප්පය හේතුවෙන් වාරකන් කාලයට මුහුදු රළු වන අතර මුහුදු රළ වේගවත්ව ගොඩබිමට ගලා එනු ලබයි. නැවත මුහුදු රළ මුහුදට ගලා යැමට මෙම තාප්පය හේතුවෙන් අවහිර වෙයි. එම මුහුදු රළ අඩි දෙකක පමණ උසට අවට සුනාමි නිවාස මුහුදු ජලයෙන් පිරීයයි. සුනාමි නිවාස ගැටළුව විසඳීමට තාප්පය හේතුවෙන් මුහුදු රළ වලින් වෙන හානිය නිරීක්ෂණයටවත් 2018/04/ දින මුහුද ගොඩ ගැලුවද සුනාමි නිවාස වලට වන හානිය දැක බලා ගැනීමටවත් එතුමා පැමිණියේ නැත. මිට ඉහතදී මෙම තාප්පයෙන් සුනාමි නිවාස වලට හානියක් සිදු වුයේ ද නැත. ගැටලුව පෙන්වා දීමට කටයුතු කරන විට එය එතුමා හැල්ලුවට , අපහසුතාවයට පත් කිරීමට මී15 සුනාමි නිවාස ලාභීන් ඉදිරිපත් කරන යෝජනවාක් බව වටහා ගෙන මඟහරිනවා විය හැක.මෙම තාප්පය මුහුද ඉදිරියට මුහුණලා ඉදිකරඇති නිසා මුහුදු රළ වලින් තාප්පයට හානියක් සිදු නොවේ. වෙරළ හරහට තාප්පය ඉදිරකර ඇත්නම් අනිවාර්යයෙන්ම මුහුදු රළ මඟින් තාප්පය කඩා බිඳ දමනු ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ඉල්ලීමට මා ඇහුම්කන් දෙන්නේ නැති බව තමයි එම පෙත්සමෙන් සඳහන් කර ඇත්තේ. මෙහි කෙලින්ම සඳහන් කර ඇත්තේ තාප්පය කඩන ලෙසයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

අපි ගිය සභාවේ කතා වු ආකාරයට ගෙට්ටු දෙක දමන්න. ඔය කියන ආකාරයට වතුර පාරක් එන්නේ නැත. අපි දේවාලයේ අනික් පැත්තෙන් වතුර බැස යන්න තබා ඇත. දැන් ප්‍රශ්නය වී ඇත්තේ ගේට්ටු දෙකයි. අපි ගියවර අනුමත කළා වගේ නගර සභාව ඉදිරිපත් වි ගේට්ටු දෙකක් දමා දෙන්න. එතැනින් වතුර බැස යාමට සැලැස්වීමෙන් ප්‍රශ්නය නිමවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔවුන් ඉල්ලා සිටින්නේ මුළු තාප්පයම කඩන ලෙසයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

එසේ කළ නොහැක . ඔය තාප්පය සුනාමියට පෙරත් තිබුණු තාප්පයකි. එහෙම දෙයක් වුණේ නැහැ. දැනට රළ පාරක් පැමිණියාම වතුර බැසිමට තැනක් නැහැ තමයි. ඔය ප්‍රශ්නය ආවේ ගේට්ටු දෙක අපි වැසිමට පටන් ගත් පසුවයි. දැන් අපි තීරණය කළ ආකාරයට ගේට්ටු දෙකක් දමමු. මෙය නගර සභාවට අයිති ඉඩමක් නිසා නගර සභාවෙන් ඉදිරිපත් වී ගේට්ටු දෙකක් දමා දිමෙන් ප්‍රශ්නය නිමවේ. ගේට්ටු දෙක සාදාන්නේ නැති එක තමයි ප්‍රශ්නය වී ඇත්තේ. නගර සභවේ සේවකයන් යොදවා ගේට්ටු දෙක සවි කර දෙන්න වතුර බැස යාමට. දැන් දේවාලය ඉදිරිපිට සාදා ඇත්තේ මුහුදට නැවත වතුර යන විදියට තමයි සාදා ඇත්තේ. ඒ අය උත්සාහ කරන්නේ ගේට්ටු දෙකක් නොදා තාප්පය නිකං තැබිමටයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ ඒ අයට ඔනේ තාප්පයම අයින් කරන්න. මෙහි චෝදනාව එල්ල කර ඇත්තේ මා මෙයට ඇහුම්කන් නොදෙන බවයි. මේ පිළිබඳ පළාත් පාලන කොමසාරිස්තුමාට පෙත්සමක් ඉදිරිපත් කර ඇති අතර එතුමා මාගෙන් විමසා සිටිනවා ඔබ විසින් ගත් ක්‍රියාමාර්ගය කුමක්ද කියා. මා සභාවේ තින්දව පරිදි තමයි ක්‍රියා කර ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඔබතුමා සභාවේ තින්දුව පරිදි ගේට්ටු දෙකක් දමා දෙන්න. මාහට ඡන්දේ දන් පිරිස බොහෝ සිටිනවා. මා ඡන්දේ ප්‍රශ්නය බලන්නේ නැහැ. ගේට්ටු දෙකක් දමා දෙන්න. මේ සඳහා දේවාලයටත් ආරක්ෂාවත් තිබිය යුතුයි.ඉදිරිපටත් ගේට්ටු දෙකක් තිබෙනවා . උදේ ගේට්ටු දෙක ඇරලා රෑට වසා තබන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනිඒ.පී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි . මෙයට ලිපියක් යොමු කරන්න. සභාවේ තීරණය පරිදි ක්‍රියා කර සිටිනවා කියා. මෙහි අත්සන් කාගේද කියා දන්නේ නැහැ. ඔය පෙත්සමේ අත්සන් වගයකුත් ගසා ඇත. ගරු නගර සභා මන්ත්‍රිනි ඉනෝකා මහත්මියණනි අර අත්සන් වගයක් ගසා ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පිටු දෙකක අත්සන් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඉනෝකා මහත්මිය කතා කරමින්</u>**

ඔය අත්සන් ටික පරික්ෂා කර බලන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවේ ගත් තීන්දුව පරිදිමෙය දැනුම් දෙන්න. තාක්ෂණ සේවා මහත්මයාණෙනි මෙම ගේට්ටු දෙක සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන්න.

**තීරණය**

**සුනාමි නිවාස ගැටලුව මැයෙන් මෝදර දේවාල භූමියේ ඉදිකර ඇති තාප්පය සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් මීට පෙර සභාවේදි ගන්නා ලද තිරණය පරිදි ක්‍රියා කිරිමටත් , ගේට්ටු දෙකක් සවි කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

12.02 ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් 2019.01.08 වන දින පැවැත්වෙන මාසික සභා රැස්වීම සඳහා සහභාගි විමට නොහැකි බව දන්වා එවන ලද ලිපිය සඳහා සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් 2019.01.08 වන දින පැවැත්වෙන මාසික සභා රැස්වීම සඳහා සහභාගි විමට නොහැකි බව දන්වා ඇත.

තීරණය

කොළඹින් බැහැරව 2019.01.07,08 හා 09 යන දින වල සිටින බැවින් 2019.01.08දින පැවති මාසික සභා රැස්වීම සඳහා සහභාගි විය නොහැකි බව දන්වමින් ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පන්යන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලිපියට අනුව එම දින සඳහා නිවාඩු ලබා ගැනිම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

12.03 2018 නොවැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2018 නොවැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව . ආයතනය පවත්වන ලද දින ගණන18, පැමිණි රෝගින් සංඛ්‍යාව 150කි . රෝගින් සඳහා ගිය මුදල රු.15400.68 ක් වශයෙන් වාර්තාව ඉදිරිපත් කර ඇත.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 නොවැම්බර් මස සඳහා වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි**

12.04 ක්‍රීඩා භූමිභාරකරු වන ජී.එම්. සහන් සංකල්ප මහතා විසින් නගර සභා ක්‍රිකට් පුහුණුවීම් සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභා ක්‍රිකට් පුහුණු පාසලේ පුහුණුවීම් කටයුතු සිදු කරනු ලබන්නේ සතියට දවස් දෙකකි. එනම් අඟහරුවාදා දින හා බ්‍රහස්පතින්දා වේ. සතියේ දිනයන්හි මෙම දින දෙක ඉදිරියට අප පුහුණු පාසලට පුහුණු වීම් කටයුතු සිදු කිරීම සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය වෙන්කර ලබා දෙනමෙන් ඉල්ලා සිටිනවා

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි සවස කියන වනතුරු පුහුණු වීම් සඳහා ඉල්ලා තිබේද ? එතන ලොකු ගැටලුවක් ඇති වී තිබෙනවා . ඒ අවට ගමේ සිටින පුද්ගලයන්ට එය සැහෙන බාධාවක් වී තිබෙනවා. රාත්‍රියේදි විදුලි බල්බ් දල්වා ක්‍රීඩා කරන බවයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

විදුලි බල්බ් දල්වා දුන්නා පාපන්දු ක්‍රීඩාව සඳහා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

අපි මෙය ලබා දෙමු සවස 5.00 වනතුරු .

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පියසේන ක්‍රීඩාංගනය ඒ ප්‍රදේශයේ තරුණ තරුණියන්ට ක්‍රීඩා කිරිමට අම්බලන්ගොඩ නගර සභාවට පරිත්‍යාග කරන ලද ක්‍රීඩාංගනයකි. මෙසේ දීමෙන් සිදු වන්නේ පොල්වත්තේ දරුවන්ට ක්‍රීඩා කිරිමට ස්ථානයක් නොමැති වන බවයි. මෙය අපි නගර සභාවෙන් වෙන් කරනා විට. එම තරුණි තරුණයන්ට ක්‍රීඩා කරන්න තැනක් තිබිය යුතුයි පොල්වත්ත ප්‍රදේශයේ. මෙය වෙන්කරන්න එපා . මෙය වෙන්කරන්න වෙන්කරන්න විශාල ගැටලුවක් වේ. ප්‍රදේශයේ සිටින ජනතාවගෙන් අපට දෝෂාරෝපණ පැමිණේ. මෙය වෙන්කරනවා නම් සවස 3.30 පමණ වන විට නතර කළ යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙතනිනුත් යම්කිසි සේවාවක් සිදු වෙනවා. එම ළමයි රාශියක් පුහුණුවීම් කටයුතු සිදු කරනවා. අපි මේ දින දෙක වෙන් කරන්න සවස 5.00 න් පසු ප්‍රදේශයේ ක්‍රීඩා කරන අයට ලබා දෙන ලෙස.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් මෙසේ වෙන් කළාට පසු වෙන මුකුත් අතවශ්‍ය කටයුක්තක් පැමිණියහොත් ගැටලුවක් ඇතිවේ.එවැනි දේවල් පැමිණියහොත් ඒවාට යටත්ව කරන්න

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නගර සභාවේ අවශ්‍යතාවය පරිදි අපට ඒවැනි කටයුක්තක් පැමිණියහොත් පුහුණු වීම් කටයුතු නතර කළ හැකිය.

තීරණය
ක්‍රීඩා භූමිභාරකරු වන ජී.එම්. සහන් සංකල්ප මහතා විසින් නගර සභා ක්‍රිකට් පාසලේ පුහුණුවීම් සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය සතියට දින දෙකක් සවස 5.00 දක්වා ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව වෙන්කිරීම් නොමැතිනම් පමණක් එම දින දෙක ලබා දීම සුදුසු බවට ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදි.

12.05 විෂය ලිපිකරු විසින් ඉදිරිපත්කර ඇති 2019 වර්ෂයේ අයවැය ලේඛනයේ ( බදු හා ගාස්තු පැනවීම) මුද්‍රණ දෝෂ සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

2019 වර්ෂයේ අයවැය ලේඛනයේ ( බදු හා ගාස්තු පැනවීම) මුද්‍රණ දෝෂ පිළිබඳවයි . පිටු අංක 80 ඇති 06.03 මානාන ක්‍රීඩාංගණය වෙන් කිරීම ගාස්තු අයකිරීම සංගීත සංදර්ශන සඳහා කානිවල් සඳහා පාසල් වලට දිනකට රු.15000/= ක් ලෙස සඳහන් ව ඇත. එය රු.10000/= ක් ලෙස සංශෝධනය විය යුතුය. පිටු අංක 77 හි 06.02 පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය වෙන් කිරීම ගාස්තු වලට අංක 3 යටතේ සැහැල්ලු පන්දු ක්‍රීඩාව සඳහා දිනකට රු.500 ක් ලෙස සටහන් වී ඇති අතර එය රු.1500/= ක් ලෙස සංශෝධනය විය යුතු අතර මේ සඳහා අවසර ඉල්ලා ඇත.

**තීරණය**

**විෂය ලිපිකරු විසින් ඉදිරිපත්කර ඇති 2019 වර්ෂයේ අයවැය ලේඛනයේ ( බදු හා ගාස්තු පැනවීම) මුද්‍රණ දෝෂ ඇති**

**01 පිටු අංක 80 හි 6.3 මානාන ක්‍රීඩාංගනය වෙන් කිරීම සම්බන්ධව අය කරනු ලබන ගාස්තුවල සංගීත සංදර්ශන හා සර්කස් කානිවල් (පාසල්) සඳහා දිනකට ගාස්තුව රු15000/=ක් ලෙස සඳහන්ව ඇති මුදල රු.10000/= ලෙස ද**

**02 පිටු අංක 77 හි 6.2 පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය වෙන් කිරීම සම්බන්ධව අය කරනු ලබන ගාස්තුවල අංක 03 යටතේ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟයක් සඳහා දිනකට ගාස්තුව රු.500/= ක් ලෙස සඳහන් ඇති මුදල රු.1500/= ලෙසද ගාස්තුවල සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.**

12.06 විෂය ලිපිකරු නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු දීමනා වැඩිකර ගැනීම සම්බන්ධයෙන් ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පරිසර බලපත්‍ර සකස් කිරීමේ ගාස්තු වශයෙන් 2018 වර්ෂයේ ගැසට් පත්‍රයට අනුව කමිටු දීමනා වශයෙන් ගෙවන ලද මුදල රු.400ක් වේ. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පරිසර බලපත්‍රයක් නිකුත් කිරීම නිලධාරීන් දැනුවත් කිරීමේ ලේඛණයේ තාක්ෂණ ප්‍රගති සමාලෝචනයට සහභාගී වන එක් නිලධාරියෙකුගේ දීමනාව සඳහා රු.500/= ක දීමනාවක් ගෙවන ලෙස දන්වා ඇත. ඒ අනුව කමිටු රැස්වීම් වාරයක් සඳහා දැනට ගෙවනු ලබන රු.400/= මුදල රු.500/= දක්වා වැඩි කිරීමට සභාවේ අනුමතිය ඉල්ලා සිටි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒ අයට රු.400/= ක් සභාවෙන් ගෙවනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රු400/= ක මුදලක් සභාවෙන් ගෙවනු ලබයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙම පරිසර බලපත්‍ර ගන්නවා වැදගත් විදියට ව්‍යාපාර කරගෙන යන පුද්ගලයන්. පරිසර බලපත්‍රය ගන්නේ නැති පුද්ගලයන්ට නගර සභාවෙන් මේ වන විට ගෙන ඇති පියවර මොනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා පරිසර අමාත්‍යාංශයටත් ප්‍රකාශ කළා පරිසර බලපත්‍ර ලබා දීමේ නීතිමය දෝෂයක්. ඒ කියන්නේ පණතේ තිබෙනවා බලපත්‍ර ලබා ගත් පුද්ගලයන්ට වැරදි කළාම නඩු දමන ක්‍රමයක් තිබෙනවා . නමුත් පරිසර බලපත්‍ර නොගත් පුද්ගලයන්ට නඩු දමන ක්‍රමයක් සඳහන් කර නැත. එම නිසා එය සංශෝධනය කරන ලෙස මා සභාපතිවරයෙක් ලෙස මීට අවුරුදු 07 . 08 ඉහතදී පරිසර අමාත්‍යාංශයේ පැවැත්වූ රැස්වීමකදී මා කරුණු ඉදිරිපත් කළා. ඔබතුමා කියන කාරණය තවම නිවැරදි වී නොමැත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මේ කාරණය අපේ ජීවිත කාලයටම නිවැරදි වෙනවාද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය පාර්ලිමේන්තුවේ වැඩකි . අපි නෙමෙයි එය සිදු කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

දැන් තිබෙන ගංඟාවල් , ඇළ , දොළවල් විශේෂයෙන්ම අපද්‍රව්‍ය සේදුම් ස්ථාන බවට පත් වී ඇත. වාහන පැස්සුම් ආයතනවල නම් එම පැස්සුම් කුර දැම්මා එය දිරා ගියා ඉවරයි. මහපාරිමාණයෙන් පරිසරය විනාශ වන කටයුතු වේ. ඒවා ගැන නිහඩ බවක් දක්වන්නේ ඇයිද කියා මා හට විශාල ප්‍රශ්නයකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය නිතියේ තිබෙන දෝෂයකී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එසේ නම් අපි යෝජනා කළ යුතුයි පාර්ලිමේන්තුවට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩට අපේ පක්ෂයෙන් මන්ත්‍රිවරු නැහැනේ.

**තීරණය**
**විෂය ලිපිකරු නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු දිමනා වශයෙන්රු.400/= ක් පැවති දිමනාව රු.500/= දක්වා වැඩි කිරීමට සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

12.07 වනරෝපා ජාතික උත්සවයට සමගාමිව පැල තවාන් කිරීම සම්බන්ධ ලිපියට සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වනරෝපා ජාතික උත්සවයට සමගාමිව පැල තවාන් ඇති කිරිම . උක්ත කරුණට අදාලව පැල තවාන් ඇති කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්තුමාගේ 2018.12.05 දිනැති ලිපිය හා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2018.12.19 දිනැති ලිපිය ඉදිරිපත් කර ඇත. ඒ අනුව නගර සභා බල ප්‍රදේශවල පැල තවාන් ඇති කරන ලෙසත්, අවුරුදු නැකත් සිට්ටුවට ඇතුලත් කරන පැල සිටුවීමේ නැකත හා පැල ලබාදීමටත් පෙර සූදානමක් වශයෙන් පැල තවාන් ඇති කිරීමත් පැල කඩයක් පවත්වා ගෙන යාමත් දක්වා ඇත.ඉහත පරිදි පැල තවාන් සකස් කිරීමට තල්ගස්ගොඩ දළුක්කන්ද ඉඩම තෝරා ගැනීම සුදුසු බව යෝජනා කරන අතර එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනනි , කොතනද ඔය පැල තවාන සකස් කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාගේ කොට්ඨාශාශයේ කොම්පොස්ට් ව්‍යාපෘතිය ඇති ස්ථානයේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් .ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ඉඩම ඒ අයට දෙන ලෙසද ඉල්ලා සිටින්නේ ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ අපි ඉඩමේ මෙම කටයුක්ත සිදු කරන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , එම ස්ථානයට වඩා හොඳයි මා කලින් සභාවක් පවසා සිටියා නිවාස යෝජනා ක්‍රමයේ පහළ කොටසේ අක්කරයක පමණ බිම් තිරුවක් තිබෙනවා. අඩි 50 ක විතර දිග කුඹුරට යන තුරු. එය ඉතා ජාරාවාස වී ඇත. ජනතාවටත් මෙය හිරිහැරයකි. එහි මෙම පැල තවාන සිදු කළානම් හොඳයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතැන කොහොමද බහින්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එතැන කඳු බැවුමක් එතැන සිටුවීමට පුළුවනි. එවිට එතැන අලංකාර බවක් ඇතිවේ.නිවාස සංකීර්ණයේ හොඳයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බලමු අපි එම ස්ථානයට ගොස්.

**තීරණය**
**වනරෝපා ජාතික උත්සවයට සමගාමීව පැල තවාන් සකස් කිරීමට තල්ගස්ගොඩ දළුක්කන්ද නගර සභාව සතු ඉඩම ලබාදෙන ලෙස ඉල්ලා ඇති ඉල්ලීමට අනුව ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් එම ඉඩමේ දිගින් ඇති බිම් කොටසේ මෙම වගාව ඉදිකිරීම සුදුසු බව පැවසූ අතර එය නිරීක්ෂණය කොට එම ස්ථානය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

12.08 රියෝ ක්‍රීඩා සමාජයේ මගින් නගර සභාව වෙත ගෙවිය යුතු ජල ගාස්තුව සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රියෝ ක්‍රීඩා සමාජයෙන් , ජල සැපයුම ලබා ගැනීමට ලිපියක් ලබා ගැනීම . අප ක්‍රිඩා සමාජය මඟින් නගර සභාවට ගෙවිය යුතු ජල සැපයුම සම්බන්ධව මුදලින් රු.100000/= මුදලක් මේ වන විට ගෙවනු ලැබූ අතර ඉතිරි මුදල වාරික මගින් මාස 6කින් ගෙවීමට කටයුතු කරනු ඇත. ඒතෙක් අපහට ජල සම්පාදන මණ්ඩලය ලබා දිය යුතු ලිපිය ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මෙම කාරණය ගියවර සභාවටත් යොමු කළා නේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රියෝ ක්‍රීඩා සමාජය විසින් ගෙවිය යුතු මුදල රු.207307.63 කි. ඉන් රු.100000/= මුදලක් ගෙවා ඇත. ඉතිරි ජල සම්පාදන මණ්ඩලයට ලිපියක් ඉදිරිපත් කරන ලෙස ජලය ලබා ගැනීමට විරෝධතාවයක් නොමැති බව පවසා. ජල සම්පාදන මණ්ඩලයට ලිපියක් ලබා දෙන ඉල්ලා ඇත. ඉතිරි මුදල සමාන වාරික 6කින් ගෙවන ලෙස දන්වා ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙම මුදල නොගෙව්වොත් එහෙම මොකද වෙන්නේ ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා පවසන්නේ ඔය කරන්න යන්න එපා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගෙවීමේ වගකිම තිබිය යුතුයි. ඒ අයට ජලය ලබා දිය යුතුයි . ක්‍රිඩා කරන දරුවන්ට එය අවශ්‍යයි.රියෝ ක්‍රිඩා සාමාජය කියන්නේ මෙම නගරයේ ක්‍රීඩා කරන දරුවන්ට ලොකු අත්වැලක් දෙන ආයතනයකි. එය කිසි ගැටලුවක් නැහැ. නමුත්

අප සභාවෙන් නිත්‍යානුකුල නොවන ආකාරයට ජලය ලබා ගත් බිලෙහි ගෙවීම් කළ යුතුයි. දැන් රු.100000/= මුදලක් ගෙව්වා නම් ඉතිරි මුදල ද වාරික 6කින් හරි කමක් නෑ ගෙවන්න දෙන්න . ගැටලුවක් නැහැ. නමුත් ගෙවීමේ වගකීම සිදු වන්නේ කොහොමද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අය භාර ගන්නවා කියා තමයි මෙහි සඳහන් කර ඇත්තේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

භාර ගන්නවා කිව්වාට අපි ජල සැපයුම දුන් පසු ඉතිරි මුදල නොගෙවා සිටියොත් මොකක්ද ගන්න තීන්දුව? එයත් මෙම සභාවේදීම තීරණය කළ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මොකක්ද මේ සඳහා ගනු ලබන තීන්දුව?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙම ක්‍රීඩා සාමාජයේ චෙක්පත් 6ක් වත් තබා ගන්න. ඇපය සඳහා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේනම් මේ සඳහා ගිවිසුමක් ඇතිකර ගැනීම හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මට දැන ගැනිමට අවශ්‍යයි . විරුද්ධත්වයක් නැහැ කියා ජලය ලබා දුන් පසු ජල සම්පාදන මණ්ඩලයෙන් තමයි සැපයුම ලබා දෙනු ලබන්නේ. එම නිසා අපිට අයිතියක් නැති වෙයි එය ක්‍රියා විරහිත කිරිමට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ දැන් අපිට අයිතියක් නැහැ. මෙය කලින් කර තිබුණේ බැට්මින්ටන් ක්‍රීඩාංගණයට ජලය ලබා ගත් මාර්ගය. ඒ අය එතැනින් ජල නල මාර්ගයකින් ජලය ලබා ගෙන තිබුණා. බිල වැඩි වීම පිළිබඳ සොයා බැලිමේදි මේ අය අනවසරයෙන් ලබා ගෙන තිබුණා. ඒ සඳහා ගෙවිය යුතු මුදල රු.207307.63 මුදලක් බව තක්සේරු කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

දැන් අපි විරුද්ධත්වයක් නැහැ කියා ලියුම දුන් පසු නොගෙව්වත් අපිට කරන්න දෙයක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපගේ ගරු උපසභාපති තුමා පවසනනේ ගිවිසුමක් ඇති කර ලබා දෙන ලෙසයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගිවිසුමක් ඇතිකරගෙනත් නොගෙවා සිටියොත් මොකද කරන්නේ. අපිට ජල සැපයුම නතර කළ නොහැක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපිට ගිවිසුමෙන් නිත්‍යානුකුලව මුදල් ලබා ගත හැකිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ක්‍රිඩා සමිති තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වෙනවා තනි පුද්ගලයන්ගේ අධිපත්‍ය තුල . ක්‍රිඩා සමිති සමාගම් හරහා නොවන අවස්ථා තිබෙනවා. මෙම ක්‍රීඩා සාමාජයේ මෙය ඉල්ලා සිටින්නේ සභාපතිද , ලේකම් ද කියා මුලින්ම බැලිය යුතුයි. මොකද හේතුව අපිට යම් යම් පුද්ගලයන් පවසන්නේ මේවා පෞද්ගලික බුදල් ලෙස පාවිච් කරන බවයි. එවැනි

ගැටලු තිබෙනවා. නමුත් ඔය ක්‍රිඩා සමාජය යම් සේවයක් ඉටු කරන නිසා ගරු මන්ත්‍රීතුමා පවසන ආකාරයට විශාල ගැටළුවක් වෙනවා . ගිවිසුමක් ඇති කර ගන්නවා නම් හොඳයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගිවිසුම් ගත වී ඇප තැන්පතු මුදලක් තබා ගත්තද එයත් මේ සභාවේ තිරණය කරන්න .එවැනි මුදලකට ඇප තැන්පතුවක් ලබා ගතහොත් එම මුදල බැංකුවේ තැන්පත් කර තැබිමට සිදු වේ. එම නිසා රක්ෂණ ඇප තැන්පතුවක් ලබා ගන්න. හැබැයි එය මාස 6ක් ඇතුලත ගෙවන බවට ලබා ගත යුතුයි. බැංකුවෙන් ගන්න ගියහොත් අපිට මුදල් ගෙව්වා වගේ තමයි මෙය සිදු වන්නේ . එම නිසා රක්ෂණ තැන්පතු ඇපයකින් අපට ලබා ගත හැකි ආකාරයට මෙය සකසා ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රීනි එම්.ඩබ්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, රුහුණු සංචාරක කාර්යාංශයෙන් මාදම්පා ගංගාව සාදා තිබෙන මධ්‍යස්ථානයට ජල සැපයුම එම ගොඩනැගිල්ලටත් ගැනිමට අවශ්‍ය ව ඇත. මා හිතනා ආකාරයට ඩොල්ෆින් ජල ක්‍රීඩා සාමාජයේ බිල නගර සභාවෙන් ගෙව්වත් ඩොල්ෆින් ජල ක්‍රිඩා සාමාජයෙන් තමයි දැනට ජල සැපයුම ලබා ගනු ලබන්නේ . රුහුණු සංචාරක කාර්යාංශයට වෙනම ජල සැපයුමක් ලබා ගැනීමට සභාවෙන් අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපි එම කාර්යාංශයේ පැවැති උත්සවයට සහභාගි වුණා. ඒ ගිය විට අපි දුටුවා ඩොල්ෆින් ජල ක්‍රිඩා සාමාජය ඉදිකරන ලද නාන කාමරයේ ජල කාරාම කැඩී තිබේ. එහි වතුර ටැංකිය වගේ .

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය ඉදිකර ඇත්තේ කොන්ත්‍රාත්කරු විසිනි.එවා සාදා දෙන ලෙස පොරොන්දු වුණා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එය බලන්න සාදා තිබේ ද කියා? ටැංකිය වගේ වතුර පිරි තිබුණා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කොන්ත්‍රාත්කරු විසින් සාදා දෙන බවට පොරොන්දු වුණා. මා රුහුණු කාර්යාංශයේ සභාපතිතුමාට පැමිණිලි කළා. ඔහු පැවසුවා මෙය සාදා දෙන බවට. මෙම රියෝ ක්‍රඩා සමාජයේ රක්ෂණ ගිවිසුමක් ලබා ගෙන එම ඉතුරු මුදල ගෙවීමේ පදනම මත ලබා දෙන්න.

**තීරණය**

**රියෝ ක්‍රීඩා සාමජය මගින් නගර සභාවට අයවීමට ඇති හිඟ ජල ගාස්තුව සඳහා රක්ෂණ ගිවිසුමක් අත්සන් කර ඉතිරි මුදල වාරික 06 කින් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

12.09 අම්බලන්ගොඩ , ඕකන්ද , ප්‍රජාශාලා ගොඩනැගිල්ලට වම් පසින් පිහිටි ත්‍රිකෝණාකාර ඉඩම් තීරයේ ගබඩා කාමරයක් සාදා දෙන ලෙස ජී.ඩබ්. අනුර මහතා විසින් එවන ලද ලිපියට සභා ගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ , ඕකන්ද , ප්‍රජාශාලා ගොඩනැගිල්ලට වම් පසින් පිහිටි ත්‍රිකෝණාකාර ඉඩම් තීරයේ ගබඩා කාමරයක් සාදා දෙන ලෙස ජී.ඩබ් අනුර මහතා ඉල්ලා ඇත. ඉහත සඳහන් ප්‍රජා ශාලාවේ සමෘද්ධි කාර්යාලය හා ග්‍රාම නිලධාරි කාර්යාල පවත්වා ගෙන යනු ලබන අතර පොදු රැස්වීම් සියල්ලම පහේ පවත්වනු ලබන්නේ මෙම ගොඩනැගිල්ල තුලයි. දැනට ඕකන්ද මරණාධාර සමිතියේ හා , ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතියේ ප්ලාස්ටික් පුටු හා යකඩ බට සෙවිලි තහඩු ගබඩා කරනු ලබන්නේ මෙම ගොඩ නැගිල්ල තුලයි. මෙවැනි තත්වයක් යටතේ භාණ්ඩ ගබඩා කිරිම හා අනෙකුත් රාජකාරි කටයුතු වලට බලවත් හිරිහැරයක් සිදු ව ඇති අතර ගොඩනැගිල්ලේ බිත්ති ආදිය පළුදු වී ඇත. මෙවැනි තත්වයක් යටත් මෙම ගොඩනැගිල්ල පාවිච්චි වුවුහොත් ගොඩනැගිල්ලේ ඇතුලත හානියක් සිදුවන බැවින් අදාල ගබඩා කාමරයක් සකසා දෙනමෙන් කාරුණිකව ඉල්ලිමක් කර ඇත.

**තීරණය**

**අම්බලන්ගොඩ, ඕකන්ද, ප්‍රජාශාලා ගොඩනැගිල්ලට වම් පසින් පිහිටි ත්‍රිකෝණාකාර ඉඩම් තීරයේ ගබඩා කාමරයක් සාදා දෙන ඉල්ලා ඇති පී.ඩබ්. අනුර මහතාගේ ඉල්ලීම අනුව මේ සඳහා මීට ඉහතදී ද මාසික සභා රැස්වීමේදී සාකච්ඡා කර ඇති අතර එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කර අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

12.10 අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ නිල පියස ඉදිකිරිම සම්බන්ධව තම කැමැත්ත ප්‍රකාශ කර ඉදිරපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ඕකන්ද ග්‍රාමසේවා වසමට නිල පියස වැඩ සටහන යටතේ ස්වදේශිය කටයුතු අමාත්‍යාංශයෙන් රු.2000000/= ක මුදලක් මා ගරු අමාත්‍යතුමාගේ මා පුද්ගලිකව කතා කර ඉල්ලා ගනු ලැබුවා. මෙම නිල පියස සකස් කරන ලෙස ඔබතුමන්ලා භූමි භාගයක් නගර සභාවෙන් වෙන් කර දුන්නා. නගර සභාව මඟින් මෙම භූමි භාගය සුද්ද කරද්දි ඔබතුමා ම මා හට දැනුම් දුන්නා. මා ඉන්පසු මා මෙය පොඩ්ඩක් නතර කරනු ලැබුවා. නැවත එහි පස් කපා අයින් කරනු ලැබුවා. පස් ඉවත් කළ පසු ඕකන්ද ග්‍රාමසේවා වසමට එම කොටස අයත් වන්නේ නැත. එම් ගමේ ජනතාවගේ විරෝධයක් පැමිණියා අපේ ගමේ ග්‍රාමසේවක කොට්ඨාශයේ එය සාදන්න එපා . එම කොටසේ අපට අවශ්‍යතාවයන් තිබෙනවා. අපගේ ග්‍රාමසේවා වසමේ කරන දේවල් ඉදිකිරීමට අපට ස්ථානයක් නැති වන නිසා . ඒ ලිපියක් මා ඔබතුමාට යොමු කරන ලදි. මෙම නිල පියස ඕකන්ද ප්‍රදේශයේ ඉදි කළ යුතුයි. මෙය ලබා ගත්තේ ඉතාමත් සත්භාවයෙනි. ගමට සේවයක් කිරිමට මා හට අවශ්‍යාව ඇත්තේ මෙම නිලධාරින් 4 ම එකම ස්ථානයක තබා මෙම වැඩකටයුතු සිදු කිරීමට. මේ ගමේ සේවය සඳහා යන්නේ මෙම ගමේ පදංචිකරුවන්මයි. මාත් එම ගමේ ජිවත්වන කෙනෙකි. මේ සඳහා අපි ප්‍රසිද්ධ දැන්වීමක් ප්‍රදර්ශනය කළ රැස්වීමක් කැඳෙව්වා මෙම ගැටලුව විසඳා ගැනීමට. එත් මොන හේතු නිසා ද දන්නේ නැහැ මේ සඳහා 12කු විතර සහභාගි විය.රැස්වීමේදි එක එක යෝජනා ඉදිරිපත් කරන ලදී. මා මේ සඳහා නොගිහින් ගම් වාසින්ට පැවසුවා ඔබලාම මෙයට යන්න. ගමේම ප්‍රභූවරුන් වන ජයවිර මහතා , මහින්ද මහතා ආදි ප්‍රභූවරුන් පිරිසට පැවසුවා ඔබලාම මේ සඳහා තීරණයක් ගන්නා ලෙස. එම තීරණය සහත 76කු අත්සන් සහිත ලිපිය මා ඔබතුමාට ඉදිරිපත් කර ඇත. මෙහි එම පුද්ගලයන් ඉල්ලා සිටිනවා නිල පියස ඉදිකිරිම 86 ඕකන්ද ග්‍රාමනිලධාරී වසම . අම්බලන්ගොඩ නගර සීමාවේ 86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියස ඉකිරීමට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් රු.2000000/= ක මුදලක් වෙන් කර දී ඇත. මෙම ගොඩනැගිල්ල ඕකන්ද අත්කම් නිවාස අංක 9 නිවස ඉදිරිපිට තාප්ප මායිමේ සිට සුසාන භූමියේ මායිම දක්වා උතුරු දිසාවට වනසේ ඉදිකිරීමට සුදුසුය. කවුරු විරුද්ධ වුවත් මෙම ස්ථානයේ දැනට පවතිනනේ කෙසෙල් ගස් වවා කුණු ගොඩකි. මෙය සැදිමෙන් එම ස්ථානය පිරිසිදු වෙනවා. අලංකාර වෙනවා. කිසිම කෙනෙකුට කුණු දැම්මට නොහැකිය. මේ නිල පියස ඉදි කළ යුතුයි. ඔය ඉහත භූමි ප්‍රදේශක් ඉල්ලා සිටියත් එය අපි සැදිය යුතු නැහැ. එම කාර්යාලයේ නිලධාරින් 2කුට වඩා සිටිය නොහැකිය . මෙහි සඳහන් වූ ආකාරයට බිත්ති පුපුරා ගොස් ඇත. නැවත අලුත් වැඩියා කටයුතු කළ යුතුයි. පොදු සේවා කටයුතු සඳහා මෙය තබා ගන්න. මරණාධාර සමිති වැඩිහිටි සමිති එහි තැබිය හැකියි. එම ගොඩනැගිල්ලේ එක් කරුණක් වන්නේ වයසක අයට උඩ නැගිමට බැරිය. ශාලාව ඇත්තේ ඉහල මාලයේය. සමෘද්ධි රැස්විමක් තිබුණත් එය තබනුයේ ඉහල මාලයේය. මෙම නිල පියස ඉදිකරනු ලබන්නේ බිම මට්ටමෙහිය. ශාලාව ඇත්තේ මැද සාලයේය. අතන කාර්යාලයේ සිට වාඩි වී ඔනැම නැති බැරි වයසක කෙනෙකුට මෙහි සේවය ලබා ගත හැකිය. මා මන්ත්‍රිවරියක් වශයෙන් මා හට අවශ්‍යාව ඇත්තේ පොදු ජනතාවගේ වැඩක් කිරිමටයි. මා ඉල්ලා සිටිනවා සියළුම මන්ත්‍රිවරුන්ගේ මෙයට සහායෝගය ලබා දෙන ලෙස. මෙම ලබාගත් මුදල් වලින් මෙම නිල පියස ඉදිකළ යුතුයි. යම්කිසි පොදු වැඩක් ඉටු කරන විට කිසිම කෙනෙකු බාධා කරන්න එපා. මෙහි කිසිම කෙනෙකුට ප්‍රකාශ කරන්න බෑ මෙහි මෘත දේහය වළ දමනවා කියා .එතැන සුසාන භූමිය වුණාට එහි මෘත දේහ වල දමන්නේ නැත . පිට්ටනියක් තිබෙනවා ඉදිරිපිට. පිට්ටනිය ඉදිරිපිට කොටසයි මා ඉල්ලා සිටින්නේ . පිට්ටනියට බාධාවක් වන්නේ නැහැ. මෙම ලිපියේ සඳහන් කර තිබෙනවා. අවමංගල්‍ය අවස්ථාවකදි හෝ වෙනත් උත්සවයකදි රථ වාහන නැවැත්වීමට කිසිදු බාධාවක් ද නොවනු ඇත. තවද විහාරස්ථානයේ හෝ කිසිදු උත්සවයක් අවුරුදු උත්සව,ක්‍රිකට් ක්‍රීඩා උත්සව වැනි උත්සව පැවැත්විමටද මෙම නිල පියස අදාල ස්ථානයේ ඉදිකිරිම බාධාවක් නොවනු ඇත. නිල පියස ඉදිකිරිමට ඕකන්දයේ වෙනත් ස්ථානයක් නොමැති බැවිනි. ඇත්තටම ඕකන්ද ප්‍රදේශයේ මෙ සඳහා ස්ථානයක් නොමැත. අපි කිහිප තැනක්ම ගිහින් බැලුවා. අපි ප්‍ර දේශිය සභාවේ තාක්ෂණ සේවා නිලධාරි මහත්මියට ස්තුතිය කළ යුතුයි. එතුමිය කිහිප වරක් ම අපි කියන ස්ථානයට පැමිණ මැන බැලුවා. එම ස්ථානයේ එය ඉදිකළ නොහැකි ඉඩ නැති නිසා. මා හට මෙම යෝජිත නිල පියස සාදා ගැනිමට ඉඩ සලසා දෙන්න . මෙම මුදල් රඳවා තබා ගැනීමට නොහැකිය.රඳවා තබා ගෙන සිටිනුයේ බොහොම අමාරුවෙනි. ප්‍රා දේශිය ලේකම්තුමිය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට දුරකථනයෙන් දැනුම් දී ඕකන්ද ප්‍ර දේශයේ මෙය ඉදිකරන බව පැවසිමෙන් තමයි මෙම මුදල් රඳවා තබා ගෙන සිටිනුයේ. එය රජයේ මුදල් නිසා රඳවා තබා ගෙන සිටිමට නොහැකිය. එම ලැබුණු මුදල් වලින් මෙය කිරීමට සහායෝගය ලබා දෙන්න. ඕකන්දේ ජනතාවට සේවය

ලබා ගැනිම සඳහායි මෙය ඉදිකරනු ලබන්නේ. ඔවුන්ට ප්‍රයෝජනය ලබා ගැනිම සඳහායි. දේශපාලනයකින් තොරව සෑම කෙනෙකුම පවසා සිටියේ මෙය කවුරු දුන්නාත් කමක් නැහැ. මෙය ඉදිකරන්න . ඔබතුමා අනුමත කරනු ලැබු ස්ථානයේ වුණත් මට කමක් නැහැ. මම එතැන වුණත් මෙය ඉදි කරනවා. එහිදි බොහෝ බාධා පැමිණෙනවා ඕකන්ද ප්‍රදේශයේ ජනතාවට. ඒ අය ඕකන්ද සුසාන භුමියේ පහළට ම බැස යා යුතු නිසා. අපි වුණත් වයසට ගියවිට අපිටත් වුණත් ලොකු කන්දක් පහළට බැසිමට නොහැකිය. සේවයක් සපයන්න සදන ආයතනයක , සේවයක් සපයන නිලධාරින්ගේ යහපත උදෙසා , අපේ ඕකන්ද ගම්වාසින්ගේත් යහපත බලා කතා කරන අපිත් යම් සේවයක් ඒ අදාල ග්‍රාම නිලධාරි මහතාගෙන් ලබා ගන්න නිසා ඒ සියලු දෙනාගේම යහපත බලා ගරු සියළුම මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මෙම බිම් කොටස ගෙන නිල පියස ඉදි කරන්න සහායෝගය ලබා දෙන ලෙස. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ 76 දෙනා ගනු ලැබු තිරණයත් මන්ත්‍රිවරියක් වශයෙන් මාගේ ඉල්ලිමත් සලකා බලා මෙම බිම් කොටස ලබා දෙන ලෙස. හෙට දිනයේම මෙහි අත්තිවාරම් දමා මෙම වැඩය ආරම්භ කිරිමට.මෙය ඉල්ලා සිටිනුයේ ආදරණිය ඕකන්ද ජනතාවට සේවයක් සැපියීම සඳහායි. අර අනුර මහතා ඉල්ලා ඇති කොටසේ අපගේ ගබඩා බඩුත් දමාගෙන සමති සමාගමුත් පවත්වාගෙන යා හැකියි. අපගේ සියළුම මරණාධාර සමිතියේ බඩුත් තිබෙන්නේ එහි.දැනට එම ගොඩනැගිල්ලේ ග්‍රාම නිලධාරි මහතා සහ සමෘද්ධි නිලධාරි මහතා පමණයි එම ගොඩනැගිල්ලේ සිටින්නේ. එම කාර්යාල අසළ අපගේ අයත් රැදි සිටිනවා.එය අම අයට රාජකාරියට ලොකු බාධාවක් සිදු වෙනවා.අතන ගොඩනැඟිල්ල ඉදි කලහොත් ඒ අයගේ බඩුත් සුරක්ෂිතව ඇත. ඒ අය යතුරු පරිහරණය කරනු ලබන්නේ . එවිට එම නිලපියසත් සමඟ කිසිම කෙනෙකුට සම්බන්ධතාවයක් නැත.ඒ අයට නිදහසේ රාජකාරි කටයුතු කල හැකිය. එහි දොර ඇරිමට අපි යා යුතු නැ. අපි මේ අයගේ දොර නිතරම අරිනවා. මරණාධාර සමිතියේ බඩු ගන්න.මරණාධාර සමිතියේ බඩු ගන්න.වැඩිහිට සමතිය තැබිමට ආදියට අපි මෙම ගොඩනැගිල්ල පවිච්චි කරන එක රජයේ නිලධාරින් 4 ට ලොකු බාධාවක් වී ඇත. දැනට සිටින්නේ නිලධාරින් 2 යි එම නිසා 4 ම එකම ස්ථානයට ගැනීමට මෙම නිල පියස සැදිම අත්‍යවශ්‍ය කරුණකි. එම නිසා මෙයට අවශ්‍ය සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. අපි නගර සභාවෙන් ඉල්ලිමක් කළා. අපි එම ඉල්ලීමට ගරු ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙ වජිර අබේවර්ධන මැතිතුමාටත් මා ස්තුතිය පුද කර සිටිනවා. අපි ඉල්ලා සිටි නිල පියස 4ක් ලබා දී තිබෙනවා. මා දුරකථනයෙන් කතා කර පෝරඹ සහ ඕකන්ද නිල පියස ඉල්ලා ගනු ලැබුවේ .එදා එතුමා මේ සඳහා රු.4000000/= ක් ලබා දුන්නා. මා ඉදිරියේදිත් තල්ගස්ගොඩ ආදි  තව 6ක්  ඉදිරියේදි ලබා ගැනීමට තිබෙනවා. මා ඇප කැපවි එම 6 ක් ලබා ගෙන අම්බලන්ගොඩ නගරයේ නිල පියස ටික ඉදිකිරිමට අවශ්‍ය සහායෝගය ශක්තිය ලබා දෙන බවටත් මෙම වැඩය කිරීමට සියළුම මන්ත්‍රීවරුන්ගෙන් මේ සඳහා සහායෝගය ලබා දෙන ලෙසටත් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සඳහා දැන් පහළට බැස යාමට කිවු ස්ථානයේ යෝජිත තැනක් තිබෙනවාද? ඒ කොතනද කියා කරුණාකර මාහට ප්‍රකාශ කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සභාවේ ස්ථාන 11 ක් හදුනා ගෙන තිබෙනවා.2018.10.02 පැවති සභා රැස්විමේ වාර්තාවේ 12.08 යටතේ මෙම ස්ථාන හඳුනාගෙන තිබෙනවා.

- මහ අම්බලන්ගොඩ කොට්ඨාශය, කොට්ඨාශයෙන් පිටත කොට්ඨාශයට මායිම්ව පිහිටි ඉඩමකි . ප්‍රජා ශාලා ගොඩනැගිල්ලට යාබදව පිහිටි නගර සභා පෙර පාසලට ආසන්නව පිහිටි මානාන ක්‍රිඩා භූමිය. ක්‍රීඩා භූමියට හානියක් නොවන පරිදි ඉදිකිරිමට
- කරත්ත කන්ද කන්ද මාවතේ පොදු ළිඳ පිහිටි ඉඩම
- පනියන්දුව දැනට ප්‍රජා ශාලාව පිහටි ගොඩනැගිල්ල පිහිටි ඉඩම .  මිට කලින් සඳහන් කළ මහ අම්බලන්ගොඩ කොට්ඨාශයේ ගොඩනැගීල්ල ඉදිකරනු ලබනුයේත් එතැනමයි.
- පටබඳිමුල්ල දැනට ග්‍රාම නිලධාරි ගෙඩනැඟිල්ල පවත්වා ගෙන යනු ලබන වෙරළ උද්‍යානය අශ්‍රිතව පිහිටි ඉඩම .
- කළුවඩුමුල්ල ග්‍රාමිණි විද්‍යාලයේ ක්‍රීඩා භූමිය. ක්‍රීඩා කටයුතු වලට බාධාවක් නොවන පරිදි ලබා දිය හැක.
- පෝරඹ අ/ම කරුණාරත්න ප්‍රජා ශාලාව පිහිටි ඉඩම .
- විලේගොඩ අම්බලන්ගොඩ මහ විහාර පාරේ ඉඩම පිහිටි ඉඩම . මෙම භූමිය දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමකි. එහි අවසරය ලබා ගෙන කළ යුතුයි.
- තල්ගස්ගොඩ ඩිපෝව ඉදිරිපිට පිහිටි ඉඩම
- පොල්වත්ත බුද්ධදත්ත පාසල ඉදිරිපිට ඇති ඉඩම් කොටස හෝ පිට්ටනිය අසළ කොටස .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

පොල්වත්ත බුද්ධදත්ත පාසල ඉදිරිපිට ඇති ඉඩම නගර සභාව සතු ඉඩමක්ද  ?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

- ඕකන්ද සුසාන භූමිය පිටිපස තොරණ ගසා ඇති තැන විහාරගොඩට මුහුණලා ඇති ඉඩම් කොටස. ලෙස තමයි තින්දු කර ඇත්තේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මෙම කියන ස්ථානය සුසාන භූමිය අයිනෙන් යන ස්ථානයද මේ සඳහන් කරන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එතැන තමයි යෝජනා කර ඇත්තේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මේ මන්ත්‍රීතුමිය සඳහන් කරනු ලබන යෝජිත ස්ථානය කොතැනද ? පන්සල අයිනේ ද ?

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

මා දැන් යෝජනා කරනු ලැබ සිටිනනේ ඕකන්දෙ පන්සල පසු විට ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාගේ නිවසට හැරෙන මායිම් තාප්පයේ සිටි ආරි මහත්මියගේ නිවස පහළ කොටසට . පොල්වත්ත ග්‍රාම නිලධාරි කොටස නිසා ගැටලුවක් වුණා. ඕකන්ද ප්‍රදේශයට අයිති නැහැලූ එම සුසාන භූමියේ එම කොටස .

පොලපොල්වත්ත පුර අය විරෝධතාවයක් ඉදිරිපත් කර ඇත . මෙහි ඉදි කරන්න එපා . එය ඕකන්ද ප්‍රදේශයේ ඉදිකරන ලෙස. ඒ අයත් 60කු පමණ අත්සන් කර ඉදිරිපත් කර ඇත.මේ නිසා ලොකු ප්‍රශ්නයකට මැදි වි ඇත. අපි එතැන සුද්දත් කළා. සුද්ද කර පස් කපා ඉවත් කර නැකත් සාදා සියල්ලම සූදානම් කළ පසු තමයි ගමේ අය පැමිණ විරෝධතාවයක නිරත වුයේ. මා හට ඒ ගමේ අයත් අවශ්‍ය වෙනවා . පොදු වැඩක් කිරීමට ගොස් ජනතාවගෙන් දොස් අසන්න අවශ්‍ය නැහැ. මා ගරු සභාපතිතුමාට මෙය ඉදිරිපත් කරන්නම්. ඇත්තටම මා දන්නෙත් නැහැ එය පොල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාශයට අයිති බවට . මා සිතුවේ ඕකන්ද ප්‍රදේශයට අයිති බවයි. අපගේ ඕකන්ද ප්‍ර දේශයේ ජනතාව බොහෝ පිරිසකගේ ඉල්ලීමක් තිබුණා . පහළ මෙය ඉදිකරන්න එපා කියා. නමුත් නගර සභාවේ අනුමතිය ලබා දුන් නිසා මා පවසා සිටියා . නගර සභාවෙන් අනුමතිය ලබා දුන් නිසා එතැන තමයි මෙය ඉදිකළ යුක්තේ. නමුත් එම ගම් ප්‍රදේශයේත් විරෝධයක් පැමිණියා.ඇත්තටම ඕකන්ද ප්‍රදේශයේ ඉදිකළ යුක්තේ එම ග්‍රාම නිලධාරි වසමට අයිති භූමි භාගයයි. මෙය පොල්වත්තේ ඉදිකිරිමෙන් වැඩක් නැත.එය ලොකු බලපෑමක් වී ඇත. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා එය පොල්වත්තට හෝ කළුවඩුමුල්ලට ගැනීමට ගත් නිල සෙවණේ දැන් වැඩ ආරම්භ කරමින් සිටිනවා. ගස කපා ඉවත් කර දෙන තෙක් වැඩ කිරීමට නොහැකි වී ඇත. එම ගස ඉවත් කිරීම හෙට අනිද්දාම සිදු විය යුතුයි. ගල් , ගඩොල් ,වැලි ආදි සේරම ගෙනත් තිබෙනවා.වැඩ පටන් ගැනිමට බලාගෙන සිටින්නේ ගස ඉවත් කරනතුරු. ගස ඉවත් කිරීමත් නගර සභාවෙන් කළ යුතුව ඇත. එය ඉවත් කර දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය මටත් සම්බන්ධ ප්‍රශ්නයකි.මෙම නිල සෙවණ ආදි දේවල් අප ගම් ප්‍ර දේශයට ලැබීලා එවා ඉදිවෙන එක ගැන අපේ විරුද්ධත්වයක් නැහැ.දැන් මෙතුමිය මේ බව ප්‍රකාශ කරනු ලබන්නේ හොඳ අදහසකින් වුවුත් මෙය ඉදිකරනු ලබන්නේ ඕකන්ද ප්‍රදේශයේ වුවත් මෙය ඉදිකරනු ලබන්නේ පොල්වත්ත පොදු සුසාන භූමිය තුලයි. පොල්වත් පොදු සුසාන භූමිය තිබෙන්නේ කුමටකටද ? කෙනෙකු මිය ගිය මෘත දේහය වල දමන්න ඕන. එහි අඩි 40*20 කැල්ලක් ඉවත් වෙනවා කියන්නේ කොහොමද? ඔය කියන ස්ථානයේ මෘත දේහ වල දමනු ලැබු ස්ථානයකි. අපි මෙහිදි ජනප්‍රිය වෙන්න තින්දු ගන්නේ නැහැ. මා පැවසු වුයේ ඒ නිසයි ඕකන්ද මැද තිබෙන ඉඩම් කැල්ලක් . එහි ඉදිකර ගන්න කියා. එසේ නැතිනම් ඔය ක්‍රීඩාංගනයේම ඕකන්දට අයිති වෙන කොටසේ ඉදි කර දමන්න. ඔබතුමට මතකද ? එක පාරක් තාප්පයක් ඉදිකිරිමට ගොස් ගම බෙදී ප්‍රශ්නයක් ඇති වුණා. එහෙත් මෙතුමිය පවසා සිටින්නේ ඕකන්ද ප්‍රදේශයමේම ඉදි කළ යුතු බවයි. එය පොල්වත්තටයි අයිති වෙන්නේ. පොල්වත්තට අයිති එකකි. මෙම සුසාන භූමිය අපට විතරක් අයිති එකක් නෙමේ මෙම කොට්ඨාශ 13ටම අයිති එකකි. පොල්වත්තපුර සුසාන භූමියේම කොටසක ඉඩම් කොටසක මන්ත්‍රිවරු ජනප්‍රිය වෙන්න තීන්දු ගෙන නිවාස ඉදිකළා. අදටත් ඒවාට ඔප්පු දෙන්න පුළුවන්ද ? ඔබතුමා පසු පස කොට්ච්චර එනවාද ඔප්පු ගන්න.ඒවාට ඔප්පු දීමට හැකියාවක් තිබෙනවාද ? නැහැ. අනෙක් කාරණය පොදු සුසාන භූමියක අපිට වලක් හැරිමටවත් නිත්‍යානුකුල අයිතියක් තිබෙනවාද උසාවියකින් ඇර. රටේ යුධ සමයේ මිය ගිය රණවිරුවෙකුගේ සොහොන් කොතක් ඉදිකිරිමට නොදුන් සුසාන භූමියකි. මෙහි නිත්‍යානුකුල තත්වයක් අවබෝධ කර ගත යුතුයි. මාත් කැමතියි මෙය ඉදි කරනවාට .

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

මාගේ පියාගේ මෘත දේහය නිදන් කරනු ලැබුවේ ඔය ස්ථානය තුලයි.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මෙහිද මුදල් ප්‍රතිපාදන වෙන් කරන විට මේ සඳහා අපි ඉඩම් කොටසක් මුදලට හරි ලබාගෙන ඕන වැඩ කටයුතු කරන්න. මෙතුමිය මා පැමිණෙන විට මා හට පැවසුවා මේ නිල සෙවණ හදන්න ඕන . හෙට දිනයේ මුල් ගල තබන්න ඕන. 31 වෙනි දින පැමිණ හෙට මුල්ගල තැබීමට සූදානම් වෙනවා. මෙහි නිත්‍යානුකුල තත්වය කුමක්ද ? අද පවතින නීතිය අනුව පන්සලක ඉදිකිරිමක් සිදු කළත් අදාල පළාත් පාලන ආයතන වලින් අවසර ගත යුතුයි.එම නිසා යම් ක්‍රමයකට යා යුතුයි. මේවාට අපිට අත ඔසවා ප්‍රශ්න ඇති කර ගන්න බැහැ.අපි ජනතාවට මුහුණ දිය යුතුයි. ජනතාව කැමතියි නිල සෙවණ ඉදිවෙනවාට . දෙමහල් ගොඩනැගිල්ක් අපි ඉදිකර ඇත.රජයේ මුදල් වැයකළ යුක්තේ ප්‍රතිඵලයක් තිබෙන ආකාරයටයි. අනික් කරුණ තවත් ආයතනයකට හානි නොවන ආකාරයට. අපි කැමතියි. නමුත් මෙතුමිය ප්‍රකාශ කර තිබෙනවා මා මෙයට විරුද්ධ බව. මා හට දුරකථනයෙන් අමතා මේ ගැන විමසා සිටියා. මා කරුණු පැහැදිලි කර දුන්නා. ඉන්පසු ප්‍රශ්නයක් නැහැ. මට අත්සන් කරගෙන එනවා නම් 500 න් වුණත් අත්සන් ලබා ගත හැකිය. මා එහෙම අත්සන් ලබා ගන්න යන්නේ නැහැ. මා විරුද්ධ වෙන්නෙත් නැහැ.ඔබතුමිය එය ඉදිකරන්න. නමුත් ගරු සභාපතිතුමා ගනු ලබන නිත්‍යානුකුල පියවර අනුව කටයුතු කරන්න. අපි සැම දෙයම කරනු ලබන්නේ නිත්‍යානුකුල වන විදයටයි. ඔබතුමාට මතක ඇතනේ අර එඬේරමුල්ලේ කාණුවක් ඉදිකිරිමට ගොස් ඔබතුමාලාගෙනුයි අය කරනු ලැබුවේ. මෙය මතකයි නේද ? එයට ගෙව්වා නේද ? එම නිසායි කියන්නේ . මෙය සෙල්ලම් වැඩක් නෙමේ. පොල්වත්ත ප්‍රදේශයේ බුද්ධිමතුන් සිටින්නේ . ඔවුන් දැන ගතහොත් ඔබතුමාට ප්‍රශ්න ඇතිවෙයි. මළ ගෙදරක් සිදු වූ විට පැමිණ වාහන හරවා ගැනීමට ආදි සියල්ලටම තිබෙන්නේ ක්‍රීඩා පිට්ටනියයි. එහි මෙය ඉදිකරනු ලැබුවොත් වෙන්නේ එය නාස්ති වෙයි. දැන් තිබෙන ප්‍රජා ශාලාවෙත් විදුරු බිදෙනවා. විදුලි මීටර් බෝඩ් එකක් කැඩී තිබේ. එය බිම වැටී තිබේ. මා ඕකන්ද ජනතාවගේ සිතුම් පැතුම් හොඳින් හඳුනනවා. අනුර කියන මහත්මයා ලිපිය ඉදිරිපත් කිරීම හොඳයි. ජනප්‍රිය වෙන්න තින්දු තීරණ ගත්තට මේ ගැන සභාපතිතුමාවත් දන්නේ නැහැ.

ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්

සභාපතිතුමා දන්නවා. සභා තීරණය ගත්ත ස්ථානයේ තමයි මුල්ගල තැබීමට ගියේ.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මෙය ඉදිකළ යුකතේ ඕකන්ද ප්‍ර දේශය තුලයි. නමුත් මෙම තීරණය ගත් ස්ථානය තිබෙන්නේ පොල්වත්ත කොට්ඨාශය තුලයි. සුසාන භූමියක් හාරා එය ඉදිකරන එක ගැන නිත්‍යානුකුල තත්වය මා දන්නේ නැහැ. මා මෙතුමියට පවසා සිටියෙත් නිත්‍යානුකුල විදියට කටයුතු කරන ලෙසයි . අර රථගාල් කරන තැන මෙය ඉදිකරන්න ගියාම ජනතාව විරුද්ධ වුණා. පහළ මෙය ඉදිකිරිමට ගියාම ජනතාව විරුද්ධ වුණා. මා කැමතියි මෙය ඉදිකරනවාට. නිත්‍යානුකුල විදියට වැඩය ආරම්භ කරන්න. දැනටත් එම සේවාව ප්‍රජා ශාලාවෙන් සිදු වෙනවා. පොල්වත්තේ ඉදිවෙන එක පොල්වත්තට අයිති නැහැ නේද ? එය කළුවඩුමුල්ලට අයිති ස්ථානයක නේද ඉදිකරනු ලබන්නේ. එය කළුවඩුමුල්ලට වුණාට පොල්වත්තට එකක් නැහැ. මාගේ විරෝධතාවයක් නැහැ. නිත්‍යානුකුල තත්වයට අපි මෙය සැදිය යුතුයි.

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මට මතක විදියට ඕකන්ද කියන ප්‍රදේශය නර්මාණය වන්නේ 1970 වකවානුව තුලයි. අපි එය අවකත්සේරු කරනවා නෙමේ. එවැනි ප්‍රදේශයක් බිහිවීම අපිට ආඩම්බරයකි. අපිට සුසාන භූමියක් හිතුමතේටඉදිකළ නොහැක . ඔබතුමාට පුළුවන්නම් අම්බලන්ගොඩ මෙම ස්ථානයේ සුසාන භූමියක් ඉදිකරනු ලබනවා කියා ආරම්භ කරන්න. එසේ ආරම්භ කරන්න දෙන්නේ නැහැ. මෙම තිබෙන සුසාන භූමිය වෙනත් දේවල් වලට ප්‍රයෝජනයට ගන්නවාට මා විරුද්ධයි. පහුසිය දිනවල සුනඛයින් දමන්න ගිහින් ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා අපිට විරුද්ධ වු ආකාරය මතකයි නේද? ඒ වගේම දැනට මෙතැන නිස සෙවණක් තිබෙනවා. එය ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට කඩා ඉවත් කර හෝ සදා ගන්න. සුසාන භූමිය කියන ස්ථානයට අත තියන්න එපා.පොල්වත්ත ප්‍රදේශ වාසින් විදියට අපි සැවෝම ඊට විරුද්ධයි.

ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, අපේ ගරු නගර සභා මන්ත්‍රීනි අයිරාංගනී මහත්මිය යෝජනා කර සිටිනවා ඕකන්ද ප්‍රදේශයට නිල සෙවණක් ඉදි කිරීම සඳහා. අපි එයට ස්තුති වන්ත වෙනවා. එහෙත් දැන් යෝජනා වී ඇත්තේ පොල්වත්ත සුසාන භූමියයි.එම ඉඩම තුලයි මෙය ඉදිකිරිමට සැලසුම් කර ඇත්තේ. එයට පලමුව අපි විරුද්ධ වෙනවා. පොල්වත්ත සුසාන භූමිය ගෙන ඇත්තේ පොල්වත්ත්, පින්නදූව , කෙරමිණිය, තල්ගස්ගොඩ , තුඩුවෙගොඩ යන ජනතාවගේ සතේ,සත දෙක

එකතු කර ගැනිමෙනි. මා හිතන්නේ ගරු සභාපතිතුමාගේ සියාත් සත.5 ක් දී එම කාලයේදී මුදල් පරිත්‍යාග කර ඇත . එම මුදල් දී මිලට ගෙන තමයි ඔය සුසාන භූමිය ඉදිකර ඇත්තේ. එම නිසා තමයි ස්මාරකයක් ඉදිකර ඇත්තේ. ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතාට, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා, ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා, ගරු නගර සභා මන්ත්‍රීනි චම්පා සුමුදු කුමාරි මහත්මියටත් මෙය අයිතියි. මේ සඳහා මුදල් එකතු කර තිබෙන්නේ පොල්වත්ත ජනතාවගේ . මා දැඩිලෙස විරුද්ධ වෙනවා පොල්වත්ත ජනතාව සමඟ. මෙහි සුනාමි පැමිණි කාලයේ මෘත දේහ 70 කට වැඩි ප්‍රමාණයක් භූ මදාන කරනු ලැබුවා. නැවත සුනාමි ව්‍යාසනයක් පැමිණියහොත් අම්බලන්ගොඩ ප්‍රදේශයට පැමිණියොත් නැවත භූමදාන කළ යුතු වන්නේ පොල්වත්ත සුසාන භූමිය තුලයි. අම්බලන්ගොඩ සුසාන භූමියේ භූමදාන කළ නොහැක. අපගේ මෘතදේහය වුණත් භූමිදාන කළ යුක්තේ පොල්වත්ත සුසාන භූමිය තුලයි. එහි පහල කොටසේ මෙය ඉදිකළත් දැඩිලෙස විරුද්ධ වෙනවා මෙම සුසාන භූමිය තුල මෙය ඉදි කිරීම සම්බන්ධව. පින්නදූව සිරි මහින්දාරාමේ නායක ස්වාමීන් වහන්සේ වන ආරිය ධම්ම ස්වාමීන් වහන්සේගේ දේහය පුච්චනු ලැබුවේ ඔය ස්ථානය තුලයි.අදාහනගාර අවශ්‍ය වන්නේ නැහැ කවුරුහරි වස දි හෝ යම් සිද්ධියකින් මියගියහොත් උසාවියෙන් එම දේහය කපා බලා පවසා සිටින්නේ එම මෘත දේහය වල දමන ලෙසයි. එසේ නැතිව පුච්චන්න කියන්නේ නැහැ. සිල්මාතාවන්ගේ ආදාහන කටයුතු සිදු කරනු ලබන්නේ ඔය ස්ථානය තුලයි.පොල්වත්ත සුසාන භූමිය කිසිම කෙනෙකුට ගත නොහැකියි. මා හිතන්නේ පළාත් පාලන පණතෙත් තිබෙනවා ගොඩනැගිලි ඉදිකළ නොහැකි බව.එම නිසා කියවා බලන්න පණත් පළමුව . අපි ඒවා කියවා පැමිණ ඇත. ගරු සභාපතිතුමනි , ගන්නා තින්දුව හරියට නිවැරදිව ගන්න ජනතාව වෙනුවෙන් .

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඒ.පී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ,මා හට අදාල නොවුණත් මා යම් අදහසක් ප්‍රකාශ කිරිමට කැමතියි. දැන් යහපාලනය බෙදි විසිරි ගිහින් ඇති මොහොතක යම් යම් අය අදහස් දක්වනවා. මටනම් ගොඩක් සංතෝෂයි. අම්බලන්ගොඩ නගරයේ නිල පියස වැනි ඉදිකිරිම් සිදු කිරීම සම්බන්ධයෙන් කාන්තාවක් විදියට හරිම ආඩම්බරයි.එතුමියට ස්තුතිවන්ත වෙනවා . එතුමිය දැන් ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබෙනවා. අපි එක එක්කෙනා වාද කර ගන්න එපා. අපි මේ සඳහා එකමුතු වී සහයෝගය ලබා දෙන ලෙසත් මා සියළු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මේ සඳහා සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙස. එයට වාද විවාද කරමින් ප්‍රශ්න ඇති කරගත යුතු නැහැ. අවස්ථාව ලැබි ඇත්තේ අපේ ගමට අපේ නගර සභා සිමාව තුලට. ඉන් ප්‍රයෝජන ගනු ලබන්නේ අපේ ජනතාව . මේ රජයේ නිලධාරින් එකතැනක සිටින එක ඉතා හොඳයි. තැන තැන විසිරි යනවාට වඩා . ජනතාව යම් කටයුක්තක ගිය විට ග්‍රාමසේවක මහතා , සමෘද්ධි නියාමකත් මුණ ගැසි සියල්ලම ඉටුකරගෙන පැමිණිය හැකියි. ගරු සභාපතිතුමනි එතුමියට මේ පැමිණි මුදල් ආපසු යන්න නොදි එම කාර්ය ඉටු කර ගැනිමට උදවු කළ යුතුයි . වාද විවාද නතර කර. අපි මොන දේශපාලන පක්ෂයක වුවත් මොන දේශපාලන අදහස් දැරුවත් හොඳ වැඩක් ඉටු කරන විට අපි එය අගය කළ යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මෙම ප්‍රශ්නයට මා මැදිහත් වෙනවා නිරායාසයෙන්ම . මෙම සභාවේ ගරු මන්ත්‍රිතුමන්ලගේ කතා ඇසු විට එතැන දැඩි විරුද්ධත්වයක් තිබෙන බව පෙනෙනවා. එසේම නිත්‍යානුකුල නිතිය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. එම පසුබිම උඩ සාකච්ජා කර අඩුම අඩුම ගණනේ අර මුලින් සඳහන් කර ස්ථානයවත් ලබා දෙන්න. අපි දෙපිලකට බෙදි වැඩක් නැහැ.

- ❖ පස්වරු 12.35 සභාවේ මුලාසනය ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතාට භාර දී ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා සභාවෙන් නික්ම ගියහ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි , මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීමට හැකිනම් ඕකන්ද ප්‍රදේශයේ ජනතාවටත් සේවයක් වන නිසා ස්ථානයක් ලබා දි මෙය ආරම්භ කිරීම සුදුසු බවයි මට හැඟි යන්නේ. ඇත්තටම විරුද්ධත්වයක් තිබෙනවා. අද උදයෙත් පුද්ගලයන් 2කු අපගේ නිවසට පැමිණියා. මෙම ස්ථානය පිළිබඳවයි විරුද්ධත්වය තිබෙන්නේ. පුළුවන්තරම් ඉක්මනින් එතුමියට මෙය ඉදිකිරීමට ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි මන්ත්‍රිතුමිය ප්‍රකාශ කළ ආකාරයට සුදුසු ස්ථානයක් බලා ලබා දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි , අනාගතයේ අපගේ වැසියන්ට වැලලෙන්න තිබෙන බිමෙහි මෙම ඉදිකිරිමට විරෝධතා පැමිණ ඇති නිසා අපගේ ගරු මන්ත්‍රීතුමියගේ නව යෝජනාව ඉවත දමන්න එපා. අපි දකිනවා ඕකන්ද ප්‍ර දේශයේ ළිං 2 ක් පිහිටි

ස්ථානයක්. අර දෝනා හැරුනු හිස් බිම ප්‍රදේශය . අන්න එවැනි ස්ථානයක් තෝරා ගතහොත් ඔබතුමියට කිසිම ප්‍රශ්නයක් නැතිව මෙම කටයුක්ත කර ගත හැකියි. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාණෙනි , අර ඥානසිලි මහත්මියගේ නිවසට හැරෙන තැන දකුණු පැත්තේ ළිං දෙක ළග මායිම . මෙම මායිම කොහේ හෝ ගම් ප්‍රදේශයටනේ එකතු වන්නේ. මෙම ගැටලු සහගත තත්වයෙන් මිදෙන්න. ඔබතුමියගේ කටයුක්ත ඉටු කර ගැනිමට හැකිවේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි , ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය ප්‍රතිපාදන වෙන් කරගෙන මේ නිල පියස ඉදිකිරිමට යන අවස්ථවේ කුමන රජයකින් හෝ කුමන අමාත්‍යාංශයකින් හෝ එම ප්‍රතිපාදන ලැබීම ගැන අම්බලන්ගොඩ නගර සභාව විදියට සතුටු වෙනවා. තව තවත් එවැනි ප්‍රතිපාදන ලබා ගනිවි කියන ප්‍රාර්ථනයක් කරනවා. එසේම එයට බාධාවක් නොවිය යුතුයි කියා අපි ගරු මන්ත්‍රීවරු විදියට සිටිනවා. එසේම එම ගම් පියස නියෝජනය කරනවා මේ ගරු සභාවේ ගරු මන්ත්‍රිවරුන් දෙපලකුත් ගරු මන්ත්‍රිවරියකුත් . පොල්වත්ත ප්‍ර දේශයම ගත් විට මන්ත්‍රිතුමන්ලා තුමියන්ලා 6 දෙනාම ගත් විට මේ සභාවේ එක එක පරස් පර අදහස් ප්‍රකාශ කර සිටියා. එම නිසා ඔබතුමන්ලා එකඟතාවයකට පැමිණෙන්න. අපිට මෙහි ගන්න තීන්දුවක් නැහැ. අපි ගරු මන්ත්‍රිවරුන් විදයට ඉතා ඉහල අන්දමින් ප්‍රශස්ථව සිටිනවා මෙම ඉදිකිරිම විය යුතු බවට. එම ස්ථානය පිළිබඳ ගැටලුවක් තමයි දැන් ඇති වි තිබෙන්නේ. එම නිසා ඔබතුමියත් තේරුම් ගන්න මෙම ස්ථානය පිළිබඳ මොවුන් දක්වන නෛතික තත්වය පිළිබඳව . එහි පොඩි සාධාරණත්වයක් තිබෙනවා මෙය පොදු සුසාන භූමිය නිසා . අර එතුමා ප්‍රකාශ කර සිටියා වගේ අපට සුසාන භූමියක් වෙන ස්ථානයක ඉදි කරන්න ලැබෙන්නේ නැහැ. මෙහි තව අඩි 6 ක්වත් ඉදිකරන්න ඉඩම දෙන්නෙත් නැහැ. ඒ පැත්තෙන් පන්සල මේ පැත්තෙන් පොල්වත්තපුර නිවාස සංකිර්ණය සාදා නිම කර ඇත.එම ජනතාව අයින් කළ නොහැකිය. මේ පැත්තෙන් පොදු පාර , මේ පැත්තෙන් ගෙවල් සංකීර්ණය . ඒ පවරාගත්තාත් පවරා ගන්න වෙන්නේ කවදා හරි ඔය අහිංසක ජනතාවගේ නිවෙස් .එම නිසා මේ තිබෙන භූමි ප්‍රමාණය ආරක්ෂා කර ගැනිමට තමයි මෙම ගරු මන්ත්‍රිතුමන්ලා නියලි සිටින්නේ . ඔබතුමන්ලා අතර ඇති දේශපාලන භූමිකාව ගැන නෙමේ මා මේ පවසන්නේ . සුහදව ගරු මන්ත්‍රිතුමා සඳහන් කර ළිඳ තිබෙන භූමි භාගයේ පර්.6 ක් තිබෙනවා.මොකද පොදු නානා ළිඳක් ඇති ස්ථානයක පර්.6ක් තිබෙනවා.එහි පොඩි ගැටලුවකට ඇත්තේ ළිඳ තිබ්ම පමණයි. එතැන ගොඩකර නිසියාකරව එම ගොඩනැගිල්ල සැදිය හැකියි. ගරු උපසභාපතිතුමනි , මෙම මන්ත්‍රීවරුන් සුහදව සකච්ජා කිරීමට අවස්ථාවක් ලබා දි සුදුසු ස්ථානය තෝරා ගෙන අපිට දන්වන්න. මෙම ප්‍රතිපාදන යවන්න එපා.ඔබතුමිය මෙම සඳහන් කරනු ලැබූ කරුණු සමඟ සාවධානව හිතන්න. වාදයකට යන්න එපා . වාද කර අපිට කිසිම ජයග්‍රහණයක් ලබන්න බැරිය.ඔබතුමන්ලා අතරින් තමයි ස්ථානය තිරණය කර ගත යුක්තේ. අපි සියළුම මන්ත්‍රිවරුන් කැමතියි එම ස්ථානය ලබා දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි , මෙම මුදල් හදිස්සියේ ලැබුණේ. දෙසැම්බර් මස 29 දිනයි. වර්ෂය අවසන් වීමෙන් එම මුදල් අවිච්ජේදනය වේ. එම නිසා වැඩ පටන් ගත යුතුයි. මෙහි ලොකු ගැටලුවක් තිබේ. මාගේ පෝරඹ කොට්ඨාශයේ ඉඩම පොඩ්ඩක් අඩුයි. ගරු සභාපතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා එම ඉඩම ලබා දිම සම්බන්ධව. සියළුම මන්ත්‍රිවරුන් විශේෂයෙන්ම ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාට සාකච්ජා කර මෙම මුදල් අවිච්ජේදනය විමට කලින් සැම දෙනාම එකතු වි මෙම මුදල රැකගෙන මෙම සේවා පියස සැදිමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය දැඩි වෙහෙසක් දරා තමයි මෙම සේවා පියස සැදිමට අවශ්‍ය මුදල් ලබා ගෙන ඇත්තේ . එවැනි දෙයක් අම්බලන්ගොඩ නගරයේ පොල්වත්ත , ඕකන්ද නගරයට අත්‍යවශ්‍යවයි. නිතිමය ගැටවක් නැති ස්ථානයක් එතුමියට ලබා දෙන ලෙස ගරු සභාවෙන් මා ඉල්ලා සිටිනවා. මොකද එතුමිය මහන්සි වි ලබා ගත් මුදල් අවිච්ජේදනය වුවහොත් වැඩක් නැති වෙයි. එතුමිය පොඩ්ඩක් කලබල වි ඇත. මෙය සෙමින් කතා කර විසඳා ගත්තානම් හොඳයි. සුසාන භූමියක් තිබෙන ස්ථානයක පසුගිය වකවානුවේ රට වෙනුවෙන් දිවි පිදූ රණ විරුවෙකුගේ බිරිඳ හා දියණිය අවසර ඉල්ලා සිටියා අපගේ ගරු සභාවෙන් එතුමාගේ මෘත දේහයක් භූමිදාන කර ස්ථානයේ ස්මාරකයක් සැදිමට . මේ සම්බන්ධව ගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා , ආරක්ෂක ලේකම්තුමා ආදි පිරිසත් මේ සඳහා අවසර ලබාදෙන ලෙස ගරු සභාවට ලිපි යොමු කළා ස්මාරකයක් සැදිමට ඉඩ දෙන ලෙස. අපගේ ගරු සභාවේ තීරණය ගෙන තිබුණේ කිසිම සුසාන භූමියක ස්මාරක සැදිමට ඉඩ නොදෙන බවයි . ගැසට් එකත් සහා තීරණයත් ආදිය ගැන එතුමන්ලාට ලිපියක් මඟින් දන්වා සිටියා. එම නිසා මා සිතන්නේ නැහැ සුසාන භූමියක ඉදිකිරිමක් කිරිමට හැකිවේයි කියා. කෙසේ හෝ එතුමියට මෙම සේවා පියස ඉදිකිරිමට නගර සභාවේ බිම් කොටසක් ලබා දෙන ලෙසත් එතුමියගේ මෙම කටයුක්ත සර්ථක වේවායි ප්‍රාර්ථනා කර සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා ප්‍රකාශ කළ ආකාරයට උදාහරණ 3.4 ක් ම ඇත. ගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා , ස්මාරකයක් සෑදීමට ගරු සභාපතිතුමාගෙන් අවසර ඉල්ලා තිබුණා. ඒ අවස්ථාවේ ගරු සභාපතිතුමා ගරු හිටපු ජනාධිපතිතුමාට නීතිමය තත්වය පිළිබඳ පැහැදිලි කර සිටියා. මේ පිළිබඳව ගරු සභාවේත් කතා කර තමයි මෙම තීරණය ගනු ලැබුවේ. නීත්‍යානුකූල නොවන අවස්ථාවල වැඩ කටයුතු සිදු කර සභා තීන්දුව ගත්තාත් සභා තීන්දුව නොගෙන වැඩ නොකර අපේ ගරු සභාපතිතුමාටත් මටත් මුදල් ගෙවන්න සිදු වුණා. ඉහත ගරු රාහුල මන්ත්‍රීතුමා සඳහන් කර ආකාරයට එඬේරමුල්ල පාර සෑදීමට ගිය අවස්ථාවේ. පාර අඩි 30 යි නමුත් දැනට තිබෙන්නේ අඩි 27 යි . එම ප්‍රමාණයට කාණුවක් දමනු ලැබුවා . එහි වැඩ අවසන් වූ පසු මේ සභාවේම සිටි ගරු මන්ත්‍රීවරයකුම දන්වා සිටියා මෙම පාරේ අඩි 30 ක් තිබෙනවා. දැන් එහි ඇතතේ 27 ක් කාණුවක් ඉදිකර ඇති බවට. එම අදාල මුදල සභාව් අත ඔසවනු ලැබූ ගරු මන්ත්‍රීවරුන්ට ගෙවන්න නියම කළා.එ වන විට සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් 2 සිටියේ මාත් ගරු සභාපතිතුමාත් පමණයි. ඒ අනුව අපිට රු.107000/= ක පමණ මුදලක් ගෙවන ලෙස තීන්දුවක් දුන්නා. එවකට විෂයභාර හිටපු අපගේ ප්‍රධාන අමාත්‍යතුමා එම මුදල කපා ඉවත් කර අපිව නිදහස් කරනු ලැබුවා . අපි ස්තුතිවන්ත වෙනවා එතුමාට මේ සම්බන්ධව. අන්න එවැනි තත්වයන් ඇති වෙනවා මෙය නීත්‍යානුකූල තත්වයට ගියේ නැති වුණොත් එහෙම. එම නිසා සුසාන භූමියක මෙවැනි කාරණයක් කිරීමට නොහැකියි. මා ගරු මන්ත්‍රීවරුන්ට යෝජනා කර සිටිනවා වෙනත් ස්ථානයක් තෝරා ගන්න . නැතිනම් මෙම කර්මාන්තය කිරීමට බැරි වෙනවා. එක සභාවක විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ එක අඩියක් විහාරස්ථානයට එක අඩියක් ඇල්ලීම සම්බන්ධයෙන් ඕකන්ද ප්‍රදේශයේ ජනතාව පැමිණ මෙම සභාව වැටලුවා. වැඩි කාලයකදි නෙමේ ගිය සභා කාලයේදී .මේ සඳහා පිරිසක් කැමති වුණා. තව පිරිසක් කැමති වුණා. ගම දෙකට බෙදුනා . එම නිසා නීත්‍යානුකූලව සභාවට මෙය දෙන්න බැරි වුණා. ගරු මන්ත්‍රීතුමියණනි මෙයත් මෙසේ විරෝධතා මතුවීමෙන් නීත්‍යානුකූලව දිය නොහැකි තත්වයක් ඇති වෙනවා.ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාණෙනි, අර වසා ඇති ළිඳ ඇති ස්ථානයේ ගොඩක් ඉඩ තිබෙනවා නේද? එතැන හොඳයි නේද ?

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු උප සභාපතිතුමනි , මේ අයගේ සැලැස්මේ යම් ප්‍රමාණයක් තිබෙනවා. මෙහි එක පැත්තකින් ටිකක් පළල වැඩියි.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

මා හට මෙම කරුණු දෙකෙන් එකක් ඉටු කිරීමට හැකියාව ඇත්තේ. මොකද හෙට වෙනවිට මෙය ඉවරයක් වෙන්න ඕන. එකක් තමයි මා හෙට ගරු සභාව තීන්දු කරන ලද ස්ථානයේ මා හෙට අත්තිවාරම් දමනවා. සභාව අනුමතිය දී තිබෙනවා . ඒ අනුව තමයි මා මුදල් ගෙන්නා ගනු ලැබුවේ. එයට කවුරුත් විරුද්ධ වෙන්න බැහැ. අනිවාර්යෙන්ම හෙට දිනයේ මා මෙය කරනවා. ඔබතුමන්ලා ඒකමතිකව මෙය තීන්දු කර තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

සභාව මේ සඳහා අනුමතිය දුන්නාට අදාල සැලැස්ම අයදුම්පතක් දමා අනුමත කර ගන්න. සභාව අනුමතිය දී තිබෙන්නේ ගොඩනැගිල්ලට ඉඩම ගන්නවා නම් ඒ නීතිමය තත්වයටයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමයණනි, ඔබතුමියට එවැනි තීරණයක් ගත නොහැකිය. යම් නීතිමය තත්වයක් තිබෙනවා. මොන රජයේ ආයතනයක් වුවත් නගර සභාවට සැලසුමක් ඉදිරිපත් කර නීත්‍යානුකූල අවසරයක් ගත යුතුයි . මා ඔබතුමියට ප්‍රකාශ කර සිටින්නේ සාධාරණව. මෙය ගැටුමකට යන්න එපා. යම් පිරිසක් කියනවා මෙය පොල්වත්තට අයිති ස්ථානයක් කියා. මේ නිසා ගැටළුවක් තිබෙනවා. මේ සඳහා දිගින් දිගටම විරුද්ධ වුවහොත් මෙය සෑදීමට නොහැකි වෙනවා. මා කලින් සඳහන් කර ස්ථානයේ හොඳටම ඉඩ තිබෙනවා. කාර්මික නිලධාරි මහතා සමඟ ගිහින් එම ස්ථානය මැන බලන්න. එතැන ඕකන්ද කොට්ඨාශයට තමයි අයිති වෙන්නේ. එවිට කාටවත් දොස් පැවරීමට නොහැකිය.එහෙම කැමතිනම් මේ සභාවෙන් අද තීන්දුවක් ගන්න අද මෙම ස්ථානයට කැමතියි කියා. මා පවසා සිටින්නේ ඕකන්ද කොට්ඨාශයේ පහළ තිබෙනවා නාන ළිඳක්. දැනට එය වසා ඇති ස්ථානයක්. ළිං 2 ක් තිබෙනවා.

- ❖ පස්වරු 12.45 සභාවේ මුලාසනයට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා පැමිණියහ.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

දැනට ළිඳ සෑදීමට මුදල් වෙන් කර තිබෙනවා. ළිඳත් අත්‍යවශ්‍යයි ඕකන්ද ප්‍රදේශයට නිල පියස නැතත්. මෙහෙම ගැටලුවක් තිබෙනවා නම් ඕකන්දේ නිල පියස අපි ඉවත් කර ගනිමු. මා ප්‍රකාශ කර සිටිනවා මෙය ඉවත්කර මට

කළුවඩුමුල්ල ප්‍රදේශයට හරි මෙය දෙන්න ඕන. ඕකන්දට අවශ්‍ය නැහැ නිල පියසක්. ඔබතුමා මට අවසර දී තිබෙනවා කළුවඩුමුල්ලේ නිල පියසක් සෑදීමට. විදුහල්පතිගේ ප්‍රශ්නයක් ආවා. ඕකන්ද නිල පියසට විකල්පයක් ඔබතුමලා යොදන්න . කළුවඩුමුල්ලේ මෙය ඉදිකරන්න. එයත් අපේ කොට්ඨාශයක්. මා එය කළුවඩුමුල්ල ප්‍රදේශයට දීමට කැමතියි. එම කොට්ඨාශ දෙකේ කොහේ සෑදුවත් කමක් නැහැ. මොකද අම්බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශයේ අයනේ ඉන් ප්‍රයෝජන ගනු ලබන්නේ. කිසිම ප්‍රශ්නයක් නැහැ. ඕකන්ද , කළුවඩුමුල්ල ,කොහේ සෑදුවත් කමක් නැහැ. ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කර සිටිනවා කළුවඩුමුල්ලේ එම භූමිය නගර සභාව සතුයි කියා.අපි මේ මුදල් වලින් කළුවඩුමුල්ලේ හරි මෙය ඉදිකළ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා මේ සම්බන්ධව දකුණු පළාත් අධ්‍යාපන ලේකම් වෙත. කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය පවරා ඇත්තේ කළුවඩුමුල්ලේ ක්‍රීඩා කටයුතු වලට අගතියක් නොවන පරිදි කටයුතු සිදු කළ යුතු බවයටයි. ඒ සඳහා ක්‍රීඩාවට බාධාවක් නොවන සේ ක්‍රීඩාගාරයට පිටුපසින් මෙය ඉදිකිරීමට අවසර දෙන ලෙස අපි ඉල්ලීමක් කළා. ප්‍රාදේශීය ලේකම්තුමියත් ඉල්ලීමක් කර ඇත.ගරු දකුණු පළාත් අධ්‍යාපන ඇමති රාහාසාප්‍රත්‍ර ඇමතිතුමාගෙන් තමයි මෙම තීන්දුව ගත යුතු වන්නේ. නමුත් ඔය අර්බුද නැති තැන් තිබෙනවා. පනියන්දුව මහ අම්බලන්ගොඩට අපි තැනක් දී තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඕකන්ද ප්‍ර දේශයට අත්‍යවශ්‍ය නැහැ කියා මට පෙනෙනවා. එම නිසා කළුවඩුමුල්ලේ මෙය ඉදිකරන්නම්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ළිඳ ළඟ හොඳයි මෙය ඉදිකිරීමට. එතැන ඉඩ තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්රදීප් මහතා කතා කරමින්</u>**

නෑ. මේ ළිඳ සෑදිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එතැන ගිහින් මනිනු ලැබුවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේන්. අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මැනුම් 4 ක් සිදු කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ළිං වහන්න බැහැ. ඕකන්ද ප්‍රදේශයට වතුර නැහැනේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ළිඳ සෑදීමට ගිහින් කැඩුනේ . එය සෑදීමට අපි මුදල් වෙන් කර ඇත. ගරු මන්ත්‍රීතුමාටත් මන්ත්‍රීතුමියටත් මා ප්‍රකාශ කර ඇත. මේ සඳහා කොන්ත්‍රාත්කරුවෙකු ඉදිරිපත් කරන්න. අපි මුදල් දෙන්නම් කියා.රු.800000/= පමණ වෙන්කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඕකන්ද ප්‍රදේශයට ළිං අවශ්‍යයි. බොන්න , නාන්න ජලය නැහැ. වතුර ටැංකියක් ඉදිකරන ලෙස ඉල්ලීමක් ද කර ඇති බව මා දුටුවා . වතුර ටැංකියක් ඉදිකිරීමත් අත්‍යවශ්‍යයි. මොකද ජලය නෑ නිවෙස් වලට . ඕකන්දේ සිටින ජනතාව රෑ නිදිවර්ජිතව පොල්කටු වලින් පුරවන ආකාරයේ සෙල්ලමක් තමයි සිදු වී තිබෙන්නේ. ඇත්තටම අපි ගම්වල කතා කළ යුතු ප්‍රශ්න . රු. ලක්ෂ 30ක් 40ක් වියදම් කර සභාවෙන් වතුර ටැංකියක් ස්ථාපිත කර ජලය ලබා දීමෙන් ලොකු පිනක් සිදු වේ. එයත් අත්‍යවශ්‍ය දෙයකි. නමුත් මේ නිල සෙවණට එන මුදල් කිසිම දෙයකට යොදවන්න බැහැ.නිල සෙවණ දුන් මුදල් වතුර ටැංකියටවත් කිසිම දෙයකට දිය නොහැකිය. නැතිනම් මා නිල සෙවණට වඩා කැමතියි වතුර ටැංකිය සාදනවානම්. ළිඳක් අත්‍යවශ්‍ය වී තිබෙනවා. අපිත් නාන්න යන්නේ පහළ ඇති ළිඳටයි. වතුර එන්නේ නැහැ. රෙදි සේදීම ආදී සියළු දේවල් කරනු ලබන්නේ පහළ ළිඳට ගොසිනි. ඕකන්ද ප්‍රදේශයේ වතුර ප්‍රශ්නය තදින්ම තියෙන දෙයකි. මෙම නිල සෙවණ සාදන එකට විසඳුමක් ලබා දෙන්න. උප සභාපතිතුමා ප්‍රකාශ කර ස්ථානය අපගේ තාක්ෂණසේවා නිලධාරී මහත්මිය සමඟ ගොස් මනිනු ලැබුවා. ඥානසිලි මහත්මියගේ නිවස අසළ ඉහල කොටස. එම තැන ගන්නත් බැහැ. එම ළිඳ හදනවානම් බැහැ. ළිඳ වසා තමයි සෑදිය හැක්කේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අර ශාන් මහතාගේ නිවස අසළ කොටසේ මෙය ඉකිකළ හැකි නේද?

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

අර පහළ කොටසේ ද? එතනත් බැහැ. එම සැලැස්මේ දිග පළල අනුව තමයි එය සැදිය යුක්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පෙර පාසල පැවැත්වෙන ස්ථානයේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම ස්ථානයේ ඉඩ තිබෙනවා .එම ස්ථානය ගිහින් බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතා ගිහින් තමයි බැලිය යුක්තේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඥානසිලි මහත්මියගේ ඉඩමෙන් පහළ කොටසේ මුල්ලේ කැල්ලක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එහි ඉදිකරන්න බැහැ. ජනතාව ඉඩම් අල්ලාගෙන

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම් ස්ථානය බලන්න. එතැන හරි නම් දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර දරුවන්ගේ බර කිරිමට ඇති ගොඩනැඟිල්ල. එතැන මායිමේ සිටම ගත හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු තාක්ෂණසේවා නිලධාරිතුමනි , අද දිනයේ මට මෙය ගිහින් මැන බලා දෙන්න. පෙර පාසල පවතින භූමියේ කොණට වෙන ඉඩම් කැබැල්ලද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

පෙර පාසල පවතින භූමියේ කොණට වෙන ඉඩම් කැබැල්ල

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමි ඔය යෝජනා කරන තැනත් පොල්වත්තේ ඉදිකිරිමට නියමිත තැනත් යන තැන් දෙකම ඉවත් කරන්න. අපි සභාවේ තින්දු කර සිටියත් සුදුසු භූමියක් බලන්න. නැතිනම් අපිට ඔය කළුවඩුමුල්ලේ නිල පියස ඉදිකිරිමට දකුණු පළාත් කැබිනට් තින්දුවක් වෙනම අර ගැනීමට සිදුවෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම මුදල් රඳවා තබා ගැනිමේ ප්‍රශ්නයක් තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ මම ලැස්තියි එය ඉදිකිරිමට අවසර දෙන්න. නමුත් මහජනතාවගේ ඉල්ලිමට විරුද්ධව කටයුතු කිරිමෙන් ඇති වැඩක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

මා යහපත් චේතනාවෙන් මෙය ඉටු කරද්දි ජනතාව තරහා කරගෙන මට වැඩක් නැහැ. මාගේ ගම් ප්‍රදේශයේ ජනතාව එපා කියනවා නම් මට එය දෙන්න අවශ්‍යාත් නැහැ.මොකද මට මින් තනියම ප්‍රයෝජනයක් ගැනිමට නෙමේ. මට නිවසට ගිහින් හරි ග්‍රාම නිලධාරිතුමා මුණ ගැසිය හැකියි. මට කිසිම ප්‍රශ්නයක් නැහැ.කළුවඩුමුල්ලේ හෝ මෙම ග්‍රාමසේවා වසම් දෙකෙන් එකක මෙය සැදිමට වෙනවා. නැතිනම් මට ගරු ඇමතිතුමාට කියන්න සිද්ධ වෙනවා මෙම මුදල් ආපසු ලබා ගන්නා ලෙස. මා එය ප්‍රකාශ කිරිමට කැමති නැහැ. අමාරුවෙන් කතා කර ලබා ගත් මුදල් නිසා. නැතිනම් අපේ මන්ත්‍රිතුමියට එම මුදල් දෙන්න තිබුණා. එය දීමට නොහැකි වි ඇත්තේ නමින් වෙන්කර ඇති නිසා. ප්‍රාදේශිය ලේකම්තුමියත් ප්‍රකාශ කර සිටියේ කළුවඩුමුල්ල , ඕකන්ද කියා ඇති වෙනත් තැනකට පවරන්න බැහැ කියා.නැතිනම් අපි වෙනත් කෙනෙකුට මෙය පවරන්න බැලුවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු අමාත්‍යතුමාට කතා කර බලන්න.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

එතුමා දන්නෙත් නැහැ මෙය නොකර බව. දැන් කියන්නේ වැඩ කරන බවයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැහැ අපි මෙය වෙනස් කිරිමට අවශ්‍යනම් අපි කතා කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

නැහැ එය එසේ කරන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

කළුවඩුමුල්ල ප්‍රදේශයටත් දැඩි අවශ්‍යතාවය තිබෙනවා. කළුවඩුමුල්ලට ප්‍රජා මණ්ඩලයටවත් ගොඩනැගිල්ලක් නැහැ. ඕකන්දට තිබුණාට .

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

නැහැ කළුවඩුමුල්ලෙන් එම මුදල යනවාට අපි කැමති නැහැ. ඉතිරි ඉල්ලිම් ටිකකත් මා ඉෂ්ඨ කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව තින්දු කිරීමට අපි කමිටුවක් පත් කරමු. අපි ඒ සඳහා ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියත් , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාත් , ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාත් , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාත් , ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතාත් , ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාත් ,

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

අපේ මන්ත්‍රිතුමිය ගෙන එනු ලැබු උත්සාහය හොඳයි. එහෙත් කඩුව රත්තරං කියා බෙල්ල කපා ගන්න බැනේ. එකෙනේ මේ වෙලා තිබෙන්නේ. මා ස්තුති වන්ත වෙනවා එතුමියට. එහෙත් සුසාන භූමිය අපිට එසේ පාවිච්චි කළ නොහැකියි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපි දැන් එය ප්‍රතික්ෂේප කළා. ඕකන්ද පොල්වත්ත කළුවඩුමුල්ල ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රිවරුන් එකතු වි තිරණය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මට දුරකථන ඇමතුමක් ලැබුණා. මහ අම්බලන්ගොඩ නිල සෙවණ සැදිමට මානාන ක්‍රිඩාංගණය මැනිම් කටයුතු සිදු කරනු ලබනවා කියා. මානාන ක්‍රිඩාංගණයේ තවත් නිල සෙවණක් ඉදිකිරිමෙන් ක්‍රිඩා කටයුතු කිරිමට

ඉඩ කඩ මදියි. එම ස්ථානය නැතිව ගරු නගර සභා මන්ත්‍රීතුමිය සමග සාකච්ජා කර වෙනත් ස්ථානයක් ප්‍රකාශ කරන්නම්. මහ අම්බලන්ගොඩට මානාන ක්‍රිඩාංගණය එපා. මොකද පිට්ටනිය අයිති වන්නේ අපට නෙමේ. එය අයිති වන්නේ පනියන්දුව කොට්ඨාශයටයි. මා ප්‍රකාශ කර සිටිනවා මහ අම්බලන්ගොඩ ස්ථානයක් ඇත . මා එය පෙන්වා දෙන්නම් . එතැන සැදිමට කටයුතු කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ළිඳ ළඟද ?

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>
ළිඳ ළඟ තමයි . නගර සභාව සතු ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පෝරඹ නිල සෙවණ ඉදිකරන අ/ම කරුණාරත්න දෙටු පියසේ ඉඩ මදිවුණා.එහි අඩි 20*40 ප්‍රමාණය තිබෙනවා. එහෙත් එහි අඩි 3 ක් අඩු කළා.. මෙම නිල සෙවණේ මුදලුත් යවන්නයි ලැස්ති වුණේ.තාක්ෂණසේවා නිලධාරි මහතා ප්‍රාදේශිය ලේකම්තුමිය සමග සාකච්ජා කර එම අඩි 3 දිගින් වැඩි කළා. පළල අඩු තැන්වල ඒ විදියට සැලැස්ම වෙනස් කර සැදීමට පුළුවනි. එම නිසා ඒ ගැන අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව අපගේ මන්ත්‍රීවරු ටික දෙනා එකතු වි සාකච්ජා කර තින්දුවක් ලබා ගෙන අපට වාර්තා කරන්න. අපි එයට අවසර දෙන්නම්. අපි සභාවෙන් අවසර දෙමු එම මන්ත්‍රීවරුන්ට සාකච්ජා කර සුදුසු තැනක සැදිමට අවසර දෙන්න.

**තීරණය**

අම්බලන්ගොඩ, ඕකන්ද පොල්වත්තපුර නිල සෙවණ සැදීම සඳහා පොල්වත්තපුරට අයත් ඉඩමක් බැවින් ඒ සඳහා මහජනතාවගේ හා මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් සිදුවි තිබෙන බැවින් මේ සඳහා ගරු මන්ත්‍රීවරුන් වන ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා , ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය යන මන්ත්‍රී කණ්ඩායමෙන් සැදුම්ලත් කමිටුවක් පත්කර මෙම නිල සෙවණ ඉදිකිරීම සඳහා ස්ථානයක් තෝරා ගැනීම පිළිබඳ තීරණයකට එළඹීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කර අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

12.11 ප්‍රධාන අමාත්‍යාංශය , දකුණු පළාත , වරිපණම් බදු ප්‍රතිශතය අඩු කිරිම සම්බන්ධ ලපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

යථොක්ත ලිපිය මඟින් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේදි නේවාසික ස්ථාන සඳහා 8% ක් වාණිජ දේපළ සඳහා 12% ක් ලෙස වරිපණම් බදු අයකළ බවත්, 2018.11.13 දින පැවති සභාවේ තීරණය පරිදි 2019 වර්ෂයේදි නේවාසික ස්ථාන සඳහා 7% ක් හා වාණිජ දේපළ සඳහා 11% ක් ලෙස වරිපනම් බදු ප්‍රතිශතය 1% කින් අඩු කිරිමට ඉල්ලිමක් ඉදිරපත් කර ඇත. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේදි නේවාසික ස්ථාන සඳහා 7% ක් හා වාණිජ දේපළ සඳහා 11% ක් ලෙස 2018 වර්ෂයට වඩා වරිපණම් බදු ප්‍රතිශතය 1% කින් අඩු කිරිම නගර සභා අඥා පනතේ 160(3) වගන්තිය ප්‍රකාරව ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව අමාත්‍යාංශ ලේකම්තුමා විසින් ලිපියකින් දන්වා ඇත.

**තීරණය**

**2019 වර්ෂයේ නේවාසික ස්ථාන සඳහා 7% ක් හා වාණිජ දේපළ සඳහා 11%ක් ලෙස වරිපණම් බදු ප්‍රතිශතය 1%කින් අඩු කිරිම නගර සභා අඥා පනතේ 160(3) වගන්තිය ප්‍රකාරව ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.**

12.12 අම්බලන්ගොඩ, ඕකන්ද පොල්වත්තපුර නිල සෙවණ සෑදීම සඳහා පොල්වත්තපුරට අයත් ඉඩමක් බැවින් ඒ සඳහා ප්‍රදේශයේ අත්සනින් යුතු ජනතාවගේ විරෝධතාවය පල කරන ලද ලිපිය සභාගත කරන ලදි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අම්බලන්ගොඩ, ඕකන්ද පොල්වත්තපුර නිල සෙවණ සෑදීම සඳහා පොල්වත්තපුරට අයත් ඉඩමක් බැවින් එයට විරුද්ධව අත්සන් සහිතව එම ප්‍ර දේශයේ ජනතාව විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත . මේ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

තීරණය

අම්බලන්ගොඩ, ඕකන්ද පොල්වත්තපුර නිල සෙවණ සෑදීම සඳහා පොල්වත්තපුරට අයත් ඉඩමක් බැවින් ඒ සඳහා මහජනතාවගේ හා මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් සිදුවී තිබෙන බැවින් මේ සඳහා ගරු මන්ත්‍රීවරුන් වන ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා , ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය යන මන්ත්‍රී කණ්ඩායමෙන් සැදුම්ලත් කමිටුවක් පත්කර මෙම නිල සෙවණ ඉදිකිරීම සඳහා ස්ථානයක් තෝරා ගැනීම පිළිබඳ තීරණයකට එළඹීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කර අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

12.13 අම්බලන්ගොඩ හෙප්පුමුල්ල ආර්.ඊ. ද සිල්වා මාවතේ නිවැසියන් විසින් එවන ලද ලිපියේ සඳහන් තාප්පය පිළිබඳ ගැටළුව සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

අම්බලන්ගොඩ හෙප්පුමුල්ල ආර්.ඊ. ද සිල්වා මාවතේ නිවැසියන් වන අප පහතින් අත්සන් තබන අප භාවිතා කරන මාර්ගය අසුරමින් ඉදිකරන අනවසර තාප්පය වහාම නතර කර නිත්‍යානුකූලව සිදුකරන ලෙස අම්බලන්ගොඩ නගර සභාව, මහගේ දුමින්ද රොෂාන් යන අයට 2017.07.17 දින ලිඛිතව දැනුම් දෙන ලදි. එම නියෝගය නොතකා ඔහු එසේ කරන්නට යෙදුන අවස්ථාවේදි අප නැවත නගර සභාවට ලිඛිතව දැනුම් දෙන ලදී. 2018.06.14 දින නාගරික සංවර්ධන අධිකාරියෙන් පැමිණ ක්ෂේත්‍ර පරික්ෂණය දසිදු කරන ලදී. ඉන් අනතුරුව නගර සභාව හා දුමින්ද රොෂාන් යන දොර්ශවය අතර සාකච්ඡාව මෙදින පැවැත්වූ අතර එදින සභාපති අරුණ ප්‍රදීප් මහතාගේ නියෝගය වූයේ එතැන් පටන් දින 07 ක් තුළ නීත්‍යානුකූල කර ගැනිමට මහගේ දුමින්ද රොෂාන් ඉදිරිපත් නොවුණෙහොත් නීත්‍යානුකූල පියවර ගන්නා බවයි. ( හඩ පටිගත කර ඇත) දිගින් දිගටම නගර සභාව එම් දුමින්ද රොෂාන් වෙත වරින් වර ලිපි කිහිපයකින් නීත්‍යානුකූල වන ලෙස දැනුම් දි සාකච්ජා පවත්වා අවසන් ලෙස 2018.10.17 දින අනුමත සැලසුම් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දැනුම් දිමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ගයක් , රාජකාරියක් නොකරන වග පෙනේ. ගරු සභාපතිතුමනි, අගතියට පත්ව සිටින අපහට යුක්තිය සාධාරණව ඉටු කරන ලෙස මින් කාරුණිකව ඉල්ලා සිටිනවා.රුවන්තිකා නිල්මිණි 58/ඒ, ආර්.ඊ. ද සිල්වා මාවත , හෙප්පුමිල්ල , කේ කුසුමාවති මෙන්ඩිස් , එස්ඩබ්. ප්‍රැන්සි ශිරාන් , ජී.ඩබ්. සුමිත් යනුවෙන් 4කු අත්සන් කර ඇත. මෙම ප්‍රශ්නය බලා මෙය නිරාකරණය කර දෙන්න.

__ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රශ්නය පිළිබඳව ඔබතුමා දන්නවා ඇති . මෙහිදි ඔය ප්‍රැන්සිස් හිරාන නැමැති අය පදිංචියට පැමිණියා විතරයි. පළාත් පාලන ජන්දයට කලින් ඔය තාප්පය බැදිම සම්බන්ධව විරෝධයක් මතු වුවා. පසුව ප්‍රැන්සිස් හිරාන් පවසා ඇත්තේ මා එය බලා ගන්නම් කියාය. අර පුද්ගලයාගෙන් ඡන්දය ලබා ගැනිම සඳහා මෙසේ ප්‍රකාශ කර ඇත.ජන්දෙන් පසු මොහු නැවත විරුද්ධ වුණා. ඔහු පවසන්නේ මෙය නගර සභා බැම්ම වුඩ බැඳ ඇති බවයි. එම මහතා මෙම සම්පූර්ණ විස්තර සියල්ලම පටිගත කර විඩියෝ කර ඇත. එහිදි සභාපතිතුමායි මායි එම පුද්ගලයා ගෙනවිත් සාකච්ජා කළා.ප්‍රැන්සිස් හිරානුත් සාකච්ජා කළා. ඔබතුමා ඒ පිළිබඳව දන්නවානේ. අපි ප්‍රකාශ කර සිටියා මෙයට නඩුවක් දමා ගන්නා ලෙස. ඔතැන නගර සභාවේ බැම්ම උඩ නෙමෙයි මෙම තාප්පය ඉදි කර ඇත්තේ

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

ගරු මන්ත්‍රිතුමනි , ඔය ප්‍රැන්සින් කියන නිවසේ කලින් සිටියේ අපගේ නිතිඥ මහත්මයෙකි. එතුමාගෙන් තමයි ඔය අනික් කියන පුද්ගලයා විකුණනු ලැබුවේ. මා එතුමාගෙන් විමසා සිටියා මෙම තාප්පය තිබුණ ආකාරය පිළිබඳව. එතුමා ප්‍රකාශ කර සිටියේ තාප්පය ඔය ආකාරයට තමයි පැවතුනේ කියා.මෙහිදි සිදු වි ඇත්තේ අර පුද්ගලයා විසින් කැඩුණු කොටස බැදිම තුල මෙම පුද්ගලයා නගර සභාව මඟින් මෙම තාප්පය අනවසර තාප්පයක් කියා කැඩිමට සැරසෙනවා.

දේශපාලනය වෙනම දෙයකි. අපි සාධාරණත්වය බැලිය යුතුයි . සම්පූර්ණ අසාධරණයි. මෙම තාප්පයේ මුල්ල රවුම් කිරීමට අපට බලයක් නොමැත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්**</u>

අර පුද්ගලයා ගිහින් නඩුවක් දමනු ලැබුවහොත් නගර සභාවට තමයි ප්‍රශ්නය වන්නේ.අනවසරයෙන් මෙය කැඩීමට ගියහොත්. ප්‍රශ්නයක් වෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මා දෙපාර්ශවයම සමඟ සකච්ජා කළා. ඔබතුමා ඔය ප්‍රකාශ කරන පුද්ගලයා නම් සාධාරණ නැහැ.ඔහුට අවශ්‍යනම් නඩුවක් දමා වැඩය කර ගැනීමට තිබුණා. අපි මඟින් එසේ කිරීමට බැහැ.

**තීරණය**

**අම්බලන්ගොඩ හෙප්පමුල්ල ආර්.ඊ. ද සිල්වා මාවතේ නිවැසියන් විසින් එවන ලද ලිපියේ සඳහන් තාප්පය පිළිබඳ ගැටළුව පෞද්ගලික ප්‍රශ්නයක් බැවින් එය ඔවුන් විසින් පෞද්ගලිකව විසඳා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණප්‍රදීප්මහතාවිසින්යෝජනාකරඅතරගරුනගරසභාමන්ත්‍රීඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

12.14 ආර්.එම් සුමතිපාල මහතා අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස පස් නැවතුම්පොළට බඳවා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එච්.එම්. සුමතිපාල වන මා සෞඛ්‍ය කම්කරුවකු ලෙස බස් නැවතුම්පොළෙහි සේවය කර 2018.11.01 වන දා විශ්‍රාම පූර්ව නිවාඩු ලද අතර 2019.02.04 වන දින විශ්‍රාම ගැනීමට නියමිතයි. බස් නැවතුම්පොළෙහි ස්ථිරව සේවය කල මා නැවත එම සේවයෙහි යෙදීමට ඉතා කැමැත්තෙන් සිටින බැවින් එම සේවය ඉටු කිරීමට මා හට නැවත අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.මෙම සේවයකයා ගැන පවසන්න ඕන . මෙම සේවකයා විශ්‍රාම යනවා 2019.0204 වන දින . නමුත් අපි මෙම සේවකයාගෙන් ඉල්ලීමක් කළා පෙරවරු 3.00 ට විතර පැමිණ බස්නැවතුම්පොළ පිරිසිදු කිරීමට පුළුවන් ද කියා. මෙම සේවකයා පමණයි මෙය භාර ගනු ලැබුවේ. උදෙන්ම පැමිණ බස්නැවතුම්පොළ පිරිසිදු කරනු ලබනවා. එය ඉතාමත් හොඳට පිරිසිදුව තබා ගනු ලැබුවා. මෙම සේවකයා ඉවත් වූ පසු තත්වය ඉතාමත් අසතුටුදායක තත්වයකට පැමිණ ඇත. අනික් සේවකයන් සමඟ වැඩයඅවුල් සහගත වි ඇත. මේ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා. මෙම සේවකයා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමතියෙන් මෙම සේවකයා බඳවා ගන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලටගේ මහතා කතා කරමින්**</u>

මෙම සේවකයා තමයි බස්නැවතුම්පොළ ඔය තත්වයට පිරිසිදුව තබා ගෙන සිටියේ. උදේ පාන්දර 3.00 ට පැමිණ සුද්දර කර සෝදා තමයි මෙම සේවකයා පිටත්ව යනනේ. ඒ තත්වය අද බැහැරවෙලා තියෙනවා. මා යෝජනවක් ගෙන එමට සිටියේ ඔය සේවකයා නැවතත් බඳවා ගන්නා ලෙස. ඔහු විසින්ම මෙම යෝජනාව කළ එක හොඳයි. නගරයට පැමිණෙන බොහෝ පිරිස් මෙම බස්නැවතුම්පොළ මගිනුයි සිය ගම්බිම් කරා ගමන් කරන්නේ. මෙම ස්ථානය පරිසිදුව තබා ගැනීමට නම් මෙම සේවකයා බඳවා ගන්නා ලෙස යෝජනා කර සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

විශ්‍රාම ප්‍රශ්නයක් කතා කළ නිසා මා දැන ගන්න කැමතියි . විශ්‍රාම ගිය සේවකයන්ගේ ලිපිගොනුව නිසියාකාරව සකස් වන්නේ නැහැ. ඒවා ප්‍රමාදයි කියා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.එම රාජකාරි ඉටුකළ නිලධාරිණිය මාරු කරනු ලැබු බවමට දැනගන්නට ලැබුණා. එහෙත් තවම එම කටයුතු ආරම්භ කර නැති බව මට දැනගන්නට ලැබුණා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

සේවා පියස සෑදීමට දැන් මානාන ක්‍රිඩාංගනය මනිනවා . නමුත් ඒ අයට උවමනා තැනනම් සෑදිමට දෙන්න බැහැ ගරු සභාපතිතුමනි. නගර සභාවට අවශ්‍ය තැනයි සෑදිය යුක්තේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ එසේ ඒ අයට අවශ්‍ය තැන සාදන්නේ නැත. මේ සඳහා නගර සභාවෙන් අවසර දිය යුතුයි.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස බස් නැවතුම්පොළෙහි සේවය කල එච්.එම්. සුමතිපාල නැවත ඔහුගේ සේවා කාලය දිර්ඝ කරන ලෙස කරන ලද ඉල්ලීමට අනුව වසරකින් සේවා කාලය දීර්ඝ කිරිම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමතිය ලබා ගැනීම සුදුසු බවට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිරකරනලදුව ගරු සභාවේඒකමතිකවසම්මතකරන ලදී.**

12.15 අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උස් ජල ටැංකියක් ඉදිකරමින් ජලය සැපයිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම හෝ වෙනත් විකල්පයක් යෙදීම සම්බන්ධ ලිපියට සභා ගත කරන ලදී

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උස් ජල ටැංකියක් ඉදිකරමින් ජලය සැපයිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම හෝ වෙනත් විකල්පයක් යෙදීම. ඉහත කරුණට අදාලව ඔබ විසින් එවන ලද 2018.11.16 දිනැති මේ සමඟ ඉදිරිපත් කරන ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුවේ ලිපිය හා බැදේ.ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව විසින් 2018.09.18 දින මෙම කරුණ සම්බන්ධව දැනුවත් කළ ලිපිය අනුව 2018.10.17 වන දින අප විසින් ජාතික ජලසම්පාදන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( දකුණ) වෙත ඉදිරිපත් කල ලපිය ඔබගේ දැනගැනීම සඳහා මෙය ඉදිරිපත් කරන අතර මේවන විට ප්‍රාදේශිය සේවා මධ්‍යස්ථානයේ සැලසුම් අංශය වෙත එම ඉල්ලිම යොමුකොට ඇත. ඉදිරියේදි ඉහත ඉල්ලිම සම්බන්ධයෙන් අදාල වන සැලසුම් කටයුතු අවසන් වූ වහාම ඔබ වෙත අදාල ඇස්තමේන්තු ඉදිරිපත් කරනු ඇත. එබැවින් මෙම කරුණ සම්බන්ධයෙන් යම් දැන ගැනීමක් අවශ්‍ය වුවහොත් මාතර - ප්‍රධාන ඉංජිනේරු ( සැලසුම්) සම්බන්ධ කරගන්නා ලෙස කරුණිකව දන්වා ඇත. දුරකථන අංකය 041-2224769 , ප්‍රාදේශිය ඉංජිනේරු , අම්බලන්ගොඩ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඒ සඳහා අවශ්‍ය මුදල් පළාත් සභාවෙන් වෙනත් මාර්ගයකින් හරි ජල සම්පාදන මණ්ඩලයට ලබා දුන්නානම් මේ වන විට මෙම ජල ටැංකිය සාදා නිම කරනු ඇත. මේ සඳහා ලක්ෂ 200 ක් පමණ වැයවන බව දන්වා ඇත.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ජල සම්පාදන පහසුකම් ලබා දෙන්න දෙන්න ඕකන්ද ප්‍රදේශයට ජල ප්‍රශ්නය බලපා ඇත. නව සම්බන්ධතා ලබා දෙන්න දෙන්න ගැටලුව බලපා ඇත.ටැංකියේ ජල පරිමාව එකවර අඩු වූ වූ විට මෙය සිදුවේ . ධාරිතාව අඩි 16ට අඩු වූ පසු මෙය බලපා ඇත. මෙහි පිටපතක් අපිට ලබා දෙන්න.

**තීරණය**

**අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උස් ජල ටැංකියක් ඉදිකරමින් ජලය සැපයිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම හෝ වෙනත් විකල්පයක් යෙදීම 2018.10.17 වන දින ජාතික ජලසම්පාදන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( දකුණ) වෙත ඉදිරිපත් කල ලපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.**

- ❖ පස්වරු 1.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා සභාවෙන් නික්ම ගියහ.

12.16 අම්බලන්ගොඩ පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිලසෙවණ ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඇති ඉඩමේ ඇති ගස කපා ඉවත් කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමේ නිල සෙවණ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ආරම්භ කර ඇති අතර , මෙම භූමියේ ඇති දැවමය වටිනාකමක් නොමැති නුග වර්ගයට අයත් ගසක් හේතුවෙන් ඉදි කිරීම් කටයුතු වලට බාධාවක් වී ඇති බව මා වෙත වාර්තා වී ඇත.මේ සම්බන්ධව දක්වන සහායෝගය අගේ කොට සලකන බව දන්වා ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති තැනක ගස් කපන්නේ කෙසේද ? අපිට ඔය ඉඩම අයිති නැහැ.ඔය ඉඩම ගරු ප්‍රධාන අමාත්‍යතුමා තමයි එහි මුල්ගල තබනු ලැබුවේ. එය පාසලට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති ඉඩමකි. නගර සභාවට මෙය පවරා නැත. අපට සැදිමට අවසර දුන්නාත් වසර අවසානයේ මේ සඳහා මුදල් ලබා දුන් නිසා එය ඉදිකර ගැනිමට නොහැකි වුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නැහැ ප්‍රාදේශීය ලේකම්තුමිය ප්‍රකාශ කර සිටියේ එය නගර සභාවට අයත් ඉඩමක් බවයි. මා ගස කපා ඉවත් කිරිමට සැරසු විට ප්‍රකාශ කර සිටියේ නගර සභාවෙන් අවසර ලබා ගෙන ගස කපා දෙන්නම් කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මෙම ගස කපා ගැනීමට අනුමතිය දෙන්නම්. ගස කපා ඉවත් කර ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගස කපන්න කෙනෙක් නැහැ. එම ගස කපා ඉවත් කර දෙන්න. මේ සියල්ල කර ගසා ගෙන කපන්න ගියොත් නිල සෙවණ සැදිමට වෙන්නේ නැහැ. එහි ශ්‍රම දායකත්වයක් තිබේ. එය කරන පුද්ගලයාට කළ නොහැකිය. මෙය කෙරෙන්නේ නැහැ. සභාවෙන් මෙම ගස ඉවත් කර දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා ගරු මන්ත්‍රිවරු මොකද කියන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මිනිසුන් බුද්ධිමත් . පසුගියකාලයේ දිගින් දිගටම රාත්‍රි 2 .00 වනතුරු ධාවනය කළා යැයි අපට දුරකථන ඇමතුම් ලබා දුන්නා. ඇයි මෙසේ කරන්නේ කියා. මෙසේ කොන්ත්‍රාත් දුන් ඉඩමක සුද්ද කරනවා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඕකන්දේ මෙම නිල සෙවණ ඉදිකිරිම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමියගේ ඉල්ලිම පරිදි අප එම භූමිය සුද්ද කර දෙනු ලැබුවා.එය අයිනෙන් ඉදිකළ යුතු නිසා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශීය ලේකම්තුමියගේ ඉල්ලිම පරිදි කියා සභාවේ මුදල් සභාවේ අනුමතියක් නොමැතිව යොදවන්න බැහැ.අන්තිමට ගෙවන්න වුණාම ගරු සභාපතිතුමනි , ඔබතුමාට මුදල් අතින් ගෙවිමට සිදුවේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපි දෙන්නා නිසා කලින් මුදල් කපා හැරියා.මෙම ලිපියේම සඳහන් වෙනවා මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති ඉඩමක් බව. අපි කොහොමද කියන්න මෙය කපන්නේ කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙයත් මා පැවසිය යුතුයි.ඔය කළුවඩුමුල්ල ක්‍රිඩාංගණය පැවරුවාසේ කැබිනට් මණ්ඩලයෙන් අපට පැවරුවා . බහුකාර්ය මධ්‍යස්ථානයක් ඉදිකිරිමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මුදලුත් ලැබී අපි මුල්ගලකුත් තැබුවා. නමුත් මෙහි අපිට නෙමේ මුදල් එවනු ලැබුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දක්ෂතාවය මත එම මුදල් නැවත හැරි ගියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මේ සඳහා බාධාවන් සිදුවුවහොත් ගරු අමාත්‍යතුමාගෙන් නිල පියසඅ ඉදිකිරීමට මුදල් නොලැබේ. මෙම නිල පියස 2,3 වම බාධා එනවිට අනෙක් නිල පියසවල් ඉල්ලා සිටීමට නොහැකිය. මා නම් එහෙම වුණොත් ඉල්ලා සිටින්නේ නැත. ඔය ගස කපා ඉවත් කර දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමයණනි, නිත්‍යානුකුල නොවන විදියට වැඩ කිරීමට ගිහින් අර ගරු මන්ත්‍රිතුමා සඳහන් කළ ආකාරයට කඩුව රත්තරං කියා බෙල්ල කපා ගන්න බැහැ.මෙහි හරිනම් ගස කපා ඉවත් කිරීමට අවසර දිය යුක්තේ ප්‍රාදේශිය ලේකම්තුමියයි. රජයේ ආයතන වල ගස් කැපීමේ අයිතිය තිබෙන්නේ ප්‍රාදේශිය ලේකම්තුමියට හරි රාජ්‍ය දැව සංස්ථාවටයි. දැව සංස්ථාවට ඕන ගස කපා ගෙන යන්න දෙන්න ඕන.ඔබතුමිය නැහැ කියා ඔබතුමියගේ වැඩය කරගන්න බලන්න එපා. කිසිම රජයේ ආයතනයක ගසක් තිබේනම් අපට කපන්න බැහැ.රාජ්‍ය දැව සංස්ථාවට දී හෝ එම ආයතනය මඟින් වෙන්දෙසියට දැමිය යුතුයි. නිත්‍යානුකුලව ප ප්‍රාදේශිය ලේකම්තුමිය හඳනවානම් එතුමියගේ ඇග බේරා ගැනීමට අපට ඒ සඳහා අනුමතිය ලබා දෙන්න බැහැ.ගස කපා ඉවත් කිරීමට ගරු සභාවේ අනුමතිය ලබා ගෙන එය ඉවත් කර දෙන්න. නිත්‍යානුකුලව ටෙන්ඩර් කරන්න ඕන . මුදල් ගෙවන්න ඕන . අපිට පුළුවන්ද ඒවා කරන්න.මේ සඳහා සභාවේ සේවකයන් නැහැ ගස කපා ඉවත් කරන්න. තින්දුවක් ගන්න හරියට එහෙම නම් .

**<u>ගරු නගර සභා ධනසේන මාදූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශිය ලේකම්තුමිය නගර සභාවට ගස් කැපීමට නියෝග කරනවා. නුගේතුඩුවේ අතුරු මාර්ගයේ තිබෙනවා අඹ ගසක් . එය කපන්න කියා ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා යෝජනා කළා මීට මාස 6 කිහිපයකට පෙර. මා යෝජනා කර ගරු සභාපතිතුමා අත්සන් කර දුන්නා මේ ගස් කපන්න කියා. පොල්වත්ත පාසල ඉදිරිපිට තිබෙනවා කොට්ටම්බ ගසක් . එය කඩා වැටුණොත් ජීවිතත් නැතිවෙයි. සභාපතිතුමා නියෝග කලාම මෙහි සිටින නිලධාරින් ගණන් ගන්නේ නැහැ. ප්‍රාදේශිය ලේකම්තුමිය පවසනවා අපිට මෙය කපා ඉවත් කරන්න කියා. මේ ගරු මන්ත්‍රිවරුන් ප්‍රකාශ කළාම එවෙලේ මේවා ක්‍රියාත්මක කරන්න කියා ඔය නිලධාරින්ට ප්‍රකාශ කරන්න. ඔබතුමායි හැල්ලුවට ලක් වන්නේ. දැන් ඔය යෝජනා දෙකක් ඉදිරිපත් කළා. දෙකම එකම ලිපියේ යෝජනා කළා. මේ ගරු මන්ත්‍රිතුමා යෝජනා කළා . ඒවා ක්‍රියාත්මක වුයේ නැහැ. ප්‍රාදේශිය ලේකම්තුමිය කියන එක අපි එක පාරට කරන්න යනවා.අපේ සේවකයන් ප්‍රාදේශිය ලේකම්තුමිය කරන වැඩය නෙමේ කළ යුතු ඔබතුමා කියන දෙයයි.මෙය ඔබතුමාටත් හොඳ නැහැ . නගර සභාවටත් හොඳ නැහැ. ගමේ ජනතාව මේ පිළිබඳව අපෙන් විමසන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ නගර සභාවේ වැටෙන්න ගිය ගස් දෙක ටෙන්ඩර් කර අපට කැපීමට මාස 2 ක් පමණ ගියා . ප්‍රාදේශිය ලේකම්තුමිය පැවසුවා කියා කෙසේද එක දිනකින් ඔය ගසා කපා ඉවත් කරන්නේ. ප්‍රාදේශිය ලේකම්තුමිය පවසන්න අනුමතිය දෙන්න කියා ගස කපා ඉවත් කරන්න.

**තිරණය**

**අම්බලන්ගොඩ පොල්වත්ත බුද්ධත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවණ ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල ඉඩම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක් බැවින් එහි ඇති ගස ප්‍රාදේශිය ලේකම් කර්යාලය මගින් ඉවත් කර ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

12.17 ඩබ්.ඩී. විමලතුංග මහතාගේ අංක 1709 දරණ පිඹුරේ 4E1 කොටස වඩුගේ උපුල් වසන්ත හා 4E2 කොටස වඩුගේ අරුණ ශාන්ත යන ඔහුගේ පුතුන් දෙදෙනාට තෑගි ඔප්පුවකින් පැවරීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එස් ටි 2018/123 අයදුම් පත්‍රයේ අනුබෙදුම් අයදුම්පත්‍රය මඟින් ජේ.පි නිහාල් ද සිල්වා මහතාගේ අංක 1709 දරණ පිඹුර දරණ ඩබ්.ඩී. විමලතුංග මහතාගේ අංක 1709 දරණ පිඹුර අනුමත කිරිම සඳහා ඉදිරිපත් කර ඇත. එම පිඹුරේ සඳහන්

ලොට් අංක 4E1 පිඹුර හා 4E2 යන කැබලි වී ඇත්තේ එස් ටී 2013/138 යටතේ නගර සභාවට අනුමත වී ඇති මාදුවගේ තිලකරි මහතාගේ 11/11 E දරණ පිඹුරෙහි සඳහන් අංක 4E1 දරණ ඉඩම එස් ටී 2013/134 කොටස වඩුගේ තිලකසිරි මහතාට වෙනත් පැවරුම් නියෝග පවරා ඇත.එබැවින් 2018/123 ඉඩම යටතේ අනුමත කිරීමේ 1% යටතේ ගාස්තු අයකල යුතුව ඇත.එහෙත් ඩබ්.ඩී. විමලතුංග මහතා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් දන්වා ඇත්තේ 4E1 පිඹුර හා 4E2 යන ඉඩම් කැබලි විකිණීමක් සිදු නොකරන බවත් තම දරුවන් හට ලබා දෙන බවත්ය ඒ අනුව අංක 152 දරණ වඩුගේ අරුණ ශාන්ත යන අයගේ උප්පැන්න සහතික සහ වඩුගේ උපුල් වසන්ත යන අයගේ උප්පැන්න සහතික ඉදිරිපත් කිරීමෙන් ඩබ්.ඩී. විමලතුංග මහතා ගේ පුතුන් දෙදෙනා බව පිලිගෙන ඇත. ඒ අනුව 1709 දරණ පිඹුරේ4E1 වඩුගේ උපුල් වසන්ත කොටස හා 4E2කොටස වඩුගේ අරුණ ශාන්ත යන අවට පැවරීමේදී පමණක් තෑගි ඔප්පුවකින් පැවරීමේදී පමණක් 1% ගාස්තු නිදහස් කිරීම සුදුසු බව යෝජනා කරන අතර වෙනත් පැවරීමකදී 1% ගාස්තු අයකළ යුතු බව යෝජනා කර සිටිනවා. ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

**ඩබ්.ඩී. විමලතුංග මහතාගේ අංක 1709 දරණ පිඹුරේ 4E1 කොටස වඩුගේ උපුල් වසන්ත හා 4E2 කොටස වඩුගේ අරුණ ශාන්ත යන ඔහුගේ පුතුන් දෙදෙනාට තෑගි ඔප්පුවකින් පැවරීම සඳහා ගාස්තුවලින් නිදහස් කිරීම සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.**

12.18 විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා ආදි ධම්සෝ කලා පර්ෂදය මගින් ඉදිරිපත් කර ඇති ලිපය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ධර්මාශෝක විද්‍යාලීය ආදි දම්සෝ කලා පර්ෂදය හා විද්‍යාලීය සෞන්දර්ය අංශය එක්ව ඉදිරිපත් කරනු ලබන විද්‍යාලීය සිසු දරු දැරියන්ගේ කුසලතාවයන් එළි දක්වන රංග ගීතා 04 ප්‍රසංගය, ප්‍රදර්ශක පුවරු ප්‍රදර්ශනය හා ප්‍රවේශපත්‍ර වෙනුවෙන් අය කරනු ලබන විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව වාර්තාවක් කැඳවනු ලැබුවා . ඒ අනුව 1947 අංක 12 දරණ විනෝද බදු පණතේ 02 වගන්තිය ප්‍රකාරව නගර සීමාවේ ඇති සිනමා ශාලාවල ආදායම් 10% ක්ද අනෙකුත් විනෝද කටයුතු ආදායමින් 25% ක් දබැගින් බද්දක් අය කරනු ලබයි. නගර සීමාව තුල පාසල් මගින් පවත්වනු ලබන විනෝද කටයුතු සඳහා ආදායමින් 10% බැගින් බද්දක් අයකර ගැනීමට 2019 අයවැය ලේඛනය සඳහන් පරිදි අයකර ගැනීම සුදුසු බවට යෝජනා කර සිටි. ඒ අනුව 25% අයකිරීම 10% දක්වා අඩු කිරීමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා. මෙය සම්පූර්ණයෙන් ඉවත් කිරීමක් නැහැ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මේ අය ඉල්ලා සිටිනුයේ 10% නිදහස් කරන ලෙසටද

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නැහැ සම්පූර්ණ මුදල නිදහස් කර දෙන ලෙසයි. නමුත් අපි අයවැය තීරණය ගෙන තිබෙනවා මෙම මුදල සම්පූර්ණ නිදහස් කරන්නේ නැහැ. 10% මුදලක් නිදහස් කරනා බවට . ඒ අනුව ක්‍රියා කරනවාද සම්පූර්ණයෙන් නිදහස් කරනවාද ?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය පාසලක් . මෙය දම්සෝ ආදි කලා පර්ෂදය වුණත් කවුරු කළත් පාසලට අධාරයක් ලබා ගන්න කරන්නේ. ගරු සභා තීරණය ගත්තාත් මෙම මුදල සම්පූර්ණයෙන් නිදහස් කිරීමට සුදුසු බවයි මා ප්‍රකාශ කර සිටින්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එම මුදල සම්පූර්ණයෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස් එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ධර්මාශෝක විද්‍යාලයෙන් තමයි මා අධ්‍යාපන කටයුතු හැදෑරුවේ. එම විද්‍යාලයට දියුණුවෙනවාට එහි මුදල් ආරක්ෂා වෙනවාට මා කැමතියි. නමුත් අපිට අයිතියක් නැහැ ධර්මාශොක විද්‍යාලයට යාමට දැන් . නමුත් ධර්මාශෝක

විද්‍යාලය පැමිණෙන්නේ නැහැ අපි වෙනුවෙන් කතා කරන්න. හරියටම කවකටුව තබා තිත තබා මැන බලා දශමෙට දෙකට අපගේ ළමයින් කපනවා. මා කොහෙත්ම කැමති නැහැ අඩුකරනවාට මෙම මුදල .

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහි මත දෙකක් තිබෙන නිසා ඡන්ද විමසීමක් සිදු කළ යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමාගේ මතයට අපි ගරු කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

විනෝද බද්දෙන් නිදහස් කිරීමට අකැමති අය ඡන්දය දීමට අත ඔසවා සිටින්න . මේ සඳහා ගරු මන්ත්‍රීවරු 4 කු විරුද්ධයි. විනෝද බද්දෙන් නිදහස් කිරීමට අකැමති අය ඡන්දය දීමට අත ඔසවා සිටින්න. මේ සඳහා ගරු මන්ත්‍රීවරු 6 කු පක්ෂව ඡන්දය දුන් අතර වැඩි ඡන්ද 3 කින් මෙය අනුමත කිරීමට යෝජනා කර සිටිනවා. මා ඡන්දය දීමෙන් වැලකි සිටියේ 2019 අයවැය යෝජනාවේ 10% අයකළ යුතු බවට මා යෝජනා කළ නිසායි. එම නිසා මා එම යෝජනාව කළ එය අයින් කිරීමට ප්‍රකාශ කිරීම වැරුද්දකි. එම නිසා මා එයට ඡන්දය දෙන්නේ නැහැ.

**තීරණය**

**ආදි දම්සෝ කලා පර්ෂදය හා විද්‍යාලීය සෞන්දර්ය අංශය එක්ව ඉදිරිපත් කරනු ලබන විද්‍යාලීය සිසු දරු දැරියන්ගේ කුසලතාවයන් එළි දක්වන රංග ගීතා 04 ප්‍රසංගයේ ප්‍රදර්ශක පුවරු හා ප්‍රවේශ පත්‍ර වෙනුවෙන් අය කරනු ලබන විනෝද බද්දෙන් නිදහස් කිරීම ඉල්ලීම සම්බන්ධයෙන් සභාවේ ගරු මන්ත්‍රීවරුන් 07කු ඊට එකඟව ඡන්දය පාවිච්චි කළ අතර 04 දෙනෙකු විපක්ෂවත් ඡන්දය පාවිච්චි කළ අතර ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා 2019 අයවැය ලේඛණයේ විනෝද බදු අයකිරීම 10%කින් වැඩි කිරීමට යෝජනා කර ඇති බැවින් ඡන්දය දීමෙන් වැලකීසිටි අතර වැඩි ඡන්ද 03කින් සභා සම්මත විය.**

**12.19 පොල්වත්ත අයිඩියල් සිටි මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභාවට පවරා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ පොල්වත්ත අයිඩියල් සිටි මාර්ගයේ සංවර්ධනය කිරීම සඳහා සභාවට පවරා ගැනිම සඳහා එම මාර්ගය පවරා දීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇත. මේ සඳහා සභා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටි.

**තීරණය**

**අම්බලන්ගොඩ පොල්වත්ත අයිඩියල් සිටි මාර්ගයේ සංවර්ධනය කිරීම සඳහා සභාවට පවරා ගැනිමට අදාල අයදුම්පත් සඳහා සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ එකමතිකව සභා සම්මත විය.**

- ❖ වෙනත් කරුණු

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , අපට සෞඛ්‍ය කම්කරුවන්ගේ ශෝචනීය දිවි පෙවෙත ගැන යම් අදහසක් දැක්විය යුතුයි. උදේ පාන්දර 4.30 , 5.00 වන විට ඔවුන් මෙම සේවා බිමට පැමිණෙනවා. ඔවුන් අපේ කිළි , කුණු , දුඟඳ , සුවඳ සේ සලකා කටයුතු කරන අයුරු ප්‍රශංශනියයි. මේ පිළිබඳව වඩාත් සංවේදිව කටයුතු කළේ අපගේ මහාචාර්ය ආරියදේව ස්වාමින් වහන්සේයි. උන් වහන්සේ දේශනා කළේ රටත් මදත් අපට , ඇටත් පොතුත් නුඹට. ඇත්තටම උන් වහන්සේගේ එම ප්‍රකාශය අනුව යමින් මම සැම විටම උත්සාහ දරනවා අපේ කෙරම්ණිය පින්නදූවට පැමිණෙන ඒ කසළ එකතු කරන අහිංසක කම්කරුවන්ගේ කුසට යමක් එකතු කර සන්තර්පණය කරන්න. මේ සඳහා ඇතැම් අවස්ථාවල අපට ඔවුන් මුණ ගැසෙන්නේ නැහැ. මා මොවුන්ගේ බඩ වියතට යම් දෙයකින් කුස පුරවන්න යම් වැඩ පිළිවලක් සකස් කළා. අපගේ ආසන්නතම විහාරස්ථානය වන කැලේ සිහසුනේ නායක ස්වාමීන් වහන්සේ සමඟ මාත් සමඟ එකතුවෙලා කසළ කම්කරුවෙකුට ලාල් කියන පුද්ගලයාට නිවහනක් ඉදිකර දුන්නා. දිනපතාම ඔවුන්ට ආහාර වෙලක් සකසා දෙන්න උන්

වහන්සේ වැඩ පිළිවළක් යෙදුවා. මා විහාරස්ථානයට අප ගම් පැත්තෙන් ප්‍රවේශ වෙන්න ගේට්ටුවක් සවි කළා. මොවුන් අපේ පාරේන් රථය නතර කර විහාරස්ථානයට ගොස් කුස පිරේන්න යම් දෙයක් අනුභව කර එම විහාරස්ථානයේ ඇති දොඩම් ලෙල්ලක් , පුස්කන මාෂ්මිලෝෂ් කැබැල්ලක් ආදි කසළ එක්රැස් කර ගෙන එනවා. මෙය ඉවසාගත නොහැකි එක්තරා පවිටු පුද්ගලයෙකු අපේ මන්ත්‍රිතුමෙකු සමඟ පැමිණ මේ සභාවේ පරිපාලකවරයෙකු භිය වද්දවා මෙම ගමන යන්න එපා කියා. මේ වැඩය නිසා මේ දෙදෙනාගේ කුසට යමක් ලැබෙන්නේ නැහැ.අපි කුස පිළිබඳව නෙමේ කියන්නේ. මේ සේවාව කාටද කළ හැක්කේ. දිනපතාම මේ අභිංසකයින් දෙදෙනා සතුටු කරන මේ අවස්ථාව නැවත ආරම්භ කර දෙන්න. සෞඛ්‍ය සේවකයන්ගේ ප්‍රති ලාභ නැවත ලබා දෙන්න. එසේම අපි දක්වන්නට ඕන අපේ සෞඛ්‍ය කම්කරුවන්ට ආහාර ගන්න අපගේ සභාවේ තැනක් නැහැ. අපි දුර්වල වෙලා අසමත් වෙලා ඔවුන්ට සලකන්න. ඔවුන්ගේ යම් කළමණා දමා ගැනීමට යම් ස්ථානයක් සකසා දෙන්න. මීට සභා දෙක තුනකට ඉහත මා දන්වා සිටියා සෞඛ්‍ය උපකරණ වර්ෂාධික කාලයේදී එම ස්ථානයේ තැබීමෙන් තෙත බරිත වෙන නිසා . අපි කතා කරන්නේ ලක්ෂ 3,4 ව්‍යාපෘති . නමුත් අපිට ලක්ෂ 5 ක් වැය කරන්න බැරි වී තිබෙනවා මේ අපේ අභිංසක කම්කරුවන් වෙනුවෙන්.එම නිසා මා ඉල්ලා සිටිනවා මේ අභිංසක සෞඛ්‍ය සේවකයන් ගැන මීට වඩා හිතා කටයුතු කරනා ලෙස.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ සෞඛ්‍ය කම්කරුවන් ගැන කතා කරනා විට කාණු පද්ධතිය පිළිබඳ කතා නොකර බැහැ.කලින්නම් අපේ බාෂ් දමා පිරිසිදු කරන ක්‍රමයක් තිබුණා. කම්කරුවන් නැහැ, සේවකයන් නැහැ. ඔබතුමා මේ ගැන බලන්න . දැන් බඳවා ගනු ලැබුවා. කාණු පද්ධති 10 ක් ගතහොත් 8 ක කුණු හිරවී අවහිර වී ඇත. අපගේ නිලධාරීන් සමඟ සාකච්ජා කර මෙම කාණු පද්ධති සතියකට එක දිනක් වත් පිරිසිදු කිරීමට වැඩ පිළිවළක් සකස් කරන්න. මේ සඳහා ජනතා දෝෂාරෝපණ තිබෙනවා. ගරු පියල් හරිස්චන්ද්‍ර මැතිතුමා පිළිගැනීමේ උත්සවයට ධර්මාශෝක විද්‍යාලයෙන් කොඩි කණු 75 කුත් පුටු 300 කුත් ඉල්ලා සිටිනවා එම කොඩි කණු හා පුටු ටික ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , අපගේ මාර්ග වල ෂැලැබ් කැඩුනාම එම ෂැලැබ් නැවත සකස් කිරීමට ක්‍රමවේදයක් නැහැ. හිමාල් මහතාගෙන් විමසා සිටි විට ප්‍රකාශ කරනු ලැබුවේ ෂැලැබ් 100 ක් ඉදිකිරීමට බඩු ඉල්ලා ඇති බවත් මේ වනතුරු එම බඩු නොලැබුණු බවයි. පසුගිය දිනයකදි අපගේ නිවසට පැමිණීමට ඇති ෂැලැබ් එක ගෙන ගොස් පාරට දමන්න සිදු වුණා. කබ්ම් ඇණි රථවාහන වල ටයර් හිල් වී තිබීම නිසා. එවැනි ශෝචනිය තත්වයක් තිබෙන්නේ. දැන් අනිත් ෂැලැබුත් ජනතාව හෙට අනිද්දා වන විට ගලවා ගෙන යයි. ඉතාම කනගාටුදායක තත්වයකි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අදාල ඉල්ලීම කල විට සැපයුම් නිලධාරිට මෙය යොමු විය යුතුයි. මේ ගැන ලේකම්තුමිය සොයා බලන්න ඇත්තටම මාගේ කොට්ඨාශයෙත් ෂැලැබ් වගයක් කැඩී ඇත. ඇණුවුම් කර එම බඩු ගෙනවිත් දෙන්න

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මටත් යම් අදහසක් දැක්වීමට අවශ්‍යයි. මා මීට ඉහත දිනකදි ප්‍රා දේශිය ලේකම් කාර්යාලයට ගියා.ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කර ආකාරයට එම ස්ථානයේ කාණු උතුරා යන තරමට පිරී ඇත. මහජනතාව විශාල ප්‍රමාණයක් නිතර ගැවසෙන ස්ථානයකි. එවැනි තැනක මෙවැනි දෙයක් සිදු වීමෙන් අපේ නගර සභාව පිරිහීමකට පත්වෙනවා.අඹබිලන්ගොඩ ප්‍රධාන නගරයකි. අනික් කරුණ දළුක්කන්ද ප්‍ර දේශයේ කාණුවක් වසා ඇත. එය ඔබතුමා දුටුවා කිවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

කාණුවක් වහන්න එතැන කාණුවක් තිබුනේ නැහැ. ඔය දළුකන්ද පාරේ අල්ලනු ලැබුවේ වෙන පාරකට ආව ඉන්ටලොග් ගල් ගෙනහින් . ඔය පාරේ යන්න බැරුව තිබුණෝ මඩ වෙලා. ඔබතුමිය ඕතනට ගියේ නැහැනේ . ගිහිල්ලා බලන්න. ඕතැන ප්‍රශ්නයකුත් පැමිණියා. ගරු සභාපතිතුමා ලිඛිතව දන්වා සිටියා. තාක්ෂණසේවා නිලධාරින් ගිහින් නිරික්ෂණ කටයුතු කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාගනි මහත්මිය කතා කරමින්</u>

දේශපාලනය මොනවා වුණත් එක්සත් ජාතික පක්ෂයේ කෙනෙකු වැරදි දෙයක් කළාත් එය ඉවත් කරන්න. මට ප්‍රශ්නයක් නැහැ. මා කළත් එය වැරදි වැඩේ වැරදියි . එය කිසි ප්‍රශ්නයක් නැහැ. පාර අල්ලා නොගෙන.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔබතුමි ඔබතුමියගේ පාක්ෂිකයන් වෙනුවෙන් කතා කරනවා. මා කියන්නේ වැරදි වැඩේ වැරදියි. අපි තාක්ෂණ නිලධාරි සමඟ ගිහින් බැලුවා . ඔහුගේ වාසියට ඔහු ප්‍රකාශ කරනවා කාණුවක් වසා ඇති බව.ගරු සභාපතිතුමාට ලිඛිතව ලිපියක් ආවා. අපගේ ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් පෙරේරා මහතා තමයි ලිඛිතව එය ගෙනහින් දුන්නේ. එම නිසා මෙය අපි ගිහින් නිරික්ෂණය කළ ස්ථානය. පක්ෂයක් එක් පුද්ගලයෙක් ගැන හිතා කතා කරන්න එපා. එම නිසා අපටත් සිදු වෙනවා අපේ පක්ෂයේ අපේ සාමාජිකයන් කියා කතා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාගනි මහත්මිය කතා කරමින්**

ගරු උපසභාපතිතුමනි , සමාවෙන්න ඕන , මා පක්ෂයක් ගැන හිතලා නෙමේ කතා කළේ.පක්ෂයේ පුද්ගලයෙකු එතැන නිත්‍යානුකුල නොවන පරිදි වසා ඇත්නම් නිත්‍යානුකූලව කටයුතු කරන්න.පක්ෂේ කියා බැහැනේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ තනිකරම කරනු ලබන්නේ තාප්පය ඉදිකර තාප්පයට පිටින් ගේට්ටුව දුවනවා. හැබැයි තාප්පයේ කොන්ක්‍රිට් එක උඩ දුවන්නේ. අන්න එම හේතුවයි ඇත්තේ. මෙය ලොකු ආසාධාරණයකි එම පුද්ගලයින්ට කරන්නේ . පෞද්ගලික තරහකි එම අයට කරනු ලබන්නේ . එම පුද්ගලයින් පොලිසි ගොස් ඇත. මේ සභාවට ගෙනවිත් ඉදිරිපත් කරනු ලබන්නේ පෞද්ගලික දේවල්ය.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාගනි මහත්මිය කතා කරමින්**

ගරු උපසභාපතිතුමනි, මා දන්නේ නැහැ එය පෞද්ගලික තරහාක්ද කියා මෙතැන කියන ලද ප්‍රශ්නයක් තමයා මා ඉදිරිපත් කරනු ලැබුවේ .

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , අපිට ප්‍රශ්නයක් තිබෙනවා ඉදිරිපත් කරන්න.කෙරමිණිය පුස්තකාලය කේ.ජී. සිල්වා පුස්තකාලය නමින් නාම කරණය කිරිම පිළිබඳ. ඔබතුමා පරික්ෂණයක් පවත්වන ලෙස නියෝග කළා. නමුත් කිසිම හාවක් චුවක් නැහැ. දැන් අපි 15 දා අපේ පහණට තෙල් මහෝත්සවයේදි අපේ වියදමින් ගල් පුවරුවක් මඟින් නිරාවරණය කරන්න කටයුතු යොදා ඇත. ඒ පිළිබඳ ඔබතුමා ප්‍රකාශ කරන්නේ කුමක් ද ?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එමපරික්ෂණය කරනු ලැබුවේ පළාත් පාලන විමර්ශන නිලධාරිතුමා. අපට තවම වාර්තාව ලැබුණේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

හැකි ඉක්මනින් එය ගෙන්වා ගන්න . අර වෙහෙරේ වැඩකටයුතු කිරිම පිළිබඳව පිළිතුරක් ලබා දුන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය කර ගත් ආකාරයට කර ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,ඔබතුමා ගරු සභාපතිතුමා විදියට ඇහුම්කන් දෙන බව අපි හොඳාකාරවම දන්නවා. අපේ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගෙන් සාධාරණ ඉල්ලීමක් කිරීමට කැමතියි. මේ සභාව ආරම්භ කර මාස දෙකකට වඩා මාගේ කොට්ඨාශයේ සෞඛ්‍ය සේවකයන් යොදවා සුද්ද පවිත්‍ර කටයුතු කරනු ලැබුවේ. මා 25 වතාවක් පමණ ඉල්ලීම් කළා. ඔබතුමා නිලධාරින්ට බලපෑම් කර තිබෙනවා හිතවත්කමට මාගේ කොට්ඨාශයේ වැඩ කටයුතු සිදු කරනවා කියා . අපේ වැඩ තියෙන අතරදී.එහෙම අපහසුතාවයට පත් කරන්න එපා. ඇගේ හයියට කටේ හයියට. අපිත් කොට්ඨාශ 12 ම වැඩ කරලා හොඳම නගර සභාව විදියට දායකත්වයක් දක්වන්න කැමතියි. ඇගේ හයියට කටේ හයියට වැඩ කරන්න යන්න එපා. එම නිලධාරින් දෙදෙනාම මෙතැන සිටිනවා. එම නිලධාරින් දැනුවත් කර මේ ගැන කටයුතු කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම කියපු කෙනෙක් සිටි නම් නැගිටලා මෙතැන කියන්න. එහෙම ප්‍රකාශ කරන්න එපා.ගරු සභාපතිතුමනි, මා කිසිම දිනක එසේ ප්‍රකාශ කර නැහැ.කාටවත් කියන්නත් බැහැ. හැබැයි එසේ ප්‍රකාශ කර තිබෙනවා නම් යම්කිසි නිලධාරියෙකුට දැන් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්න. දැන් මෙතුමා ප්‍රකාශ කරනු ලබන්නේ ඔය ප්‍රකාශය නෙමේ. මා නිලධාරින්ට එසේ ප්‍රකාශ කර තිබෙනවාද ? මා බලපෑම් කර තිබෙනවාද ? මේ ප්‍රකාශ කරනු ලැබුවේ ඒ විදියටනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

කටේ හයියට ඇගේ හයියට කියන කතාව නෙමේ ප්‍රකාශ කර ඇත්තේ.ඔබතුමා සද්දේ දමා එවැනි දේවල් කරන නිසා තමයි කියන්නේ .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මාගේ කටේ හයිය , ඇඟේ හයිය ඔබතුමාට නවත්වන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමාට පුද්ගලික ප්‍රශ්නයක් තිබෙනවා නම් එය බේරා ගනිමු වෙනම. ඔබතුමා ප්‍රකාශ කර තිබෙනවා එම කතාව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මාගේ කටේ හයිය , ඇඟේ හයිය ඔබතුමාට නවත්වන්න බැහැ. මා එසේ සිදු කර තිබේ නම් එම නිලධාරින්ගේ නම් කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමා කෙලින් වැඩ කරන බව ඇත්ත. ඔබතුමා සහයෝගය දෙන්න කියා ප්‍රකාශ කරන්නේ. ගරු සභාපතිතුමා ඇහුම්කන් දෙනවා . මාගේ කොට්ඨාශයේ හිතවත්කමට වැඩ කරනවා කියා ප්‍රකාශ කර තිබෙනවා.

- **පස්වරු 1.45 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

බී. ඒ. ධම්මිකා,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2019 -01–08** වන දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.